# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාතර්මේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

මහරගම

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

# ක්‍රිස්තියානි ධර්මය

## ගුරු මාර්ගෝපදේශය

## 12 ශ්‍රේණිය

**(2017 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ)**

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාතර්මේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info@nie.lk

ක්‍රිස්තියානි ධර්මය

12 ශ්‍රේණිය

.ගුරු මාර්ගෝපදේශය

ප්‍රථම මුද්‍රණය 2017

C ජාතික අධ්‍යාපන ආයතනය

ISBN..................... :

ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාතර්මේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk
විද්‍යුත් තැපැල : info@nie.lk

මුද්‍රණය :

මුද්‍රණාලය
ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් • සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදී.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශවයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එකම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීමහැකිතාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබාදීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමීව භාවිතා කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි .


ආචාර්ය ජයන්ති ගුණසේකර,<br>
අධ්‍යක්ෂ ජනරාල්,<br>
ජාතික අධ්‍යාපන ආයතනය,<br>
මහරගම

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුමයි. ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂය මාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරුමාර්ගෝපදේශ නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු මාර්ගෝපදේශයන් හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන , පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහානිර්මාණය වන ගුරු මාර්ගෝපදේශය ශික්ෂකයාහට ද දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළපොතට සහකරුවකු වන ගුරු මාර්ගෝපදේශය තවත් පෙළ පොතක් නොවන බව දන ගුරුභවතුන් ගුරු මාර්ගෝපදේශය හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සම්පාදිත අදාළ පෙළ පොත යන සම්පත් ද්‍රව්‍ය දෙක ම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයෙකු වුවද අපේක්ෂා කරන සාධනයන්, විෂය ඉගැන්වීමට මග පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මික වීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනගා ගැනීමට ගුරු මාර්ගෝපදේශය පහුරක්, යාත්‍රාවක් කර ගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන හිමි
පීඨාධිපති, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය
ජාතික අධ්‍යාපන ආයතනය.

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** : ශාස්ත්‍රීය හා කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය

**විෂය සම්බන්ධීකරණය** :

- ගරු ගමිණි පෙරේරා පියතුමා
  සහකාර කථිකාචාර්ය , ජාතික අධ්‍යාපන ආයතනය
- ශාස්ත්‍රපති ගරු එස්. අනුයාස් ඒ. ප්‍රනාන්දු නි.ම.නි. පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය
- ප්‍රදීප් කුමාර ප්‍රනාන්දු පියතුමා
  සහකාර කථිකාචාර්ය, ජාතික අධ්‍යාපන ආයතනය

**ලේඛක මණ්ඩලය** :

- ශාස්ත්‍රපති කේ. පද්මිණි එස්තර් පෙරේරා, ගුරු උපදේශක
  කලාප අධ්‍යාපන කාර්යාලය
  කැලණිය
- ශාස්ත්‍රපති එස්.ජී.කේ.ඩී.එල්.සී. ප්‍රසාද්, නියෝජ්‍ය විදුහල්පති
  බප/ කො සාන්ත ජෝසප් පිරිමි විද්‍යාලය
  කොළඹ 14
- ශාස්ත්‍රපති ඩබ්.ජේ.පි.ජේ.එම්.ඩී. පෙරේරා, ගුරු උපදේශක
  කලාප අධ්‍යාපන කාර්යාලය
  කොළඹ 13
- ශාස්ත්‍රපති ගරු මේරි නිමල්කා පැව්දි සොයුරිය - සහකාර විදුහල්පති
  බප/ කො සාන්ත ජෝසප් පිරිමි විද්‍යාලය
  නුගේගොඩ
- ශාස්ත්‍රපති එල්.නිලන්ති ද සිල්වා
  බප/ පිළි / මෙතොදිස්ත උසස් විදුහල
  මොරටුව
- අධ්‍යාපනපති (ක්‍රිස්තියානි අධ්‍යාපනය) එම්. රදීකා සමන්ති මෙන්ඩිස්
  ශාන්ත තෝමස් විදුහල
  ගල්කිස්ස
- අධ්‍යාපනපති හා සාමාජීයවිද්‍යාපති, ජුඩ්. දසනායක පියතුමා
  බාහිර කථිකාචාර්ය , විද්‍යාපීඨය, බිංගිරිය
- ශාස්ත්‍රපති නිමාලි පෙරේරා
  සාන්ත ලෝරන්ස් කන්‍යාරාමය
  කොළඹ 06

## කතෝලික උපදේශක මණ්ඩලය

- අති උතුම් දේවධර්මචාර්ය මැක්ස්වෙල් සිල්වා රදගුරු හිමිපාණෝ
  සභාපති,
  අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම

- අති උතුම් දේවධර්මචාර්ය ජෝශප් පොන්නයියා රදගුරු හිමිපාණෝ
  උපසභාපති,
  අධ්‍යාපන ධර්මෝපදේශ හා බයිබල් අධ්‍යයනය පිළිබඳ රදගුරු කොමිසම

- අතිගරු අයිවන් පෙරේරා නාහිමිපාණෝ,
  කතෝලික පාසල් පිළිබඳ ජාතික අධ්‍යක්ෂ

- ගරු. දයා ෂෙල්ටන් වැලිකඩආරච්චි පියතුමා.
  අධ්‍යාක්‍ෂ,
  සාන්ත ජුසේවාස් දේවධර්ම නිකේතනය, බොරැල්ල

- ගරු ග්‍රෙගරි එල්. ප්‍රනාන්දු පියතුමා,
  සහකාර අධ්‍යක්‍ෂ,
  ආගමික අංශය, අධ්‍යාපන අමාත්‍යාංශය , ඉසුරුපාය

- ශාස්ත්‍රපති ගරු ක්‍රිස්ටෝපර් බාල්රාජ් දේවගැතිතුමා,
  විදුහල්පති, සාන්ත තෝමස් විදුහල, බණ්ඩාරවෙල.

- ගරු එබනේෂර් ජෝශප් දේවගැතිතුමා,
  මහලේකම්, ජාතික ක්‍රිස්තියාන් මණ්ඩලය, කොළඹ 07.

- ආචාර්ය ෂර්ලි ලාල් විජේසිංහ,
  ක්‍රිස්තියානි සංස්කෘතික දෙපාර්තමේන්තුව,
  කැළණිය විශ්වවිද්‍යාලය.

- ගරු පියල් ජානක ප්‍රනාන්දු පියතුමා,
  ජාතික අධ්‍යක්‍ෂ,
  බයිබල් හා ධර්මෝපදේශ අපෝස්තලික සේවා

## පරිගණක වදන් සැකසුම

- එල්. නිලන්ති ද සිල්වා මහත්මිය.

## විවිධ සහාය කාර්යාලීය කටයුතු

- එස්. සී. ප්‍රියදර්ශනී මහත්මිය, ජාතික අධ්‍යාපන ආයතනය.
- ඩයස් අමරසිංහ මහතා, ජාතික අධ්‍යාපන ආයතනය.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස්

කතෝලික ධර්මයට අනුව සාර්ථක ජීවිතයක් ගත කිරීමට අත්‍යවශ්‍ය නිපුණතා පාදක කොට ගනිමින් පාසල් අධ්‍යාපනය හරහා එම නිපුණතා සංවර්ධනය කර ගැනීමට ඉඩ ප්‍රස්ථා සලසමින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

දැනුමින් පමණක් හිස පුරවා ගෙන දැනුම් කේන්ද්‍රීය විභාග ක්‍රමයක් යටතේ ඉහළ සාමාර්ථ ලබා ගැනීම පමණක් නොසෑහේ. දැනුම පමණක් ලබා දෙන අධ්‍යාපන ක්‍රමයක් සාර්ථක අධ්‍යාපන ක්‍රමයක් ලෙස සැලකිය නොහැකි ය. අධ්‍යාපනය තුළින් ආවේදන නොවරදීම තීව්‍ර කර, කුසලතා අනිවාර්යයෙන් ම ඔපමට්ටම් කළ යුතු ය. මේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අදිටනින් මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කර ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයට අනුරූප ව ලියා ඇති අතර පෙළපොත මෙම ගුරු මාර්ගෝපදේශයට හා විෂය නිර්දේශයට අනුව ලියවීමට නියමිත ය. එබැවින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී මෙම සීමාවන් නොඉක්මවා කටයුතු සංවිධානය කර ගැනීමට වගබලා ගත යුතු ය. එහි දී :

■ පාඩමට ප්‍රවේශය වඩාත් වැදගත් බැවින් ප්‍රබෝධාත්මක ආරම්භයක් ලබා දෙමින් එය හොඳින් සිදු කරන්න.
■ පාඩමට ප්‍රවේශවීමට හා පාඩම සංවර්ධනය සඳහා අවශ්‍ය ගුණාත්මක යෙදවුම් පරිශීලනය කරන්න.
■ සුදුසු පරිදි කණ්ඩායම් කර කණ්ඩායම් ක්‍රියාකාරකම්වල සිසුන් යොදවන්න.
■ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී වඩාත් සුදුසු ස්ථානය තෝරා ගැනීමට උනන්දු වන්න.
■ මෙහි දක්වා ඇති ඉගෙනුම් පලවලින් සිසුන්ගේ ජීවිත පොහොනි කරලීමට කටයුතු කරන්න.
■ සිසුන්ගේ විශ්වාසය වර්ධනය කිරීමට කටයුතු කරන්න.

මෙහි ඇතුළත් පාඩම්වලට යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය භාවිත කිරීම අනිවාර්ය නොවන අතර විකල්ප ඉගෙනුම් ක්‍රම, සුදුසු පරිදි භාවිත කළ හැකි ය. එහෙත් නිපුණතාව, නිපුණතා මට්ටම, ඉගෙනුම් පල හා විෂය අන්තර්ගතයෙන් බැහැර නොවිය යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී කතෝලික ආගමික ආකල්ප වර්ධනය කෙරෙහි ද ප්‍රායෝගික අවස්ථා යොදා ගැනීම කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කරන්න.

පාඩම ආරම්භයේ සිට අවසානය දක්වා තක්සේරුව සිදු කළ යුතු අතර හැකියා නොහැකියා අනුව ප්‍රතිපෝෂණය හා ඉදිරිපෝෂණය ලබා දිය යුතු ය. අදාළ පාඩමට අපේක්ෂිත ඇගයීම, තක්සේරුව හා ඇගයීම් නිර්ණායක අනුව සකස් කර ගන්න. ඇගයීම් සිදු කිරීමේ දී ලකුණු ලබා දෙන නිර්ණායක පිළිබඳ පෙරාතුව සිසුන් දැනුවත් කරන්න. ඔබ විසින් සිසුන්ට ලබා දෙන ලද අභ්‍යාසවල නිරවද්‍යතාව පරීක්ෂා කොට සටහන් තබන්න.

සෑම පාඩම් සටහනක් අවසානයේ ම යොදා ඇති ගෙදර පරිසරයෙන් යන කොටස දෙමාපිය වැඩිහිටි සහභාගිත්වය යටතේ සිදු කිරීමට යෝජිත ය. ඒ සඳහා උපදෙස් විදුහල්පති මගින් ද, විෂය භාර ගුරුභවතා පංති කවවල දී ද දෙමාපියන්ට හා වැඩිහිටියන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

ව්‍යාපෘති නායක ( කතෝලික ධර්මය)
ආගම් හා සාරධර්ම අධ්‍යාපන දෙපාතර්මේන්තුව

| පටුන | පිටුව |
| --- | --- |
| අධ්‍යක්ෂ ජනරාතුමාගේ පණිවිඩය | iv |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් හිමිගේ පණිවිඩය | v |
| විෂයමාලා කමිටුව | vi |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කිරීම සඳහා උපදෙස් | viii |
| විෂය නිර්දේශයේ අන්තර්ගතය | x |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | 1-137 |

# විෂය නිර්දේශයේ අන්තර්ගතය

## විෂය හැඳින්වීම

ඕනෑම සමාජයක අරමුණ වන්නේ යහපත් සදාචාරාත්මක හා ගුණගරුක පුරවැසියන් බිහි කිරීමයි. මේ සා වැදගත් අරමුණක් මුදුනේ පමුණුවාලීම සඳහා දහම් විශාල කාර්ය භාරයක් ඉටු කරයි. දහමට අනුගත ව දිවි ගෙවන මිනිසා සිය ජීවිතය තුළ යහපත වටිනාකම් හා ගුණාංග චරිතායනය කරගත් අයකු වේ. දහම තුළ පෝෂණය වී දිවි ගෙවන මිනිස් පරපුරක් බිහිකරලීම සඳහා දහම් අධ්‍යාපනයට ඉතා වැදගත් වගකීම් සමූහයක් හිමි වේ.

පාසල් විෂයමාලාව තුළ අධ්‍යයනය කරන විෂයයන්ගෙන් ජීවිතයෙන් වෙන කළ නොහැකි විෂයයක් ඇත්නම් ඒ ආගම ධර්මයයි. එයට හේතුව වන්නේ, ආගම ධර්මයේ ඉගෙන ගනු ලබන්නේ ජීවිතය ජය ගැනීමට වඩා ජීවිතය ගොඩනගාගෙන දැහැමි දිවි පෙවෙතකට හුරුවීමටයි . එම දිවි පෙවෙතට හුරුවීමෙන් ලැබෙන ප්‍රයෝජන මෙලොවට වඩා මතු සදාතන දියට සුවිශේෂි වේ.

කිතුණු අපගේ දහම වනුයේ කිතු දහමයි. මෙම දහම වසර 11 ක් පුරා අධ්‍යයනය කර, 12 ශ්‍රේණියේ දී ක්‍රිස්තියානි ධර්මය ඉගෙනීමට ප්‍රවිෂ්ට වන්නා වූ සිසු සිසුවියන්ට එම දහම පිළිබඳ ව තවත් සුවිශේෂි ආකාරයට අධ්‍යයනය කිරීම සඳහා අවස්ථාව හිමි වේ. එහි දී ක්‍රිස්තියානි ධර්මය පළමු වසර 11 තුළ අධ්‍යයනය කළාට වඩා ශාස්ත්‍රීය ව හා ගැඹුරින් අධ්‍යයනය කිරීමට අ.පො.ස. උසස් පෙළට පිවිසෙන සිසුන්ට අනගි අවස්ථාවක් උදාවනු ඇත.

අ.පො.ස. උසස් පෙළ පංතියට පිවිසෙන තරුණ සිසු දරුවන්ට සිය ජීවිතය තුළින් ක්‍රිස්තුන් වහන්සේට සාක්ෂි දැරීමට හා සිය ජීවිත අභියෝග ජය ගනිමින් ක්‍රිස්තු කේන්ද්‍රය දිවියක් ගත කිරීම සඳහා උසස් පෙළ ක්‍රිස්තියානි ධර්මය විෂය නිර්දේශය මගින් මංපෙත් විවර කර ඇත.

එම අරමුණ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂාවෙන් මෙම විෂය නිර්දේශය සකස් කර තිබේ. මෙම විෂය නිර්දේශය තුළ නිපුණතා මට්ටම 15 ක් නිපුණතාවක් යටතේ 12 ශ්‍රේණියේ දී ද, ඉතිරි නිපුණතා මට්ටම 15 ඉතිරි නිපුණතා 5 යටතේ 13 ශ්‍රේණියේ දී ද අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

## ජාතික අධ්‍යාපන පද්ධතිය සඳහා අරමුණු

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයින්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතිය සහාය විය යුතුය. වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරධැය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගෙන ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇති

1. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පය මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම.

2. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

3. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග වර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

4. පුද්ගලයින්ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

5. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

6. පුද්ගලයාගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

7. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

8. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වු ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන් පත් කර ගැනීමට දායක වනු ඇත.

1. සන්නිවේදන නිපුණතා

   සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනු කාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

   සාක්ෂරතාව — සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

   සංඛ්‍යා පිළිබඳ දැනුම — භාණ්ඩ, අවකාශය සහ කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

   රූපක භාවිතය — රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති හා වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

   තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය — පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළ දී ද, පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

2. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

   - නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලි හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
   - ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්
   - චිත්තවේගී බුද්ධිය

3. පරිසරයට අදාළ නිපුණතා

   මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයන්ට අදාළ වේ.

   සමාජ පරිසරය — ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

   ජෛව පරිසරය — සජීවි ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

   භෞතික පරිසරය — අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව ඉගෙනීම,වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් හා තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

4. වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා
ආර්ථික සංවර්ධනයට දායක වීම. තම වෘත්තීය ළැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම. හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම. යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

5. ආගම සහ ආචාර ධර්මයන්ට අදාළ නිපුණතා
පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණයි

6. ක්‍රීඩාව හා විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා
සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්.

7. ඉගෙනීමට ඉගෙනුම් පිළිබඳ නිපුණතා
ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම්

ඉහත ජාතික අරමුණු හා මූලික නිපුණතා ශ්‍රී ලංකාවේ සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති රාමවු ක් සඳහා යෝජනා ඇතළ ත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2003 දෙසැම්බර් වාර්තාවෙන් උපුටා ගැනිණි.

## නිපුණතා හා නිපුණතා මට්ටම්

1. ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීම සඳහා එහි පසුබිම භාවිත කරයි.
   1.1 ශුද්ධ බයිබලයේ උත්තරීතර බව හඳුනාගෙන එයට නිසි ගෞරවය දක්වයි.
   1.2 භූගෝලීය හා ඓතිහාසික පසුබිම ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීමට යොදා ගනියි.

2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.
   2.1 දේව ධාර්මික සම්ප්‍රදායයන් පංච පුස්තකය අර්ථකථනය කිරීමට යොදා ගනියි.
   2.2 ප්‍රාග් ඉතිහාසයේ අඩංගු දේව ධාර්මික ඉගැන්වීම් ජීවිතයට අදාළ කර ගනියි.
   2.3 ආදිපිතෘවරුන්ගේ යහපත් ආදර්ශ චරිතායනය කරයි.
   2.4 එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දැකීමට නික්මයාම සිද්ධිය පිටිවහලක් කර ගනියි.
   2.5 සීනයි ගිවිසුමට අනුව දිවිගෙවයි.

3. ප්‍රඥාවෙන් පූර්ණ ව දිවැසිවරයකු ලෙස සාක්ෂි දරයි.
   3.1 පුරාණ ගිවිසුමේ දිවැසිවර සංකල්පය තුළින් ජීවිතය ආලෝකවත් කර ගනියි.
   3.2 දිවැසිවර කැඳවීමට නොපසුබට ව ප්‍රතිචාර දක්වයි.
   3.3 ජීවිතය නිසි මග ගැන්වීම සඳහා ප්‍රඥා සාහිත්‍යයෙන් ආලෝකය ලබයි.

4. ක්‍රිස්තුන් වහන්සේ ලෝකයේ විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේට සාක්ෂි දරයි.
   4.1 ශුභාරංචිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා නව ගිවිසුමේ පසුබිම භාවිත කරයි.
   4.2 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ අවබෝධය කිතුනු වටිනාකම් ප්‍රචලිත කිරීමට යොදා ගනියි.
   4.3 ශු. පාවුලු තුමා අනුගමනය කරමින් ධර්මදූත සේවයේ නියැලෙයි.

5. කිතුනු ඉගැන්වීම්වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි.
   5.1 ස්වර්ග රාජ්‍යයේ වටිනාකම් චරිතායනය කරයි.
   5.2 ශු. පාවුලු තුමාගේ දේවධාර්මික ඉගැන්වීම් මත ජීවිතය ගොඩනගා ගනියි

6. සක්‍රමේන්තුමය ජීවිතයක් ගත කරයි.
   6.1 ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ තම කාර්යභාරයන් මැනවින් ඉටු කරයි.
   6.2 දිව්‍ය සත්ප්‍රසාද භෝජනයෙන් පෝෂණය වී පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කරයි.

7. ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂි දරයි.
   7.1 ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වී පිරිපුන් දිවියක් ගත කරයි.
   7.2 විශ්වාසය රැකගනිමින් අභියෝග ජය ගනියි.
   7.3 විශ්වාසය පෝෂණය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව ජීවත් වෙයි.
   7.4 දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව උගන්වයි.

8. ශුද්ධ වූ සභා ගමන් මග නිවැරදි කර ගැනීම සඳහා ශුද්ධාත්ම මගපෙන්වීමට විවෘත වෙයි.
   8.1 එල්දොයී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දක්වමින් ගැටලු නිරාකරණය කර ගනියි.
   8.2 කාලානුරූප ව ශුද්ධ වූ සභාව නිසි මග ගැන්වීම සඳහා දායක වෙයි.

9 ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාව තුළ සුබ අස්නේ පණිවිඩකරුන් ලෙස සාක්ෂි දරයි.
   9.1 පෘතුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ආරම්භය පිළිබඳ ව කරුණු සොයා බලයි.
   9.2 ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ධර්ම දූතයකු ලෙස කටයුතු කරයි.
   9.3. බාධක හමුවේ විශ්වාසයට සාක්ෂි දරයි.
   9.4 කිතුනු ධර්මදූත ව්‍යාපාර මගින් විවිධ ක්ෂේත්‍රයන්හි සිදු කළ සේවා ඉදිරියට ගෙන යාමට පියවර ගනියි.
   9.5 දේශීය ශුද්ධ වූ සභාවක් ගොඩනැගීමට දායක වෙයි.

10. මානව වටිනාකම් සුරකිමින් විවිධත්වය තුළ ඒකත්වයක් ගොඩනැගීමට කැප වෙයි.
   10.1 වත්මන් සමාජ ජීවිතය තුළකිතුනු වගකීම් නොපිරිහෙලා ඉටු කරයි.
   10.2 එක ම ශුද්ධ සභාවක් ගොඩනැගීමට සහජීවනයෙන් කටයුතු කරයි.

## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම | කාලච්ඡේද. ගණන |
|---|---|---|---|
| 12 | 1 | 1.1 - 2.4 | 120 |
| | 2 | 2.5 - 4.1 | 85 |
| | 3 | 4.2 - 5.2 | 95 |

## 3.1 - 12 ශ්‍රේණිය

**නිපුණතා, නිපුණතා මට්ටම්, විෂය සන්ධාරය සහ කාලය**

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 1.ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීම සඳහා එහි පසුබිම භාවිත කරයි. | 1.1 ශුද්ධ බයිබලයේ උත්තරීතර බව හඳුනාගෙන එයට නිසි ගෞරවය දක්වයි. | හැඳින්වීම -<br>නාම විග්‍රහය, භාෂාවන්, පොත්, වැදගත්කම<br>මැසොරෙටික්, සෙප්තුවාජින්ත, වල්ගේට්,<br>දේව අනාවරණය<br>දේවානුභාවය<br>කර්තෘත්වය | 1 ශුද්ධ බයිබලය පිළිබඳ මූලික තොරතුරු ගොනු කරයි.<br>2 ශුද්ධ බයිබලය දේව වචනය බව විශ්වාස කරයි.<br>3 ශුද්ධ බයිබලය පිළිබඳ මූලික තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 ශුද්ධ බයිබලය ගරුත්වයෙන් භාවිත කළ යුතු බව පිළිගනියි .<br>5 එකමුතු ව දේව වචනය අධ්‍යයනය කරයි. | 15 |
| | 1.2 භූගෝලීය හා ඓතිහාසික පසුබිම ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීමට යොදා ගනියි. | භූගෝලීය පසුබිම (පලස්තීනය)<br>ඓතිහාසික පසුබිම<br>(නික්මයාමේ සිට රෝම අධිරාජ්‍යය දක්වා)<br>නික්මයාම<br>වීරවරු<br>රජවරු<br>රාජ්‍ය දෙකඩ වීම<br>අසිරියානු විප්‍රවාසය<br>බබිලෝනියානු විප්‍රවාසය<br>පර්සියානු යුගය<br>ග්‍රීක යුගය<br>රෝම යුගය | 1 ශුද්ධ බයිබලයේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 විශ්වාසයෙන් ශුද්ධ බයිබලය අධ්‍යයනය කළ යුතු බව පිළිගනියි.<br>3 ශුද්ධ බයිබලයේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ඉතිහාසය තුළ ක්‍රියාත්මක වූ දෙවියන් වහන්සේ වර්තමානය හා අනාගතය තුළ ද මැදිහත් වන බව විශ්වාස කරයි.<br>5 එකිනෙකාගේ ජීවිත තුළ දේව ක්‍රියාකාරිත්වය අත්දැකීමට අන් අය යොමු කරවයි. | 20 |
| 2. දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි. | 2.1 දේව ධාර්මික සම්ප්‍රදායයන් පංච පුස්තකය අර්ථකථනය කිරීමට යොදා ගනියි. | J, E, D හා P සම්ප්‍රදායයන්<br>(එක් එක් සම්ප්‍රදාය හැඳින්වීම, පංච පුස්තකය තුළ විකාශය, විශේෂ ලක්ෂණ හා ඉදිරිපත් කරන ධර්මය) | 1 පංච පුස්තකය තුළ අඩංගු දේව ධාර්මික සම්ප්‍රදායයන් හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 දෙවියන් වහන්සේ විවිධාකාරයෙන් අත්දැකිය හැකි බව පිළිගනියි.<br>3 පංච පුස්තකය තුළ අඩංගු දේව ධාර්මික සම්ප්‍රදායයන් හතර පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 එදිනෙදා ජීවිතය තුළ දේව නීතිය පිළිපැදීමට යොමු වෙයි.<br>5 ධාර්මික දිවියක් ගත කිරීමට අන් අයට මග පෙන්වයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 2.2 ප්‍රාග් ඉතිහාසයේ අඩංගු දේව ධාර්මික ඉගැන්වීම් ජීවිතයට අදාළ කර ගනියි. | ප්‍රාග් ඉතිහාසය පිළිබඳ හැඳින්වීම<br>විශ්වය සහ මිනිසා මැවීම පිළිබඳ කථා දෙක.<br>(උත්පත්ති 1:1-2:4අ, 2:4ආ-25)<br>මිනිසාගේ වැටීම පිළිබඳ කථා 4<br>(උත්පත්ති 3, 4, 6:1-9:17, 11:1-9) | 1 ප්‍රාග් ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 දුර්පරීක්‍ෂා ජය ගත යුතු බව පිළිගනියි.<br>3 ප්‍රාග් ඉතිහාසය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 විශ්වයේ ආරම්භය හා එහි ක්‍රමානුකුල පැවැත්ම මගින් හෙළිවන දේව ආදරය අත්දකියි.<br>5 දුර්පරීක්‍ෂා ජය ගැනීමට අන් අයට මග පෙන්වයි. | 20 |
| | 2.3ආදීපීතෘවරුන්ගේ යහපත් ජීවිත ආදර්ශ චරිතායනය කරයි | ආදීපීතෘ යුගය<br>ආබ්‍රහම්ගේ කැඳවීම<br>(උත්පත්ති 12:1-6)<br>ගිවිසුම<br>(උත්පත්ති 15:1-21, 17:1-14)<br>විශ්වාසය<br>(උත්පත්ති 12, 24)<br>ඊසාක් හැඳින්වීම<br>(උත්පත්ති 21:2-5)<br>ගිවිසුම අලුත් කිරීම<br>(උත්පත්ති 26:19-25)<br>ජාකොබ් හැඳින්වීම<br>ගිවිසුම අලුත් කිරීම<br>(උත්පත්ති 28:10-22)<br>ජීවිත වෙනස<br>(උත්පත්ති 32:22-30<br>උත්පත්ති 33:3) | 1 ආදීපීතෘ යුගය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ආදීපීතෘවරුන්ගේ ජීවිත ආදර්ශ අනුකරණය කළ යුතු බව පිළිගනියි.<br>3. ආදීපීතෘ යුගය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි.<br>5 දෙවියන් වහන්සේ තුළ ජීවිත වෙනසක් අත්දැකීමට අන් අයට සහාය වෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| | 2.4 එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දැකීමට නික්මයාම සිද්ධිය පිටිවහලක් කර ගනියි. | ඊජිප්තුවේ වහල් මෙහෙවර හා මෝසෙස්ගේ උපත (නික්මයාම 1, 2 පරිච්ඡේද)<br>මෝසෙස්ගේ කැඳවීම (නික්මයාම 3:1-4:17)<br>වසංගත දසය (නික්මයාම 7:14-10:29, 12:29-36)<br>ජුදා පාස්කු මංගල්‍යය (නික්මයාම 12:1-28)<br>මුහුද තරණය (නික්මයාම 14:1-31)<br>වලා ටැඹ හා ගිනි ටැඹ (නික්මයාම 13:21-22)<br>පාළුකරයේ ගමන<br>මාරා - (නික්මයාම 15:22-25)<br>සීන් කාන්තාරය - (නික්මයාම 16 )<br>මස්සා හා මෙරිබා (නික්මයාම17:1-7, ගණන් 20:1-13)<br>ලෝකඩ සර්පයා (ගණන් 21:4-9)<br>ආක්‍රමණවලින් ආරක්ෂා වීම (නික්මයාම 17:8-13) | 1 නික්මයාම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 විශ්වාසය තුළ දේව ආදරය හා රැකවරණය අත්දැකිය හැකි බව පිළිගනියි.<br>3 නික්මයාම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකියි.<br>5 අන් අයගේ සුරක්ෂිත බව වෙනුවෙන් කැපවෙයි. | 30 |
| | 2.5 සීනයි ගිවිසුමට අනුව දිවි ගෙවයි. | සීනයි ගිවිසුම (නික්මයාම 20, 24 පරිච්ඡේද)<br>හැඳින්වීම<br>වැදගත්කම<br>ස්ථිර කිරීම<br>දස පනතෙහි ලක්ෂණ | 1 සීනයි ගිවිසුම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 එක ම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කළ යුතු බව පිළිගනියි.<br>3 සීනයි ගිවිසුම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 දස පනතට අනුව ජීවත් වෙයි.<br>5 දස පනතේ මගපෙන්වීම තුළ සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 3. ප්‍රඥාවෙන් පූර්ණ ව දිවැසිවරයකු ලෙස සාක්ෂි දරයි. | 3.1 පුරාණ ගිවිසුමේ දිවැසිවර සංකල්පය තුළින් ජීවිතය ආලෝකවත් කර ගනියි. | හැඳින්වීම (දිවැසිවරයෙක් යනු)<br>වර්ගීකරණය<br>ප්‍රධාන තේමා තුන<br>ඒකදේවවාදය<br>සදාචාරය<br>මෙසියානු සංකල්පය<br>(2 සාමුවෙල් 7:10-17<br>යෙසායා 7:10-17, 9:1-7, 11:1-9<br>මීකා 5:1-4<br>සෙකරියා 9:9-16) | 1 දිවැසිවර සංකල්පය පිළිබඳ තොරතුරු ගොනු කරයි<br>2. දිවැසිවරයකු මෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.<br>3. දිවැසිවර සංකල්පය පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 දිවැසිවරුන්ගේ ප්‍රධාන තේමා තම ජීවිතයට අදාළ කර ගනියි.<br>5 සදාචාරාත්මක දිවියක් ගතකිරීමට ජීවිතාදර්ශයෙන් මග පෙන්වයි. | 10 |
| | 3.2 දිවැසිවර කැඳවීමට නොපසුබට ව ප්‍රතිචාර දක්වයි. | දිවැසිවර යෙසායා<br>හැඳින්වීම<br>කැඳවීම<br>ප්‍රධාන ඉගැන්වීම්<br>දිවැසිවර ජෙරමියා<br>හැඳින්වීම<br>කැඳවීම<br>ප්‍රධාන ඉගැන්වීම්<br>දිවැසිවර එසකියෙල්<br>හැඳින්වීම<br>කැඳවීම<br>ප්‍රධාන ඉගැන්වීම්<br>දිවැසිවර ආමොස් හා හොෂියා<br>හැඳින්වීම<br>ප්‍රධාන ඉගැන්වීම් | 1 දිවැසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 වර්තමාන සමාජය තුළ දිවැසිවරුන් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කළ යුතු බව පිළිගනියි.<br>3 දිවැසිවරුන් පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 දිවැසිවර පණිවිඩය තුළ තම ජීවිතය හැඩගස්වා ගනියි.<br>5 දිවැසිවර ආදර්ශය අනුව අන් අය යහමගට යොමු කරවයි. | 20 |
| | 3.3 ජීවිතය නිසි මග ගැන්වීම සඳහා ප්‍රඥා සාහිත්‍යයෙන් ආලෝකය ලබයි. | ප්‍රඥා සාහිත්‍ය පිළිබඳ හැඳින්වීම<br>ගීතාවලිය පොත පිළිබඳ ව හැඳින්වීම<br>ගීත වර්ගීකරණය<br>ජනවන්දනාව සඳහා භාවිතය | 1 ප්‍රඥා සාහිත්‍යය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 යහපතින් අයහපත වෙන්කරගෙන යහපත පමණක් කළ යුතු බව පිළිගනියි.<br>3 ප්‍රඥා සාහිත්‍යය පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත්. කරයි.<br>4 ගීතාවලියෙහි ආභාසය තුළ තම යාච්ඤා ජීවිතය පොහොනි කර ගනියි.<br>5 ප්‍රඥාවන්ත ව කටයුතු කරන සමාජයක් ගොඩනැඟීමට දායක වෙයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 4. ක්‍රිස්තුන් වහන්සේ ලෝකයේ විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේට සාක්ෂි දරයි. | 4.1ශුභාරංචිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා නව ගිවිසුමේ පසුබිම භාවිත කරයි. | නව ගිවිසුමේ දේශපාලන පසුබිම<br>නව ගිවිසුමේ සාමාජීය පසුබිම<br>නව ගිවිසුමේ ආගමික පසුබිම | 1 නව ගිවිසුමේ දේශපාලන, සාමාජීය හා ආගමික පසුබිම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 තම බලතල අයුතු ලෙස භාවිත නොකළ යුතු බව පිළිගනියි.<br>3 නව ගිවිසුමේ දේශපාලන, සාමාජීය හා ආගමික පසුබිම පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 නව ගිවිසුමේ දේශපාලන, සාමාජීය හා ආගමික පසුබිම තුළ නව ගිවිසුම අර්ථකථනය කරයි.<br>5 තම තනතුරු අන් අයගේ සුබසෙත සඳහා යොදවයි. | 20 |
| | 4.2 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ අවබෝධය කිතුනු වටිනාකම් ප්‍රචලිත කිරීමට යොදා ගනියි. | ශුභාරංචි ලේඛන ගතවීමේ අවධි<br>ශුභාරංචි හැඳින්වීම (මතෙව්, මාක්, ලූක්, ජොහන්)<br>කර්තෘත්වය<br>කාලය හා ස්ථානය<br>පරමාර්ථ<br>ආවේණික ලක්ෂණ<br>සමදර්ශක ගැටලුව<br>සමදර්ශක හා ජොහන් ශුභාරංචිය අතර සමානතා හා අසමානතා<br>ක්‍රියා පොත හැඳින්වීම<br>කර්තෘත්වය<br>කාලය හා ස්ථානය<br>විශේෂ ලක්ෂණ | 1 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ශුභාරංචිය ප්‍රචලිත කිරීමට ඇප කැප විය යුතු බව පිළිගනියි.<br>3 ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. ශුභාරංචියේ ආලෝකය තුළ තම ජීවිතය හැඩ ගස්වා ගනියි.<br>5. ජීවිත පැවැත්ම අන් අයට ශුභාරංචියක් වෙයි. | 25 |
| | 4.3 ශුද්ධ වූ පාවුලු තුමා අනුගමනය කරමින් ධර්මදූත සේවයේ නියැලෙයි. | ශුද්ධ වූ පාවුලු තුමා පිළිබඳ හැඳින්වීම<br>ශුද්ධ වූපාවුලු තුමාගේ ධර්මදූත ගමන්<br>ශුද්ධ වූපාවුලු තුමාගේ ලිපි වර්ගීකරණය | 1 ශුද්ධ වූ පාවුලු තුමාගේ දූත සේවාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ශුද්ධ වූ පාවුලු තුමාගේ ජීවිතාදර්ශය තුළ ධර්මදූත සේවාව සඳහා ඇප කැප විය යුතු බව පිළිගනියි.<br>3 ශුද්ධ වූ පාවුලු තුමාගේ දූත සේවාව පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 තම ජීවිත සාක්ෂියෙන් ධර්ම දූතයකු වෙයි.<br>5 ධර්මදානය මගින් අන් අය දේව රාජ්‍යය වෙත ළං කරවයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
| --- | --- | --- | --- | --- |
| 5. කිතුනු ඉගැන්වීම්වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි. | 5.1 ස්වර්ග රාජ්‍යයේ වටිනාකම් චරිතායනය කරයි. | මතෙව් ශුභාරංචිය පිළිබඳ අධ්‍යයනය<br>ක්‍රිස්තුන් වහන්සේගේ දේශනා පහ (මතෙව් 5-7, 10, 13, 18, 24-25)<br>සවිස්තරාත්මකව (මතෙව් 13, 24-25)<br>ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය වර්ගීකරණය<br>1. සුව කිරීම් (මතෙව් 8:14-17)<br>2. දුෂ්ට ආත්ම දුරු කිරීම් (මතෙව් 8:28-34)<br>3. ස්වභාව ධර්මය හා සම්බන්ධ මාරුත දමනය (මතෙව් 8:23-27)<br>4. මළවුන් උත්ථානය(මතෙව් 9:18-19,23-26)<br>ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය, මරණය, උත්ථානය හා දර්ශනය වීම (මතෙව් 26-28) | 1 මතෙව් ශුභාරංචිය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 දේව රාජ්‍ය වටිනාකම් අනුව ජීවත් විය යුතු බව පිළිගනියි.<br>3 මතෙව් ශුභාරංචිය පිළිබඳ ව ගොනු කළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීමේ දී අත්දකින දුක් වේදනා සතුටින් දරා ගනියි.<br>5 දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීම සඳහා අන් අය සමග සහයෝගයෙන් කටයුතු කරයි. | 30 |
| | 5.2 ශුද්ධ වූ පාවුලු තුමාගේ දේවධාර්මික ඉගැන්වීම් මත ජීවිතය ගොඩනගා ගනියි. | ශුද්ධ වූ පාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම්<br>ප්‍රේමය (1 කොරින්ති 13)<br>බැහැපත්කම (පිලිප්පි 2:5-11)<br>පවුල් දිවිය (එපීස 5:22-6:4) | 1 ශුද්ධ වූපාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ කරුණු ගොනු කරයි.<br>2 බැහැපත් දිවියක් ගත කළ යුතු බව පිළිගනියි.<br>3 ශුද්ධ වූ පාවුලු තුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳ ගොනු කළ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ප්‍රේම පාරමිතාව අනුව ජීවිතය හැඩගස්වා ගනියි.<br>5 පවුල තුළ සහයෝගයෙන් හා ප්‍රේමයෙන් දිවි ගෙවයි. | 20 |
| 6. සක්‍රමේන්තුමය ජීවිතයක් ගත කරයි. | 6.1 ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ තම කාර්යභාරය මැනවින් ඉටු කරයි. | ජේසුස් වහන්සේගේ බෞතීස්ම ස්නාපනය (මාක් 1:11<br>ගීතාවලිය 2:7 යෙසායා 42:1)<br>ප්‍රසාද ස්නාපන කැඳවීම තුළ කිතුනු අපගේ කාර්යභාරය (පූජක, දිවැසි, එඬේර) | 1 ප්‍රසාද ස්නාපනීය කැඳවීමේ කාර්යභාරය පිළිබඳ කරුණු ගොනු කරයි.<br>2 ප්‍රසාද ස්නාපනය ලැබීම තුළ පූජක, දිවැසි හා එඬේර කාර්යභාරය ඉටු කළ යුතු බව පිළිගනියි.<br>3 ප්‍රසාද ස්නාපනීය කැඳවීමේ කාර්යභාරය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ප්‍රසාද ස්නාපනීය කැඳවීමට සාක්ෂි දරයි.<br>5 ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළ සමාජ සේවයේ නිරත වෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 6.2 දිව්‍ය සත්ප්‍රසාද හෝජනයෙන් පෝෂණය වී පරිත්‍යාගශීලී ජීවිතයක් ගත කරයි. | ජීවනදායක හෝජනය (ජොහන් 6:51-58)<br>දිව්‍ය සත්ප්‍රසාදය ස්ථාපිත කිරීම (මතෙව් 26:26-28, මාක් 14:22-24 ලූක් 22:14-20, 1 කොරින්ති 11:23-25)<br>නිසි ලෙස දිව්‍ය සත්ප්‍රසාදය වැළඳීම. (1 කොරින්ති 11:27-32) | 1. ජීවනදායක හෝජනය පිළිබඳ ව කරුණු ගොනු කරයි.<br>2. දිව්‍ය සත්ප්‍රසාදය විශ්වාසයෙන් යුතු ව පිළිගනියි.<br>3. ජීවනදායක හෝජනය පිළිබඳ ව රැස්කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. නිසි ලෙස දිව්‍ය සත්ප්‍රසාදය වැළඳීමට යොමුවෙයි.<br>5. අන් අය හා එක් ව පරිත්‍යාගශීලී ව කටයුතු කරයි. | 15 |
| 7. ජීවිත අභියෝග හමුවේ ශුද්ධාත්ම බලයෙන් පිරිපුන් වී විශ්වාසයට සාක්ෂි දරයි. | 7.1 ශුද්ධාත්ම බලයෙන් සන්නද්ධ වී පිරිපුන් දිවියක් ගත කරයි. | ශුද්ධාත්ම ආගමනය (ක්‍රියා 2:1-41)<br>මුල් සභාවේ ලක්ෂණ (ක්‍රියා 2:42-47, 4:32-37)<br>උපස්ථායකයන් පත් කිරීම (ක්‍රියා 6:1-7)<br>ප්‍රාණපරිත්‍යාගී සාක්ෂි<br>ස්තේපන් (ක්‍රියා 7:54-60)<br>මහා ජාකොබ් (ක්‍රියා 12:1-2)<br>විජාතිකයින්ට සුබ අස්න (ක්‍රියා 8:4-17, 10:1-48, 8:26-40)<br>ජෙරුසලම් මන්ත්‍රණ සභාව (ක්‍රියා 15:1-21) | 1. පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය දක්වා කරුණු ගොනු කරයි.<br>2 ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී තරුණ ජීවිතයට එල්ලවන අභියෝග ජයගත යුතු බව පිළිගනියි.<br>3 පෙන්තකොස්තයේ සිට මුල් කිතුනු සභාව වර්ධනය වූ ආකාරය පිළිබඳ ව නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ශුභාරංචිය පතළ කිරීමට නොපසුබට ව ක්‍රියා කරයි.<br>5 ශුද්ධ වූ සභාවට එල්ලවන අභියෝග ජය ගැනීම සඳහා සහයෝගය දක්වයි. | 25 |
| | 7.2 විශ්වාසය රැකගනිමින් අභියෝග ජය ගනියි. | පීඩන 10<br>මිලාන් ආඥාව | 1 කිතුනු සභාවේ පීඩන සමය පිළිබඳ ව තොරතුරු ගොනු කරයි.<br>2 අභියෝග හමුවේ විශ්වාසය සවිමත් කර ගත යුතු බව පිළිගනියි.<br>3 කිතුනු සභාවේ පීඩන සමය පිළිබඳ ව ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 විශ්වාසයට එරෙහි අභියෝග ජය ගනියි.<br>5 අභියෝග ජය ගැනීම සඳහා අන් අය හා එකමුතුව ක්‍රියා කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 7.3 විශ්වාසය පෝෂණය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව ජීවත් වෙයි. | සභා පියවරු හැඳින්වීම<br>ප්‍රාණපරිත්‍යාගී ශු. ජස්ටින් තුමා<br>ශු. අතනාසියුස් තුමා<br>ශු. ජෙරොම් තුමා<br>ඇලෙක්සැන්ඩ්‍රියාවේ ශු. සිරිල් තුමා<br>ශු. අගුස්තීනු තුමා<br>ඔරිජන් තුමා (ඔරිගන් තුමා)<br>ටර්ටූලියන් තුමා<br>(එක් එක් අය පිළිබඳ ව කෙටි හැඳින්වීමක් පමණි.) | 1. සභා පියවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. දේව විශ්වාසය වර්ධනය කර ගනිමින් ශුද්ධ වූ සභාවේ සත්‍යතා අනුව දිවි ගෙවි යුතු බව පිළිගනියි.<br>3. සභා පියවරුන් පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. ශුද්ධ වූ සභාවේ දහම් සත්‍යතාවලට අනුව දිවි ගෙවයි.<br>5. අන් අයගේ විශ්වාසය වර්ධනය කිරීම සඳහා එක් ව කටයුතු කරයි. | 25 |
| | 7.4 දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව උගන්වයි. | වේදභේද හා ජගත් මන්ත්‍රණ සභා<br>නයිසීන<br>කොන්ස්තන්තිනෝපල්<br>එපීස<br>කැල්සිඩොන් | 1. පළමු ජගත් මන්ත්‍රණ සභා 4 පිළිබඳ තොරතුරු රැස් කරයි.<br>2 දේව ධාර්මික සත්‍යතා නිවැරදි ව ඉගැන්විය යුතු බව පිළිගනියි.<br>3. පළමු ජගත් මන්ත්‍රණ සභා 4 පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. ශුද්ධාත්ම බලයෙන් පූර්ණ වී දූර්මතවලට එරෙහි ව නැගී සිටියි.<br>5. දේව ධාර්මික සත්‍යතා සුරැකීමට අන් අය හා එක් ව ක්‍රියා කරයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 8. ශුද්ධ වූ සභා ගමන් මග නිවැරදි කර ගැනීම සඳහා ශුද්ධාත්ම මගපෙන්වීමට විවෘත වෙයි. | 8.1 ඵලදායී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දක්වමින් ගැටලු නිරාකරණය කර ගනියි. | 4-16 සියවස දක්වා ශු.සභා ඉතිහාසය ඉතා කෙටියෙන්<br>(අධ්‍යාපනය හා පැවිදි නිකායයන් ඇතුළුව)<br>ශු. සභාව බෙදී යාමේ පසුබිම<br>මාටින් ලූතර්<br>කැල්වින් හා ස්විංග්ලි<br>8 වන හෙන්රි රජතුමා<br>ජෝන් වෙස්ලි හා චාල්ස් වෙස්ලි<br>විලියම් බූත් | 1 ක්‍රි.ව. 4-16 සියවස දක්වා විශ්ව ශුද්ධ සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 ඵලදායී විවේචනවලට ශුභවාදී ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>3. ක්‍රි.ව.4-16 සියවස දක්වා විශ්ව ශුද්ධ වූ සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 ජාතික සමගිය හා ආගමික සහජීවනය ගොඩනැගීමට දායක වෙයි.<br>5 පිළිගත් සභා අතර සභා එකමුතු ව ගොඩනැගීමට දායක වෙයි. | 25 |
| | 8.2 කාලානුරූප ව ශුද්ධ වූ සභාව නිසි මග ගැන්වීම සඳහා දායක වෙයි. | 16-21 සියවස දක්වා ශුද්ධ වූ සභා ඉතිහාසය ඉතා කෙටියෙන්<br>(ප්‍රතිසංස්කරණය හා පුනරුදය)<br>තාපස නිකායයන්<br>ත්‍රිදෙන්තීන මන්ත්‍රණ සභාව<br>නවීන යුගය<br>ප්‍රංශ විප්ලවය<br>ශුද්ධ වූ සභාවේ දායකත්වය<br>පළමුවන වතිකාන සභාව<br>විශේෂිත ශුද්ධෝත්තම පියවරු<br>දෙවන වතිකාන මන්ත්‍රණ සභාව | 1 16-21 සියවස දක්වා සභා ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 කාලානුරූපී වෙනස්කම්වලට ශුභවාදී ව ප්‍රතිචාර දැක්විය යුතු බව පිළිගනියි.<br>3 ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 කිතුනු සභා නායකයන් ඉදිරිපත් කරන ඉගැන්වීම් හා මග පෙන්වීම් තම කිතුනු ජීවිතයට අදාළ කර ගනියි.<br>5 ශුද්ධ වූ සභා නවෝදය වෙනුවෙන් දියත් කරන වැඩසටහන් සාර්ථක කර ගැනීම සඳහා අන් අය සමග සහයෝගයෙන් ක්‍රියා කරයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| 9 ශ්‍රී ලංකාවේ කිතුනු අනන්‍යතාව තුළ සුබ අස්නේ පණිවිඩකරුවන් ලෙස සාක්ෂි දරයි. | 9.1 පෘතුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාව තුළ කිතු දහමේ ආරම්භය පිළිබඳ ව කරුණු සොයා බලයි. | පෘතුගීසීන් පැමිණීමට පෙර යුගයේ කිතු දහම<br>පෘතුගීසීන් පැමිණීමට පෙර ශ්‍රී ලංකාවේ කිතුනුවන් සිටි බවට සාක්ෂි<br>කොස්මස් ඉන්ඩිකොප්ලෙයුස්ටස් නමැති දේශ සංචාරකයාගේ සාක්ෂිය<br>අනුරාධපුරයෙන් හමුවූ ගලක කෙටූ කුරුසිය<br>සීගිරි සමයේ සිටි මිගාර සේනාපති<br>තෝමස් අපෝස්තුලුවරයාගේ අනුගාමිකයන් මෙරට සිටි බවට පවත්නා සාක්ෂි<br>මුගලන් රජු සමයේ කිතුනු ලාංඡන සහිත රන් කාසි<br>අබුසයිද්ගේ සටහන් ක්‍රි.ව 911 "ලංකාවේ එවකට සිටි රජුගේ ඇමති මණ්ඩලයේ හතර දෙනෙක් කිතුනුවෝ වූහ"<br>බෙන්ජමින් රබායිගේ සටහන් (12 වන සියවසේ) ශ්‍රී ලංකාවේ ජුදෙව් ක්‍රිස්තියානීන් 2300ක් පමණ ද පූජකවරුන් ද දේවස්ථාන ද තිබිණි | 1. ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි අනන්‍යතාව සුරැකිය යුතු බව පිළිගනියි.<br>3. ශ්‍රී ලාංකේය කිතු සසුනේ ආරම්භය පිළිබඳ ගොනු කරගත් කරුණු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. විවිධ අභියෝග හමුවේ ක්‍රිස්තියානි විශ්වාසය සුරකියි.<br>5. ජාතික හා ආගමික සහජීවනය ගොඩනැඟීමට දායක වෙයි. | 10 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.2 ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ ධර්ම දූතයකු ලෙස කටයුතු කරයි. | පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>පෘතුගීසීන් පෙරදිගට පැමිණීම<br>පෘතුගීසි පෙරදිග ඉන්දීය වෙළඳ සමාගම<br>පද්‍රෝආදෝ හෙවත් යටත් විජිතයන්හි ආරක්ෂක භාරය<br>ලොරෙන්සෝද අල්මේදා ලක්දිවට ගොඩබැසීම<br>ධර්මදූතවරුන් ලක්දිවට පැමිණීම.<br>පෘතුගීසි ධර්මදූතවරුන්ගේ ප්‍රයත්නය සාර්ථක වීමට බලපෑ හේතු<br>පෘතුගීසි ධර්මදූත ප්‍රචාරයේ ඌණතා<br>පෘතුගීසි යුගයේ දී ඇතිවූ කතෝලික විරෝධී පීඩන<br>මන්නාරමේ ප්‍රාණපරිත්‍යාගීවරු<br>වීදිය බණ්ඩාරගේ පීඩනය<br>කිතු දහම වැළඳගත් රජ දරුවෝ<br>ධර්මපාල කුමරා<br>ජයවීර බණ්ඩාර<br>කරලියද්දේ බණ්ඩාර<br>වීර සුන්දර බණ්ඩාර<br>දෝන කතරිනා (කුසුමාසන දේවී)<br>යාපනය රජ පවුලේ කුමර කුමරියන්<br>දෝන් ජුවන් යමසිංහ<br>පෘතුගීසි පාලනයේ ප්‍රතිඵල | 1. පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. පෘතුගීසි යුගයේ ධර්මදූතයන් කළ සේවය අගය කරයි.<br>3. පෘතුගීසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. කිතුනු අනන්‍යතාව සුරැකීමට දායක වෙයි.<br>5. ධර්මදූත සේවය සඳහා සහයෝගය දක්වයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.3.බාධක හමුවේ විශ්වාසයට සාක්ෂි දරයි. | ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>ලන්දේසීන් ශ්‍රී ලංකාවට පැමිණීම<br>පෘතුගීසීන් හා ලන්දේසීන් අතර පැවති භේදය<br>ලන්දේසීන්ගේ කතෝලික විරෝධී ප්‍රතිපත්ති<br>ලන්දේසීන් මෙරට කතෝලිකයන්ට පීඩා කිරීමට හේතු<br>ලන්දේසි පීඩන හමුවේ මෙරට කතෝලිකයන්ගේ ප්‍රතිචාර<br>ලන්දේසි යුගයේ අධ්‍යාපනය<br>ලන්දේසි පාලන සමයේ හිතකර ලක්ෂණ<br>ශුද්ධ වූ ජුසේ වාස් පියතුමාගෙන් ලක් සසුනට වූ සේවය හා එතුමාගේ ධර්මදූත ප්‍රතිපත්ති<br>ගෞරවනීය ජාකෝමේ ගොන්සාල්වේස් පියතුමාගෙන් ලක් සසුනට වූ සේවය<br>ඔරතෝරියානු නිකායික ධර්මදූතවරුන්ගෙන් ලද සේවය<br>ගරු පිලිප්පුස් බල්දේවුස් දේවගැතිතුමාගෙන් ලක් සසුනට වූ සේවය | 1. ලන්දේසි යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2. ශුද්ධ වූ ජුසේ වාස් පියතුමන් ප්‍රමුඛ ඔරතෝරියානු නිකායික පියවරුන්ගෙන් මෙරට කිතුනු සභාවට වූ සේවය අගය කරයි.<br>3. ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4. සැබෑ ධර්මදූතයකු ලෙස කටයුතු කරයි.<br>5. කිතුනු සාහිත්‍යය පෝෂණය කිරීමට අන් අයට සහයෝගය දක්වයි. | 20 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.4 කිතුනු ධර්මදූත ව්‍යාපාර මගින් විවිධ ක්ෂේත්‍රයන්හි සිදු කළ සේවා ඉදිරියට ගෙන යාමට පියවර ගනියි. | බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>ආගමික නිදහස<br>කතෝලිකයන්ට පූර්ණ නිදහස ලබා දුන් මැග්නා කාර්ටා පනත<br>විදේශීය ධර්මදූත කණ්ඩායම් මෙරටට පැමිණීම හා සේවය<br>ලන්ඩන් ධර්මදූත කණ්ඩායම- 1805<br>බැප්ටිස්ට් ධර්මදූත කන්ඩායම-1812<br>වෙස්ලියන් ධර්මදූත කණ්ඩායම- 1814<br>ඇමෙරිකන් ධර්මදූත කණ්ඩායම - 1816<br>සභා ධර්මදූත සංගමය (C.M.S.) 1818<br>ගැලවීමේ හමුදාවේ ධර්මදූත කණ්ඩායම - 1883<br>බයිබල් සමාගම<br>බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ කතෝලික සභාව (අනුපදවි හා රදගුරු පදවි ආරම්භය)<br>පැවිදි නිකායන්ගේ පැමිණීම හා සේවය<br>සිල්වෙස්ත්‍රීන බෙනදිකාන නිකාය - 1845<br>නිර්මල මරිය නිකාය - 1848<br>ශුද්ධ වූ පවුලේ පැවිදි නිකාය - 1862<br>ද ලා සාල් නිකාය - 1866<br>යහපත් එඬේරාගේ පැවිදි නිකාය - 1869<br>මරිය තුමියගේ ප්‍රැන්සිස්කාන පැවිදි නිකාය - 1886<br>දිළිඳුන්ගේ කුඩා සොහොයුරියෝ පැවිදි නිකාය - 1888<br>දයාවේ සොහොයුරියන්ගේ පැවිදි නිකාය - 1896<br>සුරදූතික සොහොයුරියන්ගේ පැවිදි නිකාය - 1903<br>මාරිස්ට් සහෝදරතුමන්ලා - 1911<br>අපොස්තලික කර්මෙල් නිකාය - 1922<br>බ්‍රිතාන්‍ය යුගයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය<br>ගරු ක්‍රිස්ටෝපර් බොන්ජන් පියතුමා හා ආධාර ලබන පාසල් (උපකෘත පාසල්)<br>ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් කිතුනු දායකත්වය | 1 බ්‍රිතාන්‍ය යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනුකරයි.<br>2 කිතුනු ධර්මදූත ව්‍යාපාරය තුළින් ශ්‍රී ලංකාවේ ආගමික, අධ්‍යාපනික හා සාමාජීය ක්ෂේත්‍රයන්ට ලැබුණු දායකත්වය අගය කරයි.<br>3 ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 සැබෑ කිතුනුවන් ලෙස කටයුතු කරයි.<br>5 ආගමික නිදහස සුරැකීමට දායක වෙයි. | 25 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් ඵල | කාලච්ඡේද ගණන |
|---|---|---|---|---|
| | 9.5 දේශීය ශුද්ධ වූ සභාවක් ගොඩනැගීමට දායක වෙයි. | නිදහස් යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම<br>නිදහසින් පසු ලාංකේය ශු. සභාව මුහුණදුන් ගැටලු<br>පාසල් රජයට පවරා ගැනීම<br>පැවිදි සොයුරියන් රෝහල් සේවයෙන් ඉවත් කිරීම<br>පැවිදි අයගේ වීසා අවලංගු කිරීම<br>ක්‍රිස්තියානි ආගමිකයන් කෙරෙහි නිර්දය විවේචන<br>ජනවාර්ගික ගැටලුව සහ සාම ක්‍රියාදාමය<br>බෙදී ගිය කිතුනු ආගමික ව්‍යාපාර<br>දේශීයකරණය සඳහා දරන ලද ප්‍රයත්න<br>නිදහස් යුගයේ රදගුරු පදවි විකාශය | 1 නිදහසින් පසු යුගයේ ශ්‍රී ලංකාවේ කිතු දහම පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 නිදහසින් පසු දේශීය කරණය සඳහා සභාව දරන ලද ප්‍රයත්න අගය කරයි.<br>3 ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි<br>4 ශ්‍රී ලාංකේය ශුද්ධ වූ සභාව දේශීයකරණය සඳහා ඇපකැප වෙයි.<br>5 දේශීය ශුද්ධ වූ සභාව පෝෂණය කිරීමට දායක වෙයි. | 20 |
| 10. මානව වටිනාකම් සුරකිමින් විවිධත්වය තුළ ඒකත්වයක් ගොඩ නැගීමට කැප වෙයි. | 10.1වත්මන් සමාජ ජීවිතය තුළ කිතුනු වගකීම් නොපිරිහෙලා ඉටු කරයි. | මිනිස් බවේ ගරුත්වය<br>කාන්තාව පිළිබඳ කිතුනු චින්තනය<br>මානව සංවර්ධනය සඳහා කිතුනු සහභාගීත්වය<br>මිනිසාගේ සමාජ ජීවිත (කිතුනු විවාහයේ ශුද්ධත්වය)<br>ගැටුම් නිරාකරණය හා සාමය නගාලීම<br>පරිසර සුරැකීමේ කිතුනු වගකීම | 1 මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 අන් අයට ගරු කළ යුතු බව පිළිගනියි.<br>3 මිනිස් බවේ ගරුත්වය සුරැකීම සඳහා කිතුනුවා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 මානව සංවර්ධනය සඳහා කටයුතු කරයි.<br>5 ගැටුම් නිරාකරණය කර ගනිමින් සාමකාමී ව දිවි ගෙවයි. | 15 |
| | 10.2එක ම ශුද්ධ සභාවක් ගොඩනැගීමට සහජීවනයෙන් කටයුතු කරයි. | කිතුනු සභා සමගිය<br>1.ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතුනු සභා<br>2.කිතුනු සභා එකමුතුව සඳහා බයිබලීය පදනම<br>උත්තම පූජක යාච්ඤාව<br>(ජොහන් 17:19-26<br>1 කොරින්ති 1:10-13)<br>3. සභා එකමුතු කිරීම සඳහා ප්‍රයත්නය<br>WCC, වතිකාන ප්‍රකාශන 2, BEM<br>ARCIC 1 සහ 2<br>4. සභා එකමුතු කිරීම සඳහා ශ්‍රී ලාංකේය ප්‍රයත්න | 1 කිතුනු සභා සමගිය පිළිබඳ තොරතුරු ගොනු කරයි.<br>2 කිතුනු සභා එකමුතුව උදෙසා ක්‍රියා කළ යුතු බව පිළිගනියි.<br>3 කිතුනු සභා සමගිය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.<br>4 කිතුනු සභා ඒකත්වය වෙනුවෙන් කටයුතු කරයි.<br>5 සියලු කිතුනු සභාවන්ට ගරු කරයි. | 15 |

**නිපුණතාව 1.0** : ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීම සඳහා එහි පසුබිම භාවිත කරයි.

**නිපුණතා මට්ටම 1.1** : ශුද්ධ බයිබලයේ උත්තරීතර බව හඳුනාගෙන එයට නිසි ගෞරවය දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 15

**ඉගෙනුම් ඵල**

1. ශුද්ධ බයිබලය පිළිබඳ මූලික තොරතුරු ගොනු කරයි.
2. ශුද්ධ බයිබලය දේව වචනය බව විශ්වාස කරයි.
3. ශුද්ධ බයිබලය පිළිබඳ මූලික තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
4. ශුද්ධ බයිබලය ගරුත්වයෙන් භාවිත කළ යුතු බව පිළිගනියි.
5. එකමුතු ව දේව වචනය අධ්‍යයනය කරයි.

**1.1.1 නාම විග්‍රහය**

- "බයිබලය" සඳහා ග්‍රීක වචනය: "බිබ්ලොස්"
- "බිබ්ලොස්" යන වචනය මුලින් ම යෙදුනේ: පැපිරස් පදම්කර සාදන ලද පොත්වලට
- මුල් යුගයේ දී ශුද්ධ ලියවිල්ල ග්‍රන්ථාරූඪ කෙරුණේ: පැපිරස් පදම්කර සාදන ලද හැකුළුම්පත්වල
- එම නිසා ශුද්ධ ලියවිල්ලට බිබ්ලොස් යන නම
- වුල්ගාතාහි (වල්ගේට්හි) "බයිබලය" සඳහා යෙදෙන ලතින් වචනය: "ටා බිබ්ලියා"
  - අර්ථය: "පොත්"
- ලතින් භාෂාව ශුද්ධ වූ සභාවේ නිල භාෂාව වූ පසු ව "ටා බිබ්ලියා" යන්න "බිබ්ලියා" බවට
  - අර්ථය: "පොත් මාතාව"
  - යමකට "මාතාව" යනුවෙන් භාවිත කරන්නේ ගෞරවය සඳහා: උදා:- පාසල් මාතාව
  - ශුද්ධ බයිබලය ද මවක් මෙන් අපට මග පෙන්වන නිසා දේව වචනයට සවන් දී එයට අනුව අපගේ ජීවිත සකස් කර ගැනීම කිතුනු අපගේ යුතුකමක්
- ශුද්ධ බයිබලය කිතුනු අපගේ උතුම් ම පොත
  - හේතුව: එය තුළ දේව වචනය ගැබ් වී ඇති බැවින්
- ශුද්ධ බයිබලය වෙනත් පොතකින් වෙනස් වීමට හේතු
  1. එය තුළ පමණක් අනාවරණය වූ දේව වචනය ගැබ් වී තිබීම
  2. එය පමණක් දේවානුභාවයෙන් ලියවී තිබීම

**1.1.2 ශුද්ධ බයිබලය ලියැවුණු භාෂා**

- පුරාණ ගිවිසුම: හෙබ්‍රෙව් හා අරමයික් භාෂාවලින්
  - බබිලෝනියානු විප්‍රවාසයෙන් පසු ලියැවුණු පොත්: ඇරමයික් භාෂාවෙන්
  - හේතුව: බබිලෝනියානු විප්‍රවාස සමයෙහි ජුදා ජනතාව ඇරමයික් භාෂාවට හුරුවීම
- නව ගිවිසුම: ග්‍රීක භාෂාවෙන්
  - ක්‍රි.පූ. 333 දී ග්‍රීක අධිරාජ්‍යයා වූ මහා ඇලෙක්සැන්ඩර් විසින් පලස්තීනය ආක්‍රමණය කිරීමේ සිට ග්‍රීක භාෂාව වැදගත් වීම
  - පලස්තීනය ක්‍රි.පූ. 63 දී රෝම ප්‍රාන්තයක් වූ වුවත් ග්‍රීක භාෂාව භාවිත වීම නිසා නව ගිවිසුමේ කෘති ග්‍රීක භාෂාවෙන්

**1.1.3 ශුද්ධ බයිබලයෙහි කෘති**

**1.1.3.1 පුරාණ ගිවිසුමෙහි කෘති**

- පුරාණ ගිවිසුමෙහි සම්මත ග්‍රන්ථ නාමාවලිය පිළිබඳ මතභේද
  - ජුදා හා ක්‍රිස්තියානි පිළිගැනීමට අනුව පුරාණ ගිවිසුමෙහි කෘති 39

- ○ කතෝලික පිළිගැනීමට අනුව පුරාණ ගිවිසුමෙහි පොත් 46 ම දේවානුභාවයෙන්
- ○ මෙම වෙනසට හේතුව
  - ➢ ජුදා හා ක්‍රිස්තියානි අය මැසෙරෙටික් පිටපත භාවිතය
  - ➢ කතෝලික අය සෙප්ටුවාජින්ත පිටපත භාවිතය
- ද්විතීය සම්මත ග්‍රන්ථ 7 නිසා පුරාණ ගිවිසුමේ පොත් සංඛ්‍යාව පිළිබඳ මතභේදය
- "ද්විතීය සම්මත ග්‍රන්ථ" යන්නෙහි අර්ථයඃ දෙවනුව සම්මත වූ ග්‍රන්ථ
- ඒවා දෙවනුව සම්මත වූ බව පැවසුව ද ඒවා මැසොරෙටික් පිටපතට පෙර සිට පැවත එන සෙප්ටුවාජින්ත පිටපතෙන්
- නව ගිවිසුමේ කතුවරුන් තම උපුටා ගැනීම් 350න් 300ක් සෙප්ටුවාජින්ත පිටපතෙන් ද ගෙන තිබීමෙන් නව ගිවිසුමේ කතුවරුන් අතර සෙප්ටුවාජින්ත පිටපතෙහි පිළිගැනීම පැහැදිලි
- උපුටා ගැනීම් 300න් 18ක් ද්විතීය සම්මත ග්‍රන්ථවලින්
- ජුදා ආගමිකයන්ට ශුද්ධ බයිබලයඃ පුරාණ ගිවිසුමේ පොත් 39
- කිතුනු අපගේ ශුද්ධ බයිබලයඃ පුරාණ හා නව ගිවිසුම්වලින් යුක්ත වේ
- ජුදා ජාතිකයන් ද්විතීය සම්මත ග්‍රන්ථ තම ශුද්ධ ලියවිල්ලෙන් බැහැර කිරීමට හේතුවක්ඃ ජුදෙව්වන් හා කිතුනුවන් අතර වාදවිවාදවල දී මුල් කිතුනු සභාව ජේසුස් වහන්සේගේ දේවත්වය හා මෙසියස් වහන්සේගේ කාර්යභාරය සනාථ කිරීමට ද්විතීය සම්මත ග්‍රන්ථ භාවිත කිරීම
- එම නිසා වසර 400ක් පමණ ජුදෙව්වන් භාවිත කළ ද්විතීය සම්මත ග්‍රන්ථ සහිත සෙප්ටුවාජින්ත පිටපත පසු ව ඔවුහු ප්‍රතික්ෂේප කිරීම
- උදාඃ- ක්‍රි.ව. 150 දී පමණ ලියැවුණු "ජුදෙව්වන් සමග සංවාදය" නමැති කෘතියෙහි ජුදෙව්වන් ශුද්ධ ලියවිල්ල කපා හැර ඇති බවට ශුද්ධ වූ ජස්ටින් තුමා චෝදනා කිරීම
- කතෝලික සභාව විශ්වාසය පිළිබඳ කරුණක් වශයෙන් පුරාණ ගිවිසුමේ සම්මත පොත් වශයෙන් ග්‍රන්ථ 39ක් වෙනුවට 46 ක් පිළිබඳ ව ප්‍රකාශ ත්‍රිදෙන්තීන ජගත් මන්ත්‍රණ සභාවේ දී කිරීම.
- එය අත්තනෝමතික ප්‍රකාශයක් නොවන්නේ, හිප්පෝ (ක්‍රි.ව. 393) කාතේජ් (ක්‍රි.ව. 397) දී කාතේජ් (ක්‍රි.ව.419) ෆ්ලොරන්ස් (1441) ජගත් මන්ත්‍රණ සභාවල ප්‍රකාශ කරන ලද ඉගැන්වීම නිසා

**1.1.3.2 නව ගිවිසුමෙහි කෘති**

- නව ගිවිසුමෙහි පොත් 27
- ශුභාරංචි 4 (මතෙව්, මාක්, ලූක් හා ජොහන්)
  - ○ ශුභාරංචියක් යනු ජේසුස් වහන්සේගේ ජීවිත කථාව (චරිතාපදානයක්) නොව උන්වහන්සේගේ ජීවිතයේ තෝරාගත් සිද්ධි කිහිපයක් ඇසුරෙන් ලියන ලද දේව ධාර්මික කෘතියක්
- අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත
  - ○ ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වන අවස්ථාවේ අපෝස්තුලුවරුන්ට වදාළ පණිවිඩය (ක්‍රියා 1:8) යථාර්ථයක් වූ ආකාරය අපෝස්තුලුවරුන්ගේ ක්‍රියා පොත ගෙනහැර දැක්වීම
- හසුන් 21
  - ○ 13ක කර්තෘත්වය ශුද්ධ වූ පාවුලු තුමාට (රෝම, 1 කොරින්ති, 2 කොරින්ති, ගලාති, එපීස, පිලිප්පි, කොලොස්සි, 1 තෙසලෝනික, 2 තෙසලෝනික, 1 තිමෝති, 2 තිමෝති, තීතස් හා පිලොමොන්)
  - ○ මේවායේ කර්තෘත්වය ශුද්ධ වූ පාවුලු තුමාට හිමි වුව ද එයින් අදහස් කරන්නේ ඒවා පාවුලු තුමා විසින් ම ලියූ බව නොව ඒවා යම් ආකාරයකට ශුද්ධ වූ පාවුලු තුමාට සම්බන්ධ බව
  - ○ ඉතිරි හසුන් 8 (හෙබ්‍රෙව්, ජාකොබ්, 1 පේදුරු, 2 පේදුරු, 1 ජොහන්, 2 ජොහන්, 3 ජොහන් හා ජාකොබ්)
  - ○ ඒවා හඳුන්වන වෙනත් නම්ඃ සාමාන්‍ය හසුන්, විශ්ව ලේඛන හා කතෝලික (ජගත්) සංදේශ

- ○ හෙබ්‍රෙව් ලිපියෙහි කර්තෘ සඳහන් නොවේ
- ○ ඉතිරි 7හි කර්තෘත්වය හිමි වන්නේ ජේසුස් වහන්සේගේ අපෝස්තුලුවරුන් 4 දෙනෙකුට (පේදුරු තුමා, ජොහන් තුමා, කුඩා ජාකොබ් තුමා හා ජූඩ් තද්දේවුස් තුමා)

- නව ගිවිසුමෙහි අවසාන කෘතියඃ එළිදරව්ව
  - ○ සාම්ප්‍රදායික ව එහි කර්තෘත්වය ජොහන් අපෝස්තුලුතුමාට
  - ○ නව ගිවිසුමේ කෘති 5ක කර්තෘත්වය ජොහන් අපොස්තුලුතුමාට (ජොහන් ශුභාරංචිය, 1 ජොහන්, 2 ජොහන්, 3 ජොහන් හා එළිදරව්ව
  - ○ මෙම කෘති "ජොහනීය දේහය" ලෙස හැඳින්වේ
  - ○ මේවායේ කර්තෘත්වය පිළිබඳ විවිධ විශාරද මත

**1.1.4 ශුද්ධ බයිබලයේ පිටපත්**

**1.1.4.1 සෙප්ටුවාජින්ට් (ග්‍රීක්) පිටපත**

- ඩයස්පෝරාවේ සිටි ජුදෙව් ජාතිකයෝ හෙබ්‍රෙව් භාෂාව නොදැනීම
- ඔවුන් ද දේව වචනය මත තම ජීවිතය ගොඩනගා ගැනීමට අපේක්ෂා කිරීම
- ඒ සඳහා ශුද්ධ ලියවිල්ලේ ග්‍රීක පරිවර්තනයක් අවශ්‍ය වීම
- ග්‍රීක අධිරාජ්‍යයාගේ අනුග්‍රහයෙන් හෙබ්‍රෙව් ශුද්ධ ලියවිල්ල ක්‍රි.පූ. 3වන සියවසේ දී ග්‍රීක භාෂාවට පරිවර්තනය වීම
- පරිවර්තනයට ලක් වූයේ පලස්තීනයේ ජුදෙව්වන් අතර තිබූ සම්මත ග්‍රන්ථාවලිය නොව ඩයස්පෝරාවේ ජුදෙව්වන් අතර පැවති සම්මත ග්‍රන්ථාවලිය
- පලස්තීනයේ පැවති සම්මත ග්‍රන්ථාවලියට වඩා ග්‍රන්ථ 7ක් සෙප්ටුවාජින්ත පිටපතෙහි
- එම ග්‍රන්ථ 7ඃ තෝබිත්, ජුදිත්, ප්‍රඥාව, උපදේශකයා (සිරාක්), බාරුක්, 1 හා 2 මකබි
- එයට අමතර ව  එස්තර් 10:4-16:24 හා දානියෙල් 3:24-90, 13 හා 14 පරිච්ඡේද
- සෙප්ටුවාජින්ත පිටපත ශුද්ධ ලියවිල්ලෙහි හෙබ්‍රෙව් පිටපතට වඩා පැරණි
- හේතුවඃ හෙබ්‍රෙව් ශුද්ධ ලියවිල්ල පලස්තීනයේ ජුදෙව්වන් අතර පැවතුන ද එහි සම්මත ග්‍රන්ථාවලිය තීරණය කළේ ක්‍රි.ව. 90හි මධ්‍යධරණී මුහුද අසල ජම්නියාවේ (ජබ්නේහි) පැවති රබ්බීවරුන්ගේ සම්මන්ත්‍රණයකින් (එසේ වුවත් ක්‍රි.ව. 2-3 ශතවර්ශවල පවා සම්මත ග්‍රන්ථාවලිය පිළිබඳ මත භේද)
- ද්විතීය සම්මත ග්‍රන්ථ සහිත සෙප්ටුවාජින්ත පිටපත මැසොරෙටික් පිටපතට පෙර සිට ම පිළිගැනීමට ලක් ව තිබීම

**1.1.4.2 මැසොරෙටික් (හෙබ්‍රෙව්) පිටපත**

- මුල් හෙබ්‍රෙව් පිටපත ලියවී තිබුණේ ව්‍යංජනාක්ෂරවලින්
- එයට ප්‍රාණාක්ෂර යෙදුවේ ක්‍රි.ව. 6වන ශතවර්ෂයේ මැසොරෙටික්වරුන්
- එම නිසා හෙබ්‍රෙව් පිටපත "මැසොරෙටික් පිටපත" යනුවෙන් හැඳින්වීම

**1.1.4.3 වුල්ගාතා (ලතින්) පිටපත**

- ශුද්ධ බයිබලය ලතින් භාෂාවට පරිවර්තනය කළේඃ ශුද්ධ වූ ජෙරොම් තුමා විසින් අති උතුම් ඩැමසස් ශුද්ධෝත්තම පියතුමා කළ ඉල්ලීමක් අනුව
- ගතවූ කාලයඃ අවුරුදු 24ක් පමණ
- නිම කළ වර්ෂයඃ ක්‍රි.ව. 406
- "වුල්ගාතා" ("වල්ගේට්") යන්නෙහි අර්ථයඃ "පොදු ජනතාවගේ පිටපත"

**1.1.5 දේව අනාවරණය**

- ශුද්ධ බයිබලය හා දේව අනාවරණය අතර ඇත්තේ වෙන් කළ නොහැකි සබඳතාවක්
- ශුද්ධ බයිබලයේ අන්තර්ගත වන්නේඃ දෙවියන් වහන්සේ ගැලවීමේ ඉතිහාසයෙහි කළ අනාවරණ

- "අනාවරණය" සඳහා යෙදෙන ග්‍රීක වචනයඃ "ඇපොකලිප්ස්"
- අර්ථයඃ වැසී ඇති යමක් නිරාවරණය කිරීම, සැඟවී ඇති යමක් එළිදරව් කිරීම
- "දේව අනාවරණය" යනුඃ අභිරහසක් වන විශ්වයේ නිර්මාතෘවරයාණන් වන අදෘෂ්‍යමාන දෙවියන් වහන්සේ මැවිල්ලක් වන මිනිසාට අනාවරණය කිරීම
- දේව අනාවරණය දෙයාකාරය වේඃ
  1. ස්වභාව ධර්මය තුළින්
  2. ස්වභාව ධර්මයේ නීතිය ඉක්මවා විශේෂාකාරයෙන් සිදු කරන අනාවරණය

**1.** ස්වභාව ධර්මය තුළින්
- ○ චිත්‍රයක පරමාර්ථය චිත්‍ර ශිල්පියා ගැන කියා පෑම නොවූවත් චිත්‍රයක් එහි නිර්මාණකරුවා පිළිබඳ ව බොහෝ දේ අනාවරණය කිරීම
- ○ එලෙස ම විශ්වය හා මිනිසා තුළින් ඒවායේ මැවුම්කරුවාණන් පිළිබඳ අනාවරණය කිරීම
- ○ මෙතරම් සංකීර්ණ හා ක්‍රමානුකූල විශ්වයක් ඉබේ ඇතිවිය නොහැකි බව තාර්කික ව සිතන පුද්ගලයෙකුට සුපැහැදිලි
- ○ ඉතා පුංචි දෙයක් පවා ඉබේ ඇති විය නොහැකි නම්, ඉතා සූක්ෂම ක්‍රියාකාරිත්වයක් ඇති මිනිසා ඉබේ ඇතිවිය නොහැකි
- ○ ස්වභාව ධර්මයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ව තාර්කික ව සිතන පුද්ගලයාට එයට නිර්මාණකරුවෙකු සිටිය යුතු බවත් එහි නිර්මාණකරුවා අතිඋත්කෘෂ්ට තැනැත්තෙකු බවත් සුපැහැදිලි (ගීතා 19:1-6)

- දෙවියන් වහන්සේ තෝරාගත් ජනතාවට ස්වභාව ධර්මය තුළින් අනාවරණය වූ සේක. උදාඃ-
  - ○ මන්නා ආහාරයෙන් හා වටුවන්ගෙන් පෝෂණය කිරීම (නික්මයාම 16)
  - ○ පර්වතයෙන් ජලය ලබා දීම (නික්මයාම 17:1-7)

**2.** ස්වභාව ධර්මයේ නීතිය ඉක්මවා විශේෂාකාරයෙන් සිදු කරන අනාවරණය

- දෙවියන් වහන්සේ පිළිබඳ තතු ඇති සැටියෙන් අනාවරණය කරන්නේ ස්වභාව ධර්මය ඉක්මවා සිදු කරන අනාවරණ තුළින් උදාඃ-
  - ○ ආදිපිතෘවරුන්, මෝසෙස් තුමා, වීරනායකයන්, රජවරුන්, දිවැස්වරුන් මගින්
  - ○ විශේෂාකාරයෙන් හා අද්විතීය ආකාරයෙන් තම පුත්‍රයාණන් මගින් (හෙබ්‍රෙව් 1:1-2).
- දේව අනාවරණයෙහි අංශ 2 ඃ

1. ස්ව අනාවරණයඃ තමන් වහන්සේ පිළිබඳ අනාවරණය
2. උන්වහන්සේගේ ගැලවීමේ සැලැස්ම පිළිබඳ අනාවරණය

**1.1.6 දේවානුභාවය**

- දේවානුභාවය සඳහා යෙදෙන ග්‍රීක වචනයඃ "තියෝනෙව්ටෝස්" (2 තිමති 3:16)
  - ○ "තියෝ" යනු දෙවියන් වහන්සේ
  - ○ "නෙව්මා" යනු හුස්ම
  - ○ "තියෝනෙව්ටෝස්" යනු "දෙවියන් වහන්සේ විසින් හුස්ම හෙළන ලද"
- යමකට දෙවියන් වහන්සේ හුස්ම හෙළන්නේ ද එය සම්පූර්ණ වෙනස් වේ (උත්පත්ති 2:7)
- එලෙස ම දේව වචනය ග්‍රන්ථාරූඪ කරන ලද මිනිස් කතුවරුන් මත දේව හුස්ම හෙළමින් ඔවුන්ගේ ක්‍රියාවලිය අද්විතීය කාර්යයක් කිරීම
- ශුද්ධ ලියවිල්ල ලියූ මිනිස් කතුවරුන්ගේ මනස ශුද්ධාත්මයාණන් වහන්සේ ශුද්ධ ලියවිල්ල ලියන අවස්ථාවේ විනිවිද යාම
- ශුද්ධාත්මයාණන් වහන්සේගේ ආනුභාවයෙන් ශුද්ධ ලියවිල්ල ග්‍රන්ථාරූඪ වීම

දේවානුභාවයේ ප්‍රභේද

**1.** එඬේරික දේවානුභාවය

- එඬේරික දේවානුභාවය යනු පුද්ගලයෙකු ක්‍රියා කිරීමට (නායකත්වය දැරීමට) ලබන දේවානුභාවය
- දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ජනනායකයන් මෙම දේවානුභාවය ලැබීම
- ශුද්ධ බයිබලයෙහි සඳහන් වන්නේ: ඔවුන් පිට "දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය" ලැබීමක් ලෙස උදා:- සැම්සන් (වීරා 14:19), දාවිත් (1 සාමු 16:13), මෝසෙස් තුමා (යෙසා 63:11) හා මෙසියස් වහන්සේ (යෙසා 11:2, 61:1, ලූක් 4:18-19)

**2.** දෙසීම සඳහා වූ දේවානුභාවය

- දෙසීම සඳහා දේවානුභාවය යනු දේව පණිවිඩය ප්‍රකාශ කිරීම සඳහා දානය කරන දේවානුභාවයයි.
- මෙම දේවානුභාවය ලැබුවේ: දිවැසිවරු, ජේසුස් වහන්සේ, අපෝස්තුලුවරු (2 පේදුරු 1:21, ලූක් 4:18, 12:11-12)

**3.** ලිවීම සඳහා අණ ලැබීම

- ලිවීම සඳහා ලැබුණේ අණක් (නික් 17:14, ද්වි 5:22, 31:24, යෙසා 30:8, ජෙර 30:2)
- මුළු ශුද්ධ ලියවිල්ල ම දේවානුභාවයෙන් යුක්ත ය (2 තිමෝති 3:16)
- දේවානුභාවයෙන් ලේඛනගත කරන ලද ශුද්ධ ලියවිල්ලේ අරමුණු (2 තිමති 3:16):
    1. ඉගැන්වීමට
    2. දුර්මත දුරුකිරීමට
    3. හික්මවීමට
    4. ධර්මිෂ්ට ජීවිතයක් ගත කිරීමට උපදෙස් දීමට

1.1.7 ශුද්ධ බයිබලයේ කතෘත්වය

- සභා පියවරුන්ගේ සිට ම පිළිගැනීම
    - ශුද්ධ ලියවිල්ල දේවානුභාවයෙන් ලියවුණු බව
    - එහි කර්තෘ දෙවියන් වහන්සේ බව
- අතිඋතුම් 13වන ලියෝ ශුද්ධෝත්තම පියතුමාගේ "දිව්‍ය සංරක්ෂණය" (1893) නම් විශ්ව ලේඛනය අනුව
    - ශුද්ධ බයිබලයේ ප්‍රධාන කතෘවරයාණන් (Principal Cause): දෙවියන් වහන්සේ
    - උප (උපකරණ) කර්තෘ (Instrumental Cause): මිනිසා
- දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලයේ ප්‍රධාන කතෘ නිසා එහි ඇත්තේ දෙවියන් වහන්සේගේ අනාවරණය
- එම අනාවරණය / පණිවිඩය සර්ව කාලීනය; සර්ව භෞමික ය
- එහෙයින් ශුද්ධ බයිබලයේ පණිවිඩයට ස්ථාවර බවක් හා සදාතනික බවක්
- මිනිසා තම නිර්මාණාත්මක ක්‍රියාවලිය තුළින් ශුද්ධ බයිබලයේ උප කර්තෘ වන නිසා ශුද්ධ බයිබලයේ සීමිත පැත්තක් උදා:- ශුද්ධ බයිබලයේ ලියවී ඇති සියල්ල ම ඓතිහාසික හා විද්‍යානුකූල නොවන්නේ මිනිසා සීමා සහිත පුද්ගලයකු වන නිසා.
- දෙවියන් වහන්සේගේ හස්තයේ මිනිසා උපකරණයක් වුව ද මිනිසාත් වෙනත් උපකරණයකුත් අතර වෙනසක්:
    - වෙනත් උපකරණයකට බුද්ධියක් හා නිදහස් කැමැත්තක් නැත
    - මිනිසා බුද්ධිය හා නිදහස් කැමැත්ත මෙහෙයවා නිර්මාණාත්මක ක්‍රියාවලියෙහි නිරත වීම
    - එයට අවශ්‍ය දේව පණිවිඩය දෙවියන් වහන්සේගෙන්

**නිපුණතාව 1.0 :** ශුද්ධ බයිබලය අර්ථකථනය කිරීම සඳහා එහි පසුබිම භාවිත කරයි

**නිපුණතා මට්ටම 1.2 :** භූගෝලීය හා ඓතිහාසික පසුබිම ශුද්ධ බයිබලය අර්ථ කථනය කිරීමට යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20

**ඉගෙනුම් ඵල**

1. ශුද්ධ බයිබලයේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
2. විශ්වාසයෙන් ශුද්ධ බයිබලය අධ්‍යයනය කළ යුතු බව පිළිගනියි.
3. ශුද්ධ බයිබලයේ භූගෝලීය හා ඓතිහාසික පසුබිම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
4. ඉතිහාසය තුළ ක්‍රියාත්මක වූ දෙවියන් වහන්සේ වර්තමානය හා අනාගතය තුළ ද මැදිහත් වන බව විශ්වාස කරයි.
5. අප එකිනෙකාගේ ජීවිත තුළ දේව ක්‍රියාකාරීත්වය අත්දැකීමට අන් අය යොමු කරවයි.

**1.2 පලස්තීනයේ භූගෝලීය පසුබිම**

**1.2.0 හැඳින්වීම**

- තෝරාගත් ජනතාව හා සම්බන්ධ වන දේශය හඳුන්වන නම්: පලස්තීනය, කානාන්, ඉශ්රායෙලය, පොරොන්දු දේශය, ශුද්ධ වූ දේශය
- නැගෙනහිර පර්සියානු බොක්කෙන් ඇරඹී ඉරාකය හරහා මධ්‍යධරණී වෙරළ මායිම්කොට බටහිර නයිල් ගඟ දක්වා විහිදෙන අඩ කවාකාර භූමිය: "සරු අඩ සඳ"
- සරුසාර අඩසඳ තුළ පිහිටි සරු බවින් අඩු හා ඉතා කුඩා ප්‍රදේශයක්: පලස්තීනය
    - දේශගුණය: වියලි
    - වර්ෂාව වසරකට දෙවරක්
- සරු අඩ සඳ තුළ පුරාණ ප්‍රධාන ශිෂ්ටාචාර තුනක්: අසිරියාව, බබිලෝනියාව හා මිසරය
- විවිධ යුගවල දී මෙම අධිරාජ්‍යයන් තුනෙහි ම බලපෑමට පලස්තීනය නතු වීම
- මෙම අධිරාජ්‍යයන් අතර ගමන් කිරීමේ දී මාර්ග දෙකක් :
    i. මුහුදු (වෙළඳ) මාර්ගය: මිසරයේ සිට ගාසා තීරය හරහා මුහුදු තීරය ඔස්සේ ගලීලය සහ දමස්කය පසුකොට මෙසපොතේමියාව දක්වා
    ii. රජ (යුද්ධ) මාර්ගය: සීනයි පාළුකරය හරහා නැගෙනහිර කඳු ඔස්සේ දමස්කය පසුකොට මෙසපොතේමියාව දක්වා
- පලස්තීනයේ පිහිටීම
    - මධ්‍යධරණී මුහුදේ නැගෙනහිර වෙරළේ
    - බටහිර ආසියා වේ
- පුරාණ පලස්තීනයේ මායිම්
    - උතුරෙන් දාන්
    - දකුණෙන් බෙයර්ෂෙබා
- විශාලත්වය
    - දිග සැතපුම් 150ක් පමණ
    - මධ්‍යධරණී මුහුදේ සිට ජොර්දාන් නිම්නය දක්වා පළල: උතුරේ දී සැතපුම් 30ක් පමණ දකුණේ දී සැතපුම් 50ක් පමණ
    - භූමි ප්‍රමාණය වර්ග සැතපුම් 7,000ක් පමණ
- භූවිෂමතාව: ස්වභාවික තීරු 4ක්: වෙරළබඩ තීරුව, බටහිර කඳු, ජොර්දාන් මිටියාවත හා නැගෙනහිර කඳු

2.1.1 වෙරළබඩ තීරුව

මිටියාවත් තුනකින් සමන්විත වීම

i. අක්කෝ මිටියාවත

- කාර්මෙල් කඳු පාමුල සිට උතුරට
- ඉතා සාරවත් හා ජනාකීර්ණ ප්‍රදේශයක්
- එලියා දිවැසිවරයා හා බාල් පූජකයන් පිළිබඳ සිද්ධිය සිදු වූ කාර්මෙල් කඳු ගැටය මෙහි (1 රාජා 18).

ii. ෂාරෝන් මිටියාවත

- ජොප්පාවේ සිට කයිසාරිය දක්වා
- පේදුරු තුමා විවිධ සත්ත්වයන්ගෙන් සමන්විත රුවලක් පිළිබඳ දර්ශනය දුටුවේ ජොප්පාවේ
- ජුදය, සමාරිය හා ඉදුමිය යන ප්‍රදේශවල ආණ්ඩුකාරයා පදිංචි ව සිටියේ කයිසාරියේ
- පාවුලු තුමා ක්‍රි.ව. 58-60 කාලයෙහි කයිසාරියෙහි සිරගත ව

iii. පිලිස්ති මිටියාවත

- ජොප්පාවට දකුණින් පටන් ගෙන දකුණට

2.1.2 බටහිර කඳු

- පලස්තීනයේ කොඳු නාරටිය මෙනි
- මෙම කඳුවැටිය එස්ඩ්‍රාලෝන් තැනිතලාව නිසා දෙකඩ වේ
- මෙම තැනිතලාව හරහා මිසරය හා සිරියාව යා කරන මුහුදු මාර්ගය
- පාරාවෝ නෙකෝ රජතුමා විසින් ජොෂියා රජතුමා ව ක්‍රි.පූ. 609 දී ඝාතනය කරනු ලැබුවේ මෙගිද්දෝ මෙම තැනිතලාවේ
- එස්ඩ්‍රාලෝන් තැනිතලාව හා සම්බන්ධ ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයේ වැදගත් සිදුවීම්
  - නායින් නුවර වැන්දඹුවගේ පුතා උත්ථාන කිරීම (ලූක් 7:11-17)
  - තාබෝර් කන්ද
- බටහිර කඳු කොටස් 4

I ගලීල කඳුකරය

- ගලීල කඳුකරය ප්‍රධාන කොටස් 2: උතුරු හෙවත් ඉහළ ගලීලය හා දකුණු හෙවත් පහළ ගලීලය
- දකුණු ගලීලයේ
  - ජේසුස් වහන්සේ ඇති දැඩි වූ නාසරෙත් (ලූක් 4:16)
  - ජේසුස් වහන්සේගේ පළමු ප්‍රාතිහාර්ය සිදු කරන ලද කානා (ජොහන් 2:11).

ii. සමාරියාවේ මධ්‍යම කඳුකරය

- මෙහි ඇති වැදගත් ස්ථාන
  - බෙතෙල්, ෂිලෝ හා ෂෙකෙම් යන ශුද්ධස්ථාන
  - සමරිතානුවරුන් තමන් සඳහා දේව මාලිගාවක් තනා ගත් ගෙරසීම් කන්ද
  - ආදිපිතෘ ජාකොබ්ගේ පුත් ජොසෙප් ඉෂ්මායෙල්වරුන්ට විකුණුම් දොතාන් (උත් 37:17)
  - සමාරියාව නමැති නගරය

iii. ජුදා කඳුකරය

- නැගෙනහිර ප්‍රදේශය පාළුකරය
- හෙබ්‍රොන් පලස්තීනයෙහි ඇති උස ම නගරය
  - හෙබ්‍රොන් අවට ආබ්‍රහම් තුමා සැහෙන කාලයක් ජීවත් වීම
  - දාවිත් රජතුමා ජුදාහි රජතුමා ලෙස අභිෂේක කිරීම (2 සාමුවෙල් 2:3-4)
- හෙබ්‍රොන් නගරයට උතුරෙන් බෙත්ලෙහෙමෙහි ජේසුස් වහන්සේගේ උපත
- බෙත්ලෙහෙමට උතුරින් ජෙරුසලමෙහි කඳු ගැටයක් මත දේව මාලිගාව
- ජෙරුසලමට නැගෙනහිරින් ඔලිව් කන්ද
- ජෙරුසලම හා ඔලිව් කන්ද අතර කිද්‍රෝන් ඇල (මතෙව් 26:36, ජොහන් 18:1).
- ජෙරුසලමට නිරිතදිගින් ගෙහෙන්නා නිම්නය
- ස්නාවක ජොහන් තුමාගේ උපත සිදු වූයේ ද ජුදා කඳුකරයේ (ලූක් 1:39)
- ජෙරුසලමට නැගෙනහිරින් ලාසරස්, මාර්තා හා මරියාගේ ගම වූ බෙතානිය

iv. නෙගෙබ්

- නෙගෙබ් යන්නෙහි අර්ථය වන්නේ, "වියලි"
- ශුද්ධ බයිබලයෙහි එය යෙදෙන්නේ, "දකුණ" යන අරුතෙන්

**2.1.3 ජොර්දාන් මිටියාවත**

- බටහිර කඳු හා නැගෙනහිර කඳු අතර ගිලා බැස ඇති භූමි තීරයක
- මෙම මිටියාවත හරහා ජොර්දාන් ගඟ ගලා බැසීම
- ජොර්දාන් ගඟෙහි ආරම්භයː ලෙබනන් කඳුවලින්

i. ගලීල මුහුද

- මුහුදු මට්ටමට වඩා අඩි 675ක් පමණ පහළින්
- හදවතක හැඩය
- හඳුන්වන නම්ː
  - කින්නෙරෙත් මුහුද (ජෝෂුවා 12:3, 13:27)
  - ගෙනසෙරෙත් විල (ලූක් 5:1, මතෙව් 14:34)
  - තිබේරියස් මුහුද (විල) (ජොහන් 6:1, 21:1)
- මෙම මුහුදේ හදිසි කුණාටු
- මෙය ජේසුස් වහන්සේගේ දහම් සේවයේ කේන්ද්‍රස්ථානයක්
- ගලීල මුහුද අවට පිහිටි නගර
  - කපර්නාවුම (මාක් 1:21-29, ලූක් 4:31, 7:5, ජොහන් 6:59)
  - බෙත්සයිදාව (ලූක් 9:10, මාක් 6:45)
  - මග්දලාව (ජොහන් 1:44, 12:21, ලූක් 8:2, මාක් 16:9)
  - තිබේරියස්

ii. මළ මුහුද

- මුහුදු මට්ටමින් අඩි 1300ක් පහළින්
- 27%ක ලවන සාන්ද්‍රණයක් ඇති නිසා මසුන් හෝ වෙනත් ජීවීන් නැත
- මළ මුහුද මතුපිට මනුෂ්‍යයකුට වුව ද නොගිලී පාවීමට හැකි
- ජේසුස් වහන්සේ ඇවිද්දේ මළ මුහුද මත නොව ගලීල මුහුද මත
- මළ මුහුදේ වයඹදිග වෙරළේ කුම්රාන් නටබුන්

**2.1.4 ජොර්දානයෙන් එපිට නැගෙනහිර කඳු**

- මෙම කඳු ජොර්දාන් නිම්නය හා සිරියානු කාන්තාරය අතර පිහිටීම
- මෙම කඳුවලින් ආරම්භ වන ගංගාː යාර්මොක්, ජබොක්, අර්නොන් හා සෙරෙද්

**1.2.2 ඉශ්‍රායෙලයේ ඓතිහාසික පසුබිම**

**1.2.2.1 නික්මයාම හා දේශයක් හිමිකර ගැනීම**

- හික්සොස්වරු මිසරය අල්ලා ගැනීමː ක්‍රි.පූ. 1767 දී පමණ
- හික්සොස්වරු යනු සෙමතික් ජනවර්ගයට අයත් ආබ්‍රහම් පරපුරේ නෑදෑයෝ
- හෙබ්‍රෙව්වරුන් ද සෙමතික් ජන වර්ගයට අයත් වූ නිසා ජෝසෙප්ට මිසරයේ දේශාධිපති තනතුර
- හික්සොස් ජාතික පාරාවෝගේ ආරාධනයෙන් ජාකොබ්ගේ පෙළපත මිසරයට ගොස් සමෘද්ධිමත් වීම

- ඉශ්රායෙල් ජාතිකයන් මිසරයේ සිටි කාලයඃ වසර 430ක් පමණ (නික්මයාම 12:40)
- ක්‍රි.පූ. 1559 මිසර ජාතික පළමුවන අහ්මොස් හික්සොවරුන් ව මිසරයෙන් පන්නා දැමීම
- මිසර ජාතික පාරාවෝ රජවරු හික්සොස්වරු ගැන වෛරයක් මෙන් ම බියක් ඇති ව සිටීම (නික් 1:10)
- මේනිසා හික්සොස් පාලනය සිහිපත් කරන සෑම දෙයක් ම මිසර පාරාවෝ රජවරුන් විනාශ කිරීම
- මෙම බිය සහ ගබඩා නගර තැනීමේ දී වහල් ශ්‍රමයේ අවශ්‍යතාවය නිසා දෙවන රම්සේස් (ක්‍රි.පූ. 1290-1224) ඉශ්රායෙල්වරුන් වහල් බවට පත්කිරීම (නික් 1:11-12).
- දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට පොරොන්දු 2
    1. ඔහුගෙන් මහත් ජාතියක් ඇති කිරීම
    2. එම ජාතියට සදහට ම හිමිවන දේශයක් ලබා දීම
    - පළමු පොරොන්දුව ඉටු වී ඇත (නික් 1:7)
- දෙවන පොරොන්දුව ඉටු වීමට නම් ඉශ්රායෙල් ජනයා මිසරයෙන් නික්ම යා යුතු ය
- එයට පසුබිම නිර්මාණය වන ආකාරයඃ නික්මයාම 1
- ඉශ්රායෙල්වරුන් මිසරයෙන් නික්මයාමඃ ක්‍රි.පූ. 1280 දී පමණ
- වසර 40ක් පාළුකරයේ
- පලස්තීනයේ පදිංචි වීමඃ ක්‍රි.පූ. 1250-1225 අතර (බොහෝ විට ක්‍රි.පූ. 1240 දී පමණ)

**1.2.2.2 වීර නායකයන්ගේ යුගය (ක්‍රි.පූ. 1200-1050)**

- අවුරුදු 150ක්
- ආගමික, දේශපාලනික හා සංස්කෘතික අතින් පරිවර්තන යුගයක්
- පලස්තීනයේ පදිංචි වීමෙන් පසු
    - ස්ථාවර කෘෂිකාර්මික රටාවකට ඇතුළත් වීම
    - වතුපිටි හිමිකර ගැනීම
    - තාවකාලික කූඩාරම් වෙනුවට ස්ථිර නිවාස ගොඩනැගීම
    - එවැනි දේ අගය කිරීම හා අලංකාර කිරීම නිසා සංස්කෘතික ප්‍රභවයක්
- පොදු ආණ්ඩු ක්‍රමයක් හෝ ඒකීය පාලනයක් නැත
- එම නිසා නව දේශය තුළ එක්තරා ව්‍යාකූලත්වයක් හා නොසන්සුන්තාවක්
- දේශය තුළ සිටි විවිධ ජාතීන්ගේ ආක්‍රමණවලට නතු වීම
- වීර නායකයන්ගේ වගකීමඃ බාහිර බලවේගයන්ට විරුද්ධ ව සටන් කරමින් ජුදා ජනතාව එක්සත් කරමින් ජාතියක් වශයෙන් ගොඩනැගීම
- මොවුන් එක්තරා ආකාරයකට "අනුහසාත්මක යුද නායකයන්"
- වීර නායකයන් 12 : ඔත්නියෙල් (වීරාවලිය 3:7-11), ඒහුද් (වීරාවලිය 3:12-30), ෂම්හර් (වීරාවලිය 3:31), දෙබෝරා හා බාරාක් (වීරාවලිය 4:1-5/31), ගිඩියොන් (වීරාවලිය 6:11-8/35), තෝලා (වීරාවලිය 10:1), ජායීර් (වීරාවලිය 10:3), ජෙප්තා (වීරාවලිය 11), ඉබ්ෂාන් (වීරාවලිය 12:8), ඒලොන් (වීරාවලිය 12:11), අබ්දෝන් (වීරාවලිය 12:13), සම්සොන් (වීරාවලිය 13:1-16:31)

**1.2.2.3 රජවරුන්ගේ යුගය**

- වීරනායකයන්ගේ පාලනයේ දුර්වලතාඃ
    - පාලනය මුළු දේශය පුරා ම පැතිර නොයාම
    - ජුදා ගෝත්‍ර හැම එකක් ම එක්සේසත් කිරීමට නොහැකිවීම
- මේ නිසා අසල්වැසි ජාතීන් බලවත් වන විට ඉශ්රායෙල්වරුන් ආක්‍රමණවලට නතු වීම
- මේ නිසා රජතුමෙකු යටතේ සියලු ම ගෝත්‍ර එක් ව එකට සංවිධානය වීම දේශපාලනික, ආර්ථික, සාමාජීය ආදී සෑම අංශයකින් ම ඵලදායක බව ඔවුනට අවබෝධ වීම
- එම නායකත්වය යුද්ධ කාලවල දී මෙන් ම සාම කාලවල දී ද අඛණ්ඩ ව මුළු රාජ්‍යයට ම මග පෙන්වීමක් බව ඔවුනට අවබෝධ වීම

- එවැනි තත්ත්වයක් ඉශ්රායෙල් ජාතිය තුළ උදා කරගැනීම සඳහා ස්ථාවර ව පවත්නා රාජකීය නායකත්වයක අවශ්‍යතාව තේරුම් ගැනීම
- අසල්වැසි රාජ්‍යයන්හි රජුගේ පාලනය සාර්ථක ව ක්‍රියාත්මක වන අයුරු ඔවුන් ප්‍රත්‍යක්ෂ කිරීම
- සාමුවෙල්ගෙන් රජතුමෙකු ඉල්ලීමට බලපෑ ප්‍රධාන කරුණු
  1. සාමුවෙල් වයස්ගත ව දුර්වල ව සිටීම
  2. සාමුවෙල්ගේ පුතුන් පියාගේ අඩිපාරේ නොගොස් වස්තු තණ්හාවෙන් අල්ලස් ගැනීම
  3. වීරවරුන්ට අනෙක් රටවල රජවරු මෙන් ජනතාව එක්රැස් කිරීමටත්, ජනතාවට ආරක්ෂාව සැපයීමටත්, දේශය සංවර්ධනය කිරීමටත් නොහැකි වීම (1 සාමුවෙල් 8:1-20)

**1.2.2.3.1 සාවුල් රජතුමා (ක්‍රි.පූ. 1020-1000)**

- බෙන්ජමින් ගෝත්‍රයට අයත් ධනවත් පවුලක ගිබියා නම් ගමේ කිෂ් නමැත්තාගේ පුතා (1 සාමු 10:26)
- පියාගේ නැති වූ කොටළුවන් සොයා ගිය සාවුල්ට සාමුවෙල් හමු වීම (1 සාමු 9:1-27)
- දෙවියන් වහන්සේගේ නියමය අනුව සාමුවෙල් විසින් සාවුල් අභිෂේක කිරීම (1 සාමු 10:1)
- ඔහුගේ වයස අවුරුදු 30 (1 සාමු 13:1)
- මිස්පාහි දී ජනතාවට සාවුල් ව රජතුමා ලෙස සාමුවෙල් විසින් හඳුන්වා දීම (1 සාමු 10:17-27).
- අමොනිවරුන්ගේ රජ වූ නාහාෂ් ව පරාජය කිරීම (1 සාමු 11)
- අති විශාල හමුදාවක් කැටුව පිලිස්තිවරු සාවුල්ගේ රාජ්‍යයට විරුද්ධ ව මික්මාෂ්හි කඳවුරු බැඳ සටනට සූදානම් වීම නිසා සාවුල්ගේ හමුදාව විසිරීම (1 සාමු 13:1-14)
- සාවුල්ගේ පුත් ජොනතන්ගේ උපායශීලී ක්‍රියාවකින් පිලිස්තිවරුන්ගේ සේනාව පරාජය කළත් සාවුල්ගේ මුළු රාජ්‍ය කාලයේ දී ම පිලිස්තිවරුන් හා සටන් කරන්නට සිදු වීම (1 සාමු 14)
- අමෙලෙක්වරුන් ව පරාජය කිරීම (1 සාමු 15/1-9).
- සාවුල්ගේ කායික ලක්ෂණත්, මානසික නොසන්සුන්කමත්, ප්‍රසිද්ධ පාප කර්මත් (1 සාමුවෙල් 13:8-14, 15:10-33), අවිනිශ්චිත ජයග්‍රහණත්, සාසනික ගැටුම් (1 සාමුවෙල් 22:17-18) කැපීපෙනෙයි
- රජ වූ නමුත් ඉතා සරල ගැමි ජීවන රටාවක්
- රජ මාලිගාවක් නැත
- පවුල් ජීවිතය ආදර්ශමත්
- ඉශ්රායෙලයට ස්ථාවර හමුදාවක් දානය කිරීම

**1.2.2.3.2 දාවිත් රජතුමා (ක්‍රි.පූ. 1000-961)**

- දාවිත් රජතුමා රජමාලිගාවට පැමිණි ආකාරය පිළිබඳ සම්ප්‍රදායයන් 2:
  1. වීනා වාදකයකු ලෙස (1 සාමු 16:14-23, 17:1-11, 17:32-53)
  2. යුධ කටයුතුවල නිරත ව සිටි සහෝදරයන්ට ආහාර සපයන්නකු ලෙස (1 සාමු 17:12-30, 17:55-18:2)
- ජනප්‍රිය වූයේ ගොලියත් පරාජය කිරීම නිසා
- බිරිඳ : සාවුල්ගේ දියණිය (මීකල් )
- සාවුල් රජතුමා ඔහු ව මරාදැමීමට උත්සාහ කිරීම නිසා ජුදා පාළුකරයට පලායාම
- සාවුල් රජතුමාගේ පුතා (ජොනතන් ) හා දුව (මීකල්) දාවිත් ව ආරක්ෂා කිරීම
- සාවුල්ගේ මරණයට පෙර අභිෂේක කර සාවුල්ගේ මරණයත් සමග හෙබ්‍රෝන්හි රජ වීම (2 සාමු 2:1-11)
- සාවුල්ගේ හමුදාපති වූ අබ්නේර්ගේ සහාය ඇති ව සාවුල්ගේ පුත් ඊෂ්-බොෂෙත් අවුරුදු 7ක් රජකම් කිරීම (2 සාමු 2:8-11).
- දාවිත් රජුගේ කාලය ආරම්භයේ ද්විත්ව පාලනයක්
- ඊෂ්-බොෂෙත්ගේ මරණයෙන් පසු ව දාවිත් ජුදාහි රජ වීම (2 සාමු 5:1-5)
- ජෙබුසිවරුන්ගේ නගරය වූ ජෙරුසලම තම අගනුවර කරගැනීම
- ගිවිසුම් කරඬුව ජෙරුසලමට ගෙන ඒමෙන් ජෙරුසලම දේශපාලන වශයෙන් පමණක් නොව ආගමික වශයෙන් ද වැදගත් වීම

- දාවිත් රජතුමාගෙන් පසු පියාගෙන් පුතාට රජකම හිමිවීමේ ක්‍රමය දකුණු රාජ්‍යය තුළ ඇරඹීම
- පළමු රජවරුන් දෙදෙනාට ම රජකම දේවානුභාවය කරණ කොට ගෙන
- සලමොන් රජතුමාට එය හිමි වූයේ දාවිත්ගේ පුතා වීම හා රජගෙදර සිදු වූ කුමණ්ත්‍රනයක් නිසා

**1.2.2.3.3 සලමොන් රජතුමා (ක්‍රි.පූ. 961-922)**

- මිසරයේ රජුගේ දියනියක සරණ පාවාගෙන මිසරයේ රජු සමග ගිවිසුමක්
- තීර්හි රජු සමග ද ගිවිසුමක්
- යුප්‍රටීස් ගංගාවේ පටන් පිලිස්තිවරුන්ගේ දේශය හා මිසරය දක්වා වූ ප්‍රදේශයේ ඔහුගේ අණසක
- මුළු දේශය ම එක්සත් කර රාජ්‍යය වඩාත් ස්ථාවර බවට පැමිණ වීම
- කලින් සිටි රජවරුන්ට යුද්ධ කාර්යයෙහි නියැලීමට සිදු වුව ද සලමොන්ගේ රාජ්‍ය සමය සාම කාලයක්
- දේව මන්දිරය සෑදීමට අවුරුදු 7ක් හා රජ මැදුරු සංකීර්ණය සෑදීමට අවුරුදු 13ක් (1 රාජා 5-7).
- ජුදා රාජ පරම්පරාවේ විශිෂ්ට රජෙක්
- ඔහුගේ රාජ්‍ය කාලයේ දී ඉශ්රායෙලයේ ආර්ථික ක්‍රමයේ වෙනස්කම් ඇති වීම
  - එඬේරුන් හා ගොවීන් මෙන් ජීවත් වූ ජනතාව පුළුල් වෙළඳ ව්‍යාපාරයන් කෙරෙහි යොමුවීම
  - නැව් හිමිකර ගනිමින් ජාත්‍යන්තර වෙළඳාමෙහි නිරත වීම (1 රාජා 9:26, 10:22)
  - නාගරීකරණය කරා යාම තුළ විශාල සමාජ අසමානතා බිහිවීම
- දිස්ත්‍රික්ක 12කට බෙදා සෑම දිස්ත්‍රික්කයක් ම පාලනය කිරීමට නිලධාරියකු පත් කර පැරණි ගෝත්‍ර ක්‍රමය වෙනුවට රාජ්‍ය පාලන ක්‍රමයක් ඇති කිරීම
- වියදම් පියවා ගැනීම පිණිස අධික බදු අය කිරීම
- දාවිත්ගේ සමයේ ඇරඹුණු රාජකාරිය ක්‍රමය හෙවත් දිළිඳුන්ගෙන් බලෙන් වැඩ ගැනීම සලමොන්ගේ පාලන සමයේ දී ඉතා දරුණු ප්‍රතිඵත්තියක් වී මිනිසුන්ට ඉතා හිංසාකාරී තත්ත්වයකට පත් වීම
- ක්‍රමක්‍රමයෙන් සලමොන් රජතුමාගේ පාලනය කෙරෙහි ජනතාව තුළ අසහනයක් මතු වීම

**1.2.2.4 උතුරු දකුණු රාජ්‍යය භේදය**

- සලමොන් රජතුමාගේ පාලනය කෙරෙහි ජනතාව කලකිරීමට හේතුː
  1. සලමොන් රජුතුමා විසින් නියෝග කළ බදු බර අධික වීම
  2. ඔහුගේ ගොඩනැගිලි ව්‍යාපාරයේ රාජකාරි සේවාවල යොදවන ලද විශාල පිරිසකගේ පෞද්ගලික නිදහස හා මානව අයිතිවාසිකම් සීමිත වීම
  3. ජෙරුසලමේ පාලන තන්ත්‍රය ජුදා ගෝත්‍රයට ප්‍රමුඛතාව දීම
- සලමොන් රජතුමාගේ මරණයෙන් පසු ජනතාව සලමොන් රජුගේ පුත් රෙහොබෝවම්ගෙන් සහනයක් බලාපොරොත්තු වීම (1 රාජා 12)
- එම සහනය නොලැබීම (1 රාජා 12:10-11)
- එයින් ප්‍රකෝප වූ පීඩිත ජනතාව කැරලි කොලහාල ආරම්භ කිරීම
- මෙම කැරලිකරුවන්ගේ නායකත්වයට ජෙරොබෝවම් පත්වීම
- ප්‍රතිඵලයː උතුරු-දකුණු රාජ්‍යය භේදය (ක්‍රි.පූ. 922)
- දකුණු (ජුදා) රාජ්‍යයට
  - ගෝත්‍ර දෙකක් (ජුදා හා බෙන්ජමින්)
  - අගනුවර ː ජෙරුසලම
- උතුරු රාජ්‍යයට (ඉශ්රායෙලයට)
  - ගෝත්‍ර 10ක්
  - අගනුවර ː ෂෙකෙම්

**1.2.2.5 අසිරියානු විප්‍රවාසය**

- උතුරේ වන්දනා ස්ථාන: බෙතෙල් හා දාන් (1 රාජා 12:29)
- එම වන්දනා ස්ථාන සෑදීමේ පරමාර්ථය: ජනයා ජෙරුසලම් දේව මණ්ඩිරයට යාම වැළැක්වීම (1 රාජා 12:32)
- මෙම සිද්ධස්ථාන දෙකෙහි යාවේ දෙවියන් වහන්සේ නියෝජනය කිරීමට රන් වස්සන් දෙදෙනෙක්
- වස්සා රූපයක්; පිළිමයක්; බාල් දෙවියන්ගේ සංකේතයක්. එම නිසා රූප වන්දනාව හා බහු දේව වන්දනාව නමැති අවදානම
- ජෙරොබෝවම් රජතුමා ලෙවී ගෝත්‍රයෙන් පිටස්තර අය පූජකයන් ලෙස පත් කිරීම
- නමස්කාර දින දර්ශනය  වෙනස් කිරීම (1 රාජා 12:25-33).
- ක්‍රි.පූ. 722 දී අසිරියානු අධිරාජ්‍යය උතුරු රාජ්‍යය ආක්‍රමණය කර ඉශ්රායෙලුන් 27,290ක් අසිරියාවට වහලුන් ලෙස ගෙන යාම
- උතුරු රාජධානියේ හිස් වූ නගරවල විදේශවලින් ගෙනා සිරකරුවන්  පදිංචි කරවීම
- මිථ්‍යාදෘෂ්ටික අසිරියානු පදිංචිකරුවන් හා ඉශ්රායෙලයේ ඉතිරි වූවන් අතර අන්තර් විවාහයන්හි ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රදේශවල මිශ්‍ර සංකර ජනතාවක් ඇති වීම
- එම ජන කොටස ඉශ්රායෙල්වරුන්ගේ දෙවි ස්වාමීන් වහන්සේටත්, තමන්ගේ මුල් නිජ භූමිවලින් ගෙනා දෙවි දේවතාන්ටත් වන්දනාමාන නිසා මෙම මිශ්‍ර ආගම් අදහන්නන් "සමාරිතානුවන්" නමැති නිගරු නාමයෙන් දකුණු රාජ්‍යයේ පවිත්‍ර ජුදා ජාතිකයන් විසින් හැඳින්වීම
- බබිලෝනියාවට ගිය දකුණේ ජනතාව නැවත ආපසු පැමිණිය ද අසිරියාවට ගෙන යන ලද උතුරේ වැසියන් නැවත තම දේශයට නොපැමිණි නිසා උතුරු රාජ්‍යයේ ඉතිහාසය ද මැකී ගිය තරම් වීම

**1.2.2.6 බබිලෝනියානු අධිරාජ්‍යය (ක්‍රි.පූ. 612-538)**

- ක්‍රි.පූ. හත්වන සියවසේ පළමු කාර්තු තුනේ දී බලවත් අධිරාජ්‍යය: අසිරියාව
- අවසාන කාර්තුවේ දී බලවත් අධිරාජ්‍යය: බබිලෝනියාව

ජුදයාවේ අවසාන රජවරු

- ජොෂියා රජතුමා (ක්‍රි.පූ. 639-609)

- දාවිත් හා සලමොන් රජවරුන්ට පසු ජුදා දේශයේ විශිෂ්ටතම රජතුමා
- පාලනය කළ තිස් වසර තුළ  යහපත් දේ කිරීම
- ජාතික හා ආගමික ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම
- මේ සඳහා හුල්දා, නාහුම්, ශෙපනියා, හබකුක් හා ජෙරමියා යන දිවැසිවරුන්ගේ සහාය ලබා ගැනීම
- මෙම ආගමික ප්‍රතිසංස්කරණය ආරම්භ කළේ අසිරියාව සිවිල් යුද්ධ කරනකොට ගෙන ඉතා දුර්වල ව සිටි අවදියක නිසා තම ආගමික ප්‍රතිසංස්කරණය උතුරු රාජ්‍යයේ උතුරු දේශ සීමා දක්වා ම ගෙන යාම
- ජෙරොබෝවම් රජු විසින් උතුරු රාජ්‍යයේ බෙතෙල්හි ගොඩනගන ලද සිද්ධස්ථානය හා වෙනත් සිද්ධස්ථාන ජොෂියා රජු විනාශ කිරීම
- උතුරේ හා දකුණේ දේව වන්දනාව ජෙරුසලම් දේව මාලිගාව කේන්ද්‍රකරගෙන පැවැත්වීම
- මුළු පලස්තීනය ම නැවත වරක් දාවිත්ගේ පෙළපතේ පාලනයට නතු වීම
- ක්‍රි.පූ. 722 දී උතුරු රාජ්‍යය අසිරියාව ආක්‍රමණය කළ අවස්ථාවේ දී ලෙවීවරු ද්වීතීය නීති රැගෙන දකුණු රාජ්‍යයට පලා ගිය අතර නැවත ඒවා ක්‍රි.පූ. 621 දී පමණ ජොෂියා රජ සමයේ දී සොයාගනු ලැබ (2 රාජා 22:8) ජොෂියා රජතුමා ආරම්භ කළ ආගමික හා ජාතික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය කඩිනම් කිරීමට භාවිත කිරීම
- ජොෂියා රජ සමයේ ද්වීතීය නීති මෝසෙස් තුමාගේ දේශනා තුනක රාමුවකට සංවිධානය කර ද්වීතීය නීති සංග්‍රහය පොත තුළ අන්තර් ගත කිරීම

- ජෙහෝයාකිම් රජතුමා (ක්‍රි.පූ. 609-598)

- ක්‍රි.පූ. 605 දී නෙබුකද්නෙශර් ජුදා රාජ්‍යය බබිලෝනියාවට බදු ගෙවන රාජ්‍යයක් බවට පත් කිරීම
- ක්‍රි.පූ. 602 දී මිසරයේ පාරාවෝ-නෙකෝ රජතුමා විසින් පොළොඹ වන ලදුව ජෙහෝයාකිම් බබිලෝනියාවට කප්පම් ගෙවීම අත්හිටුවීම
- එම නිසා ක්‍රි.පූ. 598 දී නෙබුකද්නෙශර් යළිත් ජෙරුසලම වැටලීම
- අභ්‍යන්තර කුමන්ත්‍රණ හා කෝලහාල මැද ජෙහෝයාකිම් රජතුමා මියයාම හෝ මරා දමණු ලැබීම

- ජෙහෝයාකින් රජතුමා (ක්‍රි.පූ. 598-597)

- ජෙහෝයාකිම්ගේ මරණයෙන් පසු රජ වීම
- රජකමට පත්වී තුන් මසකින් බබිලෝනීය හමුදාව ජෙරුසලම ආක්‍රමණය කිරීම
- ක්‍රි.පූ. 597 දී නෙබුකද්නෙශර්ගේ හමුදා ජෙරුසලම් දේව මන්දිරයේ තිබූ රත්රන් හා රජ මැදුරේ වස්තුව පැහැරගෙන රජතුමාත්, එසකියෙල් දිවැසිවරයාත් පාලක පංතිය හා පුහුණු ශ්‍රමිකයන් බොහෝ දෙනෙකු  ඇතුළු 10,000ක් පමණ විප්‍රවාසයට ගෙන යාම

- ශෙදෙකියා රජතුමා (ක්‍රි.පූ. 597-587)

- දාවිත්ගේ පෙළපතෙහි  අවසාන රජතුමා
- මෘදු ගතිගුණ ඇති කරුණාවන්ත රජෙකු වුව ද දුර්වල සහ වැනෙන සුළු පාලකයෙක්
- ජෙරමියා වැනි අවංක උපදේශකයකුට සවන් නොදීම නිසා නෙබුකද්නෙශර් ක්‍රි.පූ. 587 දී ජෙරුසලම නගරය විනාශ කිරීම
- අන්ත දිළිඳු හා අසරණ ජනතාව හැර ශෙදෙකියා රජු ඇතුළු ජුදා ජනතාව වහලුන් මෙන් බබිලෝනියාවට ගෙන යාම
- දේව මාලිගාව විනාශ කිරීම

බබිලෝනියාවේ විසූ ජුදෙව්වරු (ක්‍රි.පූ.597-537)

- අසිරියාව හා බබිලෝනියාව තම යටත් විජිත සම්බන්ධයෙන් කටයුතු කළේ දෙයාකාරයකට
- අසිරියාව උතුරේ ජනතාව විවිධ ප්‍රදේශවල පදිංචි කරවා උතුරේ හිස් වූ නගරවල අසිරියානු අධිරාජ්‍යයේ විවිධ ප්‍රදේශවලින් ගෙනා ජනතාව පදිංචි කරනු ලැබුව ද, බබිලෝනියාව දකුණෙන් විප්‍රවාසයට ගෙනගිය ජනතාව අමිශ්‍ර ව වෙන ම ජනපදවල පදිංචි කළ අතර දකුණේ හිස් වූ නගරවල වෙනත් ජන වර්ග පදිංචි නොකිරීම
- මේ නිසා උතුරේ ජනතාව මෙන් දකුණේ ජනතාව සංකර නොවූ අතර දකුණේ ජනතාව නැවත විප්‍රවාසයෙන් හැරී එනවිට ඔවුන්ගේ නිජ බිම් ඔවුන් සඳහා හිස් ව පැවතීම
- විප්‍රවාස සමයේ දී ජුදෙව්වන් විප්‍රවාසය දෙස බැලුවේ තමන්ට ලැබිය යුතු සුදුසු දඬුවමක් ලෙස
- මෙම දඬුවම මගින් නව අනාගතයකට ජුදා ජනතාව පවිත්‍ර කිරීමක් හා සූදානම් කිරීමක් ලෙස සැලකීම
- විප්‍රගත වූ ජුදා ජාතිය දුක්විදින දාසයයෙක් මෙන් වීම (යෙසායා 42:1-9, 49:1-6, 50:4-11, 52:13-53:12).
- ජුදෙව්වන්ගේ විශ්වාසය රැකගැනීමට ධර්මශාලා (සිනගෝග) ආරම්භ වීම
- බබිලෝනියාවට ගෙනගිය දක්ෂ ශිල්පීන්, වංශාධිපතීන් හා ප්‍රභූන් ඉතා ඉක්මනින් ආර්ථික හා සාමාජීය පහසුකම් හිමිකරගෙන ස්ව උත්සාහයෙන් ඉතා දියුණු තත්ත්වයකට පැමිණීම
- ඉතා දියුණු බැංකු ඔවුන් සතු වීම
- ඉතා දියුණු සරුසාර ගම්බිම් ඔවුන් සතු වීම
- දාස සේවය සඳහා පැමිණි ජුදෙව්වන්ට දැසි දසුන් දහස් ගණනක් සිටීම
- ජුදෙව්වන් රජ මාලිගාවේ උසස් තනතුරු දැරීම
  - උදා:-රාජ්‍යය අයබදු එකතු කිරීම
  - ඇළ පාරවල් සොදිසි කර පාලනය කිරීම

### 1.2.2.7 පර්සියානු යුගය (ක්‍රි.පූ. 539-333)

- ක්‍රි.පූ. 539 දී සයිරස් රජතුමා (ක්‍රි.පූ. 550-530) විසින් බබිලෝනියාව යටත් කර ගැනීම
- බලහත්කාරයෙන් වැඩ ගැනීම සහමුලින් ම නැතිකිරීම
- නිවාස තත්ත්වය වැඩි දියුණු කිරීම
- මහජනතාවගේ ආදරය දිනා ගැනීම
- සෙනගගෙන් පැහැරගෙන තිබූ ශුද්ධ ප්‍රතිමා ඔවුන්ට ආපසු බාර දීම
- ඔවුන්ගේ ආගමික සිද්ධස්ථාන නැවත ගොඩනැගීමට ආධාර කිරීම
- විදේශ රටවල විප්‍රවාස ව සිටියවුන් නැවත ආපසු තමන්ගේ රටවලට යාමට නිදහස දීම
- බබිලෝනියේ ජීවත් වූ ජුදෙව්වන් අදියර තුනක් යටතේ තම මව්බිම කරා පැමිණීම:
    1. 50,000 පමණ සමන්විත වූ පළමු කණ්ඩායම සෙරුබ්බාබෙල්ගේ නායකත්වය යටතේ ක්‍රි.පූ 538 දී බබිලෝනියෙන් පිටත් වී ක්‍රි.පූ. 536 දී පමණ ජෙරුසලමට ළඟා වීම
- දේව මාලිගය සෑදීමට ක්‍රි.පූ. 536 දී අත්තිවාරම දමා ක්‍රි.පූ. 515 දී සාදා අවසන් කිරීම
    2. 12,000 පමණ සමන්විත වූ දෙවන කණ්ඩායම ක්‍රි.පූ. 458 දී එස්රා සමග ජෙරුසලමට පැමිණීම
- එස්රා පූජකයෙක්
- දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවේ නීති වේදියෙක් (එස්රා 7:12)
- ඔහුගේ කාර්යයන්
    - ව්‍යවස්ථාවලිය කියවීමයි (නෙහෙමියා 8)
    - විදේශීය භාර්යාවන් පිටමං කිරීම (එස්රා 10)
    - ගිවිසුම අලුත් කිරීම
    - සබත් නිවාඩුව ක්‍රියාත්මක කිරීම
    3. තෙවන කණ්ඩායම ක්‍රි.පූ. 444 දී නෙහෙමියා යටතේ ජෙරුසලමට පැමිණීම
- නෙහෙමියා ජෙරුසලමට පැමිණීමෙන් පසු
    - ජුදා දේශයේ දේශාධිපතියා (ක්‍රි.පූ. 444-432) ලෙස ක්‍රියා කිරීම (නෙහෙමියා 5:14, 5:18)
    - ජෙරුසලමේ ජනයා දිරිමත් කිරීම
    - ජෙරුසලම් නගරයේ ගරා වැටී තිබූ පවුර නැවත ගොඩනඟා, දොරටු අගුල් සවිකර, නටබුන් වූ වාසස්ථාන ගොඩනැගීම (සිරාක් 49:13)
    - ක්‍රි.පූ. 432 දී පර්සියාවට ආපසු ගිය නෙහෙමියා නැවත ක්‍රි.පූ. 425 දී ජෙරුසලමට පැමිණීම
    - දෙවනවර දේශාධිපතියා ලෙස කටයුතු කළ සමයෙහි (ක්‍රි.පූ. 425-410) දසයෙන් කොටස ලෙවීවරුන්ට ලැබෙන්නට සැලැස්වීම, සබත් දින වෙළඳම අත්හිටුවීම, මිශ්‍ර විවාහ තහනම් කිරීම වැනි සමාජ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම (නෙහෙමියා 13).
- පර්සියානු සමයේ දී
    - දේව මාලිගාවේ වන්දනාව සාමාන්‍ය ලෙස සිදු වීම
    - පාස්කු-නුමුහුන් පූප මංගල්‍යය, පෙන්තකොස්ත මංගල්‍යය සහ කූඩාරම් මංගල්‍යය යන ප්‍රධාන මංගල්‍යයන් තුනත්, පව් කමාව ඉටුකරන මංගල්‍යයත් සිදු කිරීම
    - ජුදා ජනතාව නීතියට විශේෂ ගරුත්වයක් දීම ආරම්භ වීම
    - රට පාලනය: නායක පූජකයා විසින්
    - නායක පූජකවරු දාවිත් රජ සමයේ සිටි ශාදොක් පූජකයාගේ පරම්පරාවේ අය

### 1.2.2.8 ග්‍රීක යුගය (ක්‍රි.පූ. 333-175)

- මහා ඇලෙක්සැන්ඩර් අධිරාජ්‍යයා (ක්‍රි.පූ. 356-323) ක්‍රි.පූ. 333 දී පලස්තීනය ආක්‍රමණය කිරීමේ සිට ක්‍රි.පූ. 63 දී රෝම සේනාධිපතියා වූ පොම්පේගේ ආක්‍රමණය දක්වා කාලය
- ටොලමි රාජපරම්පරාව යටතේ (ක්‍රි.පූ. 301-198) දැඩි නීති රීති හා ආර්ථික අවහිරකම් නොතිබීම
- පර්සියානු යුගයේ මෙන් ම නියමිත බදු ගෙවා ජන ජීවිතය පවත්වා ගැනීමට හැකි වීම
- නායක පූජකයන් විසින් ජනතාවගෙන් බදු එකතුකර නියමිත බදු ප්‍රමාණය ටොලමි රජවරුන්ට ගෙවීම
- නායක පූජකයන් ආධ්‍යාත්මික මෙන් ම ක්‍රමක්‍රමයෙන් දේශපාලන පාලකයන් බවට පත්වීම

- සෙප්තුවාජින්ත පිටපත
- සිව්වන ඇන්ටිඔකස් එපිපානෙස් රජතුමා (ක්‍රි.පූ. 175-153)
    - විවිධ ජාතිකයන් හා විවිධ ආගමිකයන් ජීවත් වූ තම රාජ්‍යයේ සංස්කෘතික ඒකත්වය සඳහා හෙලනිස්තිකරණය හෙවත් ග්‍රීක සංස්කෘතිය හා ඇදහිලි ක්‍රම අන් ජාතීන් කෙරෙහි බලයෙන් පැටවීම
    - දේව මාලිගාවේ ශුද්ධස්ථානයට කඩා වැදී රන් පූජාසනය, පහන් රුක, පිදූ පූප තබන මේසය, පානිය පූජා පුදන බඳුන, කුසලාන, රන් ධූම පාත්‍ර, තිරය, කිරුළ හා රහසිගත නිධානයක් පැහැර ගැනීම
    - ව්‍යවස්ථාව අමතක කිරීමටත්, ග්‍රීක චත්පිළිවෙත්වලට අයිති නොවන දේ නොකිරීමටත්, ශුද්ධස්ථානයේ දවන යාග පූජා, පඬුරු හා පානීය පූජා බැහැර කිරීමටත්, සබත් දවස හා මංගල දවස් කෙලෙසීමටත්, ශුද්ධස්ථානය හා පූජකවරු කෙලෙසීමටත්, දේව පිළිම සඳහා මඩු, කුඩාරම් හා පූජාසන ගොඩනැගීමටත්, සූකරයන් සහ වෙනත් අපවිත්‍ර සතුන් පිදීමටත්, චර්මච්ඡේදන පිළිවෙත නොකිරීමටත් රාජ ආඥාවක් නිකුත් කිරීම
    - මෙම රාජ ආඥාව පිළිනොපදින අයට මරණ දඬුවම නියම කිරීම
    - සමහරු දේව පිළිමවලට පඬුරු පුදා, සබත කෙලෙසා රජුගේ ආගම පිළිගැනීම (1 මකබි 1:41-61)
    - රාජ නියෝගවලට පටහැනි ව තම දිවි පරදුවට තබා තම විශ්වාසයට අනුව බොහෝ දෙනෙක් සාක්ෂි දැරීම (1 මකබි 1:62-64).
    - ක්‍රි.පූ. 167 කිස්ලෙව් මස 15 වැනිදා ජුපිටර් ඔලිම්පස් දෙවියාගේ පිළිරුවක් ජෙරුසලම් දේව මාලිගාවේ පූජාසනයට ඉහළින් පිහිටු වා කිස්ලෙව් මස 25 වැනිදා ජුපිටර් දෙවියාගේ මංගල්‍යය සිදු කිරීම
    - මෙම පීඩනය නිසා ක්‍රි.පූ. 167 දී මකබි කැරැල්ල ආරම්භ වීම
    - කැරැල්ල සාර්ථක වීම
    - අන්‍ය ජාතික වන්දනාවට සම්බන්ධ වූ පූජාසනය ඇතුළු සියලු ම භාණ්ඩ දේව මාලිගාවෙන් ඉවත් කිරීම
    - නව පූජාසනයක් තනා ක්‍රි.පූ. 164 කිස්ලෙව් මස 25වන දින කැපකිරීම (හනුකා මංගල්‍යය)
    - iv ඇන්ටිඔකස් එපිපානෙස් විසින් බලයෙන් ජුදෙව්වන් මත පටවන ලද හෙලනිස්තිකරණය ඉවත් කිරීම

**1.2.2.9 රෝම යුගය**

1.1. • ක්‍රි.පූ. 63 දී පොම්පේගේ රෝම හමුදාව ඉශ්‍රායෙලය අල්ලා ගැනීම
- මකබිවරුන්ගේ කාලයේ ලබාගත් නිදහස නිම වීම
- ලතින් බස රාජ්‍ය භාෂාව වීම
- රෝම නිලධාරිහු ග්‍රීක බස උගත් අය වීම
- සෑම රෝම නිල නිවේදනයක ම ග්‍රීක පරිවර්තනයක් තිබීම

    - මහා හෙරොද් රජතුමා (ක්‍රි.පූ. 37-4)

- ක්‍රි.පූ. 40 දී පර්සියන්වරු පලස්තීනය සහ ජෙරුසලම යටත් කර ගැනීම
- ක්‍රි.පූ. 37 දී රෝම සොල්දාදුවෙක් වූ ඉදුමීය ජාතික හෙරොද් ව ජෙරුසලම යටත් කර ගැනීමට යැවීම
- ක්‍රි.පූ. 37 සිට නැවතත් පලස්තීනය රෝම අධිරාජ්‍යයේ යටත් විජිතයක් වීම
- එහි රුකඩ රජතුමා ලෙස රෝමය විසින් මහ හෙරෝද් පත් කිරීම
- ඔහු ඉදුමීය ජාතිකයෙක්
- ජුදා ආගම වැළඳ ගත්තෙක්
- විවාහ 10ක් කරගත්තෙක්
- කෲර පාලකයෙක්
- දැත ලෙයින් තෙත් වූවෙක්
- තම බිරියන් හා පුත්‍රයන් පවා මරා දැමුවෙක්
- ජේසුස් වහන්සේගේ උපතේ දී කුඩා පිරිමි දරුවන් මරණයට පත් කිරීම (මතෙව් 2:16-17)
- නව නගර තැනීම හා පැරණි නගර ප්‍රතිසංස්කරණය කිරීම

- ජෙරුසලමේ බලකොටුවක් ගොඩනැගීම
- සමාරිය නගරය ප්‍රතිසංස්කරණය කිරීම
- මධ්‍යධරණී මුහුද අසල "සෙසරයා" නමැති නගරය ඉදිකර එහි වරායක් තැනීම
- ජෙරුසලම් දේව මාලිගාව අසල "ඇන්ටෝනියා" යන මාලිගාව තම නිවාසයක් මෙන් පිහිටුවා ගැනීම
- ඔහුගේ විශිෂ්ටතම නිර්මාණයඃ ජෙරුසලම් දේව මාලිගය අලුත්වැඩියා කිරීම
    - ගොඩනැගීම ආරම්භයඃ ක්‍රි.පූ. 19
    - එම ප්‍රතිසංස්කරණයෙහි ප්‍රධාන හා මූලික අදියර වසර නමයකින් නිම කිරීම
    - එතැන් සිට එය හෙරොද්ගේ දේව මාලිගාව ලෙස හැඳින්වීම
    - ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය සම්පූර්ණ කරන ලද්දේ ක්‍රි.ව. 64 දී
    - ජේසුස් වහන්සේ දේව මාලිගය පවිත්‍ර කිරීමේ සිද්ධියඃ ක්‍රි.ව. 28 පාස්කු මංගල්‍යයේ දී
    - එම නිසා දේව මාලිගය ගොඩනැගීමට වසර හතලිස් හයක් ගත වූ බව ජොහන් 2:20හි
- හෙරොද්ගේ ජීවිතය අවසානේ දී  තම රාජධානිය තම පුතුන් තිදෙනුකුට බෙදා දීම

1. ආණ්ඩුකාර ආර්කෙලාවුස් (ක්‍රි.පූ. 4-ක්‍රි.ව. 6)

- මහ හෙරොද් රජුගේ වැඩිමහල් පුතු
- රාජ්‍යයේ අඩක් ඔහුට (ජුදයාව, සමාරියාව හා ඉදුමිය)
- පියා වන මහ හෙරොද් මෙන් දුෂ්ට කෙනෙක් (මතෙව් 2:22)
- ඔහුගේ කෲර ක්‍රියා පිළිබඳ ව ජුදෙව්වෝ රෝම අධිරාජ්‍යයාට පැමිණිලි කිරීම
- අධිරාජ්‍යයා ක්‍රි.ව. 6 දී ඔහු ව  වියන්නාවට පිටුවහල් කිරීම

2. ආණ්ඩුකාර හෙරොද් ඇන්ටිපස් (ක්‍රි.පූ. 4-ක්‍රි.ව. 39)

- ගලීලයේ හා පෙරයාවෙහි යුව රජ
- පියාගේ සියලු ම දුර්ගුණයන් ඔහු තුළ
- මුලින් ම අරාබි කුමරියක් විවාහ කරගැනීම
- පසු ව තම සහෝදරයා වන පළමුවන පිලිප්ගේ බිරිඳ වූ හෙරෝදියස් අනියම් ලෙස විවාහ කරගැනීම
- හෙරෝදියස් විවාහ කර ගැනීම සඳහා අරාබි කුමරිය ව මැරීම
- හෙරෝදියස් ද හෙරොද් ඇන්ටිපස් ලවා ස්නාවක ජොහන් තුමා ව මැරීම
- ක්‍රි.ව. 18-22 කාලයේ දී තිබේරියස් අධිරාජ්‍යයා වෙනුවෙන් තිබේරියස් නම් නුවර ගොඩනැගීම

3. ආණ්ඩුකාර දෙවන හෙරොද් පිලිප් (ක්‍රි.පූ. 4-ක්‍රි.ව. 34)

- ධර්මිෂ්ට හා දයාවන්ත පුද්ගලයෙක්
- පළමුවන හෙරොද් පිලිප් හා හෙරොදියස්ට දාව උපන් සලෝමි විවාහ කර ගැනීම
- අගනුවරඃ බෙත්සයිදාව
- "පිලිප්පි කයිසාරිය" නුවර  තැනවීම (මතෙව් 16:13)
- තම නම එයට ඇතුළත් කළේ, මධ්‍යධරණී මුහුද අසබඩ තිබූ කයිසාරියෙන් වෙන්කර හඳුනා ගැනීමට

    - ආණ්ඩුකාර පොන්තියුස් පිලාත් (ක්‍රි.ව. 26-36)

- ජුදය, සමාරිය හා ඉඳුමිය පළාතෙහි පස්වන ආණ්ඩුකාරයා
- පරිපාලන මධ්‍යස්ථානයඃ කයිසාරිය
- පාස්කු මංගල්‍යයට ජෙරුසලමේ විශාල සෙනගක් රැස්වන බැවින් ඇති විය හැකි කලබලකාරී තත්ත්වයක් වළක්වාලීමට එම වකවානුවේ ඔහු ජෙරුසලමේ හෙරොද්ගේ රජ මාලිගාවෙහි
- ජුදෙව්වරු ක්‍රිස්තුස් වහන්සේ ගෙන ආවේ එතැනට

ආශ්‍රිත ග්‍රන්ථ


1. BROWN, R. E., FITZMYER, J. A. & MURPHY, R. E., **Jerome Biblical Commentory**, St. Peter's Seminary, Bangalore, 1982.

2. https://www.biblicaltraining.org/library/negeb, retrieved on 25th, September 2015.

3. දසනායක, ජූඩ් (පියතුමා), ශුද්ධ බයිබලයේ සමාජ, ආගමික, දේශපාලනික හා භූගෝලීය පසුබිම (දේව අනාවරණය 3), කොළඹ කතෝලික මුද්‍රණාලය. කොළඹ 8, 2011.

4. දසනායක, ජූඩ් (පියතුමා), නික්මයාම තුළ දේව අනාවරණය (දේව අනාවරණය 4), කොළඹ කතෝලික මුද්‍රණාලය. කොළඹ 8, 2015.

5. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 3, 1997.

6. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 2), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 3, 2002.

7. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (නව ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 3, 1995.

**නිපුණතාව 2.0 :** .දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම 2.1 :** දේව ධාර්මික සම්ප්‍රදායයන් තුළින් පංච පුස්තකය අර්ථකථනය කිරීමට යොදා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 15

**ඉගෙනුම් ඵල**

- පංච පුස්තකය තුළ අඩංගු දේව ධාර්මික සම්ප්‍රදායයන් හතර පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දෙවියන් වහන්සේ විවිධාකාරයෙන් අත්දැකිය හැකි බව පිළිගනියි.
- පංච පුස්තකය තුළ අඩංගු දේව ධාර්මික සම්ප්‍රදායයන් හතර පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එදිනෙදා ජීවිතය තුළ දේව නීතිය පිළිපැදීමට යොමු වෙයි.
- ධාර්මික දිවියක් ගත කිරීමට අන් අයට මග පෙන්වයි.

**විෂය කරුණු පැහැදිලි කරදීමට අත්වැලක් :**

## 2.1.1 පංච පුස්තකය පිළිබඳ පොදු හැඳින්වීම

- පංච පුස්තකය යනු ශුද්ධ බයිබලයේ අඩංගු වන පළමු පොත් පහ වේ. එනම්, උත්පත්ති, නික්මයාම, ලෙවී ව්‍යවස්ථාව, ගණන් කථාව සහ ද්විතීය නීති සංග්‍රහය යන ග්‍රන්ථය.

- මෙම පොත් හැඳින්වීම සඳහා හෙබ්‍රෙව් භාෂාවෙන් ''ටෝරා'' යන වචනය භාවිත වේ. එහි අර්ථය, ''ව්‍යවස්ථාව'' නැතහොත් ''ඉගැන්වීම'' යන්නයි.

- පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් ලෙස නීතිය, ව්‍යවස්ථාවලිය, මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව, මෝසෙස් තුමාගේ නීතිය, මෝසෙස් තුමාගේ නීති පොත යනාදිය ගෙනහැර දැක්විය හැකි ය.

- 19වන ශතවර්ෂය දක්වා ම පංච පුස්තකයේ කර්තෘත්වය මෝසෙස් තුමාට ආරූඪ කරන ලදි. ඒ සඳහා ශුද්ධ බයිබලය උපුටා දැක්විය හැකි ය (නික්මයාම 34:27). එහෙත් පංච පුස්තකය මෝසෙස් තුමා හෝ එක් කතුවරයෙකු හෝ විසින් ලියන ලද්දක් නම් එහි එක ම පදමාලාවක්, එක ම ශෛලියක්, එක ම ආකල්ප සමූහයක් තිබිය යුතු ය.

- බයිබලයේ පසුබිම ගැන ගැඹුරු විමර්ශනයක යෙදුණු ලූතරන් නිකායට අයිති ජර්මන් ජාතික එච්. ග්‍රාෆ්, ජූලියස් වෙල්හවුසන්, ද වෙට්ට හා එච්. ක්වෙන් මීට පටහැනි තොරතුරු අනාවරණය කර ගන්නා ලදි.
    1. පංච පුස්තකය රචනා කළේ මෝසෙස් තුමා නම් එතුමාගේ මරණය ගැන පංච පුස්තකයට ඇතුළත් කළේ කවු ද?
    2. මෝසෙස් තුමාට කර්තෘත්වය ආරූඪ නොකරන ලද පොත්වල පවා පංච පුස්තකයේ දක්නට ලැබෙන ශෛලිය දක්නට ලැබෙන්නේ මන් ද? (ජෝෂුවා සිට වීරාවලිය දක්වා පොත්වල ද්විතීය නීති සංග්‍රහයේ ලක්ෂණ ඇත.)

3. එක ම කතුවරයකු පංච පුස්තකය රචනා කළේ නම් පුන පුනා කීම් හා පරස්පර විරෝධී ව්‍යවහාරයන් දක්නට ලැබෙන්නේ මන් ද?

i. මැවීම පිළිබඳ කතා දෙකක් (උත්.1:1-2:4අ, 2:4ආ-25)

ii. දස පනත පිළිබඳ සඳහන්වීම් දෙකක් (නික්. 20:2-17, ද්වි. 5:6-21)

iii. නෝවාගේ නැවට ගත් සතුන් ගණන (උත්. 7:2, 7:8)

iv. එක ම තැනැත්තාට, එක ම ස්ථානයට නම් දෙකක්

- මෝසස් තුමාගේ මාමණ්ඩි : '' රගුවෙල්'', ''ජෙත්‍රෝ''
- දෙවියන් වහන්සේ : ''යාවේ'', ''එලෝහිම්''
- සීනයි කන්ද : සීනයි, හොරෙබ්

- මෙවැනි කරුණු රාශියක් නිසා පංච පුස්තකය එක් කතුවරයෙකුගේ කෘතියක් නොවන බව පැහැදිලි වේ. පංච පුස්තකය රචනා වීම සඳහා දේව ධාර්මික සම්ප්‍රදායයන් හතරක් දායක වී ඇති බව ශුද්ධ බයිබල් විශාරදයන්ගේ පිළිගැනීමයි.

- ඒවා නම් යාවේ (යාවිස්ත) (J), එලොහීම් (එලොහිස්ත) (E), ද්විතීය නීති (D) හා පූජක (P) වේ. පංච පුස්තකය ලියවී ඇති මෙම සම්ප්‍රදායයන් එකවර ඇති වූ ඒවා නොව අවුරුදු සිය ගණනක් තිස්සේ හැඩ ගැසුණු ඒවා ය.

| සම්ප්‍රදාය | | වාචික කාලය | ලිඛිත කාලය |
|---|---|---|---|
| යාවේ | (J) | ක්‍රි.පූ. 950 | 900 |
| එලෝහීම් | (E) | ක්‍රි.පූ. 750 | 722 |
| ද්විතීය නීති | (D) | ක්‍රි.පූ. 700 | 621 |
| පූජක | (P) | ක්‍රි.පූ. 587-400 | 400 |

### 2.1.2 යාවේ (J) සම්ප්‍රදාය

- මෙම සම්ප්‍රදාය දෙවියන්වහන්සේ සඳහා භාවිත කළ නාමය, ''යාවේ'' වේ. උදා: මැවීම පිළිබඳ දෙවන කතාවේ (උත්. 2:4 ආ-25) මැවුම්කාරයාණන් ''යාවේ'' හෙවත් චතුර් ශුද්ධාක්ෂරයෙන් (YHWH) නම් කර ඇති අතර එය සිංහල බයිබලයේ ''සමිඳාණන් වහනසේ'' ලෙස පරිවර්තනය කර ඇත.

- මෙම සම්ප්‍රදායට Y වෙනුවට J භාවිත කර ඇත්තේ ජර්මන් භාෂාවෙන් දෙවියන් වහන්සේගේ නම ලිවීමේ දී J භාවිත කිරීමත්, හෙබ්‍රෙව් භාෂාවේ Y හා J අතර වෙනසක් නොමැති නිසාත් ය.

**භාෂාමය හා සාහිත්‍යමය ලක්ෂණ**

- J සම්ප්‍රදාය කතාන්දර කීමෙහි ඉතා දක්ෂ ය.

- එම කතා ඉතා සරල ය; පැහැදිලි ය; විවිධත්වයකින් හා නාට්‍යමය ලක්ෂණවලින් යුක්ත ය; ස්වාභාවික ය ; ජිවමාන ය ; චිත්ත රූප මවා ගැනීමට ඉඩ සලසයි. උදා: මැවීමේ දෙවන කතාව (උත්. 2:4 ආ-25), මිනිසා පාපයට වැටීම හා දඬුවම් නියම කිරීම (උත්. 3) කායික් හා ආබෙල් (උත් 4), නෝවා (උත් 6-9), බාබෙල් කොත (උත්.11:1-9).

- එම කතාන්දර පාඨක කුතුහලය ඇවිස්සීමට පවා සමත් ය. උදා: ආබ්‍රහම් හමුවීමට පැමිණි අමුත්තෝ (උත් 18:1-15) .

- යාවේ සම්ප්‍රදාය ඉපැරණි නීතිමය හා ආගමික සංකලනයන්ගෙන් යුක්ත ය.

**තේමා සහ ඉදිරිපත් කරන ධර්මය**

- දේව විශ්වාසයට මුල්තැන දීම මෙම සම්ප්‍රදායේ කැපී පෙනෙන ලක්ෂණයකි. උදා: ''ගිල්ගමේෂ්'' නමැති බබිලෝනියානු වීර කාව්‍යය හා නෝවාගේ කතාව අතර සමානකම් පැවතිය ද ''ගිල්ගමේෂ්'' කතාවෙහි ඇති බහුදේවවාදය ඉවත් කර ඒක දේවවාදී රාමුවක් තුළ නෝවාගේ කතා පුවත ඉදිරිපත් කර ඇත.

- මිනිසාගේ කට, හිස, අත් වැනි මිනිස් ශාරීරික අංග දෙවියන් වහන්සේට ආරෝපණය කිරීම, මිනිස් ගුණාංග, ක්‍රියාකාරකම් හා සංවේදන දෙවියන් වහන්සේට ආදේශ කිරීම මානව රූපාකාරයෙන් විස්තර කිරීම ලෙස හඳුන්වනු ලැබේ.

- මෙම ලක්ෂණය මෙම සම්ප්‍රදාය තුළ දක්නට ලැබේ. ඒ අනුව දෙවියන් වහන්සේ මිනිසුන් අතර ''සුපිරි'' මිනිසෙකි.

- ඔවුන් වහන්සේ මිනිසෙකු විස්තර කරන ආකාරයට විස්තර කරමින් මිනිසෙකු ක්‍රියා කරන ආකාරයට ක්‍රියා කරන බව පෙන්නුම් කරයි.

  දෙවියන් වහන්සේ ආදම් හා ඒවට ඇඳුම් සකස් කරදීම (උත්. 3:21)
  දෙවියන් වහන්සේ නෝවාගේ නැවේ දොර වැසීම (උත්. 7:16)
  දෙවියන් වහන්සේ කුඹල්කරුවෙකි. (උත්. 2:7); වැවිලිකරුවෙකි; (උත්. 2:8)
  උයන් පාලකයෙකි. (උත්.2:8-9); ශල්‍ය වෛද්‍යවරයෙකි (උත්. 2:21);

පාපය යනු දෙවියන්වහන්සේ සතු දේ මිනිසා සතු කර ගැනීමට දරන ප්‍රයත්නයකි. උදා: සදාචාරයේ ආධිපත්‍යය හිමි කර ගැනීමට ආදම් හා ඒව ද (උත්. 3:4), ජීවිතයේ ආධිපත්‍ය හිමි කර ගැනීමට කායින් ද (උත්. 4:8), අමරණීයතාව හිමි කර ගැනීමට නෝවාගේ කාලයේ මිනිසුන් ද (උත්. 6:1-5) යත්න දැරී ය.

- එහි ප්‍රතිඵලය වූයේ මිනිසා දුකට, වේදනාවට හා මරණයට පත්වීමයි. උදා: ආදම් හා ඒවට හිමිවූ දඬුවම (උත්. 4:16-19) , කායින්ට හිමි වූ දඬුවම (උත්. 4:10-12), ජලගැල්ම (උත්. 6-9)

- මිනිසා දෙවියන් වහන්සේට විරුද්ධව පව් කළ නිසා ඔහුට දඬුවම් හිමිවුව ද, දෙවියන් වහන්සේ ඔහු අත් නොහරින සේක. උදා: ගැලවුම්කරුවෙකු එවීමට දුන් පොරොන්දුව (උත්.3- 15), දෙවියන් වහන්සේ කායින්ට කරුණාව දැක්වීම (උත්. 4:13-16), නෝවාගේ පවුල හා සතුන්ගේ සෑම නියෝජිතයන් බේරා ගැනීම (උත්. 6:13-22)

### 2.1.3 එලොහීම් (E) සම්ප්‍රදාය

• මෙම සම්ප්‍රදාය දෙවියන් වහන්සේට ''එලෝහීම්'' යන හෙබ්‍රව් වචනය භාවිත කරයි. එමනිසා මෙම සම්ප්‍රදායට මෙම නම ලැබී ඇත.

• මෙම සම්ප්‍රදාය සීනයි ''හොරෙබ්'' නමින් ද, මෝසෙස් තුමාගේ මාමණ්ඩිය ජෙත්රෝ නමින් ද හඳුන්වයි. (නික්. 3:1).

**භාෂාමය හා සාහිත්‍යමය ලක්ෂණ**

• භාෂා ශෛලිය කලාත්මක ය; සරල ය; ඍජු ය; උසස් හෙබ්‍රෙව් ය; J මෙන් විස්තරාත්මක නොවේ.

• මෝසෙස් තුමාගේ ප්‍රාතිහාර්යයන් අතිශයෝක්තියෙන් වර්ණනා කරයි. ඉතිහාසය ක්‍රමානුකූලව හා තර්කානුකූලවත්, ඉදිරිපත් කරයි.

**තේමා හා ඉදිරිපත් කරන ධර්මය**

• මෙහි ඇත්තේ ද යාවේ සම්ප්‍රදාය විසින් ඉදිරිපත් කරන ඉතිහාසයයි. එහෙත් එය යාවේ සම්ප්‍රදායෙන් වෙනස් වන්නේ එය අවධාරණය කරන තේමා හා ධර්මය අනුව යි.

• උතුරු රාජ්‍යයේ තිබූ භයානකම අවධානම වූයේ බාල් වන්දනාව ඒක දේව වන්දනාව සමග බද්ධ කර ගැනීම ය.

• දාන් හා බෙතෙල්වල රන් වස්සන් ස්ථාපිත කර වන්දනා ස්ථාන ගොඩනගා ගත් බැවින් ඒක දේවවාදය ආරක්ෂා කිරීම පළමුවන ජෙරබෝවම් රජුගෙන් සිදු නොවිණි.

• එබැවින් ඒක දේවවාදය ආරක්ෂා කිරීමේ නියමුවාණන් වූයේ රජතුමා නොව දිවැසිවරයා ය. එම නිසා E සම්ප්‍රදාය සඳහා වැඩි වශයෙන් බලපා ඇත්තේ දිවැසිවර සාහිත්‍යයයි.

• ඒක දේවවාදය කරා ජනතාව යොමු කිරීමේ දී දිවැසිවරුන් අවධාරණය කරන්නේ සීනයි ගිවිසුම ය.

• ගිවිසුම් ජීවිතයේ වැදගත්කම නිසා ම මෙම සම්ප්‍රදාය ආරම්භ කරන්නේ දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග කළ ගිවිසුමෙනි, (උත්.15:1-6). එහෙයින් මිනිසා දේව ගරු බිය ඇතිව මිනිසා ගිවිසුමට අනුකූල ව ජීවත් විය යුතු බව අවධාරණය කරයි.

• යාවේ සම්ප්‍රදායට අනුව මෝසස් තුමාගේ කාර්යභාරය වන්නේ ඉශ්රායෙල් ජනතාවට සමීප ව සිටිමින් ඊජිප්තුවේ සිට කානාන් දේශයට යනතුරු එඬේරෙකු ලෙස මගපෙන්වීම ය. එහෙත් එලොහිම් සම්ප්‍රදාය අනුව වඩා වැදගත් වන්නේ රජතුමා නොව දිවැසිවරයා නිසා මෝසෙස් තුමා දිවැසිවරයෙකි. ; ප්‍රාතිහාර්ය පාන දිවැසිවරයෙකි. උදා: මුහුද දෙබෑ කිරීම (නික් . 14:21). මෝසෙස් තුමාගේ කැඳවීම පවා ඉදිරිපත් කර ඇත්තේ දිවැසිවර කැඳවීමක් ලෙසය (නික් 3/1-4:17). එපමණක් නොව ආබ්‍රහම් තුමා පවා දිවැසිවරයෙකි (උත් 20:7). දිවැසිවර කැඳවීම ලබා ඇත්තේ මෝසෙස් තුමා පමණක් නොවේ. ආරොන් (නික්.15:20) හා මිරියම් (ගණන් 12:2-6) ද දිවැසිවරුන් ය.

• යාවේ සම්ප්‍රදාය මානව රූපාකාරය යොදාගෙන ඇති නමුදු එලොහිම් සම්ප්‍රදාය තුළ මානව රූපාකාරයක් නැත. එබැවින් දෙවියන්වහන්සේ මිනිසාට කතා කරනුයේ දර්ශන, සිහින (උත්.20:3, 20:6, 28:12) හා දේව දූතයන් (උත්. 31:11) තුළිනි.

• දෙවියන් වහන්සේ සිටිනුයේ මිනිසාට ඈතින් ය. මිනිසාට උන්වහන්සේට ළංවිය නොහැකි ය. (නික්. 3:5). දෙවියන් වහන්සේගේ මුහුණ දැකීමට කිසිවෙකුට නොහැකි ය. එය දැකීම මරණයට හේතු වේ. (නික්.3:6, 20:19, 33:20).

• මෙමගින් පෙන්නුම් කරන්නේ දෙවියන්වහන්සේගේ මහිමයයි.; ගාම්භීරත්වයයි; මහෝත්මභාවයයි; ශ්‍රේෂ්ඨත්වයයි; උත්කෘෂ්ටභාවයයි; බහු දේවවාදී උත්තර රාජ්‍යයේ වෙනත් දෙවිවරුන්ට වඩා උන්වහන්සේ උසස් ය.

• දෙවියන් වහන්සේට හැර අන් දෙවිවරුන්ට වන්දනා කිරීම ප්‍රතික්ෂේප කරයි. උන්වහන්සේ වෙනත් දෙවිවරු නොඉවසන සේක (නික්. 20:1-6).

• නියම වන්දනාව වන්නේ දෙවියන්වහන්සේට කීකරුවීම හා දෙවියන් වහන්සේ සමග කළ ගිවිසුම අනුව කටයුතු කිරීම ය (නික්. 19-23). අවංක බව, පක්ෂපාතීත්වය, ගැලවීම, පාපය යන කරුණු ගිවිසුම් ධර්මය තුළ අඩංගු ය.

• J හා E ක්‍රි.පූ. 700 දී පමණ එකට එක්වී ඇත. J හා E යන සම්ප්‍රදායයන් දෙකටම පොදු තේමා වන්නේ, දෙවියන්වහන්සේ ජනතාවට දේශයක් ගැන දුන් පොරොන්දුව, මිසරයේ පීඩන ගැන විස්තර, නික්මයාම හා පොරොන්දු දේශය අත්පත් කර ගැනීම යන ඒවා වේ.

• දෙවියන්වහන්සේ එදිනෙදා ජීවිතයේ දී විවිධ මාර්ගවලින් අපට ද කතා කරන සේක. උන්වහන්සේගේ හඬට සවන්දීමට අපි පුරුදු පුහුණු විය යුතු වෙමු.

### 2.1.4 ද්විතීය නීති (D) සම්ප්‍රදාය

• ක්‍රි.පූ. 722 දී උතුරු රාජ්‍යය අසිරියාව ආක්‍රමණය කිරීමත් සමග ම, දකුණු රාජ්‍යයට පලාගිය ලෙවිවරුන්, ඔවුන් සතු වූ ද්විතීය නීති දකුණට රැගෙන පැමිණිය ද ඒවා ජුදහි රජකම් කළ මනස්සේගේ කාලයේ දී (ක්‍රි.පූ. 689-641) යටපත් වී හෝ නැතිවී නැවත හමුවූයේ ක්‍රි.පූ. 621 දී පමණ ජොෂියා රජ සමයේ දී (ක්‍රි.පූ. 639-609) ජෙරුසලම් දේව මන්දිරයේදී ය. (2 රාජා. 22:3-16).

• ජොෂියා රජතුමා මෙම සම්ප්‍රදාය අනුව මනස්සේ යටතේ පරිහානියට පත්වූ ජුදා රාජ්‍යය ජාතික හා ආගමික වශයෙන් ප්‍රතිසංස්කරණය කරන ලදි.

• ජොෂියා රජතුමාගේ කාලයේ දී මෙම සම්ප්‍රදාය මෝසස් තුමාගේ දේශනා තුනක රාමුවකට (ද්වි. 1:6-4:40, 4:44-28:68, 29:1-30:20) සකස් වූ බව විශාරද මතයයි.

**භාෂාමය හා සාහිත්‍යමය ලක්ෂණ**

• මෙම සම්ප්‍රදායේ විශේෂ ලක්ෂණය වන්නේ එය අනුශාසනාත්මක වීම ය.

• මෝසෙස් තුමාගේ දේශනාවලට වැදගත් තැනක් හිමි වේ. උදා: දේශනා 3.

• එක ම දේ නැවත නැවත කීම මෙහි තව විශේෂ ලක්ෂණයකි. උදා: ''ඔබේ ස්වාමීන් වන, දෙවියන්වහන්සේ ,'' ''ඉශ්‍රායෙල් වැසියෙනි, සවන් දෙන්න.'', ''අණපනත් පිළිපදින්න.''

**තේමා හා ඉදිරිපත් කරන ධර්මය**

• ඉශ්රායෙල් ජනතාව ගිවිසුමකින් බැඳී ඇති අතර, ඊට පක්ෂපාතවීමට නම් ඔවුන් නීතිය පිළිපැදිය යුතුය. උදාඃ ද්වි. 11:8-32 දක්වා කොටසේ නීතිය (ව්‍යවස්ථාව) පිළිපැදීම හෝ නොපිළිපැදීම සම්බන්ධයෙන් ඇතිවිය හැකි ඵලවිපාක ඉදිරිපත් කර ඇත.

• ගිවිසුමට පිටුපෑම නැවත වරක් විප්‍රවාස ගතවීමට හේතුවන බව ද්වි. 29:22-28 අවධාරණය කරයි.

• එමෙන් ම මෙම ද්විතීය නීති පද්ධතිය පිළිපැදීමට අපහසු නීති නියෝගවලින් පිරී නොමැත. ඒවා ඉශ්රායෙල් වරුන්ගේ ජීවිතයට ඉතා සමීප ය.

• එම නිසා ඒවා පිළිපැදීමට උනන්දු කර ඇත (ද්වි .30:11-14). එමෙන් ම නීතිය පිළිපැදීම දේව වන්දනාවකි. (ද්වි.28). නීතිය පිළිපැදීම සෑම අවස්ථාවකදීම සිදුවිය යුතු ය. (ද්වි. 6:6-8, 28:15).

• දෙවියන් වහන්සේට වන්දනා කළ හැක්කේ ජෙරුසලමේ දේව මාලිගයේ ය. (ද්වි. 12:5, 12:14, 14:24-25)

• පාස්කු මංගල්‍යය, අස්වැන්න මංගල්‍යය හා කූඩාරම් මංගල්‍යය පවා පැවැත්විය යුත්තේ ජෙරුසලම් දේව මාලිගයේ දී ය. (ද්වි.16:16).

• එම මංගල්‍යයන් පැවැත්වීමේ නවතාවය වන්නේ ජෙරුසලමට යන වන්දනා ගමනක පසුබිමක පවත්වනු ලැබීමයි (ද්වි. 16:1-17).

• මෙලෙසින් එක දෙවි කෙනෙක්, එක දේව මාලිගාවක්, එක රාජ්‍යයක් යන්නට විශේෂ අවධානයක් යොමුකර ඇත.

• අප අපගේ පූජනීය ග්‍රන්ථය වන ශුද්ධ බයිබලයට ගරු කළ යුතු ය. එදිනෙදා ජීවිතය තුළ දේව නීතිය පිළිපැදීමට යොමුවිය යුතු ය.

## 2.1.5 පූජක (P) සම්ප්‍රදාය

• ක්‍රි.පූ. 500 දී පමණ ලියවී ක්‍රි.පූ. 422 දී පමණ "J", "E", "D" සම්ප්‍රදායයන් සමග මිශ්‍ර කරන ලදි. බැබිලෝනියානු විප්‍රවාසය නිසා නව ඉතිහාසගත සිද්ධි හේතුකොට ගෙන ඉශ්රායෙල් ජනතාවගේ විශ්වාසය නව මාදිලියකට ඉදිරිපත් කිරීමට සිදු විය.මේ සඳහා පූජකවරු "P" ලියවිල්ල සම්පාදනය කරන ලදී.

• උත්පත්ති පොතේ මුල් පරිච්ඡේදයෙන් ආරම්භ වී, මෝසෙස්ගේ මරණය දක්වා කොටස මේ සම්ප්‍රදායට ඇතුළත් වේ. (ද්වි. 34: 1-9)

• නික්මයාම පොතේ අවසාන පරිච්ඡේද හය මේ සම්ප්‍රදායට අයත් විශාලම කොටසයි.

• ජන වන්දනා වත්පිළිවෙත්වලට හා පූජක චාරිත්‍ර වාරිත්‍රවලට විශේෂ තැනක් දී ඇත.

**භාෂාමය හා සාහිත්‍යමය ලක්ෂණ**

• යොදා ගන්නා භාෂාව ශිල්පිය හා නීතිමය වන අතර, අටුවාටීකා ලෙස විස්තර කොට ඉදිරිපත් කර ඇත.

• පුනපුනා කීම් බහුල ය. එම නිසා ඒකාකාරිය. උදා. මැවීමේ පළමු කතාව, උදය උදා විය, ඒ..........දවස විය.

**තේමා හා ඉදිරිපත් කරන ධර්මය**

• දෙවියන් වහන්සේ තම සමානකමට මිනිසා මවා උන්වහන්සේට යටත්ව අන් මැවිලි කෙරෙහි අධිපතිකම් කිරීමටත්, මැවීමේ කාර්යයට හවුල්වීමටත් මිනිසාට ආරාධනා කරයි. (උත් 1:27-28)

• .සබත් දිනය දෙවියන් වහන්සේ සම්මුඛ වන දිනයකි; ශුද්ධ වූ දවසකි; ජනවන්දනාවේ යෙදෙන දිනයකි; විවේක ගන්නා දිනයකි.

• .සබත් නීතියට යටත්වීම දෙවියන් වහන්සේ හා මිනිසා අතර සම්බන්ධතාවයේ සළකුණකි (උත්.2:1-4අ, නික්.31:12-17).

• ජනවන්දනාවට පළමු තැන හිමි වේ. මෝසෙස් තුමා එය සංවිධානය කරයි. ආරොන් හා ඔහුගේ පෙළපත එය දිගට ම පවත්වා ගෙන යයි. ඒ සඳහා වන්දනා ගමන්, මංගල්‍යයන් හා දේව මාලිගාවේ වන්දනාව වැදගත් වේ (නික් .25-31).

• දෙවියන් වහන්සේගේ වැඩසිටීම දේව මාලිගාවේ ය. පූජකවරය අත්‍යවශ්‍ය අංගයකි. එමගින් මේ සඳහා අවධාරණය කරන්නේ පූජක නායකත්වයයි. (J: රාජකීය නායකත්වය, E: දිවැසිවර නායකත්වය)

• ආරම්භයේ දී මිනිසා දෙවියන් වහන්සේ හා මුලු විශ්වය සමගත් සාමයෙන් විසී ය. උදා: උත්. 1:29-30 හි මනුෂ්‍යයා හා සත්වයා මාංශවලින් තොර ආහාර ගැනීම මැවිල්ලේ සාමකාමීත්වය පිළිබිඹු කරන සංකේතයකි. මාංශ වැළඳීමට මනුෂ්‍යයාට අවසර ලැබෙන්නේ ජල ගැල්මෙන් පසුව ය. (උත් 9:2-3).

• .මෙමගින් පෙන්නුම් කරන්නේ පාපය නිසා මිනිසා මැවිල්ල සමග පැවති සාමකාමීත්වය පලුදු කරගෙන ඇති බව ය.

• සාමාන්‍ය මිනිසාට දෙවියන් වහන්සේ වෙත ළඟාවිය නොහැකි ය. එහෙත් පූජකයන්ට දෙවියන් වහන්සේ වෙත ළඟාවිය හැකිය. මන්ද සෑම පූජකයෙක් ම දෙවියන් වහන්සේ විසින් තෝරාගත් තැනැත්තෙක් වන බැවිනි.

• ජනතාවට සෘජුව ම දේව සබඳතා පැවැත්විය නොහැකි නිසා පූජකවරු මධ්‍යස්ථකයෝ වෙති (ලෙවී 8-9). කූඩාරමත්, දේවමාලිගයත් දේව බලය ප්‍රකාශ වන ස්ථානයන් ය. ගිවිසුම් කරඬුව තැන්පත් කර තිබුණේ මෙම ස්ථානවල ය.

• ගිවිසුම් කරඬුව ඉශ්රායෙල්වරුන්ගේ අතිශුද්ධත්වයේ සංකේතයක් විය. දෙවියන් වහන්සේ තම අභිමතය ජනතාවට ප්‍රකාශ කරන්නේ එහි වූ කරුණාසනය මත අසුන් ගෙන යන විශ්වාසය ඉශ්රායෙල්වරු අතර පැවතුණි. (නික් 25:10-22)

• ඉශ්රායෙල් ජනතාවගේ මුළු ජීවිතය ම දේව වන්දනාවක් හැටියට නීතිය යටතේ සංවිධානය කරනු ලැබී ය. දෙවියන් වහන්සේට විරුද්ධව පව් කළහොත් චාරිත්‍රමය වන්දි ගෙවීමේ පිළිවෙත් කළ යුතු ය. පක්ෂපාතීවූ විට දේව ආශිර්වාදය ලැබේ.

• දෙවියන් වහන්සේ ලෝකය දින 6කින් මවා 7වන දින නිවාඩු ගත් හෙයින් එදින (සබත් දින) ශුද්ධ ලෙස ගත කිරිම පිළිබඳව අවධාරණය කරයි. දෙවියන් වහන්සේ සඳහා කැපවූ ඉරුදින ශුද්ධ ලෙස ගත කිරීමට අපිත් උත්සාහ කරමු.

### මෝසෙස් තුමා හා පංච පුස්තකය

• පංච පුස්තකය රචනාවීම ආරම්භ වූයේ ක්‍රි.පූ. 10වන ශත වර්ෂයේ පමණ සිට ය. නූතන විශාරද පිළිගැනීම අනුව පංච පුස්තකය ග්‍රන්ථාරූඪ කිරීම අවසන් කරන ලද්දේ ක්‍රි.පූ. 400 දී පමණ ය. එහෙත් මෝසෙස් තුමා ජීවත් වූයේ ක්‍රි.පූ. 13වන ශතවර්ෂයේ දී ය. එසේ වුවත් තව දුරටත් මෝසෙස් තුමා පංච පුස්තකයේ කර්තෘත්වයට යම් ආකාරයකින් සම්බන්ධ බව පිළිගත හැකි ය. එසේ වන්නේ පහත සාධක නිසා ය.

- මෝසෙස් තුමා නික්මයාම සිද්ධියේ දී කාන්තාරයේ දී ජනතාවට නායකත්වය දෙමින් ආරම්භක සිද්ධියේ ප්‍රධාන නියමුවා වීම.
- පංච පුස්තකයේ අඩංගු වන්නේ බොහෝ දුරට එතුමාගේ ඉගැන්වීම් විය හැකිය.
- ඉශ්රායෙල් ජනතාව ඊජිප්තුවේ වහල්කමින් මුදවාගෙන පොරොන්දු දේශය කරා ගෙනගිය නායකයා ලෙස වාචික සම්ප්‍රදායට එතුමා කළ බලපෑම ප්‍රතික්ෂේප කළ නොහැකිය.

එම නිසා පුළුල් අර්ථයකින් මෝසෙස් තුමා පංච පුස්තකයේ කතුවරයා යැයි කිව හැකිය.

### ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය

**පියවර 1**

දේව ධාර්මික සම්ප්‍රදායයන් පංච පුස්තකය අර්ථකථනය කිරීමට යොදාගත් ආකාරය පිළිබඳව පහත මාතෘකා ඔස්සේ කතිකාවක් ගොඩනගන්න.

1. පංච පුස්තකය පිළිබඳ පොදු හැඳින්වීම
2. J, E, D හා P සම්ප්‍රදායයන්

(එක් එක් සම්ප්‍රදාය හැඳින්වීම, පංච පුස්තකය තුළ විකාශනය, භාෂාමය හා සාහිත්‍යමය ලක්ෂණ හා ඉදිරිපත් කරන ධර්මය)

**මූලාශ්‍ර**


1. ඩයස්, ඔස්ටින්, ක්‍රිස්තුධර්මය විභාග අත්වැල, ප්‍රසාන්ත් ප්‍රින්ටර්ස්, වත්තල, 1998.
2. දසනායක, ජේ., දේව අනාවරණය 1, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ 10, 2011.
3. වැලිකඩආරච්චි, ඩී.එස්., දහම් දියඹ, ශු. ජුසේ වාස් දේව ධර්ම නිකේතනය, කොළඹ 08, 2006 - දෙසැම්බර්.
4. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1997.

**නිපුණතාව 2.0** : .දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම 2.2** : ප්‍රාග් ඉතිහාසයේ අඩංගු දේව ධාර්මික ඉගැන්වීම් ජීවිතයට අදාළ කර ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් පල**

- ප්‍රාග් ඉතිහාසය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දුර්පරීක්ෂා ජය ගත යුතු බව පිළිගනියි.
- ප්‍රාග් ඉතිහාසය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- විශ්වයේ ආරම්භය හා එහි ක්‍රමානුකූල පැවැත්ම මගින් හෙළි වන දේව ආදරය අත්දකියි.
- දුර්පරීක්ෂා ජය ගැනීමට අන් අයට මඟ පෙන්වයි.

**විෂය කරුණු පැහැදිලි කරදීමට අත්වැලක් :**

## 2.2.1 ප්‍රාග් ඉතිහාසය පිළිබඳ හැඳින්වීම

- ශුද්ධ බයිබලයේ ප්‍රථම පොත උත්පත්ති වේ. උත්පත්ති පොත් ප්‍රධාන කොටස් 2කි.

    1. ප්‍රාග් ඉතිහාසය (උත්පත්ති 1-11)

    2. ආදිපීතෘ යුගය (උත්පත්ති 12-50)

- උත්පත්ති පොතේ පළමු පරිච්ඡේද 11හි අඩංගු වන්නේ ඓතිහාසික හෝ විද්‍යාත්මක කරුණු නොව දේව ධාර්මික ඉගැන්වීම් සමුදායකි. එම නිසා එහි අඩංගු කරුණු ප්‍රාග් ඓතිහාසික ය, ඒවායේ වැදගත්කම දේව ධාර්මික ය.

- උත්පත්ති 1-11හි අඩංගු කරුණු අධ්‍යයනය කරන විට ඒ තුළින් ඉතිහාසය හා විද්‍යාවට අදාළ තොරතුරු ගවේෂණය කිරීමට උත්සාහ දැරීම නිරර්ථක ක්‍රියාවලියකි. සැබැවින් ම උත්පත්ති පොත ලියවුණු ක්‍රිස්තු පූර්ව යුගයේ මිනිසාට විද්‍යාත්මක සත්‍යතාවක් පැහැදිලි කිරීමට යෑම ද නිෂ්ඵල ය.

- එලෙසම උත්පත්ති පොත ඇතුළු ශුද්ධ බයිබලය රචනා වූ අවධියේ ජීවත් වූ මිනිසා එකල පැවති විද්‍යාව භාවිත කරමින් ශු බයිබල් කතුවරයා දේව ධාර්මික සත්‍යතා පැහැදිලි කිරීමට උත්සාහ දරා ඇත. මන්දයත්, ශුද්ධ බයිබලය යනු විද්‍යාත්මක ග්‍රන්ථයක් නොව ගැඹුරු ආගමික සත්‍යතාවන් ඉතා සරල ව ඉගැන්වීමට රචනා වූවකි. එමගින් විද්‍යාත්මක කරුණු සනාථවීමක් හෝ නිෂ්ප්‍රභාවීමක් සිදු නොවේ.

- විද්‍යාවේ පරමාර්ථය මිනිසාගේ ගැලවීම පිළිබඳ ව ඉගැන්වීම නොවූව ද ධර්මයේ අරමුණ මිනිසාගේ ගැලවීමයි, (2 තිමති 3:15). දෙවියන් වහන්සේ ශුද්ධ බයිබලය තුළින් හැඩගස්වන්නේ හා පුහුණු කරන්නේ කිතුනුවන් මිස ගණිතඥයන් නොවන බව ශුද්ධවූ අගුස්තීනු තුමා පවසයි.

- තව ද විශ්වයේ ආරම්භය විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් රචනා කළා නම් එය එකල මිනිසාට තේරුම් ගත නොහැකි වනවා පමණක් නොව එය අර්ථ විරහිත වනවාට ද සැකයක් නැත.

- ශුද්ධ බයිබලයේ පරමාර්ථය මැවිල්ල සිදුවූ ආකාරය වාර්තා කිරීම නොව මැවිල්ලේ කතෘවරයාණන් දෙවියන් වහන්සේ බව පසක් කිරීම හා මිනිසාගේ සර්ව කාලික ප්‍රශ්න කීපයකට පිළිතුරු දීම ය. ඒ සඳහා බයිබල් කතුවරයා විවිධ උපමාත්මක කතා පුවත් මැනවින් භාවිත කර ඇත.

- විශ්වය හා ලෝකය මැවීම, පාපය වර්ධනය වීම හා පාපය අභිබවා දේව වරප්‍රසාදය ක්‍රියාත්මක වීම පිළිබඳ ව උත්පත්ති 1-11 දී උපමා හා කතාන්දර තුළින් බයිබල් කතුවරයා දේව ධාර්මික සත්‍යතා පැහැදිලි කරීමට උත්සාහ දරා ඇත.

- එම අගනා ප්‍රයත්නය දෙස විද්‍යාව තාක්ෂණය අතින් ඉහළ ගිනි පෙත්තට නැග ඇති වර්තමාන මිනිසා බැලිය යුත්තේ විද්‍යාත්මක ඇසකින් නොව දේව ධාර්මික දෘෂ්ටි කෝණයකිනි.

- එහි දී මිනිසා ලබන උතුම් ම තිළිණය වන්නේ ශුද්ධ බයිබලයේ අඩංගු ගැලවීමේ පණිවිඩයයි. මෙම ශ්‍රේෂ්ට පණිවිඩය ආදි වනවාසී දඩයක්කාරයාගේ සිට ලෝකය අවසාන මිනිසා දක්වා ම එක ලෙස ගැලවීම දායකය.

- ප්‍රාග් ඉතිහාසය තුළ ලෝකය හා මනුෂ්‍යයා මවනු ලැබීම පිළිබඳ ව කතා දෙකක් ඇතː
  1. උත්පත්ති 1ː1-2ː4 අ ː මැවීම පිළිබඳ පළමුවන කතාව
  2. උත්පත්ති 2ː4 ආ-25 ː මැවීම පිළිබඳ දෙවන කතාව

- මනුෂ්‍යයාගේ මැවීම හා එහි ප්‍රතිඵල විදහා දක්වෙන කතා හතරක් ද ඇතː
  1. උත්පත්ති 3ː1-24 ː ආදම් හා ඒව
  2. උත්පත්ති 4ː1-16 ː කායින් හා ආබෙල්
  3. උත්පත්ති 6ː5-9ː17 ː ජලගැල්ම හා නෝවා සමග ගිවිසුම
  4. උත්පත්ති 11ː1-9 ː බාබෙල් කොත අඩංගු වේ.

- පංච පුස්තකය රචනා වීමේ දී එයට යාවේ, එලොහීම්, ද්විතීය නීති හා පූජක යන දේව ධාර්මික සම්ප්‍රදායයන් හතර ම දායක වී ඇති නමුදු ප්‍රාග් ඉතිහාසය සම්ප්‍රාදනය වීමෙහිලා දායක වී ඇත්තේ ඉන් දෙකක් පමණි. එනම්, යාවේ හා පූජක සම්ප්‍රදායයන් දෙක පමණි.

### මැවීම පිළිබඳ පළමුවන කතාව (උත්. 1ː1-2ː4 (අ)

- මෙම කතාව තුළ මැවීමේ ක්‍රියාවලිය පැහැදිලි සැලැස්මකට අනුව ගොඩනගා තිබෙන බව පෙනේ.
  සෑම දවසකට ම පොදු වූ ලක්ෂණ හතරක් ඇත.
  1. දේව ආඥාව උදාː "ආලෝකය වේවා"
  2. දේව ආඥාව ඉෂ්ඨ වීම. "ආලෝකය විය"
  3. දේව මැවිල්ල අගය කිරීම "එය මනහර බව දුටු සේක"
  4. කාලය ගණන් කිරීම. සවස ගත විය. උදය උදාවිය. ඒ ...... දවසයි"

- පූජක සම්ප්‍රදායට අනුකූල ව දෙවියන් වහන්සේ ඇමතීම සඳහා ''එලොහිම්'' යන නාමය යොදා ඇත. මැවුම්කාර දෙවි සමිඳුන්ගේ මහෝත්තම බව සහ සර්වබලධාරීත්වය, කතා පුවත තුළින් ප්‍රබලව ධ්වනිත වේ.

- ''හිස් හා පාළු'' බව ගැන කතා කරමින් ඇරඹෙන මෙම විස්තරය සබත් නිවාඩුවෙන් අවසන් වෙයි. මැවීමේ ක්‍රියාවලියේ මුල් දින තුන තුළ ''අහස හා පොළොව'' ගැන කරුණු දක්වන කතුවරයා ඉතිරි දින තුන තුළ ''අහස හා පොළාව අලංකාර කිරීම '' ගැන විස්තර කරයි.

''හිස් හා පාළු බව''

| **අහස හා පොළොව** | දිනය | දිනය | **අහස හා පොළොව අලංකාර කිරීම** |
|---|---|---|---|
| දවාල හා රාත්‍රිය | 1 | 4 | ඉර, සඳ හා තරු |
| අහස හා ජලය | 2 | 5 | පක්ෂීන් හා මසුන් |
| ගොඩබිම | 3 | 6 | සතුන් හා මිනිසා |

සබත් දින නිවාඩුව

- ''අහස'' යනු ස්වර්ගයයි. ''පොළොව'' යනු විශ්වයයි. එබැවින් ''අහස හා පොළාව'' යනු ස්වර්ගය හා එහි ඇති සියල්ලත්, විශ්වය හා එහි ඇති සියල්ලත් ය.

- මැවීම පිළිබඳ පළමු කතාව අඩංගු මුල් පිටපත තුළ සූර්යයා හා චන්ද්‍රයා නම් කර නැත. ඒ වෙනුවට ඒවා ලොකු ආලෝකය හා කුඩා ආලෝකය යනුවෙන් සඳහන් කර ඇත. මන්ද, මෙම කතා පුවත රචනා වී ඇත්තේ බහුදේවවාදී පරිසරයක, බහු දේවවාදයට විරුද්ධව ය.

- එකල මිසර (ඊජිප්තු) අධිරාජ්‍යයේ හිරු දෙවියා ද, බැබිලෝනියානු අධිරාජ්‍යයේ සඳු දෙවියා ද ඉතා ඉහළින් වන්දනාමාන කරනු ලැබූ අතර ඉර හා සඳ නම් කළහොත් එම දෙවිවරුන්ගේ නම් ශුද්ධ ලියවිල්ලට ඇතුළත් වන නිසා, ඒවා නම් නොකිරීමෙන් එම දෙවිවරුන්ගේ නාම දේව වචනයෙන් බැහැරව තැබීමට තරම් බයිබල් කතුවරයා තීක්ෂණ වී ඇත.

- ලොකු ආලෝකය හා කුඩා ආලෝකය යන අවමානයෙන් යුත් ව්‍යවහාරයක් මගින් අවධාරණය කෙරෙන්නේ, දේවත්වයෙන් පුදනු ලැබූ මේවා සර්වබලධාරී එක ම දෙවියන් වහන්සේගේ මැවිලි පමණක් බවත් ඒවාට කිසිසේත් වන්දනාමාන නොකර ඒවායේ මැවුම්කරුවාණන්ට පමණක් වන්දනාමාන කළ යුතු බවත් ය.

- මැවීමේ ක්‍රියාවලියේ උච්චස්ථානය ''මිනිසා හා ස්ත්‍රිය'' මැවීමයි. ''අපගේ ස්වරූපය අනුව, අපගේ සමානත්වය ලෙස මනුෂ්‍යයා මවමු.'' යන ගෞරවාන්විත බහුවචනය භාෂා රීතියකි. මෙවැනි යෙදුමක් වෙනත් සතුන් හෝ වෘක්ෂලතා මැවීමේ දී භාවිත නොකිරීමෙන් අනෙක් මැවිලි අතර මිනිසාගේ උසස් බව පෙන්නුම් කරයි. තව ද විවිධාකාර සත්ත්ව වර්ග සිටිය ද එක ම මිනිස් වර්ගයක් ගැන පමණක් සඳහන් කෙරේ.

- පුරාණ ගිවිසුම තුළ කිසි ම පිළිමයක් හෝ ප්‍රතිමාවක් දෙවියන් වහන්සේගේ ස්වරූපයට තිබිය නොහැකි ය. මෙලොව දෙවියන් වහන්සේගේ ස්වරූපයට හා සමානකමට ඇති එක ම වස්තුව පුරුෂයා හා ස්ත්‍රීය පමණි. දෙවියන් වහන්සේගේ ''ස්වරූපය හා සමානකම'' දරන මිනිසා මේ ලෝකය තුළ දේව නියෝජිතයෙකි.

- උත්. 1:28 හි මෙසේ සඳහන් වේ. '' දෙවියන් වහන්සේ ඔවුන්ට ආසිරි පතමින්, නුඹලා දරු සම්පත් ලබා වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කර ගන්න. මුහුදේ මසුන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද, පොළොවේ සැරිසරන සියලු සතුන් කෙරෙහි ද බලය පවත්වන්නැයි ඔවුන්ට වදාළ සේක.'' මෙය අතිවිශේෂ ආශිර්වාදයකි. මෙමගින් බැබිලෝනියාවේ විප්‍රවාසගතව විසූ පූජකයින්ගේ විශ්වාසය ප්‍රකාශ වේ. දේව කැමැත්ත අනුව විප්‍රවාසයට හා සියලු අයහපතට අවසානයක් ඇති බව මෙම ආශිර්වාදය තුළින් පැහැදිලි වේ.

- මනුෂ්‍යයා දේව ස්වරූපය අනුව මවනු ලැබීමෙන්, ඔහු යම් ආකාරයක මැවීමේ ක්‍රියාවලියට පංකගුකාරවෙමින්, මැවිල්ල වැඩි වර්ධනය කරමින් සත්ත්ව ලෝකය පාලනය කිරීමට කැඳවනු ලබයි. කෘෂිකාර්මික හා එඬේරික පසුතලයක් තුළ ''පාලනය කිරීම'' (හෙබ්‍රෙව් රාදා) යන ක්‍රියා පදයෙන් ගම්‍ය කරන්නේ ''රැකබලා ගැනීම'', '' මඟපෙන්වීම'', ''සංරක්ෂණය කිරීම'' මිස එය ''යටත් කර ගැනීමක්'', ''බලයට නතුකර ගැනීමක් '' නොවේ එය දේව ආශිර්වාදය සමග පිරිනමන වගකීමකි.

- එම වගකීමේ ස්වභාවය උත්. 1:27 හා 1:28 එකට කියවීමෙන් ද තේරුම්ගත හැකි ය. උත් . 1:27 දී දෙවියන් වහන්සේ '' තමන් වහන්සේගේ ස්වරූපය අනුව මිනිසා මැවූ බව '' දෙවරක් සඳහන් කොට, 28වන වගන්තියේ දී පොළොව යටත් කර ගැනීමටත්, සියලු සතුන්, පක්ෂීන් හා මසුන් කෙරෙහි බලය පවත්වන්නටත් අණදීමෙන් අදහස් කරන්නේ මුළු විශ්වය හා එහි සත්ව ගහණය රැකබලා ගනිමින් සංරක්ෂණය කළ යුතු බව ය. මන්ද මිනිසාගේ කාර්යය විය යුත්තේ දෙවියන් වහන්සේගේ නිර්මාතෘභාවයට හෙවත් මැවීමේ කාර්යයට සහාය දීමය. එබැවින් දේව ස්වරූපයට මවන ලද මිනිසාට උන්වහන්සේ මුළු මැවිල්ල ම වර්ධනය කිරීමට වගකීමක් හා යුතුකමක් පැවරී ඇත.

- මැවිල්ල මත දෙවියන් වහන්සේ සතු වගකීම මිනිසා සමග බෙදා ගැනීම නිර්මාතෘන් වහන්සේගේ නියෝගයෙන් ඉස්මතු කර ඇත. මිනිස් ශ්‍රමයෙන් මැවිල්ලේ ඉදිරියට ගෙනයාම මිස එය දූෂණය කිරීම හෝ විනාශ කිරීම හෝ මිනිසාගේ කාර්යයක් නොවන බව මෙයින් ඉතා පැහැදිලි වේ.

- දේව ස්වරූපය අනුව මවා ඇති මිනිසාට වගකීමක් ද ඇත. එනම්, දේව මැවිල්ල පරිභෝජනය කළ යුත්තේ සංරක්ෂණය හා වැඩි වර්ධනය කරමිනි.

### මැවීම පිළිබඳ දෙවන කතාව (උත්. 2:4ආ - 25)

• නික්මයාම සිද්ධිය මැවීම පිළිබඳ දෙවන කතාවට පසුබිමක් සපයයි. එබැවින් මැවීමේ දෙවන කතාව හා නික්මයාම සිද්ධිය, අතර දැඩි සබඳතාවක් පෙන්නුම් කරයි. නික්මයාමේ දී :

1. සමිඳාණන් වහන්සේ ඉශ්රායෙල් වරුන් කාන්තාරයෙන් ගත් සේක.
2. උන්වහන්සේ ඔවුන් සශ්‍රීක රටකට ගෙනගිය සේක.
3. එම ගමනේ දී උන්වහන්සේ ඔවුන්ට දස පනත දුන් සේක.
4. ඔවුන් එයට අවනත නොවී එම නියමයන් කඩ කළේ ය.
5. එම නිසා ඔවුන්ට දඬුවම් ලැබිණි.

• මෙම රටාව මැවීම පිළිබඳ දෙවන කථාවේ ද දක්නට ලැබේ.

1. ජලය හීන කාන්තාර ප්‍රදේශයක මිනිසා මවනු ලැබුව ද (2:4ආ-5)
2. එම කාන්තාර ප්‍රදේශයෙන් මිනිසා ගෙන් ක්ෂේම භූමියක් වැනි ඒදන් උයන මවා දෙවියන් වහන්සේ මිනිසා එම ඒදන් උයනෙහි පදිංචි කරවූ සේක (2:8-9).
3. එහි ජීවත් විය යුතු ආකාරය පනතකින් ඉදිරිපත් කළ සේක (2:17)
4. මිනිසා එම පනත කඩ කළේ ය (3:6).
5. එම නිසා ඔහුට දඬුවම් හිමි වේ. (3:14-24)

එහෙත් උන්වහන්සේගේ කරුණාව ඉමහත් ය (3:15).

- පුරාණ බටහිර ආසියාවේ මුල්ම කර්මාන්තය කුඹල් කර්මාන්තය විය. මුල් ම කර්මාන්තකරු කුඹල්කරු විය. දෙවි සමිඳාණන් වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මිනිසා මැවීම තුළින් උන්වහන්සේට කුඹල්කරු නමැති මානවරූපි සංකේතය ආරූඪ කර ඇත.

- මිනිසා යන්නට හෙබ්‍රව් වචනය වන්නේ ''ආදම්'' ය. පොළොව සඳහා භාවිත කරන වචනය වන්නේ ''අදමාහ්'' යන්න ය.

- බයිබල් කතුවරයා හෙබ්‍රෙව් පද පෙරළිය තුළින් මිනිසා හා පොළොව අතර විශේෂ සබඳතාවක් පෙන්වීමට මෙමගින් උත්සාහ කර ඇති බව ය. එනම් පොළොවේ දූවිල්ලෙන් සෑදුණු මිනිසා, නැවත දූවිල්ලටම හැරේ. තව ද දූවිල්ල සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ '' ආපාර් '' වේ. මේ වචනයේ අර්ථ දෙකකි.

  1. දූවිල්ල
  2. අළු

- දෙවියන් වහන්සේ මිනිසා මවනු ලබන්නේ ඒදන් උයන තුළ නොව ඉන් පිටත ය. ඉන් පසු ඔහු ඒදන් උයන තුළ පිහිට වූ සේක. (උත්පත්ති 2:8). මෙමගින් පෙන්නුම් කරන්නේ මිනිසාට ලැබිය යුතු ප්‍රමාණයට වඩා දෙවියන් වහන්සේ ඔහුට දී ඇති බව ය. ඒ අනුව මෙම උයන තුළින් මිනිසා ලබූ විශේෂ දේව ආශිර්වාදය ගෙනහැර දක්වයි.

- මෙම උයන තුළ මිනිසාට වගකීම් දෙකක් පැවරේ. එනම්,

  1. එය වගා කිරීමට (අබාද් හෙබ්‍රෙව් වචනය)
  2. එය රැකබලා ගැනීමට (ෂමාර් හෙබ්‍රෙව් වචනය) (උත්. 2:15)

- දෙවියන් වහන්සේ ගස් හට ගන්වන ලද්දේ මිනිසාගේ ආහාරය පිණිසය. එහෙත් මෙම ගස් අතර ආහාරය සඳහා නොවන අති විශේෂ ශාක දෙකක් විය. එනම්,

  1. ජීවන වෘක්ෂය
  2. හොඳ නරක අවබෝධ කර ගැනීමේ වෘක්ෂය (උත්. 2:9)

- ජීවන වෘක්ෂය බයිබලයට අනුගත වූවක් නොවේ. එය අමරණීයත්වය හඟවන මැද පෙරදිග (බැබිලෝනියානු) සංකේතයකි (එළි. 22:2, 14).

- එහෙත් හොඳ නරක අවබෝධ කිරීමේ වෘක්ෂය බයිබලයට අනුගත වූවකි.

- හොඳ නරක ගස යනු නිදහස මැවීමය.''හොඳ නරක'' දැන ගැනීම යන්නෙන් අදහස් කරන්නේ දැන ගැනීමේ පූර්ණත්වය හෙවත් සදාචාරයේ ආධිපත්‍යයයි. සදාචාරයේ ආධිපත්‍යය දෙවියන් වහන්සේ සතු දෙයකි. මිනිසා කැඳවා ඇත්තේ එහි පංගුකාරත්වය ලැබීමට පමණි.

- සදාචාරයේ පංගුකාරත්වය ලබා ගැනීමට කැඳවා ඇති මිනිසා, තමාට ලබා ගැනීමට නොහැකි අධිපත්‍යයක් ලබා ගැනීම උත්සාහ කරන්නේ නම් එය ව්‍යයර්ථ වනවා පමණක් නොව එය දේව සැලැස්මට පිටුපෑමකි.

- එබැවින් හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගසෙන් අනුභව කිරීම යන්නෙන් අදහස් කරන්නේ මැවිල්ලක් වූ මනුෂ්‍යයා මැවුම්කාර දෙවියන් වහන්සේගේ අයිතියක් තමන් වෙත පවරා ගැනීමට දරන ප්‍රයත්නයකි.

- මෙම අදහස සර්පයා උත්. 3:5 හි ස්ත්‍රියට පවසන වචනවලින් ද සනාථ කෙරේ. කෙසේ වෙතත් හොඳ නරක දැන ගැනීම පාපයක් නොවේ. එය වැඩිහිටි වියට පා තැබූ අයෙකුට අවශ්‍ය දෙයකි, එහෙත් උත්පත්ති තෙවන පරිච්ඡේදයේ දී මිනිසා තමාට ලබා ගත නොහැකි දැන ගැනීමේ පූර්ණත්වය ලබා ගැනීමට දරන නිරර්ථක ප්‍රයත්නයත්, එහි ප්‍රතිවිපාකත් බයිබල් කතුවරයා මැනවින් පැහැදිලි කරයි.

- මිනිසා මිනිසකු වන්නේ ඔහුට තීරණය කිරීමේ හෝ තෝරා ගැනීමේ හැකියාව හා අයිතිය ඇති විට පමණි. මෙම හැකියාව හා අයිතිය හෙවත් නිදහස් කැමැත්ත සතුන්ට හෝ වහලුන්ට නොමැත. සතුන් ක්‍රියා කරන්නේ ඔවුන් සහජයෙන්ම හිමිකර ගත්තා වූ ඉව මත ය. එහෙත් දෙවියන් වහන්සේ මිනිසා මවනු ලබන්නේ නිදහස් කැමැත්ත ඇති ව ය, (උත්. 2:16-17). එබැවින් මිනිසා තමා කරන සෑම ක්‍රියාවකටම වගකිව යුතුය.

- මනාලියගේ පියා මනාලයා වෙත මනාලිය කැඳවාගෙන යාම පැරණි සිරිතකි. අද ද මනාලිය දේවස්ථානයට කැඳවාගෙන යනු ලබන්නේ මනාලියගේ පියා විසිනි. එලෙස ම, දෙවියන් වහන්සේ ඒව ආදම් වෙත කැඳවා ගෙන යන සේක. එය දේව ප්‍රේමයේ සළකුණකි. ඒව ආදම්ට දේව තිළිණයකි.

- පුරුෂයා හා ස්ත්‍රිය අතර සබඳතාව දෙවිඳුන් අරමුණු කළ සහජීවනයකි. මෙය පුරුෂයා හා ස්ත්‍රිය සඳහා හෙබ්‍රෙව් බසින් යෙදෙන පද පෙරළිය තුළින් ද මනා ලෙස විදහා දක්වයි. එනම්, පුරුෂයා සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය ''ඉෂ්'' වන අතර ස්ත්‍රිය සඳහා භාවිත කරන්නේ '' ඉෂ්ෂාහ්'' යන්න ය. මෙම සබැඳියාව දෙමාපියන් හා දරුවන් අතර ඇති සම්බන්ධතාව පවා ඉක්මවා යන්නකි.

- ආදම් මෘගයන්ට නම් තබයි, (උත්පත්ති 2:19). එය මිනිසාට සතුන් කෙරෙහි ඇති ආධිපත්‍යයේ සළකුණකි. මිනිසාට මෘගයන් මත පාලන බලය හිමි වේ. එහෙත් ඔහු ස්ත්‍රියට නාමයක් නොතබයි. ස්ත්‍රිය නම් කිරීමට කර්මකාරකයෙන් යොදා ඇත. ''ඇට ස්ත්‍රී කියා කියනු ඇත'' (උත්. 2:23). ස්ත්‍රිය හා පුරුෂයා සම තත්ත්වයකට උරුමකම් කියන බව මෙමගින් පෙන්නුම් කරයි.

### 2.2.4 මිනිසා පාපයට වැටීම (උත්පත්ති 3:1-24)

- මිනිසා පාපයට වැටීමේ කතා පුවත රචනා කර ඇත්තේ යාවේ සම්ප්‍රදාය විසිනි. එය ක්‍රි.පූ. දසවන ශත වර්ෂයක දී පමණ බිහිවූවකි.

- එකල කානානිවරු සර්ප වන්දනාවේ යෙදුණු අතර සර්පයාගෙන් සංකේතවත් කළේ සශ්‍රීකත්වයයි. එම සශ්‍රීකත්වයේ වත්පිළිවෙත්වල බාල් දෙවියන්ට විශේෂ තැනක් හිමි විය. ඔහුගේ ජීවන චක්‍රය ස්වභාව ධර්මයේ ඍතු අනුව සිදුවේ.

- එනම් වසන්ත සෘතුවේ උපත ලබන බාල් දෙවියන්, ශීත සෘතුවේ දී මරණයට පත්වේ. නැවත වරක් ඔහු උපත ලබන්නේ වසන්තයේ ය. ඒ සඳහා එම සෘතුවේ දී ලිංගික පිළිවෙත් බහුල ලෙස භාවිත කරමින් සශ්‍රීකත්වය ප්‍රාර්ථනා කළේ ය. ඒවා පොළොවට ද සශ්‍රීකත්වය දානය කරයි. මෙම ලිංගික පිළිවෙත නියෝජනය කරන්නේ දෙව් දූවක වන අෂේරා ය.

- අෂේරා යන්නෙහි අර්ථය සර්පයා යන්නයි. ඇය බාල් දෙවියන්ගේ බිරිඳ වූවා ය. ඇයගේ ප්‍රතිමා අඹා ඇත්තේ එක් අතක සර්පයෙක් ද, අනික් අතේ මල් ද ඇති ව නිරුවතින් සිංහයෙක් පිට නැගී එන විලාශයෙනි. දේවාලවල වෛශ්‍යාකර්මය ගැන ද මෙම දෙවඟන අදාළ කරගෙන ඇත. මෙම ලිංගික පිළිවෙත ඉශ්රායෙල්වරුන්ට විශාල පරීක්ෂාවක් මෙන් ම ඔවුන්ගේ ඇදහිල්ලට ද ප්‍රබල තර්ජනයක් විය. තව ද අෂේරා දෙවඟනට නමස්කාර කිරීමේ දී , කාමුක චාරිත්‍ර පැවැත්වීම නිසා ඇතැම් කාලවල දී මෙම පිළිවෙත් ඉශ්රායෙවරුන් අතර ඉතා ජනප්‍රිය විය. (2 රාජා.23:4). මේ නිසා මෙම සශ්‍රීකත්වයේ පිළිවෙත් ඇතුළු බාල් දෙවියන්ට හා අෂේරා දේවතාවියට දක්වන ලද වන්දනාමාන ගිවිසුම් ජීවිතයට, ඒක දේව වන්දනාවට හා පවුල් ජීවිතයට විශාල දුර්පරීක්ෂාවක් විය. එබැවින් මිනිස් සමාජයේ මුල් ම ඒකකය වන පවුල වාසනාවන්ත තත්ත්වයකට පත්වීමට සිටි නමුත් යක්ෂයාගේ කූට උපායන්ට රැවටුණු මනුෂ්‍යයා දේව නියමයට පිටුපා ගිය බව පෙන්නුම් කරන්නේ ඒවා පරීක්ෂා කිරීමට පැමිණි යක්ෂයාට සර්ප ස්වරූපයක් ආරූඪ කිරීමෙනි. මෙලෙස කානානිවරුන්ගේ වන්දනාවට පාත්‍ර වූ සර්පයා දෙවියකු නොව සාතන් ම බව ජනතාවට ඒත්තු ගන්වයි. එපමණක් වන, දේව ජනතාව වන ඉශ්රායෙල් සෙනඟ කානානීය යක්ෂයා පලවා හැර එක ම දෙවියන් වහන්සේ පමණක් ඇදහිය යුතු බව ද මෙම කතාන්දරය අවධාරණය කරයි.

- තවත් අතකින් බලන කළ. සර්පයා රුචියේ සංකේතයකි. යථාර්ථය තේරුම් ගත නොහැකිවීම රුචියේ ප්‍රධාන ලක්ෂණයකි. මෙය සර්පයා ස්ත්‍රියට පවසන පළමු වචන මාලාවෙන් පැහැදිලි වේ. ''එය සැබෑ නොවේ, ඔබ මැරෙන්නේ නැත. ඔබ ඒ ගසේ ගෙඩි කන දවසේ දී ඔබේ ඇස් පෑදී, දෙවියන් හා සමාන වී, ඔබත් හොඳ නරක අවබෝධ කරගන්න බව දෙවියන් වහන්සේ දන්න නිසා එසේ වදාළ සේක.'' (උත්පත්ති 3:4-5).

- සර්පයා හෙවත් රුචිය කතා කරන විට ස්ත්‍රියගේ රුචිය ටිකෙන් ටික වැඩි වේ. උදාහරණ : '' ස්ත්‍රිය ද ගස පෙනුමට කෙතරම් රමණීය ද පල කෙතරම් ප්‍රණීත ද නුවණ වැඩුමට කෙතරම් කදිම ද කියා දුටු විට.....'' (උත්පත්ති 3:6).

- රුචිය වර්ධනය වන විට හොඳ නරක වෙන් කර හඳුනා ගැනීමට නොහැකි වේ. හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගසෙහි විශේෂත්වය ටිකින් ටික අඩු වේ. අවසානයේ දී උයනෙහි වූ අනික් ගස් මෙන් ම මෙම හොඳ නරක අවබෝධ කර ගැනීමේ ගස අතර වෙනසක් නොදකී. එය මිහිරි පල ඇති, ප්‍රඥාව ලබා දෙන, සිත් ඇද ගන්නා සුලු, කෑමට සුදුසු ගසක් ලෙස ග්‍රහණය කර ගනියි.

- මේ අනුව සර්පයා තුළින් බයිබල් කතුවරයා එක්තරා ආකාරයකට මිනිසා තුළ ඇති වන රුචියේ අසීමිත හඬ ශබ්දය හෙවත් රුචියේ දෝංකාරය ඉදිරිපත් කර ඇත. මෙහි සීමා දැක්විය නොහැකි ය. හැම දෙයක් ම බුක්ති විඳීමට ඇති වන ආශාව හා උත්සාහය මෙහි විශේෂ ලක්ෂණ වේ. මෙය සංසිඳු විය නොහැකි ය.

- කෙසේ වෙතත් රුචිය යහපත් හෝ අයහපත් නොවේ. යහපත් හෝ අයහපත් වන්නේ රුචිය පදනම් කරගෙන පුද්ගලයා ගන්නා වූ තීරණයයි.

- මිනිසාගේ මුල්ම පාපය හෙවත් ජම්ම පාපය වන සහජයෙන් මනුෂ්‍යයා නපුරට පෙළඹීමේ ස්වභාවය ඇති වූයේ, ආදම් හා ඒව අඹු- සැමියන් ලෙස හැසිරීම නිසා නොවේ. දෙවියන් වහන්සේ ස්ත්‍රිය හා පුරුෂයා මවා ඇත්තේ ද ලිංගික සම්බන්ධකම් පවත්වමින්, දරු සම්පත් ලබා, වැඩි වර්ධනය වී, පොළොව පුරා පැතිර එය යටත් කර ගැනීමට ය. (උත්පත්ති 1:28). එහෙයින් එය ස්වභාවික දෙයකි. මුල්ම පාපයේ නියම ස්වභාවය නම් දෙවියන් වහන්සේ සතු දේ තමන් සතු කර ගැනීමට උඩගුව නිසා මනුෂ්‍යයා පෙළඹී, ඒ අනුව ක්‍රියා කිරීම ය. සදාචාරයේ පදනම මිනිසා නොව දෙවියන් වහන්සේ ය. එය මනුෂ්‍යත්වය අභිබවා යන්නකි. දේව සැලැස්ම ප්‍රතික්ෂේප කිරීම පාපයකි. එවන් නපුරක් කිරීමට මනුෂ්‍යයා පොළඹවනු ලබන්නේ ඔහු සතු නිදහස වැරදි මගට යොමුකර වන ආවේගයක් මගිනි. එය දෙවියන් වහන්සේගෙන් ලද මහගු වරප්‍රසාදයක් වන නිදහසින් අයුතු ප්‍රයෝජන ගැනීමකි. නපුරේ බලවේගය වූ සර්පයා හෙවත් රුවියේ දෝංකාරයට සවන් දී සදාචාරයේ ආධිපත්‍යය තමන් සතු කර ගැනීමට දරන ලද නිෂ්ඵල ප්‍රයත්නයකි.

- දෙවියන් වහන්සේ මිනිසාගෙන් ප්‍රශ්න කරන විට මිනිසා එම වරද ස්ත්‍රිය පිට මෙන්ම දෙවියන් වහන්සේ පිට ද පටවයි. ඒ අනුව පාපය නිසා මිනිසා දෙවියන් වහන්සේ සමග පමණක් නොව මිනිසා, මිනිසා සමග ද පැවතිය යුතු අන්‍යෝන්‍ය සබඳතාව හා අන්‍යෝන්‍ය විශ්වාසය පළුදු කරගෙන හෝ විනාශ කරගෙන ඇත. මේ අනුව ''ඉෂ්'' හා ''ඉෂ්ෂාහ්'' යන හෙබ්‍රෙව් පද පෙරළිය තුළින් බයිබල් කතුවරයා ඉඟි කළ මිනිසා හා ස්ත්‍රිය අතරේ ආරම්භයේ පැවති සබඳතාව පාපය කරණකොට ගෙන බිඳ වැටී ඇති බව පෙන්නුම් කරයි. එක ම මාංසය නමැති ගැඹුරු සබඳතාව විනාශ වී ඇත (උත්පත්ති 2:24). පුරුෂයා තමාගේ වරද ස්ත්‍රිය පිට පැවරුවා මෙන් ම ස්ත්‍රිය ද තම වරද සර්පයා පිට පටවයි. මෙමගින් ද මිනිසාගේ ස්වභාවය ගෙනහැර දක්වයි. එනම්, මිනිසෙක් වරදක් කළ කල්හි එම වරද පිළිගන්නවා වෙනුවට එය තව කෙනෙකු පිට පටවා තමාගේ නිදොස් භාවය ප්‍රකාශ කිරීමට දැඩි ප්‍රයත්නයක යෙදේ.

- ස්ත්‍රිය තමාගේ වරද සර්පයා පිට පවරයි: ''සර්පයා මා රැවටී ය ; මමත් කෑවෙමි'' (උත්.3:13). සැබවින්ම සර්පයාට ඒව රැවටීමේ හැකියාවක් කොහෙත්ම තිබිය නොහැකි ය. මන්ද, ''දෙවියන් වහන්සේ ඔවුන්ට පැනවූ තහනම පිළිබඳව පමණක් නොව එම තහනම උල්ලංඝනය කිරීමේ ඵල විපාක පිළිබඳ ව පවා ඇය තුළ මනා අවබෝධයක් තිබූ බව ඇය පෙර අවස්ථාවේ සර්පයාට දුන් පිළිතුරෙන් ම මැනවින් පැහැදිලි වේ (උත්පත්ති 3:2-3). ඒ අනුව සර්පයා ඇය රවටන්නේ කෙසේ ද? එවැන්නක් කෙසේවත් කළ නොහැකි ය. මේ සියලු කරුණු විභාග කිරීමේ දී පෙනී යන්නේ රැවටීම නිදහසට කරුණක් ලෙස ඉදිරිපත් කර ඇති බවකි. ඒව තම වරද පිළිගැනීමට දක්වන මැළිකමට එය උදාහරණයකි.

- මෙම තත්ත්වයේ භයානකකම ආදම් දෙවියන් වහන්සේට දෙන පිළිතුරෙන් තවදුරටත් පැහැදිලි වේ. (උත්.3:12). මෙම පිළිතුර හොඳින් විග්‍රහ කිරීමේ දී පැහැදිලි වන්නේ ආදම් වරද පටවන්නේ ස්ත්‍රියට වඩා දෙවියන් වහන්සේට ය. දෙවියන් වහන්සේ ස්ත්‍රිය ව සහකාරිය වශයෙන් ඔහුට දුන් නිසා තමන් වරදට වැටුණු බව ආදම්ගේ පිළිතුරෙන් පෙන්නුම් කරයි. පාපය පිළිගැනීමට මිනිසා දක්වන මැළිකම නිසා නිතරම එහි වගකීම තවත් කෙනෙකු වෙත පැවරීමට මිනිසා උත්සාහ කරයි.

- දෙවියන් වහන්සේ පළමුව මිනිසාගෙන් ද, දෙවනුව ස්ත්‍රියගෙන් ද ප්‍රශ්න කළ නමුදු දඬුවම් කිරීමේ දී පළමුව සර්පයට ද, දෙවෙනුව ස්ත්‍රියට ද, තෙවෙනුව මිනිසාට ද දඬුවම් කරයි. සර්පයා ලබන දඬුවම දෙයාකාර වේ.

1. ''බඩගෑම හා දූවිලි කෑම'' (උත්පත්ති 3:14). මෙයින් අදහස් කරන්නේ සියලු යහපත් දේ අහිමි වී අසරණ තත්ත්වයකට පත්ව ඇති බව ය. තව ද, දෙවියන් වහන්සේ සර්පයාට හා පොළොවට සාප කරන සේක. සර්පයාට සාප කිරීම යනු උෟ තුළින් සංකේතවත් කරන සශ්‍රීකත්වයේ පිළිවෙත් ප්‍රතික්ෂේප කෙරේ. දෙවියන් වහන්සේ සර්පයා හා සාරවත් පොළොවට සාප කරන නමුදු මිනිස් යුවළට සාප නොකරයි. දඬුවම් පමණක් නියම කරන සේක. පොළොවට සාප ලැබීම තුළ එහි ප්‍රතිඵල මිනිසාට හිමි වේ. එහෙයින් ඔහුට ජීවිතය පුරාවටම වෙහෙසෙ මහන්සි වී වැඩ කර ආහාර ලබා ගත යුතු අතර පොළොව කටු පඳුරු හා වල් පැළෑටි ඇති කරමින් ඔහුගේ ක්‍රියාවලියට බාධා පමුණුවයි.

2. සර්පයා හා ස්ත්‍රිය අතර ද සර්පයාගේ වංශය හා ස්ත්‍රියගේ වංශය අතර ද බද්ධ වෛරයක් ඇති කිරීම : සර්පයාට පමුණුවන දඬුවමේ දී ''ඔහු තගේ හිස පොඩි කරන්නේ ය.'' (උත්පත්ති 3:15) යන්න ඉදිරිපත් කර ඇත්තේ යුද කතා පුවත් පිළිබඳ භාෂා ශෛලිය ඇසුරිනි. පරාජය වූ රජ ජයග්‍රාහී රජතුමා ඉදිරියේ දණ ගසා තම හිස ජය ලැබූ රජුගේ පා පුටුව මත තබයි. ජයගත් රජු තම පාදයෙන් පරාජය වූ රජුගේ හිස පාගයි. මෙයින් පෙන්නුම් කරන්නේ මනුෂ්‍ය වර්ගයාට නපුරේ බලවේගයන් දමනය කළ හැකි බව ය. එහෙත් සර්පයා ද උගේ සටන් අත් නොහැර සටන් කරනු ඇත.

- ස්ත්‍රිය ලබන දඬුවම ත්‍රිවිධාකාර වේ:

1. ගැබ් ගැනීමේ වේදනාව බොහෝ සේ වැඩිවීම
2. විලි රුදාව ඇති ව දරුවන් ප්‍රසූත කිරීම
3. ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි දැඩි ආශාව ඇති ව සිටිය ද, ඔහු ඇය පාලනය කිරීම

- පුරුෂයා ලබන දඬුවම දෙයාකාර වේ.

1. දිවි ඇතිතාක් වෙහෙස මහන්සි වී ආහාර ලබා ගත යුතු වීම
2. මරණය

- අනෙක් අතට මෙම දඬුවම් දෙස බැලීමේ දී පෙනී යන වැදගත් කරුණක් නම් මේවා ස්වභාවික බවයි. එනම්, ගැබ් ගැනීම, දරුවන් බිහිකිරීම, ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි ඇති දැඩි ආශාව, වැඩ කිරීමේ අවශ්‍යතාව හා මරණය යනාදිය ජීවිතයේ අනිවාර්ය ය. එහෙත්, පාපය කරණ කොට ගෙන මේවා වේදනාකාරී වී ඇත. එනම්, ගැබ් ගැනීමේ දී වේදනා ඇති වේ. දරුවන් බිහි කරන්නේ විලිරුදා ඇති ව ය. ස්ත්‍රිය පුරුෂයා කෙරෙහි දැඩි ආශාවෙන් පෙළෙන ද පුරුෂයා ස්ත්‍රිය පාලනය කරයි. වැඩ කිරීමේ දී භූමිය මිනිසාට සහයෝගයක් ලබා නොදෙයි. මරණය වේදනාකාරී ය. එ අනුව පෙනී යන්නේ බයිබල් කතුවරයා ස්වභාවික සංසිද්ධීන් භාවිත කරමින්, ඒවා පාපයේ ප්‍රතිවිපාක ලෙස ඉදිරිපත් කරමින් දේව ධාර්මික පණිවිඩයක් දීමට සමත් වී ඇති බව ය.

- මිනිසාගේ වැටීම කරණ කොට ගෙන:

1. දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතරත්
2. මිනිසා හා ස්ත්‍රිය (ඉෂ් හා ඉෂ්ෂාහ්) අතරත්

3. මිනිසා හා භූමිය හෙවත් ස්වභාව ධර්මය (ආදම් හා අදමාහ්) අතරත් පැවති සබඳතාව හා සමතුලිතතාව බිඳ වැටී පහත සඳහන් අයහපත් ප්‍රතිඵල අවාසනාවන්ත ලෙස ඇති වී ඇත.

1. ප්‍රථම වරට ස්ත්‍රිය දූක සතුටට පත් මිනිසා, දූන් ස්ත්‍රියටත් ඇය ව ඔහුට දුන් දෙවියන් වහන්සේටත් චෝදනා කරයි.
2. ස්ත්‍රිය පුරුෂයාගේ පාලනයට යටත් වෙයි (උත්. 3:16). පුරුෂයාට යටත් වීම දුකකි.
3. සතුන්ට නම් දුන් ආදම් දූන් භාර්යාවට ද නාමයක් දෙයි (උත්. 3:20).
4. දරු ප්‍රසූතිය ආශිර්වාදයක් වන්නට තිබිණි. එහෙත් දූන් එය වේදනාවකි.
5. භූමිය කාන්තාර පරිසර තත්ත්වයක් කරා පැමිණ නිසරු වී ඇත (උත්. 3:17-18). එය මැවීමට පෙර තිබුණු ස්වභාවයට (උත්. 2:4ආ-5) නැවත යාමක් වැනි ය.
6. ''දෙවියන් වහන්සේ, මිනිසා හා ස්වභාව ධර්මය'' අතර සබැඳියාව බිඳ වැටෙයි.

- මේ අනුව මිනිස් දුක් දොම්නස් සියල්ල පාපයේ විපාක ලෙස බයිබල් කතුවරයා ඉදිරිපත් කර ඇත.

- ආදම් සහ ඒව දෙවියන් වහන්සේ ඒදන් උයනෙන් නෙරපනු ලබන්නේ ඔවුන් නග්න ව සිටිය දී නොවේ. කොළ අතුවලින් විලි වසා ගෙන සිටි ඔවුනට හම්වලින් වස්ත්‍ර සාදා ඇඳවීමෙන් පසු ව ය. මෙයින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේ පාපයට දඬුවම් කරන නමුදු පව්කරුවාට අනුකම්පා කරන බවයි. එනම් අනාරක්ෂිත මිනිසාට උන්වහන්සේ රැකවරණය සලසා දුන් බවයි.

- තම වරදෙන් හා තම කැමැත්තෙන් පාපයට වැටුණු මිනිසාට අනුකම්පා කළ දෙවියන් වහන්සේ මරණයට, දුකට, රෝග පීඩාවට, අසහනයට හා විනාශයට පත් වන්නට ඉඩ නොහළ සේක. අහිමි වූ සදා ජීවනයත්, දෙව්-මිනිස් සබැඳියාවත් නැවත ළඟා කර දෙනු පිණිස ගැලවුම්කරුවෙකු එවීමට පොරොන්දු වූ සේක (උත්. 3:15). මනුෂ්‍යයා ලැබූ මුල්ම ගැලවීමේ සුපුවත මෙය වේ. මෙම පාඨය ''ප්‍රාථමික සුවිශේෂය'' (Proto-evangelion) නමින් ශුද්ධ වූ අයිරේනියස් තුමා හඳුන්වා ඇත. එයින් අදහස් කරන්නේ ජේසුස් ක්‍රිසතුන් වහන්සේ තමන් වහන්සේගේ දුක් විඳීම, මරණය හා උත්ථානය තුළින් යක්ෂයාගේ හිස පොඩි කරමින් ජයග්‍රහණය ලබා ගත් බවයි.

## 2.2.5 කායින් හා ආබෙල් (උත්පත්ති 4:1-16)

- මෙම දේව ධාර්මික කතා පුවත ද යාවේ සම්ප්‍රදායට (''J'') අයත් වන අතර එහිදී කතුවරයා මෙම කතා පුවතින් ගෙනහැර දක්වන්නේ පළමු පනත කඩ කළ මිනිසා එයින් නොනැවතී දෙවන පනත ද කඩ කළ බවයි. එනම්, දේව ප්‍රේමයට විරුද්ධව පව් කළ මිනිසා සහෝදර ප්‍රේමයට විරුද්ධ ව ද පව් කළේ ය. ඒ අනුව දෙවියන් වහන්සේට විරුද්ධව නැඟී සිටි මිනිසා මිනිසාට විරුද්ධව ද නැඟී සිටිමින් සැහැසිකම් කරමින් මිනී මරයි. මිනී මැරීම තුළ ඔහුගේ වැටුණු තත්ත්වය මැනවින් පෙන්නුම් කරයි.

- දේව ප්‍රේමයට විරුද්ධව පව් කළ මිනිසා සහෝදර ප්‍රේමයට විරුද්ධව කටයුතු කළ ආකාරය පෙන්වීම සඳහා යාවේ සම්ප්‍රදාය උත්පත්ති 2-3හි අනුගමනය කළ සැලැස්ම ම උත්පත්ති 4හි දී ද භාවිත කරයි. එනම්,

1. දෙවියන් වහන්සේ ආදම්ට අවවාද කළා සේ, මෙහිදී කායින්ට ද අවවාද කරන සේක.
   (උත්: 2:17, 4:6-7)
2. ආදම් මෙන් ම කායින් ද දේව අවවාදයට පිටුපා දෙවියන් වහන්සේට විරුද්ධව පව් කරයි.
   (උත්. 3:6, 4:8) (උත්: 3:11-19, 4:9-12)

3. දෙවියන් වහන්සේ ආදම්ගෙන් මෙන් ම කායින්ගෙන් ද ප්‍රශ්න කර දඬුවම් නියම කළ සේක.
4. එසේ වුව ද දෙවියන් වහන්සේ ආදම්ට හා කායින්ට කරුණාව දක්වා ඔවුන්ගේ සහයට පැමිණෙන සේක. (උත්. 3:15, 3:21)
5. ආදම්ට මෙන් කායින්ට ද ඒදන් උයනෙන් පිට වීමට සිදු වේ. උත්. 3:23-24, 4:16

- මේ අනුව පෙනී යන්නේ කායින් පිළිබඳ කතා පුවත ඊට පෙර පරිච්ඡේද දෙක හා සම්බන්ධ වෙමින් එහි මූලික රටාව ම අනුගමනය කරමින් පාපය වර්ධනය වීමත් සමග ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, මිනීමැරීම ආදී භයංකර ප්‍රතිඵල උදාකර ඇති බව පෙන්වා දෙයි. තව ද අකීකරුකම හා එයට අනුබද්ධිත පල විපාක ලොව පුරා පැතිරෙන ආකාරය ද ගෙනහැර දක්වයි. වරද නිසා ඇද වැටුණු මිනිසාගේ දෛවය අයහපත සමග කෙරෙන නිරන්තර සටනකි (උත්පත්ති 3:15, 4:7). පාපය නිසා සහෝදරත්වය හා සාමූහිකත්වය දෙදරා යයි. වරද නිසා සිදුවන විනාශය (ආබෙල්ගේ මරණය) අභිබවා දේව වරප්‍රසාදය උදාවන සැටි සෙත්ගේ උපතින් නිරූපනය වේ. (උත්පත්ති 5:3).

- කායින් විසින් තම සොහොයුරා මරා දමනු ලැබීමේ අපරාධයට හේතුව ඔහුගේ යාගය ස්වාමීන් වහන්සේ විසින් පිළිගනු ලැබීම බව කතුවරයා කියයි (උත්පත්ති 4:5). එහෙත් කායින්ගේ පඬුර නොපිළිගත්තේ මන්දැයි මෙම කතා පුවත තුළ අනාවරණය නොකරයි. එඬේරෙකු වූ ආබෙල් තම බැටළු රැලේ ඉස්තරම්ම කුළුදුල් පැටවුන්ගෙන් සමහරකු සමිඳාණන් වහන්සේට යාග ලෙස ඔප්පු කළ බව කතා පුවත තුළ පැවසෙන නමුදු කායින් තමා පොළොවෙන් නිපදවූ බොල් හෝ නිසරු දේ ඔප්පු කළේ ය යන්න කතුවරයා නොකියයි. අපට ද එසේ නිගමනය කළ නොහැකි ය.

- ආබෙල්ගේ පඬුර දෙවියන් වහන්සේට ප්‍රසන්න වීම තුළින් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේගේ අද්භූත ජනක තෝරා ගැනීමයි. දෙවියන් වහන්සේ ඉශ්මායෙල් වෙනුවට ඊසාක් ද (උත්පත්ති 21:9-14), ඒසව් වෙනුවට ජාකොබ් ද (උත්පත්ති 27), දාවිත්ගේ වැඩිමහල් සහෝදරයන් සත්දෙනා වෙනුවට බාලයා හා පවුලේ අටවැනියා වූ දාවිත් ද ( 1 සාමුවෙල් 16:5ආ-13) තෝරා ගත් සේක. ඒ අකාරයට ම දෙවියන් වහන්සේ විශේෂ හා සුවිශේෂ ලෙස ආබෙල් තෝරා ගත් බව ආබෙල්ගේ පඬුර පිළිගැනීම තුලින් පෙන්නුම් කෙරේ. උන්වහන්සේ තමන් වහන්සේ කැමති අයව නිදහස් කැමැත්ත තුළ තෝරා ගන්නා සේක. එය කිසිවකුගේ හැකියා මත උපයා ගත හැකි දෙයක් නොවේ.

- එසේ වුවද මෙහි දී ඇසිය යුතු වැදගත් හා අත්‍යවශ්‍ය ප්‍රශ්නය වන්නේ, ''දෙවියන් වහන්සේ ආබෙල් තෝරා ගත්තේ ඇයි ? '' කියා ය. මන්ද යත් ඊසාක්, ජාකොබ් හා දාවිත් මෙන් ආබෙල්ගෙන් ගැලවීමේ ඉතිහාසයට කිසි ම දායකත්වයක් නොමැත. ඔහු ඉතිහාසයට පිවිසෙන සැනින් සුළඟට අසුවූ පහනක් සේ නිවී යයි. ''ආබෙල් '' යන්න මෙහි අර්ථය වන '' හුස්ම ''හෝ ''හුළං පොද'' මගින් ද අදහස් කරන්නේ කෙටි ජීවිතයකි. ඔහුගෙන් ඇති වන වංශයක් නැත. මෙම කරුණු අනුව කායින්ගේ පාපයේ බරපතලකම පෙන්වනු වස් ආබෙල්ගේ යහපත් චරිතය යොදා ගෙන ඇතැයි සිතිය හැකි ය. ඒ සමග ම කතුවරයාට අවශ්‍යව ඇත්තේ කායින්ගේ පාපය මගින් පාපය භයංකර ලෙස පැතිරෙන බව පෙන්වීමට ද විය හැකි ය.

- පාපයට පෙර කායින් තුළ තම සහෝදරයාට විරුද්ධව හටගත් ඊර්ෂ්‍යාව පිළිබඳ ස්වාමීන් වහන්සේ ඔහුට අනතුරු ඇඟවීමක් කරන සේක. ඔහුගේ සිතේ ඇති විනාශකාරී හැඟීම් දමනය නොකළහොත් ඔහුට පැමිණෙන අභාග්‍යසම්පන්න තත්ත්වය ගැන උන්වහන්සේ පහදා දෙන සේක. (උත්පත්ති 4:6-7) . මෙයින් පෙනී යන්නේ දෙවියන් වහන්සේ කායින්ගේ පඬුර නොපිළිගත්ත ද, ඔහු ව ප්‍රතික්ෂේප කර නොමැති බව ය. එහෙත් කරන්නට යන අපරාධය සම්බන්ධයෙන් තමාට විරුද්ධ ව චෝදනා එල්ල කළ හැකි සාක්ෂිකරුවෙකු නොසිටීමට වගබලා ගනිමින් දෝ ඔහු පාළු ප්‍රදේශයක දී ආබෙල් ව රහසින් මරා දැමී ය (උත්පත්ති 4:8).

- ආබෙල් සිය නිදහස් කැමැත්ත යොදා ගන්නේ දෙවියන් වහන්සේට ප්‍රසන්න වන පරිදි ය. එනම් ''කුලුඳුල් පැටවුන්ගෙන් සමහරක්'' සහ '' හොඳ ම කොටස්'' පූජා කිරීමට ය. (උත්. 4:4). එහෙත් සිය සොහොයුරු කායින් තම නිදහස් කැමැත්ත භාවිත කරන්නේ ''ආබෙල් මරා දැමීමට '' ය (උත්. 4:8). නිදහස් කැමැත්ත තුළ මිනිසා කැඳවා ඇත්තේ අයහපත කිරීමට නොව යහපත කිරීමට ය.

- පාපයට පසු තැති ගෙන සැඟවුණු ආදම්ගෙන් '' නුඹ කොහේ ද?'' (උත්. 3:9) යනුවෙන් ප්‍රශ්න කළ දෙවියන් වහන්සේ, මෙහි දී ''නුඹේ සහෝදර ආබෙල් කොහේ ද?'' (උත්. 4:9) යනුවෙන් කායින්ගෙන් විමසයි. ආදම් පව් කළේ ය. ඔහු වරද අන් අය පිට පටවමින් හෝ එය පිළිගත්තේ ය. එහෙත් කායින්ගේ පිළිතුර තම දෙමව්පියන්ගේ උත්තරයටත් වඩා අයහපත් විය. ඔහු තමා අතින් සිදුවූ බරපතල පාපයට වරදකරු යයි පිළිගන්නවා වෙනුවට තම සහෝදරයා පිළිබඳ තම දැනුම හා ඔහු කෙරෙහි ඇති වගකීම පවා ඉවත දමා බොරු කියමින් ඉතා හිතුවක්කාරී ලෙස දෙවියන් වහන්සේට පිළිතුරු දෙයි (උත්. 4:9). මෙයින් පෙනී යන්නේ පාපයේ වර්ධනය හා ඒ කරණකොට ගෙන මිනිසා දරුණු වීම ය. තම අපරාධයෙන් ගැලවීමට තැත් කරන කායින් හට දෙවියන් වහන්සේ මෙසේ කියන සේක. ''නුඹේ සහෝදරයාගේ ලේ පොළොවෙන් මට මොර ගසයි'' (උත්පත්ති 4:10). රුධිරය තුළ ජීව ධාතුව අඩංගු යයි පුරාණ ගිවිසුමේ සැලකුණු අතර එය දෙවියන් වහන්සේට පමණක් හිමි පූජනීය දෙයක් ලෙස පිළිගැනිණි. එබැවින් මිනිස් ඝාතන එක් අතකින් දෙවියන් වහන්සේ සතු දේ පැහැර ගැනීමක් වූ අතර අනෙක් අතට එය සහෝදරත්වයට පිටුපා යාමකි. කායින් සිය සහෝදරයා ඝාතනය කිරීමට සූදානම් වීමේ දී හෘද සාක්ෂිය ඔස්සේ දෙවිඳුන් කළ අනතුරු ඇඟවීම පවා නොතකා ඔහු ක්‍රියා කළ බැවින් ඔහුගේ පාපය හා එහි වගකීම වඩාත් බරපතල වේ. මෝසෙස්ගේ නීතිය අනුව හෙළු ලෙසට වන්දි ගෙවිය යුතු වන්නේ මිනීමරුවා මරණයට පත් කිරීමෙනි. (නික්මයාම 21:12-14, ගණන් 35:9-34). මෙහි නැගෙන තවත් අදහසක් නම්, කාටවත් හොරෙන් වරදක් කළ ද, එය දෙවියන් වහන්සේගෙන් වසන් කළ නොහැකි බව ය.

- කායින්ට ලැබුණු දඬුවම එක්තරා ආකාරයකට ආදම් ලැබූ දඬුවමට සමාන ය. එනම් මිනිසා හා ස්වභාවධර්මය අතර ඝට්ටනයක් ඇති වේ. තව ද ආදම් සහ ඒව ''ඒදන් '' උයනෙන් පලවා හරිනු ලැබුවා සේ කායින් ද තමාගේ වාසභූමියෙන් නෙරපා දමනු ලබයි. ස්ථිර වාසස්ථානයක් නොමැති ඔහු නන්නත්තාරේ ඇවිදින්නකු වෙයි. ''ඉබාගාතේ යන්නෙකු'' ගෙන් සංකේතවත් කරන්නේ මානව සබඳතාවලින් තොර වූ ජීවිතයකි. එහෙත් කායින් ලැබූ දඬුවම ආදම් හා ඒව ලැබූ දඬුවමෙන් වෙනස් වන අතර ඒ තුළ කැපී පෙනෙන ලක්ෂණයක් ද ඇත. එනම්, කායින් සාප ලද්දෙකු වීමයි. උත්පත්ති තුන්වන පරිච්ඡේදයේ දී සාප ලබන්නේ සර්පයා හා පොළොව පමණි. මෙයින් පෙන්නුම් කරන්නේ කායින් සාප ලද්දෙකුවීමට වඩා පාපයේ ඇති බරපතලකමය. තම දණ්ඩනයේ උග්‍ර භාවය ගැන කන්නලව් කරන කායින්ට දෙවියන් වහන්සේ කරුණාව දක්වන සේක. ඔහුට අයුතු ලෙස පීඩා කරන්නන්ගෙන් රැකවරණයක් ලබාදෙන බවට ප්‍රතිඥා දෙන සේක (උත්පත්ති 4:15). දෙවි සමිඳුන් කායින් පිට තැබූ ''සලකුණ'' දණ්ඩණයේ නොව දේව රැකවරණයේ ලාංඡනයකි. මෙමගින් පෙනී යන්නේ ස්වාමීන් වහන්සේ වෙත හැරී කන්නලව් කරන පව්කාරයාට පවා උන්වහන්සේ දයාව කරුණාව දක්වන බව ය. කායින් තම සහෝදරයා මරා දමා තම වරදින් නිදොස්වීමට උත්සාහ කළ ද, දෙවියන් වහන්සේ කායින්ට පවා තම රැකවරණය ලබා දෙන සේක.

### 2.2.6 ජල ගැල්ම හා නෝවා සමග ඇති කරගත් ගිවිසුම (උත්පත්ති 6:1-9:17)

- මෙම කතා පුවත යාවේ (J) හා පූජක (P) යන සම්ප්‍රදායයන් දෙකෙහි ම සංකලනයෙන් රචනා වූවකි. එම නිසා මෙම කතා පුවත තුළ පහත සඳහන් ලක්ෂණ දෙක දැකිය හැකි ය.

1. එකම කරුණ දෙවතාවක් සඳහන්වීම: උදාහරණ :-
    i. නෝවාට ජලගැල්ම දැනුම්දීම (උත්. 6:17, 7:4)
    ii. නෝවා යාත්‍රාවට ඇතුළුවීම (උත්. 7:7, 7:13)

iii. ජල ගැල්ම ආරම්භ වීම (උත්. 7:10, 7:11)
iv. සියලු ජීවීන්ගේ විනාශය (උත්. 7:21, 7:22-23)
v. ජලය බැස යාම (උත්. 8:1, 8:3අ)
vi. නැවත ජලයෙන් විනාශ නොකිරීමට දෙන ප්‍රතිඥාව (උත්පත්ති 8:21, 9:15)

2. එක ම සිද්ධිය දෙයාකාරයකින් විස්තර කිරීම : උදාහරණ
   i. උත්පත්ති 7:2-3 (J) : පවිත්‍ර සතුන්ගෙන් ජෝඩු හත බැගින් හා අපවිත්‍ර සතුන්ගෙන් ජෝඩුව බැගින් උත්පත්ති 6:19-20, 7:8-9, 7:13-16 අ (P) සියලු සතුන්ගෙන් ජෝඩුව බගින් නැවට ගැනීමට අණ ලැබීම
   ii. උත්පත්ති 7:4, 7:12, 8:2 ආ (J) ජල ගැල්මට හේතුව අධික වර්ෂාව වේ.
   උත්පත්ති 7:11, 8:2 අ (P) පොළොවෙන් පැන නැගුණු දිය උල්පත් නිසා ජල ගැල්ම ඇති වේ.
   ii. උත්පත්ති 7:4, 7:12,7:7 (J) : ජලගැල්ම දින 40ක් පැවතිණි.
   උත්පත්ති 7:11, 8/13අ (P) දින 354 ක් ජලගැල්ම පැවතිණ.

- උත්පත්ති 6:1-5හි ඇති ''මිනිස් දූවරුන් හා දිව්‍ය පුත්‍රයන් අතර වූ විවාහ ''ජල ගැලීමේ විස්තරයට පෙර වදනක් සපයයි. ප්‍රාග් ඉතිහාසය පුරා ම මිනිසා උත්සාහ කර ඇත්තේ දේව අභිමතය අභිබවා යාමට ය. උදාහරණ :

1. ආදම් හා ඒව සියලු ආකාර දැනීම හිමි කර ගැනීමට යත්න දැරීය. එහෙත් සදාචාර පැවැත්මේ ආධිපත්‍යය දෙවියන් වහන්සේ සතු දෙයකි.
2. කායින් ආබෙල් මරා දැමුවේ ය. එහෙත් ජීවිතය අයිති දෙවියන් වහන්සේට ය.
3. ඒ ආකාරයට ම මිනිසුන් - දූවරු දිව්‍ය පුත්‍රයන් සමග සංවාසයේ යෙදෙමින් අමරණීයතාව ලබා ගැනීමට උත්සාහ කළහ. එහෙත් දෙවියන් වහන්සේ පමණක් අමරණීය වන සේක.

- මෙලෙස මිනිසා තම මනුෂ්‍ය සීමාවන් ඉක්මවා යෑමට අසාර්ථක ප්‍රයත්න දැරී ය. සෑම විට ම එහි ප්‍රතිඵලය වූයේ පාපයයි. එයට අමතර ව, බයිබල් කතුවරයා මෙහි දී කරනු ලබන්නේ ආගමික මුවාවෙන් ගණිකාවන් වෙත යාමේ එකල පැවති පිළිවෙත් ප්‍රතික්ෂේප කිරීම ද විය හැකිය. නීත්‍යානුකුල නොවූ ආකාරයට අමරණීයතාව ලබා ගැනීමට මිනිසා උත්සාහ කළ ද, එය සාර්ථක නොවේ. එබැවින් අමරණීයතාව වෙනුවට මිනිසාගේ ජීවිතය තවත් කෙටි වේ (උත්. 6:3)

- ජල ගැලීමට හේතුව ලොව පුරා පැතිරී ඇති මනුෂ්‍යයාගේ දුෂ්ටකම බව මෙම කතාන්දරයෙන් පැහැදිලි වේ. පාපය නිසා දෙවියන් වහන්සේ ශෝක වන බවත්, එම නිසා උන්වහන්සේ දඬුවම් කරන බවත් බයිබල් කතුවරයා පවසයි.

- එහෙත් සැබවින් ම දෙවියන් වහන්සේ ශෝක වේ ද? මෙම කතා පුවත ඉදිරිපත් කරන්නේ යාවේ සම්ප්‍රදාය විසිනි. එම සම්ප්‍රදායයේ විශේෂ ලක්ෂණය වන්නේ දෙවියන් වහන්සේ ව මානව රූපාකාරයෙන් ඉදිරිපත් කිරීම යි.

- එනම්, මනුෂ්‍යයා එදා පමණක් නොව අදත් දෙවියන් වහන්සේ තේරුම් කරන්නේ තමාගේ ම අත්දැකීම් හා ආකල්ප තුළිනි. මෙසේ කිරීම යුක්ති සහගත ය. මක්නිසාද යත්, ඉන් බැහැර ව ඔහුට දෙවියන් වහන්සේ ගැන කිසිවක් කිව නොහැකි ය.

- තම දරුවන්ගේ හෝ දාසයන්ගේ හෝ බරපතල වැරදි නිසා කිපී ඔවුන්ට දඬුවම් කරන පියෙකුගේ හෝ ස්වාමියෙකුගේ ප්‍රතිරූපය තුළින් දෙවියන් වහන්සේ දෙස බැලීම ස්වභාවික ය.

- එහෙත් බොහෝ විට පාපයේ ප්‍රතිඵල එය තුළම අන්තර්ගත වේ. උඩගුවන්නා උඩගුවෙන් ද, ලෝබ වන්නා ලෝබයෙන් ද නසින්නාක් මෙන් පව් කරන්නා එමගින්ම පාපයේ විපාක තම පිටට පතිත කර ගනියි.

- යාවේ සම්ප්‍රදායයට අනුව පාපය ක්‍රමක්‍රමයෙන් ලොව පුරා වර්ධනය වුවත්, දෙවියන් වහන්සේ මනුෂ්‍යයාට ගැලවීමේ නව මංපෙත් විවර කරන සේක. පාපයෙන් දූෂණය වූ සකල මැවිල්ල ම විනාශ කිරීමට උන්වහන්සේ තීරණය කළත්, නෝවාගේ පවුල හා සියලු සතුන්ගේ නියෝජිතයන් බේරා ගැනීමෙන් පෙන්නුම් කරන්නේ උන්වහන්සේගේ දයා කරුණාවයි. එම නිසා නෝවා නව මැවිල්ලක ආරම්භකයා වශයෙන් තෝරා ගනු ලබයි. පූජක සම්ප්‍රදාය අනුව නෝවාගේ තෝරා ගැනීම ඔහුගේ යහපත්කම කරණකොට ගෙන ය. (උත්පත්ති 6:19).

- ලොව විනාශ කිරීමෙන් අදහස් කරන්නේ ලොව විනාශ කිරීමකට වඩා මිනිස් වර්ගයා වර්ධනය කළ අයහපත ලොවින් තුරන් කර දැමීමකි. එය එක්තරා අන්දමකට පවිත්‍ර කිරීමේ ක්‍රියාවලියකි. (උත්පත්ති 6:13) .

- එබැවින් ජල ගැල්ම වූ කලී ක්ෂණික ව දඬුවම් වශයෙන් පැමිණ වූ, උදහසේ පියවරක් නොව නව ආරම්භයකි. දෙවියන් වහන්සේ නෝවට ''නැවක්'' සෑදීමට අණ කළ සේක (උත්පත්ති 6:14). මෙහිදී නැව සඳහා යොදා ඇති හෙබ්‍රෙව් වදන නැව හෝ බෝට්ටුව හෝ සඳහා යොදන වචන නොවේ. මෙම හෙබ්‍රෙව් වචනය මුළු ශුද්ධ බයිබලයේ ම ඇත්තේ තව එක තැනක පමණි. ඒ නික්මයාම 2:3 හි ය. ඒ ළදරු මෝසෙස් තුමා දමා ගං ඉවුරේ බටගස් අතර තැබූ පන් පෙට්ටිය හැඳින්වීමට ය. ඒ අනුව, නෝවා හා මෝසෙස් යන කතා පුවත් දෙකෙහි ම එම වචනයෙන් අදහස් කර ඇත්තේ පාවෙන භාජනයකි. නෝවාගේ කතාවේ දී එය අති විශාල එකකි. මෝසෙස්ගේ සිද්ධියේ දී එය ඉතා කුඩා වූවකි. විශාල වුවත්, කුඩා වුවත් එහි කාර්යභාරය වන්නේ දෙවියන් වහන්සේගේ ගැලවීමේ කාර්යයට දායක වූ පුද්ගලයාගේ ජීවිතය බේරා ගැනීම ය.

- ජල ගැල්මෙන් පසු පාපය තවදුරටත් පැවතිය ද, නැවත ලොව ජලයෙන් විනාශ නොකිරිමට දෙවියන් වහන්සේ තීරණය කර ප්‍රතිඥාවක් දෙන සේක. දෙවියන් වහන්සේගේ එම ප්‍රතිඥාව (උත්පත්ති 8:21, 9:11) උන්වහන්සේගේ දයා කරුණාව මානව රූපාකාරයෙන් ඉදිරිපත් කිරීමකි. එමෙන් ම එය දේව ආරක්ෂාව හා දේව සංරක්ෂණය මතු පාපයට ගොදුරු වන මනුෂ්‍යයාට ද ලැබෙන බව සහතික කිරීමකි.

- මෙය පූජක සම්ප්‍රදාය විසින් දෙවියන් වහන්සේ හා මුළු මැවිල්ල අතර ගිවිසුමක් ලෙස ඉදිරිපත් කරයි (උත්පත්ති 9:8-11). ''දේ දුන්න'' මේ ගිවිසුමේ බාහිර සංකේතයකි. මෙහිදී දෙවියන් වහන්සේ මිනිසා සමග කරන්නේ ඒකපාර්ශ්වික ගිවිසුමකි. මිනිසා පව් කළ ද මිනිසාට කිසි අනතුරක් නොකිරීමට දෙවියන් වහන්සේ පොරොන්දු වන සේක. මිනිසාගේ පාර්ශවයෙන් කිසි ම පොරොන්දුවක් නැත. එය හුදෙක් දේව වරප්‍රසාදය, මිත්‍රත්වය හා ප්‍රේමය මත දුන් කොන්දේසි රහිත පොරොන්දුවකි.

- පුරාණ මැද පෙරදිග දේදුන්න වැසි කුණාටු අවසන් වී දක්වන සළකුණක් විය. ඒ අනුව දිව්‍ය සංරක්ෂණය එමගින් සංකේතාත්මකව ඉදිරිපත් කර ඇත. පුරාණ ගිවිසුමේ දේදුන්න දේව අනුකම්පාවේ, කරුණාවේ හා ප්‍රේමයේ සංකේතයක් විණි.

- මෙහි දී දේදුන්න සඳහා යොදා ඇති හෙබ්‍රෙව් වදන ''දුන්න'' සඳහා ද යොදන වචනයයි. වෙනත් බහු දේවවාදී ආගම්වල දෙවිවරු දුන්න භාවිත කළේ මිනිසාට දඬුවම් කිරීමට ය. දෙවියන් වහන්සේ එය අහසේ එල්ලීමෙන් පෙන්නුම් කරන්නේ දෙවියන් වහන්සේ එය ඉවත දමා ඇති බවය. වෙනත් වචනවලින් කියතොත් සාමයේ කාලපරිච්ඡේදයක් උදා වී ඇති බව ය.

- අහසේ දේදුන්න පෙනීම වැසි කුණාටු ඇති නොවීමේ ලකුණක් බව අදත් බොහෝ අය අතර ඇති මතයකි. කෙසේ වෙතත් මේ පිටුපස ඇති ඉගැන්වීම වනුයේ දෙවියන් වහන්සේගේ වචන හා ප්‍රතිඥා විශ්වාසවන්ත බව ය.

- ගිවිසුම් සාක්ෂිකරු වශයෙන් දේදුන්න යොදා ගැනීමේ දී දේව ධාර්මික වැදගත්කමක් ඇත. පැරණි මැද පෙරදිග සිදුවූ ගිවිසුම්වල දී ගිවිසුමේ සාක්ෂිකරුවන් වූයේ දෙපාර්ශවයේ දෙවිවරු ය. එහෙත් ඉශ්‍රායෙල්වරුන් තම ඒකදේවවාදී දැක්ම හේතු කොට ගෙන ස්වභාව ධර්මයේ විවිධ අංග හෙවත් දෙවියන් වහන්සේගේ මැවිලි ගිවිසුමේ සාක්ෂිකරුවන් වූ අතර මෙහිදී දේදුන්න ඒ කාර්ය ඉටු කරයි.

- ආරම්භයේ දී දෙවියන් වහන්සේ විසින් මවන ලද මුළු මැවිල්ල ම මනහර විය. පූජනීය විය; ශුද්ධවන්ත විය (උත්පත්ති 1:1-2:4අ). එහෙත් නෝවාගේ කාලය වන විට එහි තත්ත්වය කණපිට පෙරළිණි. අවුල් වූ ලෝකය නැවත සකස් කිරීමට අවශ්‍යය වේ. එහෙයින් මැවිල්ලේ මනහර බව, පූජනීය බව හා ශුද්ධ බව ජලගැල්ම මගින් ස්ථාපිත කරනු ලබයි. ඒ නව මැවිල්ලේ ආරම්භකයා වන නෝවා මගින් අලුත් ලෝකයක් ගොඩනැගේ.

- උත්පත්ති පොතේ පළමු පරිච්ඡේදයේ දී මෙන් ම මෙහි දී ද මනුෂ්‍යයා නැවත වරක් ආශිර්වාද කරනු ලබයි. ඔහුට ජීවීන් පිට බලය දෙනු ලැබේ. (උත්පත්ති 1:28, 9:1-2). එහෙත් මනුෂ්‍යයාට කෑමට දී ඇති ආහාර සම්බන්ධයෙන් එක්තරා වෙනසක් මෙහි දක්නට ඇත. උත්පත්ති 1:29-30 දී මිනිසාට හා සියලු සතුන්ට මාංශවලින් තොර ආහාර පමණක් කෑමට ලැබේ. එමගින් පෙන්නුම් කරන්නේ මනුෂ්‍යයා හා සතුන් අතර පැවතුණා වූ සාමය හා සුහදතාවයි. පාපය කරණකොට ගෙන මෙම සාමකාමීත්වය විනාශ වී ඇත. එහෙයින් මනුෂ්‍යයා තම ආහාරය සඳහා සතුන් ඝාතනය කරයි.

- ශාකභක්ෂක මිනිසා සර්ව භක්ෂකයකු වේ (උත්පත්ති 9:3). එහෙත් ලේ අනුභව කිරීම ඔහුට තහනම් වේ. ලෙය තුල ජීවිතය අන්තර්ගත යයි සැලකූ ඉශ්‍රායෙල්වරු, ජීවිතය දෙවියන් වහන්සේට පමණක් හිමි නිසා එය අනුභව නොකළෝ ය.

- එබැවින් දෙවියන් වහන්සේ සංකේතවත් කරන පූජාසනයේ එය තැවරූහ. එහෙයින් මිනී මැරීම කෙතරම් බරපතල පාපයක් වූයේ ද යත් ජීවිතයකට ජීවිතයකින් වන්දි ගෙවිය යුතු බව අවධාරණය කෙරේ (උත්පත්ති 9:5-6).

- එය එතරම් බරපතල වන්නේ මනුෂ්‍යයා දෙවියන් වහන්සේගේ ස්වරූපයට හා සමානකමට මවා ඇති නිසා ය. එම නිසා මනුෂ්‍යය ජීවිතය වටිනා පූජනීය වස්තුවකි.

**2.2.7 බාබෙල් කොත (උත්පත්ති 11:1-9)**

- නෝවාගේ කාලයේ සිදුවූ ජල ගැල්මෙන් පසු ඇති වන ලෝකය නව මැවිල්ලක් වුව ද (උත්පත්ති 8:21-22) පාපය කරණකොටගෙන නැවත එය දූෂණය වන බව බයිබල් කතුවරයා පෙන්වා දීමට උත්සාහ දරා ඇත.

- ආදම්- ඒව, කායින් හා නෝවාගේ කාලයේ සිටි මිනිසුන් මෙන් නෝවාගෙන් පටන් ගත් නව මැවිල්ලේ ජනතාව ද නැවත වරක් දෙවියන් වහන්සේට හිමි තැන ලබා ගන්නට නිෂ්ඵල ප්‍රයත්නයක යෙදෙනවා පමණක් නොව එමගින් ඔවුන් තවදුරටත් අභාග්‍යය සම්පන්න තත්ත්වයකට පත්වන බව පසක් කිරීමට මෙම කතා පුවත රචනා කර ඇත. (උත්පත්ති 11:8-9).

- මෙහිදී මිනිසාගේ විනාශයට හේතු වන්නේ මිනිසාගේ උඩගුව ය. දේව සැලැස්මට පිටුපා මිනිස් සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට යාම මිනිසාගේ විනාශයට හේතු වේ.

- පොළෝ තලය මත විවිධ ජාතීන් වශයෙන් ජන කොටස් විසිරී ගිය සැටිත්, ඔවුන්ට වෙන් වෙන් වූ භාෂාවන් හැඩගැසුණු සැටිත් විස්තර කිරීමට ගෙතූ ''සාගා'' වක් ලෙස ''බබෙල් කොත'' හඳුනා ගත හැකි ය.

- මෙම ජනතාව තමන්ට කීර්තිය ලබා ගැනීම සඳහා අහස උසට කොතක් සහිත නගරයක් සාදයි. මෙහි පරමාර්ථය විසිර නොයාමයි. අහස දෙවිවරුන්ගේ වාසභවනය ලෙස එකල මිනිස්සු විශ්වාස කළහ. මිනිසුන් අහස උසට නගින කොතක් ඇති නගරයක් ඔවුන්ටම සාදා ගැනීම යනු මිනිසුන් දෙවියන්ට හිමි ස්ථානය ලබා ගැනීම සඳහා ස්වඋත්සහයෙන් යුහුසුළු වෙන බවත් ප්‍රකාශ කිරීමකි.

- උඩගු මිනිසා තමාට කළ  හැකි හා කළ නොහැකි දේ අතර වෙනස අවබෝධ කර නොගනියි. එම නිසා ඔහු කළුගල් වෙනුවට ගඩොල් ද, හුණු බදාම (සිමෙන්ති) වෙනුවට කීල් (තාර) ද කොත ගොඩනැගීමට භාවිත කරයි. මෙවැනි විශාල කොතක් ගොඩනැගීමට ඒවා කිසිසේත් සුදුසු නැත. ඒවා දුර්වල සනයේ ගොඩනැගිලි අමුද්‍රව්‍යයන් ය. ඒවා භාවිත කිරීම අඥාන ක්‍රියාවලියකි.

- එබැවින් මනුෂ්‍ය එක්තරා ආකාරයකට මෝඩයකු ලෙස ද පෙන්නුම් කෙරේ. පාපය නිසා දෙවියන් වහන්සේට හිමි තැන ලබා ගන්නට උත්සාහ කරන මනුෂ්‍යයා තම ශක්තියෙන් හා බලයෙන් උමතු වී, තමා විසින් ම මාගේ පරමාර්ථයන් නිරර්ථක කර ගන්නා බව මින් පැහැදිලි වේ.

- මනුෂ්‍ය මට්ටමින් අතිවිශාල අහස උසට නගින කොතක් ඇති නගරය දෙවියන් වහන්සේගේ මිම්මෙන් ඉතා සුළු එකකි. ස්වාමීන් වහන්සේට එය දූවිලි කැටයක් මෙනි. එය කෙතරම් කුඩා දැයි පවසන්නේ නම්, දෙවියන් වහන්සේට එය බැලීමට ස්වර්ගයෙන් බැස ඒමට පවා සිදු වේ. (උත්පත්ති 11:15). මේ අනුව බයිබල් කතුවරයා උඩගු මනුෂ්‍යයාව හාස්‍යයට ලක් කර ඇත.

- පාපයේ විපාක ක්ෂණයකින් ම මිනිසා පිට කඩා වැටෙයි. උඩගුවේ ප්‍රතිඵලය භේද හට ගැනීමයි. මිනිසුන් එකතු කරන පොදු මූලධර්මය වන භාෂාව මිනිසුන් අතර අනවබෝධයක් ඇති කරයි. එහෙයින් ඔහුගේ  එදිනෙදා කටයුතු පවා වියවුල් වේ. මනුෂ්‍යයන් අතර පවත්නා පොදු සබඳකම් පවා සුණු විසුණු වී යයි. මනුෂ්‍යයා බලය තර කර ගනු වෙනුවට අසරණ තත්වයට පත් වී ඇත. එකිනෙකාගෙන් ඈත් වේ. ; විසිරෙයි.

- මෙහිදී ඇති වූ වියවුල හැඳින්වීම සඳහා භාවිත කරන වචනය වන්නේ ''බාබෙල්'' යන්නය. යාවේවාදී කතුවරයා එසේ නම් කිරීමට විශේෂ හේතුවක් ඇත. එනම්, මෙම කතා පුවත ''උඩගුවේ'' සංකේතයක් වූ බැබිලෝනියාව පදනම් කරගත් එකක් වන අතර ශුද්ධ බයිබලය බබිලෝනියාව අහංකාර නගරයක් ලෙස හඳුන්වා ඇත. (ජෙරමියා 50:31, යෙසායා 14:3-23).

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර** 1

ප්‍රාග් ඉතිහාසයේ අඩංගු දේවධාර්මික ඉගැන්වීම් පිළිබඳව පහත මාතෘකා ඔස්සේ කතිකාවක් ගොඩනගන්න.

1. ප්‍රාග් ඉතිහාසය පිළිබඳ හැඳින්වීම
2. විශ්වය හා මිනිසා මැවීම පිළිබඳ කතා දෙක (උත්පත්ති 1:1-2:4(අ), 2:4ආ- 25)
3. මිනිසාගේ වැටීම පිළිබඳ කතා හතර (උත්පත්ති 3, 4, 6:1-9:17, 11:1-9)

**ආශ්‍රිත ග්‍රන්ථ :**


1. දසනායක, ජේ. ප්‍රාග් ඉතිහාසය තුළ දේව අනාවරණය, කතෝලික මුද්‍රණාලය, කොළඹ 08, 2010.
2. කතෝලික ධර්මාචාර්ය සහතික පත්‍ර විභාගය අත්පොත, ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය, කොළඹ 08, 2015.
3. ශුද්ධ බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1997.

**නිපුණතාව 2.0 :** දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම 2.3 :** ආදිපීතෘවරුන්ගේ යහපත් ආදර්ශ චරිතායනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව :** 20

**ඉගෙනුම් ඵල**

- ආදිපීතෘ යුගය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ආදිපීතෘවරුන්ගේ ජීවිත ආදර්ශ අනුකරණය කළ යුතු බව පිළිගනියි.
- ආදිපීතෘ යුගය පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දේව කැඳවීමට නිසි ප්‍රතිචාර දක්වයි.
- දෙවියන් වහන්සේ තුළ ජීවිත වෙනසක් අත්දැකීමට අන් අයට සහාය වෙයි.

**විෂය කරුණු පැහැදිලි කරදීමට අත්වැලක් :**

## 2.3.1 ආදිපීතෘ යුගය

- ආදිපීතෘවරු ලෙස සැලකෙන්නේ ගැලවීමේ ඉතිහාසයේ මුල් යුගයේ දී දෙවියන් වහන්සේ විසින් තෝරා ගන්නා ලද පුද්ගලයන් ය. ඒ අය නම් ආබ්‍රහම්, ඊසාක් හා ජාකොබ් ය. ශුද්ධ බයිබලයේ සඳහන් ඉශ්රායෙල් ඉතිහාසය ආරම්භ වන්නේ ද ආදිපීතෘවරුන්ගෙනි. ආදිපීතෘ යුගය ක්‍රි.පූ. 2000-1700 අතර වෙයි.

- ආදිපීතෘවරුන් සංචාරක එඬේරුන් විය. පවුල් නායකයන් මෙන් ම ගෝත්‍ර නායකයන් විය. සංචාරක එඬේරුන් වශයෙන් ආදිපීතෘවරු, දෙවියන් වහන්සේ ඔවුන් ඉදිරියේ තැබූ ඉලක්කය කරා ගමන් ගත්හ. සංචාරක ගමනක් වූ මොවුන්ගේ ඉතිහාසය තම සත්ත්ව රංචුවලට කෑම සොයමින් අරමුණක් නොමැති ව ගිය ගමනක් නොවී ය.

- එය පොරොන්දුවකින් ආරම්භ කර ඉදිරියට යාමකි. එම නිසා ආදිපීතෘවරු දේව කැඳවීමට කීකරු වෙමින් දුෂ්කර හා අනතුරුවලට නිර්භීත ව මුහුණදුන්හ. පොරොන්දුවට ගැළපෙන ලෙස ජීවත්වීමට නොහැකි අවස්ථාවල දෙවියන් වහන්සේ මැදිහත් වී විශ්වාසය තහවුරු කරමින් පොරොන්දු අලුත් කළ සේක.

- ආදිපීතෘවරු ඉශ්රායෙල් ජනතාව දේව ජනතාවක් ලෙස ගොඩනැගීමට පුරෝගාමී වූහ. ඔවුහු ඉතිහාසයේ ක්‍රියා කළ ආකාරයෙන් තම ඇදහිල්ල ප්‍රකාශ කළහ. එම විශේෂ ගුණාංග කිතුනු අපට අද පවා අදාළ වේ.

### 2.3.2 ආබ්‍රහම් තුමාගේ කැඳවීම (උත් 12:1-6)

- ආබ්‍රහම් තුමා හාරාන් දේශයේ සිට කානාන් දේශයට යාම ඇත්ත වශයෙන් ම දෙවියන් වහන්සේගේ කැඳවීම නිසා උන්වහන්සේගේ අභිමතය අනුව සිදුවූවක් බව ස්ථිර ය.

- පරම්පරාගත ඇදහිලි ක්‍රම අනුගමනය කළ ආබ්‍රහම් තුමාට දෙවියන් වහන්සේ ප්‍රකාශ වීම හා කැඳවීම ජුදාඉතිහාසයේ නව යුගයක ආරම්භය විය. එනම්, ප්‍රාග්-ඉතිහාසය තුළ මිනිසා දෙවියන් වහන්සේ අතහැර යාම උච්චස්ථානයට පත් වූ අතර ආබ්‍රහම් තුමාගේ කැඳවීම හා පිළිතුරු දීම සමග නැවත මිනිසා එම ගමන ආපසු හැරවීමේ ක්‍රියාදාමය ආරම්භ කරයි.

- කැඳවීම සම්පූර්ණයෙන් ම නික්මෙන්නේ දෙවියන් වහන්සේගෙන් ය. කැඳවීම ලබන පුද්ගලයාගේ විශේෂ සුදුසුකමක් හෝ විශේෂ ගුණාංගයක් ගැන ශුද්ධ බයිබලයේ සඳහන් නොවේ. හුදෙක් දේව කැමැත්ත මෙහි ස්ථිර ලෙස ප්‍රකාශ වී ඇත.

- දෙවියන් වහන්සේ විසින් ආබ්‍රහම් තුමාට දක්වූ දයාව හා ආදරය මුල්කර ගෙන ආබ්‍රහම් තුමා තෝරා ගන්නා ලදී. කැඳවීම ලබන්නාගේ පෞද්ගලික සුදුසුකමකට වඩා දෙවියන් වහන්සේගේ තෝරා ගැනීම ඒ සඳහා බලපායි.

- දෙවියන් වහන්සේගෙන් නික්මෙන තෝරා ගැනීම හා කැඳවීම සුළු කොට තැකිය නොහැකි ය. එම කැඳවීම පිළිගන්නා එම පිළිගැනීමේ මිල සිය මුළු ජීවිතයෙන් ම ගෙවීමට සූදානම් ව සිටිය යුතු ය. ඔහු තමා අමතක කර දමා දෙවියන් වහනසේ ඉදිරිපත් කරන ජීවිත සැලැස්ම පිළිගැනීමට සූදානම් විය යුතු ය.

- දේව කැමැත්ත පිළිගැනීමෙන් ආබ්‍රහම් තුමාට තමාගේ ජීවිතයේ හා තම පෙළපතේ පැවැත්මට තදින් ම බලපාන ප්‍රධාන ප්‍රශ්න රාශියකට මුහුණදෙන්නට සිදු විය. ඒ සඳහා ඔහුට තම ජන්ම භූමිය අතහැර දමා අන් දේශයකට යාමට සිදුවේ. ගේදොර හා ඥාතීන් අතහැර අලුත් සමාජයක් සොයා යන්නට නියම වේ.

- තම දේශයට ආපසු පැමිණීම ඉතා දුෂ්කර කාර්යයකි. මන්ද ඔහු නොදන්නා වූ මේ ගමන සැතපුම් 800ක් පමණ වේ. සිය ඥාතීන් හා ඉන් පසු කිසිදු සම්බන්ධතාවක් පැවැත්විය නොහැකි ය.

- දුක, සැප, සතුට, වේදනාව බෙදා ගැනීමට ඥාතීන් හා ඇසුර අවශ්‍ය වුව ද ඥාතීන්ගේ සෙවන කොතරම් සුවදායක වුව ද දේව කැඳවීම පිළිගැනීමට නම් ඒ සියල්ල අමතක කොට දෙවියන් වහන්සේ කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තබා මේ ගමන යා යුතු වේ.

- මෙම දේව කැඳවීම තුළ දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට විශ්වාස කළ නොහැකි පොරොන්දු 2ක් දෙන සේක.
  - (1) දේශයක් හිමිකර ගැනීම
  - (2) මහත් ජාතියක් වීම
- තමා සහ තම භාර්යාව දරුවන් ලැබිය හැකි වයස ඉක්මවා ගොස් සිටි නිසාත් තම භාර්යාව වඳ ස්ත්‍රියක් යයි තමා දැන සිටි නිසාත් මෙම ප්‍රකාශය ආබ්‍රහම් තුමාට කිසිසේත් තේරුම් ගැනීමට නොහැකි විය. එහෙත් කිසි පැකිළීමකින් තොර ව ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේ කෙරෙහි තම පූර්ණ විශ්වාසය තබමින් දේව හඬ ශබ්දයට අවනත වෙමින් දෙවියන් වහන්සේ පෙන්වන දේශයට යාමට පිටත් විය.

- තව ද මෙම පොරොන්දු තුළ දෙවියන් වහන්සේ විසින් ''ආශිර්වාදය'' ආසිරි යන වචනය හය වතාවක් භාවිත කරනු ලබයි. පුරාණ ගිවිසුමේ දී මෙවැනි ආශිර්වාදයක් විශේෂයෙන් දානය කරනු ලබන්නේ බවභෝග වර්ධනය, දීර්ඝායුෂ ලැබීම හා දරුඵලෙන් පොහොසත් වීම සඳහා ය.

- ආබ්‍රහම් තුමාට ද දෙවියන් වහන්සේගෙන් මෙවැනි ආශිර්වාදයක් ලැබෙන්නේ එවැනි වර්ධනයක් සඳහා බව පැහැදිලි ය. මෙහි දී දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා මගින් විශාල ජාතියක් ඇති කරන බවට පොරොන්දු වී ඒ සඳහා තම ආශිර්වාදය එතුමාට දානය කරන සේක.

- මේ අනුව බලන කල ආබ්‍රහම් තුමා ගැලවීමේ ඉතිහාසය හා සම්බන්ධ ව දෙවියන් වහන්සේ විසින් තමන් වහන්සේගේ නිදහස් කැමැත්තෙන් තෝරාගනු ලැබූ පළමුවන පුද්ගලයා ය.

- පුරාණ ගිවිසුමේ තෝරාගත් ජනතාවගේ කතාන්දරය මේ අයුරින් ආබ්‍රහම් තුමාගෙන් ආරම්භ වන්නේ විශ්වාසය පදනම් කොට ගෙන ය. ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේගේ කැඳවීම තුළ වූ පොරොන්දු සම්පූර්ණයෙන් විශ්වාස කළේ ය. උන්වහන්සේගේ වචන මිනිස් අවබෝධය මත නොව දේව විශ්වාසය මත පිහිටුවා ආබ්‍රහම් තුමා පිළිගත්තේ ය. ඒ අනුව මහත් කැපවීමෙන් ක්‍රියා කළේ ය. ඒ නිසා ම ආබ්‍රහම් තුමා විශ්වාසයේ පියා විය.

- දෙවියන් වහන්සේගේ කැඳවීම සර්වකාලීන ය; සර්ව භෞමික ය. මේ කැඳවීම හා ප්‍රකාශනය කවර මාර්ගයකින් අනාවරණය වන්නේ ද යන්න අවිනිශ්චිත නමුත් එය සත්‍ය වශයෙන් සිදුවන්නකි. නිදහස් චින්තනයක් ඇති මිනිසාට එම කැඳවීම අවබෝධ කර ගැනීමට හැකි වන ශක්තිය ක්‍රියත්මක වන්නේ දෙවියන් වහන්සේ කෙරෙහි ඇති විශ්වාසය මත ය.

- එය අවබෝධ කර ගත හැක්කේ තර්කයෙන් නොව භාවනාවෙන් හෙවත් දෙවියන් වහන්සේගේ හඬ ශබ්දයට ඇහුම්කන් දීමෙනි. යම් කිසි විශේෂ සේවයක් සඳහා කැඳවනු ලබන පුද්ගලයා තුළ කෙබඳු මිනිස් දුබලකම් ඇති වුව ද ඔහු තුළ ඇති විය යුතු විශ්වාසය, කැපවීම, ධෛර්යය හා ලෞකිකත්වයෙන් හැකිතරම් මිදීම යන ගුණාංගයන් පිළිබඳ ව ශ්‍රේෂ්ට ප්‍රතිමූර්තියක් වශයෙන් එතුමා මනුෂ්‍ය වර්ගයා හමුවෙහි ලොව පවතින තාක් ජීවත් වනු ඇත.

- ආබ්‍රහම් තුමා දෙවියන් වහන්සේ අදහා ගත්තේ ය. එම ඇදහිල්ල නිසා ඔහු ධර්මිෂ්ඨයෙකු බව උන්වහන්සේ පිළිගත් සේක.

## ආබ්‍රහම් තුමා සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම

- ගිවිසුම් ඇති කර ගැනීමේ සම්ප්‍රදාය ඈත අතීතයේ සිට මිනිසුන් අතරත්, පවුල් අතරත්, රාජ්‍යයන් අතරත් පැවති සිරිතකි. බාහිර ඉතිහාසයේ පමණක් නොව ගැලවීම් ඉතිහාසය තුළ ද එය ඉතා වැදගත් හා අර්ථාන්විත සාධකයකි.

- ආබ්‍රහම් තුමා සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම උන්වහන්සේ මිනිසා සමග ඇති කරගත් තෙවෙනි ගිවිසුම වේ.
  1. ආදම් සමග
  2. නෝවා සමග
  3. ආබ්‍රහම් සමග
- මේ අනුව යාවේ හා පූජක යන සම්ප්‍රදායන් දෙක ම ආබ්‍රහම් සමග දෙවියන් වහන්සේ කළ ගිවිසුම සඳහන් කරන අතර ම කතුවරුන් දෙදෙනා ම එම ගිවිසුමේ සඳහන් කරන වැදගත් කරුණු දෙකකි.
  1. අසංඛ්‍ය වූ දරු පරපුරක් (උත් 15:5, 17:5)
  2. ඔවුන්ට සදාකාලික ව හිමි වන දේශයක් (උත් 15:21,17:8)

- දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග ඇති කරගත් ගිවිසුමට දක්වන විශ්වාසවන්ත බව සංකේතවත් කිරීමට පුරාණ මිනිසාට ඉතා සමීප, ඉතා සුපුරුදු පිළිවෙතක් උපයෝගී කරගත් සේක (උත් 15:9-12). එනම්, තෝරාගත් සිවුපාවුන් දෙකඩ වනසේ කපා, එලෙස දෙපලු කරන ලද කොටස් මුහුණට මුහුණලා තබා ගිවිසුමට සම්බන්ධ දෙපාර්ශ්වය ඒ මැදින් ගමන් කිරීම ය.

- මෙම ගිවිසුමේ දී තෝරාගත් සිව්පාවුන් වන්නේ, තුන්අවුරුදු වැස්සියක්, තුන්අවුරුදු එළුදෙනක් හා තුන්අවුරුදු බැටළුවෙකි. එයට අමතර ව කොබෙයියකු හා පරෙවි පැටවකු ද යොදාගත් අතර ඔවුන් ව දෙපලු නොකරයි. ඔවුන්ගෙන් යමෙකු ගිවිසුම කඩකළහොත් ඔවුන් ට ද එම සතාට හිමි වූ ඉරණම ම (මරණය) හිමි වන බව නියම ව තිබිණි.

- උත්පත්ති 15:17හි සඳහන් ''දුම් නගින උදුනෙන්'' හා ''දිළිසෙන ගිනිහුළෙන්'' සංකේතවත් කරන්නේ දෙවියන් වහන්සේ ය (නික් 19:18). එහි දී දෙවියන් වහන්සේ පමණක් දෙපළු කරන ලද සතුන් මැදින් ගමන් කරන සේක. ආබ්‍රහම් තුමා ගමන් නොකරයි. ඒ අනුව, දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට දුන් පොරොන්දු ඉටු කිරීමේ වගකීමෙන් බැඳෙන අතර ආබ්‍රහම් තුමාගේ පාර්ශ්වයෙන් කිසිදු වගකීමක් නැත.

- යාවේ සම්ප්‍රදායට අයත් උත්පත්ති 15 පරිච්ඡේදයේ දී දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමා සමග එළඹී ගිවිසුමේ දී ආබ්‍රහම් තුමාගේ පාර්ශ්වයෙන් කිසි ම බැඳීමක් නැත. එහෙත් පූජක සම්ප්‍රදාය උත්පත්ති 17 වන පරිච්ඡේදයෙහි ඉදිරිපත් කරන ගිවිසුමේ දී නව සම්බන්ධතාවේ ලකුණක් ලෙස ආබ්‍රහම් තුමාගේ හා සාරාගේ නම් වෙනස් කරයි. එමෙන් ම ආබ්‍රහම් තුමාට හා එතුමාගෙන් පැවතෙන පරම්පරාවට සදාචාරාත්මක, ආගමික හා චාරිත්‍රමය වගකීම් පැවරේ.

- ඒ අනුව සදාචාරාත්මක වශයෙන් දෙවියන් වහන්සේට කීකරු වී නිදොස් ව සිටීමටත් ආගමික වශයෙන් එතුමාගේ හා එතුමාගෙන් පැවත එන පෙළපත දෙවියන් වහන්සේ පිළිගැනීමටත්, චාරිත්‍රමය වශයෙන් සියලු පිරිමින් චර්මඡේදනය කළ යුතු බවටත් නියෝග පැනවේ.

- පිරිමින් චර්මඡේදනය කිරීම මිසරයේ මෙන් ම පලස්තීනයේ ද පැවතුණු ඉපැරණි සිරිතකි. එය විවාහයට පෙර පැවැත්වුණු චාරිත්‍රයක් මෙන් හෝ වැඩිවිය පැමිණීමේ චාරිත්‍රයක් මෙන් හෝ සෞඛ්‍යය හේතූන් මත සිදුකරන චාරිත්‍රයක් මෙන් හෝ සලකන ලදි. තව ද නොඅඩා වේදනාව දරා ගනිමින් තම නිර්භීතකම ප්‍රකාශ කිරීමට ඇති හැකියාව ප්‍රදර්ශනය කරන අවස්ථාවක් ලෙස ඊජිප්තුවන් එය සලකන ලදී.

- එහෙත් මෙහි දී එම බාහිර චාරිත්‍රය පළමුවරට මැදපෙරදිග ඉතිහාසය තුළ ආගමික අර්ථකථනයක් ලබයි. එය දෙවියන් වහන්සේට කැප කිරීමේ චාරිත්‍රයක් බවට පත්වේ. එහෙයින් ආබ්‍රහම් තුමා හා දෙවියන් වහන්සේ අතර ගිවිසුමේ බාහිර ලකුණ වන්නේ චර්මඡේදනයයි.

- ආබ්‍රහම් තුමාගෙන් පැවත ආ පිරිමි දරුවන්ට එය අනිවාර්ය වේ. මෙය ප්‍රසාද ස්නාපනයේ පෙරනිමිත්තක් ලෙස ද සැලකේ. එදා එම චාරිත්‍රය ඉශ්රායෙල් ජනතාව දෙවියන් වහන්සේට කැපවීමේ සළකුණක් ලෙස සලකනු ලැබිණි. එපමණක් ද නොව එය විශේෂ දේව කැඳවීමේ සලකුණකි.

**ආබ්‍රහම් තුමාගේ විශ්වාසය**

- ආබ්‍රහම් තුමාගේ විශ්වාසගේ ගමන උත්පත්ති පොතේ දොළොස්වන පරිච්ඡේදයෙන් ආරම්භ වී විසිදෙවන පරිච්ඡේදයේ දී උච්චස්ථානයට පැමිණේ. මෙම පරිච්ඡේද දෙකෙහි සමානතා කීපයකි.
   (1) දෙවියන් වහන්සේ පෙන්වන දේශයට යාමට අණ ලබයි (උත් 12:1). මොරියා දේශයට යාමට අණ ලබයි (උත් 22:2).
   (2) ආබ්‍රහම් තුමාගේ මව්බිම, නෑදැයින් හා පියාගේ ගෘහය අත්හැරීමට නියෝග ලබයි. (උත් 12:1) ආබ්‍රහම් තුමා ප්‍රේම කළ තම එක ම පුතා අත්හැරීමට (දවන යාග පූජාවක් මෙන් ඔප්පු කිරීමට) නියෝග ලබයි (උත් 22:2).
   (3) දෙවියන් වහන්සේ පෙන්වන දේශයට යෑමෙන් තම පියාණන් අවසන් වරට දැකීමට හේතුව වේ. තම එක ම පුත්‍රයා දවන යාග පූජාවක් මෙන් ඔප්පු කිරීමෙන් අවසන් වරට දැකීමට හේතු වේ.
   (4) අවස්ථා දෙකේ දී ම දෙවියන් වහන්සේගෙන් ආබ්‍රහම් තුමා ආසිරි ලබන අතර, එතුමාගෙන් විශාල ජාතියක් ඇතිවන බවට පොරොන්දු ලබයි (උත් 12:2, 22:17).

- මෙම විශ්වාසයේ ගමන තුළ ආබ්‍රහම්තුමාට ඉතා වේදනාකාරී හා අපහසු තීරණ රාශියක් ගැනීමට සිදු වුණි. එහෙත් දෙවියන් වහන්සේට පක්ෂපාතී ව හා විශ්වාසවන්ත ලෙස එතුමා නොපැකිලී එම තීරණ ගෙන ක්‍රියාත්මක කළේ ය.

- ආබ්‍රහම් තුමා හාරාන් දේශයෙන් පිටවී අවුරුදු 25ක් ද ඉශ්මායෙල් උපත ලබා අවුරුදු 13ක් ද ගත වී ඇත. දෙවියන් වහන්සේ තම පොරොන්දු ඉටු කරමින් ආබ්‍රහම් තුමාගේ මහලු වයසේ දී ඔහුට පුත්‍ර රත්නයක් දෙන ලදි.

- එහෙත් ආබ්‍රහම් තුමාට විශාල අභියෝගයකට මුහුණදීමට සිදු වේ. එනම්, සිය එක ම දරුවා වූ තමා ප්‍රේම කළ ඊසාක් ව දවන යාගයක් වශයෙන් දෙවියන් වහන්සේට පූජා කිරීමට අණ ලබයි. මෙවැනි නියෝගයක් ලබන්නේ නැවත තව දරුවෙකු ලැබීමක් කෙරෙහි බලාපොරොත්තුවක් තැබිය නොහැකි තත්ත්වයක ය.

- මෙය දෙවියන් වහන්සේ කෙරෙහි ආබ්‍රහම් තුමා තැබූ විශ්වාසය හා ඔහුගේ අනාගත බලාපොරොත්තු සියල්ල මුලිනුපුටා දමන තරම් දැඩි දේව නියෝගයක් විය. ආබ්‍රහම් තුමාට මෙය ඇදහිය නොහැකි තරම් ගැටලුවක් වුව ද දෙවියන් වහන්සේට කීකරු වී තම දරුවා පූජා කිරීමට සැරසුණි (උත් 22:9-12).

- ආබ්‍රහම් තුමාගේ ඇදහිල්ලේ ජීවිතය උරගා බලන දෙව් සමිඳාණන් වහන්සේ ඊසාක් දවන යාග පූජාවක් මෙන් තමන් වහන්සේට ඔප්පු කරන ලෙස ආබ්‍රහම් තුමාට දක්වයි. ආබ්‍රහම් තුමා දේව නියමයට අවනත වෙයි. එහෙත් මේ පුවත අවසාන වන්නේ ''ආබ්‍රහම්, ආබ්‍රහම් ........... ළමයාට අත නොගසන්න, ඔහුට කිසි අනතුරක් නොකරන්න, ඔබේ පුත්‍රයා ඔබේ එක ම පුත්‍රයා පූජා කිරීමට තරම් ඔබ දේව ගරු බිය ඇත්තෙකු බව මට දැන් පෙනේ' යයි යනුවෙන් දෙවියන් වහන්සේ විසින් කරනු ලැබූ ප්‍රකාශකයෙකි (උත් 22: 11-12).

- දෙවියන් වහන්සේ මහා බේදවාචකයකින් ඊසාක් මුදවා ගත්තා පමණක් නොව යාගයට සුදුසු බැටළුවෙකු ද ආබ්‍රහම් තුමාට දුන් සේක.

- මොලෙක් දෙවියන්ට ළමයින් පූජා කිරීම එකල තිබූ පැරණි සිරිතකි. මෙම ළමා මිනිස් යාග දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන බව උත්පත්ති විසිදෙවන පරිච්ඡේදයෙන් ඉතා මැනවින් පැහැදිලි වේ. ඇත්ත වශයෙන් ම දෙවියන් වහන්සේට වුවමනා වූයේ ඊසාක්ගේ මරණය නොව ආබ්‍රහම් තුමාගේ විශ්වාසයයි.

- ආබ්‍රහම් තුමා තුළ වූ මහා විශ්වාසය, බලාපොරොත්තුව, සැබෑ ප්‍රේමය, ඉවසීම, දැඩි කීකරුකම හා අචල අධිෂ්ඨානය පිළිබඳ ආදර්ශයන්ගෙන් එතුමාගේ මුළු ජීවිත කාලය ම පිරී ඇත. දේව අනුමැතිය අනුව ක්‍රමෙන් ඔහු තුළ වැඩී ගිය මෙම උතුම් ගුණාංග සමුදාය නිසා දෙවියන් වහන්සේගේ විශේෂ සැලකිල්ලට භාජනය විය.

- ආබ්‍රහම් තුමා ජීවත් වූ මුළු කාලය අවුරුදු 175කි. මෙසේ ඔහු දීර්ඝායු වළඳා මහලු වයසේ දී අවසන් හුස්ම හෙලා අපවත් විය. ඊසාක් හා ඉශ්මායෙල් මක්පේලාහි ගුහාවෙහි එතුමා ව භූමදාන කළහ (උත් 25:9).

### 2.3.3 ඊසාක් තුමා

- දෙවියන් වහන්සේ තම පොරොන්දුව ඉටු කළ සේක. සාරා ආබ්‍රහම් තුමාට දාව පුත්‍රයකු ලැබිණි. ඔහු ඊසාක් ය. '' ඊසාක්ට වයස දින 08ක් වූ කළ දේව අණපරිදි ආබ්‍රහම් තුමා ඔහුව චර්මඡේදනය කළේ ය. ඊසාක් උපදින විට ආබ්‍රහම් තුමාට වයස අවුරුදු 100කි. දරුවා වැඩී කිරි වැරුවේ ය. එදින ආබ්‍රහම් තුමා මංගල්‍යයක් පැවැත්වී ය (උත් 21:4,5,8).

- ඊසාක් අවංක, කීකරු දරුවෙක් බවත්, ජාතික චාරිත්‍රවලට ගරු කරමින්, තම පියා වූ ආබ්‍රහම්ට අවනත ව ජීවත් වූ බවත් ශුද්ධ ලියවිල්ල පෙන්වා දෙයි.

- බාල කාලයේ දී තමන් මරා දැමීමට (යාගයක් මෙන් පූජා කිරීමට) තැත් කළ තම පියාගෙන් ඔහු කිසිවිටෙකත් පළිනොගත්තේ ය. මෙය ඊසාක්ගේ හොඳ මිනිස් ගුණයකි. තම මව්පියන්ගේ අනුමැතිය පරිදි අවුරුදු 40 දී ඊසාක් රෙබෙකා නමැති තැනැත්තිය තම බිරිය කොට ගෙන ඇය සමග සාමයෙන් ජීවත් විය (උත් 24: 67).

- ඊසාක්ට තම වසන ප්‍රදේශයේ කානානීය යුවතියක සරණ පාවා ගත නොහැකි ය. එසේ කළහොත් එය කරණ කොට ගෙන ආබ්‍රහම් තුමාගේ පෙළපත කෙලෙසී ගොස් පොරොන්දුව නිරර්ථක වීමට ඉඩ ඇත. එම නිසා ආබ්‍රහම්තුමාගේ මෙහෙකරුවා මෙසපොතේමියාවට (හාරාන් දේශයට) යවා ආබ්‍රහම් තුමාගේ සහෝදරයාගේ මිනිබිරිය වූ රෙබෙකා ඊසාක් හට තෝරා දෙයි.

- ඊසාක් ජේසුස් වහන්සේගේ පූර්ව සලකුණකි. ජේසුස් වහන්සේ තමන් ව කුරුසපත් කිරීමට නියමිත කුරුසිය උසුලා ගෙන ගියා සේ ඊසාක් තුමා දවන යාග පූජාවක් සේ ඔප්පු කිරීම සඳහා දර සෑයට අවශ්‍ය දර උසුලා ගෙන මොරියා දේශයේ දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට පෙන්වූ කන්ද නැග්ගේ ය. මොහුගේ අහිංසකත්වය හා අවනතභාවය නිසා ''දුක් විඳින සේවකයාගේ '' ස්වරූපය ගනියි.

- ඊසාක්ගේ බිරිඳ වූ රෙබෙකා ද ආබ්‍රහම්ගේ බිරිඳ වූ සාරා මෙන් ම වඳ ස්ත්‍රියකි. එහෙත් දේව නියමය අනුව ඇය නිවුන් දරු දෙදෙනෙකුගේ මවක් වූවාය. ඔවුන් අතර වැඩිමලා බාලයාට මෙහෙකරනු ඇතැයි දෙවියන් වහන්සේ දැන්වූ සේක (උත් 25:19-26). එයින් වැඩිමලා ඒදොම්වරුන්ගේ පියා වූ ඒසව් ය. බාලයා ඉශ්රායෙල්වරුන්ගේ ආදි පියා වූ ජාකොබ් ය.

**ගිවිසුම අලුත් කිරීම (උත්. 26:19-25)**

- ඊසාක් ගෙරාර්හි මිටියාවතෙහි තම කඳවුරු පිහිටුවා, එහි පදිංචි ව සිටින විට ඔහුගේ මෙහෙකරුවන් මෙම මිටියාවතේ ළිං කණින විට ඔවුන්ට එහි දිය උල්පත් සහිත ළිඳක් සම්බ විය. එහෙත් ගෙරාර්හි ගොපල්ලෝ, ''මේ වතුර අපගේ ය'' කියමින් ඊසාගේ ගොපලුන් සමග රණ්ඩු කළ හ. ඔවුන් ඔහු සමග මෙලෙස කලහ කළ බැවින් ඒ ළිඳට ''ඒසෙක් '' යන නම ඔහු දුනි.

- ඔවුන් තවත් ළිඳක් කැණූ විට ගොරාර්හි ගොපල්ලෝ ඒ ගැන ද රණ්ඩු කළ හ. එබැවින් ඊට ''සින්නා'' යි නමදුනි.

- ඉන්පසු එතැනින් නික්ම ගොස්, තවත් ළිඳක් කැණීය. එහෙත් ඒ ගැන ඔවුන් කලහ නොකළ බැවින් එය ''රෙහොබොත්'' යන නමින් හැඳින්විය.

- ළිඳ මෙසේ හඳුන්වා, ''දැන් ඉතින් සමිදාණන් වහන්සේ අපට මේ රටෙහි ඉඩකඩ දුන් සේක. අපි මේ රටේ සමෘද්ධ වන්නෙමු''යි කී ය. පසු ව ඊසාක් බෙයර්ෂෙබාවට ගියේ ය. එම රාත්‍රියෙහිම ස්වාමීන් වහන්සේ ඔහුට දර්ශනය වී, මෙසේ වදාළ සේක. ''නුඹ පිය ආබ්‍රහම්ගේ දෙවිදාණෝ මම ය. බිය නොවන්න. නුඹ සමඟ ද මම සිටිමි. නුඹට ආසිරි දෙමි. මාගේ දාසයා වන ආබ්‍රහම් නිසා, නුඹේ පෙළපත මම වැඩි වර්ධනය කරමි'' (උත් 26:24).

- ඊසාක් ද එහි පූජාසනයක් ඉදිකොට, ස්වාමීන් වහනසේගේ නාමය කියා යාච්ඤා කළේ ය. තව ද එහි ඔහු කඳවුර පිහිටුවී ය (උත් 26:23-25).

- මෙලෙස දෙවියන් වහනසේ ආබ්‍රහම් තුමන් මගින් ඇති කර ගත් ගිවිසුම ඊසාක් මගින් අලුත් කළ සේක. දෙවියන් වහන්සේ ඔවුන් මගින් ඉශ්රායෙල් ජනතාවට ආරාධනා කළේ උන්වහන්සේ හා සමග සමීප ජීවිතයක් ගත කිරීමට ය.

### .3.4 ජාකොබ් තුමා

- ජාකොබ් තුමා කපටි පුද්ගලයෙක් විය. තම සොයුරු එසව් වඩා ක්‍රියාශීලි විය. තම පියාණන් වූ මහලු ඊසාක් රවටා, වැඩිමල් දරුවාට අයත් වූ ආශිර්වාදය ලබාගත් සැටි උත්පත්ති 27හි දක්වෙයි.

- එපමණක් ද නොව වැඩිමලා වූ ඒසව් සිය ජන්ම උරුමය ජාකොබ්ට විකුණූ බව ද (උත් 25:27) දක්වෙයි. ඒසව්ට අයත් වූ ''පිය ආශිර්වාදය '' තමා ලබාගත් හෙයින්, ජාකොබ්ට සිදු වූයේ ගෙදරින් පලා යාමට ය. තම මෑණියන්ගේ උපදෙස් අනුව කටයුතු කළ ජාකොබ් හාරාන්හි තම මාමා වූ ලාබන් වෙත පලා ගියේ ය (උත් 29:1-14).

- ලාබන්ගේ නිවසෙහි නතර වූ ජාකොබ්, සත් අවුරුද්දක් ඔහු යටතේ වැඩකර, ලාබන්ගේ දුව වූ ලෙයා සරණ පාවා ගත්තේ ය. ඉන් පසු තමත් සත් වසරක් වැඩ කර රූමත් බාල දියණිය වූ රාකෙල් ව ද බිරිඳ කොට ගත්තේ ය (උත් 29:15-30).

- ජාකොබ්ට විශාල දරු සම්පතක් ලැබිණි. ලෙයා නමැති බිරිඳගෙන් රූබන්, සිමියොන්, ලෙවී, ජුදා, ඉස්සාකර්, සාබුලොන් යන පුතුන් සය දෙනා ද, දීනා නමැති දුව ද ලැබිණි.

- රාකෙල්ගේ සේවිකාව වූ බිල්හාගෙන් දාන්, නප්තලී නමැති පුතුන් දෙදෙනා ද ජාකොබ්ට ලැබිණි.

- ලෙයාගේ සේවිකාව වූ ශිල්පාගෙන් ගාද් හා ආෂෙර් යන පුතුන් දෙදෙනා ලැබිණි.

- රාකෙල්ගෙන් ජෝසෙප් හා බෙන්ජමින් යන පුතුන් දෙදෙනා ලැබිණි.

- මෙලෙස ජාකොබ් පුත්‍රයන් දොළොස් දෙනෙකුගේ පියාණන් බවට පත් විය. මොවුන් අතරින් ජාකොබ් වඩාත්ම ඇලුම් කළේ ජෝසෙප්ට ය.

- එයට පහත හේතු බලපෑවා විය හැකි ය.
  (1) ජාකොබ් වඩාත් ම ප්‍රිය කළ භාර්යාව වන රාකෙල්ගේ පුත්‍රයා ජෝසෙප් වීම.
  (2) සිය මහලු වියේ දී ලද පුත්‍රයා වීම.
  (3) සොයුරන් ගැන සොයා බැලීම.
  (4) දෙවියන් වහන්සේගේ විශේෂ බැල්මක් ජෝසෙප්ට ඇති බව ජාකොබ්ට පෙනීයාම.

- ජාකොබ්ගේ පුත්‍රයන් දොළොස් දෙනාගෙන් පැවත ආ ගෝත්‍ර දොළොසෙන් ඉශ්රායෙල් ජනතාව ඇති විය. එම නිසා ගැලවීමේ ඉතිහාසයෙහි ජාකොබ් තුමාට විශේෂ ස්ථානයක් හිමි වෙයි.

### ගිවිසුම අලුත් කිරීම (උත් 28:10-22)

- බෙතෙල් නමැති ස්ථානයේ දී ජාකොබ් තුමා පුදුම සිහිනයක් දුටුවේය (උත් 28:10-22). ආබ්‍රහම් විසින් දෙවියන් වහන්සේ අත්දුටු ස්ථානය හෙබ්‍රොන් ය. ඊසාක් තම අත්දැකීම් ලැබුවේ බෙයර්ෂෙබාහි දී ය.

- එසේ ම ජාකොබ් තුමා තම අනාගතය පිළිබඳ ව දේව සැලැස්ම තේරුම් ගත්තේ බෙතෙල්හි දී ය. එහි අර්ථය ''දෙවියන් වහන්සේගේ ගෘහය'' යනුයි. දෙවියන් වහන්සේ ආබ්‍රහම් සමග ඇති කරගත් ගිවිසුම ජාකොබ් මගින් බෙතෙල්හි දී අලුත් කළේ ය (උත් 28:10-22).

- ජාකොබ් පලා යන රාත්‍රියේ දී බෙතෙල්හි දී සිහිනයක් දුටුවා පමණක් නොව කැඳවීමක් ද ලැබී ය. මෙම කැඳවීමේ පොරොන්දු 2කි.
  1. දෙවියන් වහන්සේ එම දේශය හිමිකර දෙන බව
  2. ඔහුගේ පෙළපත ඉතා විශාල වී පැතිර යන බව

### ජීවිත වෙනස (උත් 32:22-30,33:3)

- බලාපොරොත්තු විරහිත තත්ත්වයක සිටිය දී ජාකොබ්ට දර්ශනය වී ඔහු ව දිරිගැන්වූ දෙවියන් වහන්සේ මෙවර ඔහු වෙත එන්නේ සම්පත්වලින් ආඪ්‍ය වූ අවස්ථාවක, රාත්‍රියක එන අමුත්තෙකුගේ ස්වරූපයකිනි.

- පෙනුයෙල් නමැති ස්ථානයේ දී ජාකොබ් තුමා දේව දූතයෙකු සමඟ පොරබැදූ බව උත්පත්ති 32:22-32හි දක්වන බයිබල් කතුවරයා ජාකොබ් තුමා ලැබූ විශේෂ ශුද්ධාත්ම ශක්තියක් පෙන්නුම් කරයි.

- දේවදූතයා සමඟ පහන් වනතුරු පොර බැඳූ ජාකොබ් තුමා ඔහුට යන්නට දුන්නේ ආශිර්වාදය ලබා ගැනීමෙන් පසු ව ය. මෙතෙක් ජාකොබ් නමින් පෙනී සිටි පුද්ගලයා එතැන් සිට ''ඉශ්රායෙල්'' නම් විය.

- ජාකොබ් දෙවියන් වහන්සේ ව මුහුණට මුහුණලා දුටු පසුත් ඔහුගේ ජීවිතය ආරක්ෂා වී ඇතැයි පවසමින් ජාකොබ් එම ස්ථානයට පෙනුයෙල් යයි නම තැබී ය. මෙම සිද්ධියෙන් පසු ව ජාකොබ් තම සොහොයුරා වූ ඒසව් සමග සමගි විය.

- ආබ්‍රහම්, ඊසාක් හා ජාකොබ් යන ආදී පීතෘවරු මගින් ගැලවීමේ ඉතිහාසය ආරම්භවීමත්, යාවේ දෙවියන් වහන්සේව හඳුනාගෙන උන්වහන්සේට පමණක් වන්දනා කිරීමටත් යොමුවිය.

- සංස්කෘතික වශයෙන් දියුණුවීම, එඬේර ජීවිත ක්‍රමයට පුහුණුවීම, සතුරු උවදුරුවලින් ආරක්ෂාවීම, ගෝත්‍රික සාමය ඇති කිරීම, ටිකින් ටික දැහැමි ජනතාවක් බවට පත්වීම යනාදිය ආදිපීතෘවරුන් මගින් ජනතාවට වූ සේවය ලෙස දැක්විය හැකි ය.

- දෙවියන් වහන්සේ ඊසාක්, ජාකොබ් වැනි නායකයන් තෝරා ගත්තේ, ඔවුන්ගේ ශුද්ධවන්තකම නිසාම නොවේ. තමන් වහන්සේගේ ප්‍රේමය නිසා ය.

- ප්‍රේමයෙන් හඬගසන දෙවියන් වහන්සේට ප්‍රේමයෙන් ප්‍රති උත්තරදීම ඉශ්රායෙලුන්ට අභියෝගයක් විය. ඊට මුහුණදීමේ හැකියාව ජනිත කරවනු වස් ආදිපීතෘවරු සිය ජනතාවට උපදෙස් දුන් හ. ඔවුහු තම ජීවිත ආදර්ශවත් ලෙස ගත කළ හ. අප ද ආදිපීතෘවරු මෙන් ජීවත්වීමට කටයුතු කරමු.

**ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

**පියවර** 1

ආදි පීතෘ යුගය පිළිබඳ ව පහත මාතෘකා ඔස්සේ කතිකාවක් ගොඩනගන්න.

1. ආදි පීතෘ යුගය සඳහා කෙටි හැඳින්වීම
2. ආබ්‍රහම්ගේ කැඳවීම (උත්පත්ති 12:1-6);
   ගිවිසුම (උත් .15:1-21,17:1-14);
   විශ්වාසය (උත් .12,24)
3. ඊසාක් හැඳින්වීම (උත්. 21:2-5);
   ගිවිසුම අලුත් කිරීම (උත්පත්ති 26:19-25)
4. ජාකොබ් හැඳින්වීම
   ගිවිසුම අලුත් කිරීම (උත්. 28:10-22)
   ජීවිත වෙනස (උත්.32:22-30,33:3)

**මූලාශ්‍ර**


1. ශු. බයිබලය අධ්‍යයන පිටපත (පුරාණ ගිවිසුම 1), ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 1997
2. මෙන්ඩිස් එම්.,පංච පුස්තකය ගැන, නි.ම.නි.සන්නිවේදන මධ්‍යස්ථානය, මීනුවන්ගොඩ, 1996
3. ශු. බයිබලය, ශ්‍රී ලංකා බයිබල් සමාගම, කොළඹ 03, 2006.
4. ප්‍රනාන්දු සී. දහම් දියඹ, ශු.ජුසේවාස් දේව ධර්ම නිකේතනය, කොළඹ 08,2006- දෙසැම්බර්
5. BROWN, R.E.,FITZMYER, J.A.& MURPHY, R.E.,Jerome Biblical Commentory,st.Peter's seminary, Bangalore, 1982.

**නිපුණතාව** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම 2.4** : එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දැකීමට නික්මයාම සිද්ධිය පිටිවහලක් කරගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 30

**ඉගෙනුම් ඵල**

- නික්මයාම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- විශ්වාසය තුළ දේව ආදරය හා රැකවරණය අත්දැකිය හැකි බව පිළිගනියි.
- නික්මයාම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- එදිනෙදා ජීවිතය තුළ දිව්‍ය සංරක්ෂණය අත්දකියි.
- අන් අයගේ සුරක්ෂිත බව වෙනුවෙන් කැපවෙයි.

## මිසරයේ වහල් මෙහෙවර හා මෝසෙස් තුමාගේ උපත (නික්මයාම 1 හා 2 පරිච්ඡේද)

මිසරයට පැමිණි ජාකොබ්ගේ පරපුරට අයත් පිරිස හැත්තෑදෙනෙකි. වරප්‍රසාද ලත් ජන කොටසක් ලෙස ජීවත් වූ මොවුහු කල්යාමේ දී සමෘද්ධිමත්, බලවත් ජාතියක් ලෙස වර්ධනය විය (නික් 1:1-7). මෙයින් පෙන්නුම් කෙරෙනුයේ දෙවියන් වහන්සේ ආබ්‍රහම් තුමාට දුන් පොරොන්දුව ඉටු කර ඇති බව ය (උත්පත්ති 12:2).

''එකල ජෝසෙප් ගැන කිසිවක් නොදත් අලුත් රජෙක් සිංහාසනාරූඪ විය'' (නික් 1:8). මෙම රජතුමා ක්‍රි.පූ. 1290-1224 පමණ කාලයේ මිසර පාලකයා වූ 19වන පාරාවෝ රාජ පරම්පරාවට අයත් රාම්සෙස් බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. මෙසේ නව රජතුමා ලෙස හඳුන්වනු ලබන රාම්සෙස් කරුණු තුනක් මුල්කරගෙන ඉශ්රායෙල් ජනතාව පිළිබඳ බියෙන් පසුවූ බව දක්වේ.

1. ඉශ්රායෙල් ජනතාව ක්‍රමයෙන් ගණනින් වැඩිවීම.
2. යුද්ධයක් ඇතිවුවහොත් ඉශ්රායෙල් ජනයා සතුරන් හා එක්වීමට බොහෝ ඉඩකඩ ඇති වීම.
3. තම නව අගනුවර ගොඩනැගීමට මිනිස් ශ්‍රමය අවශ්‍ය වීම.

### මිසරයේ වහල් මෙහෙවර

ඓතිහාසික වාර්තා අනුව මේ යුගයේ දී මිසරයේ ගෘහ නිර්මාණ ශිල්පය, වාස්තු විද්‍යාව, කලාව, සාහිත්‍යය, වාණිජ්‍යය, රණකාමීත්වය ඉතා දියුණුව පැවති අතර කෘෂිකර්මාන්තය හා වාරි කර්මාන්තය පිළිබඳ උසස් තාක්ෂණ දැනුමක් ද විය.

එසේ ඉශ්රායෙල් ජනයා පීඩා විඳීම මධ්‍යයේ වැඩි වර්ධනය වූහ. තවද රජ තෙමේ ඉශ්රායෙල් ජනතාවගේ වර්ධනය මර්ධනය කිරීමට ක්‍රියා කළ ආකාරය ද දැකිය හැක.

1. ඉසිලිය නොහැකි බර වැඩ ගැනීම (නික්මයාම 1:11-14)

ඉශ්රායෙල් ජනයා පාරාවෝ සඳහා පීතොම් සහ රාමසෙස් යන ගබඩා නගර ගොඩනැගුහ. කුඹල් කර්මාන්තය, ගඩොල් කර්මාන්තය හා කෙත්වල විවිධ කෘෂිකර්මාන්ත වැනි

දරුණු වහල් මෙහෙවරෙන් ඔවුන්ගෙන් බලහත්කාරයෙන් වැඩ ගත් අතර දැරිය නොහැකි තත්වයට පත් කළහ.

2. තිඹිරිගෙයිදීම පිරිමි දරුවන් මරා දැමීම (නික්මයාම 1:15-16)

3. පිරිමි දරුවන් නයිල් ගඟට විසි කිරීම (නික්මයාම 1:22)

මෙවැනි ඓතිහාසික පසුබිමක මෝසෙස් තුමා උපත ලැබීය.

- මෝසෙස් ලෙවී ගෝත්‍රයට අයත් ය.

- පියා අම්රාන් වූ අතර මව ජොකෙබෙද් ය.

- ඔහුගේ සහෝදරයා ආරොන් ය. ඔහු ද ලෙවී ගෝත්‍රයට අයත් ය. සහෝදරිය මීරියම් ය.

- ඉශ්රායෙල් ජනයාගේ මිදුම්කරු වූ මෝසෙස් තුමාගේ උපත හා හැදී වැඩීම තුළ දිව්‍ය සංරක්ෂණය මනාව පිළිබිඹු වේ.

- කුඩා කල තම මවගේ ම ඇසුරේ හැදී වැඩුණු ඔහු පසු ව රජ මාලිගයේ දී පාරාවෝගේ දියණිය හදාවඩා ගැනීමත්, තම ජාතීන්ගේ සතුරා වන පාරාවෝගේ සියලු සැප සම්පත් මැද හැදී වැඩීමට සැලසීමත්, ඇය විසින් ඔහුට නම් තැබීමත් **''මම ඔහු වතුරෙන් ගොඩ ගතිමි'' යි කියා ඔහුට මෝසෙස් යන නම තැබීම** (නික් 2:10) හේතුවෙන් රජවාසල තුළ හැදීවැඩීමෙන් රාජකීය මට්ටමේ අත්දැකීම් ලබන්නට ඇත.

- තව ද විශාරදයන් පෙන්වා දෙන පරිදි මෝසෙස් යන නාමය පැරණි මිසර දේශයේ භාවිතා වූ නමක් ලෙස පැවති බව ද පෙන්වා දෙති.

- රජවාසල තුළ මෝසෙස් තුමාගේ හැදී වැඩීම පසුකලක දී පාරාවෝ ඉදිරියේ පෙනී සිටීමට හැකිවන්නට ඇත.

- මෙම සිදුවීම් තුළින් පෙන්නුම් කරන වැදගත් ම කැරුණ වනුයේ පාරාවෝ ඉදිරිපිට මැදහත්කරුවකු ලෙස පෙනී සිටීමේ කාර්යය සඳහා මෝසෙස් තුමාව දෙවියන් වහන්සේ සූදානම් කළ ආකාරයයි.

- රජවාසලේ හැදී වැඩුණ ද ඔහු තම ලේ නෑකම අමතක නොකළේ ය. හෙබ්‍රෙව් වැසියෙකුට පහර දුන් මිසර වැසියා මරා දැමීම තුළින් එය පිළිඹිබු වේ.

- තව ද පාරාවෝගේ උදහසින් මෝසෙස් පලායාම හා මිදියන් දේශයට පැමිණීම,

- පූජක ජෙත්රෝ වෙතට යාම, ඔහුගේ දියණියක වන ශිප්පොරා විවාහ කරගනිමින් එඬේරික ජීවිතය ගත කිරීම ඔහු ලබන කැඳවීමට මඟ දක්වන අයුරු ද අනාගතයේ තම ජනතාව රැගෙන පාළුකරයේ ගමනට පූර්ව අත්දැකීමක් ලබන ආකාරය ද දැකිය හැකි ය (නික් 2:11-22).

### මෝසෙස් තුමාගේ කැඳවීම (නික්මයාම 3:1-4:17)

මෝසෙස් තුමා අග්‍රගණයේ දිවැසිවරයෙකි (ද්වි 34:10). එබැවින් පුරාණ ගිවිසුමේ දිවැසිවර කැඳවීම් පසුබිම් කර ගනිමින් මෝසෙස් තුමා ලද කැඳවීම ඉදිරිපත් කරන අතර දිවැසිවරුන් දිවැසිවර පණිවිඩ ඉදිරිපත් කිරීමේ දී භාවිත කළ වාග් මාලා තුනෙන් එකක් වන ''සමිඳාණන් වහන්සේගේ පණිවිඩය මේය" යන ව්‍යවහාරය මෝසෙස් තුමා භාවිත කළේ ය. මෝසෙස්ගේ කැඳවීම දිවැසිවර කැඳවීමක ලක්ෂණ තුළින් ඉදිරිපත් කර ඇත.

1. දේව දර්ශනය (නික්මයාම 3:1-6)
2. දෙවිඳුන් දූතික සේවාව ඉදිරිපත් කිරීම (නික්මයාම 3:7-10)
3. කැඳවීම භාර ගැනීමට මෝසෙස් තුමා මැළිවීම (නික්මයාම 3:11 , 3:13 , 4:1 , 4:10 , 4:13)
4. දෙවියන් වහන්සේ විසින් දිරිමත් කරනු ලැබීම (නික්මයාම 3:12 , 3:14 , 4:2-9 , 4:11-12, 4:14)
5. යවනු ලැබීම (නික්මයාම 4:17)

දෙවියන් වහන්සේගේ කැඳවීමට තම අකමැත්ත පස් වරක් ප්‍රකාශ කළ ද දෙවියන් වහන්සේ මෝසෙස් තුමාව පස් වරක් දිරිමත් කිරීමෙන් අනතුරුව තම කැඳවීම භාර ගෙන තම වගකීම නොපිරිහෙලා ඉටු කළේ ය.

| කැඳවීම භාර ගැනීමට මැලි වීම | දිරිමත් කරනු ලැබීම |
|---|---|
| නික්මයාම 3/11<br>පාරාවෝ වෙත යාමට ඉශ්‍රායෙල් ජනයා මිසරයෙන් පිටතට ගෙන යාමටත් මම කවරෙක් ද ? යි ඇසීය. | නික්මයාම 3/12<br>මම නුඹ සමග සිටිමි. මා නුඹ එවූ බව දැන ගැනීමට ......... මේ කන්ද මත නුඹලා දෙවියන් වහන්සේ වන මා හට වැඳුම් පිදුම් කරන්න යැයි |
| නික්මයාම 3/ 13<br>ඔවුන් ද උන්වහන්සේගේ නම කුමක්දැයි මාගෙන් අසන කල මම ඔවුන්ට කල මම ඔවුන්ට කුමක් කියම්දැ? යි ඇසීය. | /14<br>"මම වනාහි ස්වයම්භූ නම් තැනැත්වහන්සේ වෙමි. ස්වයම්භූ තැනැත්වහන්සේ ඔබ වෙත මා එවූ සේකැයි ............... කිව යුතුය. |
| නික්මයාම 4/1<br>ඔවුහු මා විශ්වාස නොකොට මාගේ හඬට සවන් නොදී සමිඳාණන් වහන්සේ ඔබට දර්ශනය නොවූ සේකැයි කීවොත් කුමක් කරන්නේදැයි ඇසීය. | නික්මයාම 4/2-19<br>හාස්කම් පෑමේ බලය දීම.<br>- සැරයටිය ස පයකු බවට පත් වීම<br>- අතෙහි කුෂ්ටයක් ඇතිවීම හා සු වීම<br>- ගංගාවෙන් ගත් වතුර ලේ බවට පත් කිරීම. |
| නික්මයාම 4/10<br>"............... මම වාක්ප්‍ර කථිකයෙක් නොවෙමි කීමෙහි බිනීමෙහි දුබලය. දිව ගොත ගහන සුළුය." කීය. | නික්මයාම 4/1-12<br>"එබැවින් දැන් ඉතින් යන්න, නුඹට කථා කිරීමට මම උදව් වෙමි. නුඹ කිවයුතු දේ මම නුඹට කියා දෙමි" යි වදාළ සේක. |
| නික්මයාම 4/13<br>"අනේ මගේ ස්වාමිනි කරුණාකර ඔබ කැමති අන් කෙනෙකු යැව්ව මැනව" යි කීය. | නික්මයාම 4/14-15<br>"නුඹේ සහෝදරයා වන ආරොන් ඉන්නවා නොවේද ? ඔහු කථාවට දක්ෂයකු බව මම දනිමි. ............ ඔහු නුඹ වෙනුවෙන් සෙනඟට කථා කරනු ඇතැ" යි. |

- දෙවියන් වහන්සේ තම ජනතාවට ඉතා සමීප වන බවත් ඔවුන්ගේ දුක් වේදනා දන්නා බවත්, ඔවුන් වෙත දයාව පාමින් ඔවුන් මුදවා ගන්නා ආකාරය විදහා දක්වයි (නික් 3:7-10).

- තව ද ඉශ්‍රායෙල් ජනතාවගේ පීඩිත, අසරණභාවය තුළ ඔවුන් අත්නොහැර ඔවුන් රැකගත් අන්දම ද, තම සේවය සඳහා දුර්වලයන් දුබලයන් තෝරා ගැනීමත්, ඔවුන් ශක්තිමත් කරන ආකාරය ද බයිබල් කතුවරයා ඉස්මතු කිරීමට උත්සාහ කර ඇත.

- දේව කැඳවීම පැහැර හැරීමට (පලා යාමට) උත්සාහ නොකළ යුතු බවත් තම කැඳවීම අවබෝධ කර ගැනීමත් ඒ අනුව ප්‍රතිචාර දැක්වීමත් අපේක්ෂා කෙරේ.

- දෙවියන් වහන්සේගේ කැඳවීම අප සියලු දෙනාට ම පැමිණේ. දිව්‍ය සංරක්ෂණය අප හැම දෙනාගේ ම ජීවිතය හා බැඳී පවතියි

- මිනිස් සිතිවිලි, අභිලාෂයන් අභිබවා දේව බලය ක්‍රියාත්මක වන ආකාරය දැකිය හැකි ය.

- අඩුපාඩු සහිත දුර්වල පුද්ගලයන් වන අප ද දේව හඬට ඇහුම්කන් දී තම කැඳවීමට ප්‍රතිචාර දැක්වීම අවශ්‍ය වේ.

- ඒ සඳහා ලැබෙන මඟපෙන්වීම හා දිව්‍ය සංරක්ෂණය අවබෝධ කර ගත යුතු වේ.

**වසංගත දසය (නික් 7:14-10:29, 12:29-36)**

ආරොන් තම සැරයටිය සර්පයකු කිරීම සමිඳාණන් වහන්සේ විසින් මෝසස් හා ආරෝන් එවන ලද බවට පාරාවෝ ඉදිරියේ සාක්ෂියක් විය (නික් 7:8-13). පාරාවෝ හා මිසර වාසීන් මත පීඩා බලපෑව ද ඉශ්රායෙල් ජනයා වෙත නොවී ය. එසේ නම් මෙය සාමාන්‍ය සිදුවීමක් නොවන බවත් දේව හස්තයේ ක්‍රියාවක් බව තහවුරු වේ. පාරාවෝ හා මිසර වාසීහු දෙවියන් වහන්සේගේ සතුරන් ලෙස ක්‍රියා කිරීමත්, මිසරයේ බලය පරාජය කිරීමත් අරුත් ගන්වයි.

වසංගත (පීඩා) මෙසේ යත

1. වතුර ලේ වීම
2. මැඩි උවදුර
3. කිනිතුලු උවදුර
4. මැසි උවදුර
5. ගව සම්පත් වැනසීම
6. ගඩු උවදුර
7. ගල් වර්ෂාව
8. පළගැටි උවදුර
9. ගනඳුරු උවදුර
10. කුලුඳුලන්ගේ මරණය

- මෙම පීඩා දහය ප්‍රධාන වශයෙන් පූජක, යාවේ හා එලොහිම් සම්ප්‍රදායන්ගේ සංකලනයෙන් ගොඩනැගී ඇත.

- මේ සඳහා අතීතයේ සිදුවූ යම් උවදුරු හා විපත්ති වසංගත පසුබිම් වී ඇති බව ද, පාස්කු ජනවන්දනා පිළිවෙත ආශ්‍රිත ව පෝෂණය වී ඇති බව ද සමහර බයිබල් විශාරදයින්ගේ මතයයි.

උදා:- පුරාණ ගිවිසුමේ පාස්කු භෝජනය පිළිවෙතහි දී "**මෙම රාත්‍රිය අනෙකුත් රාත්‍රියන්ට වඩා වෙනස් වන්නේ ........**" යනුවෙන් ඇසූ ප්‍රශ්නයට දුන් පිළිතුරෙන් වසංගත පිළිබඳ කතා පුවත් පරම්පරාවෙන් පරම්පරාවට දායාද කිරීම තුළ පෝෂණය විය (නික් 12:26-27).

- මෙම පීඩා පැමිණවීමේ පරමාර්ථය වනුයේ දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය පාරාවෝ හා මිසර වැසියන් හට ප්‍රකාශ කිරීමත් හා ඔවුන් විසින් දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය පිළිගැනීමට සැලැස්වීමත් එය කරණකොට ගෙන ඉශ්රායෙල් ජනතාවට නික්ම යාමට පසුබිම සැකසීමත් ය.

- මෙම පීඩා පැමිණීවීම තුළ දැකිය හැකි විශේෂත්වය වනුයේ මේවා පිළිබඳ ව කල්වේලා ඇතිව දැනුම් දෙන ලදුව විශේෂ අවස්ථාවන්හි සිදුකිරීමත් හා නැවැත්වීමත් ය.

### වසංගත 10 සැලැස්ම

පීඩා 10 සංසන්දනය කිරීමේදී මේවාට පොදු සැලැස්මක් දැකිය හැකි ය. වසංගත ගොඩනඟා ඇති ආකාරය තුළ ත්‍රිවිධ සැලැස්මක් ඇත.

| | |
|---|---|
| 1, 4, 7 පීඩාවන් | මෝසෙස් හා ආරොන් පාරාවෝ මුණ ගැසෙන්න අලුයම ගංගාවට එන අතරතුරදී ය. පාරාවෝ මුණගැසී ඉශ්‍රායෙල් ජනයාට පාලුකරයේ දී උන්වහන්සේට වන්දනා කිරීමට ඉඩ සලසා දෙන ලෙස ඉල්ලයි. |
| 2, 5, 8 පීඩාවන් | මෝසෙස් පාරාවෝ රජු මුණ ගැසෙන අතර මෙහිදී මෝසෙස් අනතුරු අඟවමින් මතු සිදුවන්නට යන දේ පවසයි. |
| 3, 6, 9 පීඩාවන් | මෝසෙස් හා ආරොන් විසින් එම පීඩා හට ගැනීමට සලසනු ලබන්නේ පාරාවෝ සමග කිසියම් ගනුදෙනුවකින් තොරව ය. |

මෙම පීඩා ක්‍රම ක්‍රමයෙන් උච්චස්ථානය කරා ගොඩනඟා ඇත. (වසංගත නිසා ඇතිවන ප්‍රතිඵලවල යම් වර්ධනයක් දැකිය හැකි ය.) අදියර තුනක් යටතේ උච්ච අවස්ථාව දක්වා නැගීම මෙසේ දැක්විය හැක.

1. **ජලය ලේ බවට හැරවීම.**
   මෝසෙස් තුමාට මෙන්ම ඉන්ද්‍රජාලිකයින් ද එම ප්‍රාතිහාර්යය ඇති කිරීමට හැකි වීම (නික් 7:20-22).

2. **කිනිතුලු උවදුරු**
   මෝසෙස් තුමාට පමණක් එම ප්‍රාතිහාර්යය කිරීමට හැකිවීම (නික් 8:17-18)

3. **කුළුඳුලන්ගේ මරණය**
   දෙවියන් වහන්සේට පමණක් මෙය ඉටුකළ හැකිවීම (නික් 11:4-5)

මෙම වසංගත ස්වභාව ධර්මයේ සිදුවීම් වුව ද මෙය සිදු කරන අවස්ථාව අනුව (දේව මැදහත්කම, ඉල්ලීම) දේව හස්තයේ ක්‍රියාවන් බව දැක්විය හැකි ය. මේ තුළින් දෙවියන් වහන්සේගේ ආධිපත්‍යය පිළිගැනීමට ඉන්ද්‍රජාලිකයන්ට හා පාරාවෝ රජතුමාට සිදු විය.

### ජුදා පාස්කු මංගල්‍යය (නික්මයාම 12:1-28)

පාස්කු මංගල්‍ය පිළිවෙතෙහි අන්තර්ගත ප්‍රධාන අංග දෙකකි.

1. පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත
2. නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත

## පාස්කු බැටළුවා සම්බන්ධ පිළිවෙත (නික් 12:1-14)

- එඬේරුන්ට හේමන්තය (ශීත සෘතුව) දුෂ්කර කාල පරිච්ඡේදයක් විය. මන්ද තම බැටළු රැළට ආහාර සපයා ගැනීමට තිබූ අපහසුතාවය යි.

- එහෙත් හේමන්තයට පසුව උදාවන වසන්ත සෘතුව උදා වීමත් සමග උනුසුම් දේශගුණය ඇති වීම සමග තෘණ වැඩීම ආරම්භ වේ. මේ සමය එඬේරු නව තෘණ බිම් කරා සංක්‍රමණය වීම සිදු විය.

- මෙසේ යාමට පෙර දේව ආරක්ෂාව පතා රැළෙන් අගනා බැටළුවකු මරා උගේ ලෙය කූඩාරමේ ඉදිරිපස තිබූ කණුවක තැවරීම සිරිතක් වූ අතර නිසාන් මස 14 දින රාත්‍රියේ මෙම මංගල්‍යය පවත්වනු ලැබීය.

- නිසාන් මස 14 දින රාත්‍රිය යනු වසරේ පළමු පුර පසළොස්වක පෝය රාත්‍රිය විය.

- ඉශ්‍රායෙල් ජනතාව මිසරයෙන් නික්මයාමට පෙර මෝසෙස් තුමාගේ උපදෙස් අනුව නියමිත චාරිත්‍ර ඉටු කිරීමටත් පසුකාලීනව පාස්කු මංගල්‍ය උත්සවයට එක් වන්නට ඇතැයි පිළිගැනේ.

- දෙවියන් වහන්සේගේ ක්‍රියාකාරීත්වය තුළ ඉශ්‍රායෙල් ජනතාව අත්දුටු ගැලවීම එනම් තම දේශය වෙත ගමන් කිරීම එනම් පොරොන්දු දේශය වෙත යාම සිහිපත් කිරීමේ දී යොදාගෙන ඇතැයි සිතිය හැකි ය.

## නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත (නික් 12:15-20)

නුමුහුන් පූප සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ "මට්සාහ්" ය. මෙම පිළිවෙත කෘෂිකාර්මික යුගයේ සිට පැවතුණි. ගොවීහු තමන් ලද සරුසාර අස්වැන්න / ඵලදාව වෙනුවෙන් දෙවියන්ට තුති පිදීමට පූප සෑදූහ.

1. • ඔවූහු තම අස්වැන්න නෙළීමෙන් පසු පරිභෝජනය කිරීමට පෙර තම මුල් අස්වැන්න නෙළීමෙන් පසු තම නිවෙස්වල තිබුණ පරණ මුහුන් ඉවත් කර නව මුහුන් සාදාගන්නා තුරු නුමුහුන් පූප අනුභව කළහ.

   • ඉශ්‍රායෙල්වරුන්ගේ නුමුහුන් පූප සම්බන්ධ පිළිවෙත සම්පූර්ණයෙන් ම වෙනත් අර්ථයක් විය.

   - එනම් ඔවූහු මිසරයෙන් නික්ම යාම සිදුකළ රාත්‍රියේ කඩිමුඩියේ පිටත් ව යාමේ දී පූප වලට මුහුන් මිශ්‍ර කිරීමට කාලයක් නොමැති වීම ය.

   - මුහුන් මුසු කළ ද පිපීමට කාලයක් නොවී ය.

   - එබැවින් ගමනේ යෙදුන පළමු දින ඔවුනට නුමුහුන් පූප අනුභව කිරීමට සිදු විය.

   - මුල් කාලීනව එඬේරුන්ගේ හා ගොවියන්ගේ ලෙස මංගල්‍ය දෙකක් ලෙස පැවතිය ද පසුකාලීනව පාස්කු මංගල්‍යය තුළ එක මංගල්‍යයක් ලෙස සම්බන්ධ වී ඇති බව දැක්විය හැකි ය. (ද්වි 16:1-8, ලෙවී 23:5-8, ගණන් 28:16-25 හි ) සඳහන් වේ.

2. • පාස්කු මංගල්‍යයට කුළුඳුලන් සම්බන්ධ පිළිවෙත ද එකතු කර ඇත (නික් 13:1-6).

   - ඉශ්‍රායෙලය තුළ කුළුඳුල් පිරිමි දරු උපත පිළිබඳ සම්ප්‍රදාය වැදගත් ය. මන්ද කුළුඳුලා දෙවියන්ට කැප වූ, අයිති වූ කෙනෙකු ලෙස සැලකීම ය.
   - කුළුඳුලා පිළිබඳ සම්ප්‍රදාය මිසර කුළුඳුලන්ගේ මරණය හා සම්බන්ධ කර ඇත.

- ඉශ්රායෙල් ජනතාවගේ පාස්කු මංගල්‍යය මිසරයේ කුළුඳුලන් ඝාතනය කළ රාත්‍රියේදී යාවේ දෙවිඳුන්ගේ රැකවරණය තහවුරු විය. ඉශ්රායෙල් ජනයා වසරක් පාසා මෙම සිද්ධිය අනුස්මරණය (පරිස්මරණය - අත්දැකීමට ඇතුළුවීම) කළහ (නික් 13:10).

- එය පැරණි ගිවිසුමේ පාස්කුව බවට පත්විය.

- මෙය ඔවුන් සිදුකළේ නිසාන් මාසයේ (මාර්තු-අප්‍රේල්) 14 දින සවස ය. මෙම පිළිවෙතට සහභාගි විය හැකි වූයේ චර්මච්ඡේදිත අයට පමණි.

- 2 රාජාවලිය 22 දක්වෙන පරිදි ක්‍රි.පූ. 621 පෙර ජොෂියා රජු යටතේ සිදුවූ ආගමික ප්‍රතිසංස්කරණයට පෙර විවිධ ප්‍රදේශයන්හි පවත්වනු ලැබ ඇත.

- පාස්කු බැටළුවා මැරීම නිවසෙහිදී හෝ සමීප සිද්ධස්ථානයක සිදුවිය.

- එනම් ක්‍රි.පූ. 621 පසු පාස්කු මංගල්‍යය මෙන්ම අනෙකුත් ප්‍රධාන මංගල්‍යයන් ද (පෙන්තකොස්ත, කූඩාරම්) පවත්වනු ලැබුවේ ජෙරුසලමේ දී පමණි.

- ජේසුස් වහන්සේ ද පාස්කු මංගල්‍යය සඳහා ජෙරුසලමට වැඩියේ එබැවිනි.

- පාස්කු බැටළුවා මරනු ලැබුවේ උදයේ යාගික පිළිවෙත වූ පෙ.ව. 9.00 සහ සවස යාගික පිළිවෙත වූ ප.ව. 3.00 දක්වා අතර කාලයේදී ය.

- අනතුරුව බැටළුවා ගින්නේ පුළුස්සා තිත්ත පලා හා නුමුහුන් පූප සමඟ අනුභව කරන ලදී.

## පාස්කු භෝජන පිළිවෙත සිදුකළ ආකාරය (නික්මයාම 12:1-11 , 22-27)

- පාස්කුව සැමරිය යුත්තේ වර්ෂයේ පළමුවන මාසය වන නිසාන් මාසයේය.

- නිසාන් මස 10 දින එක බැටළු පැටවකු බැගින් සෑම පවුලට සපයා ගත යුතු ය. 14 දින දක්වා ඌ තබා ගෙන එදින රාත්‍රියේ ඌ මරණයට පත්කළ යුතු වීම (ඌගේ එක අස්ථියක්වත් නොකැඩීම)

- එම බැටළු පැටවා කැලැල් රහිත, අවුරුද්දක් වයසැති පිරිමි සතෙකු වීම.

- බැටළුවා අනුභව කරන අයගේ නිවෙස්වල දොරෙහි උළුවහු කණු දෙකේ ද උළුවස්සේ උඩ ලීයේ ද ඌගේ ලේ තැවරීම.

- ඌගේ මාංශය මද ගින්නේ පුළුස්සා නුමුහුන් රොටී හා තිත්තපලා සමග ඉගපටිය බැඳ, පාවහල් ලා සැරයටිය ගෙන ලහි ලහියේ අනුභව කළ යුතු වීම.

- ආහාරයෙන් කිසිත් ඉතිරි නොකල යුතු අතර උදය වන විට ඉතිරි වූ යමක් ඇත්නම් ගින්නෙන් පිලිස්සිය යුතු වීම.
- මෙම පිළිවෙත මතු පරම්පරාවන්ට ද සදහට ම දුන් නියෝගයක් ලෙස පිළිපැදිය යුතු වීම.
- මේ පිළිවෙතේ තේරුම ගෘහ මූලිකයා විසින් දරුවන් හට කියාදිය යුතු වීම.

**පාස්කු ජනවන්දනාවේ සිදුකළ ප්‍රධාන අංග හා ඒවායේ අර්ථ මෙසේ දැක්විය හැක.**

1. නුමුහුන් පූප භාවිතය ⇨ දේව නියමය කඩිනමින් ඉටුකළ යුතු බව සංකේතවත් කරයි.
2. තිත්ත පලා අනුභවය ⇨ වහල්කමේ වූ අමිහිරි දුක්ගාවිනා සංකේතවත් කරයි.
3. පාස්කු බැටළුවා භෝජනයට ගැනීම ⇨ දෙවියන් හා ඇති කරගත් ගිවිසුම සංකේතවත් කරයි.
4. මිදියුෂ පානය ⇨ මංගල්‍යයක්, උත්සවයක්, ජයග්‍රාහී බව සැමරීම සංකේතවත් කරයි.

පාළුකරයේ දිව්‍ය සංරක්ෂණය

- පාරාවෝගේ ග්‍රහණයෙන් මිදුණු ඉශ්රායෙල් ජනයා දෙවියන් වහන්සේගේ මඟපෙන්වීම ඔස්සේ වටවංගු මාර්ගයකින් මුහුද දෙසට ඔවුන් ගෙන ගිය බව නික්මයාම 13:18 සඳහන් කරයි.
- තව ද ජෝසෙප් ඉශ්‍රායෙල් ජනයා ප්‍රසිද්ධියේ දිවුරුවා තිබුණු ප්‍රකාර මෝසෙස් තුමා විසින් ජෝසෙප්ගේ ඇටකටු ද ගෙන ගියේ ය (නික් 13:19).
- ඔවුහු කාන්තාර ගමන තුළ ස්වභාව ධර්මය තුළින් දිව්‍ය සංරක්ෂණය අත්දුටුහ. දේව හඬට අවනතව ද දේව සැලැස්ම ඔස්සේ ද ගමන් කළ ඉශ්රායෙල් ජනතාව සමග දෙවියන් වහන්සේ වැඩසිටිමින් ඔවුනට ශක්තියක්, බලයක් වූ ආකාරය වටහා ගත හැකි ය.

මුහුද තරණය (නික්මයාම 14:1-31)

මුහුද තරණය පිළිබඳව විවිධ මත දැක්විය හැකි ය.

■ නික්මයාමේ ගමන් මාර්ගය හැදෑරීම තුළින් පිළිඹිබු වන්නේ ඉශ්රායෙල් ජනයා රතු මුහුද අසලටවත් නොගිය බව ය.

■ ඔවුන් එක්කෝ මධ්‍යධරණි මුහුදට කිට්ටුව ඇති කලපුවක් වූ සිරිබෝනිස් විල දෙසට ඔවුන් ගමන් කරන්නට ඇත

■ නැත්නම් ටිම්ෂා විල් ප්‍රදේශයේ වගුරු බිමකට එන්නට ඇත. නික්මයාම 14:21-22 වගන්ති වලට අනුව මුහුද තරණය දෙයාකාරයකින් පැහැදිලි කර ඇත. සම්ප්‍රදායයන් දෙකක් ඔස්සේ ඉදිරිපත් කර ඇති බව උපකල්පනය කෙරේ.

නික්මයාම 14:21-22

⋆ යාවේ ::(J) සම්ප්‍රදාය - මුළු රාත්‍රියේ ම පෙර දිගින් හැමූ සැඩ සුළඟක් මගින් මුහුදු ජලය වියළී යාමට සැලසූ බව (ඓතිහාසික අර්ථකථනයකි.)

⋆ පූජක :(P) සම්ප්‍රදාය - මෝසෙස් තුමා මුහුද දෙසට තම අත දිගු කළ විට මුහුද දෙබෑවී වියළි බිමත් මතු වී එන දෙපස ජලය තාප්පයක් මෙන් රැඳී සිටි බව. (විශ්වාසයේ අර්ථකථනය)

■ මෙම මත කෙසේ වුවත් ඉශ්රායෙල් ජනයා ලුහුබැඳ ආ පාරාවෝ හා ඔවුන්ගේ හමුදාවෙන් ගැලවීම ලැබීමත්, පාරාවෝගේ හමුදාව මුහුද මැද විනාශයට පත් වීමත් සත්‍යතාවයකි.

■ ලුහුබැඳ එන පාරාවෝගේ හමුදාව ඉදිරියේ අසරණ වූ ඉශ්රායෙල් ජනයා මෝසෙස්ට හා දෙවියන් වහන්සේට අවලාද කී විට මෝසෙස්ගේ පිළිතුර අප ජීවිතයන්ට මහත් ශක්තියක් ධෛර්යයක් පෙන්වා දෙන්නකි (නික් 14:13-14).

■ අප ජීවිත අභියෝග හමුවේ දෙවියන් කෙරෙහි විශ්වාසවන්ත වීමටත් අවලාද කීම නොව අප ජීවිත මෙහෙයවීමට දෙවියන්ට ඉඩ හැරීමත් වැදගත් ය.

■ මේ සියලු සිදුවීම් තුළ දෙවියන් වහන්සේගේ දේව හස්තය බලගතු ලෙස විදහා දක්වයි.

■ රෑ පහන් වනතුරු ඉශ්රායෙල් ජනයා මෙන් ම මිසර ජනයා ද මුහුද තරණය කරමින් සටහක යෙදීමත් දෙවියන් වහන්සේ මිසර ජනයා විනාශයට පත් කරලීම

■ ඉශ්රායෙල් ජනයා දේව ආදරය අත්දැකීමත්, දෙවියන් වහන්සේට ගරුබිය පා දෙවියන්ගේ සේවකයා වන මෝසෙස් තුමා කෙරෙහි විශ්වාසය තැබූහ ; කීකරු වූහ (නික් 14:31).

### වළා ටැඹ හා ගිනිටැඹ (නික් 13:21-22)

දෙවියන් වහන්සේ ඉශ්රායෙල් ජනයා සමඟ වැඩසිටීමේ සලකුණක් ලෙස ද මඟපෙන්වීමේ සලකුණක් ලෙස ද දිවා කාලයට වළා ටැඹක් හා රාත්‍රී කාලයට ගිනිටැඹක් ලෙසින් ඔවුන්ට පෙරටුව ගිය සේක. වලා ටැඹ හා ගිනිටැඹ සෙනග ඉදිරියෙන් පහ නොවී ය. සමිඳාණන් වහන්සේ ගිනි හා වලා ටැඹ මිසර වාසීන්ගේ හමුදා සන්ත්‍රාසයට පත් කළසේක (නික් 14:24).

### පාළුකරයේ ගමන

**මාරා නමැති ස්ථානයේදී පිපාස වීම (නික්මයාම 15:22-25)**

මුහුදින් එතෙර වූ ජනයා දින 03ක් පාළුකරයේ ගමන් කළ ද ජලය නොලැබුණි. "මාරා" නම් ස්ථානයේ ජලය තිබුණ ද එය කරදිය ජලය බැවින් බීමට නුපුළුවන් විය. 'මාරා'යන හෙබ්‍රෙව් වචනයේ තේරුම "තිත්ත" යනුයි. මෙහි දී ඔවුනට දෙවියන් වහන්සේ පෙන්වූ ගස ජලයට දමා කරදිය ජලය මිහිරි දිය බවට පත්කර ගත්තේ ය. එමගින් පිපාසය නිවා ගැනීමට මෝසෙස් තුමාගේ මැදිහත්වීම තුළින් ක්‍රියා කළ සේක.

### සීන් කාන්තාරයේ (පාළුකරයේ) දී ආහාර සැපයීම (නික්මයාම 16)

• ආහාර හිඟ වූ විට ඉශ්රායෙල් ජනයා මෝසෙස් තුමාටත්, දෙවියන් වහන්සේටත් විරුද්ධ ව කොඳුලෝ ය.

• ඔවුන්ගේ මැසිවිලි හඬට කන් දුන් දෙවියන් වහන්සේ ඔවුනට ආහාර සඳහා මන්නා හා වටුවන් ලබා දුන්සේක (නික් 16:12).

• කාන්තාර ගමනේ දී අසරණභාවයට පත්වන සෑම අවස්ථාවක දී ම ඔවුන්ගේ ප්‍රතිචාරය වූයේ මැසිවිලි නැගීම ය. (කෙඳිරීමය.)

• අභියෝග පිරි ජීවිතයට වඩා වහල්භාවය අගය කළහ.

• එහෙත් දෙවියන් වහන්සේ ඔවුන්ගේ අවිශ්වාසවන්තකම මධ්‍යයේ පවා තම පොරොන්දු ඉටුකරමින් විශ්වාසවන්ත වූ සේක.

**කාන්තාර ගමනේදී ඉශ්රායෙල් ජනතාව කෙඳිරි ගෑමේ ප්‍රධාන අවස්ථා හතරක් දැකිය හැකිය.**

1. රතු මුහුද අසල දී පාරාවෝ හා මිසර හමුදාව ලුහුබැඳ එන බව දුටු විට (නික්මයාම 14:11-12)
2. මාරා නමැති ස්ථානයේ දී ජලය තිබුණ ද එය බීමට නොහැකි වූ විට (නික්මයාම 15:24)
3. සීන් කාන්තාරයෙහි කුසගිනි වූ විට (නික්මයාම 16:1-3 )
4. මස්සා හා මෙරීබා (රෙපිඩීම්) ස්ථානයේ දී ජලය හිඟ වූ විට (නික්මයාම 17:1-3 )

මේ සෑම අවස්ථාවකම පෙන්නුම් කරනුයේ ඉශ්රායෙල් ජනතාවගේ හීන විශ්වාසයයි. දෙවියන් වහන්සේගෙන් ලද දීමනාවන්, වරප්‍රසාද අමතක කරමින් දෙවියන් වහන්සේට හා උන්වහන්සේගේ සේවක මෝසෙස් තුමාට විරුද්ධ ව කැරලි ගැසීම ය.

### ❖ මන්නා ලබාදීම (නික් 6:31)

• මන්නා යනු ටමෙරික්ස් මනිෆෙරා නම් ශාක විශේෂයකින් වෑහෙන ශ්‍රාවයකි.

• එම ගස්වල ළපටි කිනිතිවල සාරය උරාබොන කුඩා සතුන් තුවාල කිරීම නිසා ශාකයෙන් නිකුත් කරනු ලබන මිහිරි රසැති ශ්‍රාවයකි.

• බයිබල් කතුවරයා දක්වන පරිදි මේවා සුදු පැහැතිය.

• මිහිරි රසයෙන් යුක්තය.

• කොත්තමල්ලි ඇට තරම් වේ.

• ඉර නැග ඒමත් සමඟ දියවී යයි.

• මෙම ශ්‍රාවය වියලී ගොස් කබොල්ලක් පමණක් ඉතිරි වේ.

• පාළුකරයේ දී මෙම ආහාරය ලබාදීමත්, ඔවුනට අවශ්‍ය ප්‍රමාණය ලබාදීමත් විශේෂිත විය.

• කාන්තාරය තුළ ඔවුන් ලද මේ ආහාරය මෝසෙස් තුමාගේ ඉල්ලීම පරිදි දෙවියන් වහන්සේ ඉශ්රායෙල් ජනයාට ලබාදුන් ආහාරය ලෙස ඔවුහු පිළිගත්හ.

• කානාන් දේශයේ සීමාවලට පැමිණෙන තෙක් ම ඔවුහු මන්නා ආහාරයෙන් පෝෂණය වූහ (නික් 16:35).

## ❖ වටුවන් ලබාදීම (නික් 16:31)

• වසන්ත සමයේ දී සංක්‍රමික කුරුල්ලන් දහස් ගණනින් රංචු ලෙස පැමිණීම සාමාන්‍ය සිදුවීමකි.

• ඇතැම් විට දැඩි වෙහෙසට පත් ව සිටීම හා වැලිකුණාටු වලට අසුවීම නිසාත් මෙම පක්ෂීන් අල්ලා ගැනීම පහසු විය.

• ඉශ්රායෙල් ජනතාව මෙම වටු මාංශ සමිඳාණන් දුන් ආහාරය ලෙස පිළිගත්හ.

• පාළුකරයේ මෙම ආහාර විශේෂාකාරයෙන් ලැබීමට සැලැසීම තුළින් ඉශ්රායෙල් ජනයා දේව ආදරය, රැකවරණය ප්‍රබලව අත්දුටුහ.

• තව ද ඉශ්රායෙල් ජනයා හැමවිට ම මෙම ස්වාභාවික සිදුවීම් දෙවියන් වහන්සේ තමන් වෙත දක්වන ප්‍රේමයේ හා ආරක්ෂාවේ සලකුණක් ලෙස හඳුනා ගත්හ.

• නූතනයේ කිතුනුවා ද දිව්‍ය සංරක්ෂණය ස්වාභාවික සංසිද්ධීන් තුළින් හඳුනාගත යුතු ය.

•මේ සිද්ධීන් තුළින් ඉශ්රායෙල්වරුන්ගේ විශ්වාසය වර්ධනය විය. ඔවුන්ගේ විශ්වාසය වූයේ ස්වාමින් වහන්සේ ඔවුනට දිනපතා අවශ්‍ය දේ සපයන බවත්, ආරක්ෂා කරන බවත් ය.

මෙම සිද්ධීන් තුළින් අපගේ ජීවිතයට ලැබෙන පණිවිඩය වනුයේ අපේ දිනපතා භෝජනය දෙවියන් වහන්සේ අපට ලබාදෙන බව ය. දුෂ්කර මාර්ගයක යාමට අප ව කැඳවා ඇති බැවින් සෑම අවස්ථාවක ම අපට සහාය වෙමින් මඟ පෙන්වමින් අපගේ දෛනික අවශ්‍යතා සපුරාලන බව ය.

## ❖ මස්සා හා මෙරීබා ස්ථානවලදී ජලය ලැබීම (නික් 17:1-7)

• සීන් පාළුකරයෙන් නික්මුණු ඉශ්රායෙල් ජනයා රෙපිඩිම් නම් ස්ථානයේ කඳවුරු බැඳගත්ත ද එහි බීමට ජලය නොවී ය.

• ඒ නිසා සෙනග මෝසෙස් තුමාට අවලාද නගමින් බීමට ජලය ඉල්ලූහ.

• මෝසෙස් තුමා දෙවියන් වහන්සේගේ නියමය පරිදි සැරයටියෙන් පර්වතයට තට්ටු කළ විට ජලය ගලා ආවේය.

• මෙම ස්ථානය මස්සා හා මෙරීබා යනුවෙන් නම් කෙරිණි. එම හිබෲ වදන්වල අරුත වනුයේ,

**මස්සා** - පරීක්ෂා කිරීම (පරීක්ෂා කර බැලීම)

**මෙරීබා** - කලහ කිරීම (විවාද කිරීම) යනුයි.

• පර්වතයට තට්ටු කිරීමෙන් ජලය ගලා ආ බව ගණන් 20:1-13 දැක්වේ.

• ඉශ්රායෙල් ජනයාට ශීන් නම් පාළුකරයේ දී බීමට ජලය නොමැති විය.

• එබැවින් ඔවුහු මෝසෙස් තුමාට අවලාද නැගුහ. මේ නිසා ඔවුන් පොරොන්දු දේශයට ඇතුළු වීමට නොහැකි විය.

• දෙවියන් වහන්සේ මෝසෙස් තුමාට හා ආරොන් තුමාට දන්වා සිටියේ පර්වතයට අණ කරමින් ජලය ලබා ගැනීමට ය.

• එහෙත් මෝසෙස් ගේ විශ්වාසය හීන වී පර්වතයට අණ කරනවා වෙනුවට දෙවරක් ගැසී ය (ගණන් 20:10-11).

### ❖ ලෝකඩ සර්පයා (ගණන් 21:4-9)

• පාළුකරයේ දී ඉශ්රායෙල් ජනයා බොහෝ සේ අධෛර්යට පත්ව අසරණ වී සිටියහ.

• ඔවුහු නැවතත් දෙවියන් වහන්සේට සහ මෝසෙස් තුමාට විරුද්ධ ව අවලාද කියන්නට විය.

• එවිට සමිඳාණන් වහන්සේ සෙනග මැදට **විසකුරු සර්පයන්**_එවූයෙන් එම සර්පයෝ ඔවුනට දෂ්ට කරන්නට වුහ.

• ඉශ්රායෙල් සෙනග අතරින් බොහෝ දෙනා මරණයට පත් වූහ.

• සෙනග මෝසෙස් තුමා වෙත පැමිණ සර්පයන් ඉවත් කරන්නැයි ඉල්ලූහ.

• මෝසෙස් තුමා සෙනග උදෙසා දෙවියන් වහන්සේට යච්ඤා කළේ ය. සමිඳාණන් කී පරිදි ලෝකඩ සර්පයෙක් තනා රිටක් පිට තැබී ය.

• සර්පයන් දෂ්ට කළ අය ඒ දෙස බැලීමෙන් සුවපත් විය.

### ආක්‍රමණවලින් ආරක්ෂා වීම (නික් 17:8-13)

• නික්මයාම ගමනේ දී ඉශ්රායෙල් ජනයා අමලෙක්වරුන්ගේ ආක්‍රමණයට ගොදුරු විය.

• එවිට මෝසෙස් තුමා ජොෂුවාට උපදෙස් දෙමින් කියා සිටියේ මිනිසුන් තෝරාගෙන අමලෙක්වරුන් සමග සටන් කරන ලෙස ය.

• මෝසෙස් තම සැරයටිය ගෙන කඳු මුදුනට නැඟ තම අත් ඔසවාගෙන යාච්ඤා කළේ ය.

• එතුමාගේ අත් එසවී තිබෙන විට ඉශ්රායෙල්වරුන්ට ජයත් අත් පහතට යනවිට අමලෙක්වරුන්ට ජය අත් විය.

• එම නිසා ආරොන් හා හූර් මෝසෙස් තුමා යාච්ඤා කරන විට අත ඉහළට ඔසවාගෙන සිටීමට කටයුතු කළහ. එම නිසා අවසානේ ඉශ්රායෙල්වරුන්ට ජය අත් විය.

**නිපුණතාව** : දේව අනාවරණයට ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම 2.5** : සීනයි ගිවිසුමට අනුව දිවි ගෙවයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 15

**ඉගෙනුම් පල**

- සීනයි ගිවිසුම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- එකම දෙවියන් වහන්සේට පමණක් නමස්කාර කළ යුතු බව පිළිගනියි.
- සීනයි ගිවිසුම පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දස පණතට අනුව ජීවත් වෙයි
- දස පණතේ මගපෙන්වීම තුළ සහෝදර ප්‍රේමයෙන් ජීවත් වෙයි.

# 2.5 සීනයි ගිවිසුම (නික් 20, 24 පරි.)

## ගිවිසුම හැඳින්වීම

''ගිවිසුම" යන්නට හෙබ්‍රෙව් වචනය ''බරිත්'' ය. එහි අරුත නම් දෙපාර්ශවයක් අතර ඇතිකර ගන්නා එකඟතාවයක් යන්න ය. එය කොන්දේසි මත පදනම් වූ ද්වි පාර්ශ්වික සබැඳියවකි.

### පුරාණ ලෝකයේ තිබූ ගිවිසුම් සංකල්පය

පුරාණ පෙරදිග ලෝකයේ මිසර, හිත්තීය, අමෝරි වැනි ශිෂ්ටාචාරයන්හි මෙවැනි ගිවිසුම් පැවති බව දැකගත හැකි ය. අධිරාජ්‍යයා හා යටත් විජිත රාජ්‍යවල රජුන් අතර පැවති ගිවිසුම් මීට නිදසුන් වේ. මෙවැනි දේශපාලනික හා සමාජීය ක්ෂේත්‍ර වල ඇතිවූ ගිවිසුම්වල පොදු ලක්‍ෂණය වනුයේ,

1. දෙපාර්ශවයේ ම එකඟතාව මත කොන්දේසි ස්ථාපිත කිරීම.
2. කොන්දේසි සුරැකීම පිණිස දෙවි කෙනෙකු සාක්ෂි දැරීම.

### සීනයි ගිවිසුමේ ස්වභාවය

ශුද්ධ ලියවිල්ලේ සඳහන් ගිවිසුම් දෙස බැලීමේ දී ඉහත සඳහන් වූ ගිවිසුම්වලට වඩා විශේෂත්වයක් හා ඊට ආවේණික වූ අනන්‍යතාවක් දැකිය හැකි ය.

1. දෙපාර්ශවයක් සිටිය ද සැම විට ම ගිවිසුමට මුලපුරන්නේ දෙවියන් වහන්සේ ය.
2. දෙවියන් වහන්සේ හා මිනිසා අතර විශාල පරතරයක් තිබුණ ද දෙවියන් වහන්සේ එය අනුමත කරන සේක.

• ගිවිසුමේ සාක්ෂිකරුවාණන් දෙවියන් වහන්සේ වන අතර මනුෂ්‍යයා ගිවිසුම කඩ කළ ද දෙවියන් වහන්සේ සමාවෙන් හා දයාවෙන් ඔහු කැඳවමින් ගිවිසුමට විශ්වාසවන්තව සිටින සේක.

• එඬේරුන් ලෙස ජීවත් වූ ඉශ්රායෙල් ජනතාව සුවිශේෂ දේව ජනතාවක් බවට පත්වූයේ මේ ගිවිසුම තුළිනි.

• සීනයි ගිවිසුම (දස පනත) මගින් ඉශ්රායෙල් ජනතාව දෙවියන් වහන්සේගේ "**සම්පත**" බවටත්, දේව ජනතාව බවටත් පත්විය.

• ගෝත්‍රික ජනතාවක් වූ ඉශ්රායෙල් සෙනග සදාචාර සම්පන්න ජාතියක් බවට පත්වූයේ සීනයි ගිවිසුමට පක්ෂපාතී වීමෙන් පසු ව ය.

• දේව ජනතාව (දෙවියන්ට අයිති සම්පත) යන අනන්‍යතාවය ලබාගත්හ.

• දෙවියන් වහන්සේ සමඟ විශේෂ සම්බන්ධතාවකට ඇතුළත් වීම තුළිනි. (නික් 19:5-6). සීනයි ගිවිසුම තුළින් ඉශ්රායෙල් ජනතාව ලද විශේෂ වරප්‍රසාදයන් (විශේෂ සම්බන්ධතාවය) ත්‍රිවිධාකාර වේ.

එම විශේෂ සම්බන්ධතාවය ත්‍රිවිධාකාර වේ.

අ) දෙවියන් වහන්සේටම අයිති සම්පත වීම.

ආ) පූජක රාජ්‍යයක්

ඇ) කැපවූ (ශුද්ධවූ) ජාතියක් වීම.

**දෙවියන් වහන්සේටම අයිති සම්පත වීම**

• සම්පත සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ ''සෙගුල්ලාහ්'' ය.

• එයින් හැඳින්වනුයේ විශේෂ සම්බන්ධතාවයකි.

• දෙවිඳුන් හා ඉශ්රායෙල් ජනයා අතර ඇති විශේෂ සම්බන්ධතාවය හැඳින්වීම පිණිස යොදා ගෙන ඇත.

• ධන සම්භාරයක් මෙන්ම ප්‍රේමයෙන් සිය දිවියට සම්බන්ධ වන අයකු හැඳින්වීමට සෙගුල්ලාහ් යන වචනය යෙදී ඇත. (නික් 19:5, ද්වි 7:6, 14:2, 26:18, මලාකි 3:17, ගීතා 135:4)

**පූජක රාජ්‍යයක්**

• හෙබ්‍රෙව් භාෂාවෙහි පූජකයා සඳහා ''කොහෙන්'' යන්න යෙදෙයි.

• එහි අරුත වනුයේ ජනතාව වෙනුවෙන් දේව සම්මුඛකයට යන තැනැත්තා යන්න ය.

• පුරාණ ගිවිසුම තුළ පූජකයෝ විශේෂ වරම් ලත් කණ්ඩායමක් විය.

• දෙවියන් වහන්සේ ඉදිරියේ අන් අය වෙනුවෙන් මැදිහත් වීමට ද වරම් ලබයි.

• දෙවිඳුන්ට ළං වීමටත්, දේව මන්දිරයෙහි (දෙවිඳුන්ගේ ගෘහයෙහි) විශේෂ ලෙස විසීමට වරම් ලද පිරිසකි.
• ඉශ්රායෙල් ජනයාට ද මෙලෙස සියලු සෙනඟ අතරින් දෙවියන් වහන්සේට ළං වීමට වරම් ලද පිරිසක්, පූජක රාජ්‍යයක් (මම්ලෙකෙට් කෝහනීම්) විය.

**ශුද්ධවූ (කැපවූ) ජාතියක්**

• ''ගෝය් කඩෝෂ්'' යන හෙබ්‍රෙව් යෙදුමේ තේරුම වෙන් කරන ලද ජාතියක් යන්නය. එය බයිබලයේ එක් වරක් පමණක් නික්මයාම 19:6 යෙදේ.

• ආදිපිතෘ යුගයේ පටන් ඉශ්රායෙලය පවුලක් විය.

• නික්මයාමට පෙර වහලුන් පිරිසක් විය.

• එහෙත් නික්මයාමෙන් පසු ඔවුහු නිවහල්, නිදහස් ජාතියක් වී ඇත.

• ඔවුහු ජාතියක් පමණක් නොව ශුද්ධවූ ජාතියක් වෙති. (ශුද්ධවූ ජාතියක් ස්වාමින් වහන්සේට පමණක් කැපවූ සෙනඟක් වීම අදහස් කරයි.)

• ''ගෝය් කඩෝෂ්'' ලෙස ඉශ්රායෙල් ජනතාව සෙසු ජාතීන්ට ආලෝකයක් ලෙස ද අන්‍ය ජාතීන් අතර දෙවියන් වහන්සේගේ සාක්ෂිකරුවන් වීමට ද ඇරයුම් ලබා ඇත.

**ඉශ්රායෙල් ජනතාව මෙම ගිවිසුම සඳහා සූදානම් වූ ආකාරය (නික් 19:10-14)**

1. පවිත්‍ර වීම
2. කන්දෙන් බැහැරව සිටීම
3. ස්ත්‍රී සේවනයෙන් තොරවීම.

ගිවිසුම ප්‍රකාශ කිරීම

1. මෝසෙස් සීනයි කන්දට නැග දස පනත ලබා ගැනීම (නික් 19:1-20:1)
2. මෝසෙස් හා ප්‍රජා මූලිකයන් 70 දෙනා කන්ද මුදුනේ දී එය පිළිගනියි. (නික්මයාම 24:1-2)

   (මෝසෙස්, ආරොන්, නාදාබ්, අබිහු හා ඉශ්‍රායෙල්වරුන්ගේ ප්‍රජා මූලිකයන් 70 දෙනා කන්දට නැග දුරින් සිටියහ. මෝසෙස් තුමා පමණක් දෙවියන් වහන්සේට සමීප ව සිට දස පනත ලියූ ගල් පුවරු ලබා ගත්තේ ය.) (නික් 24:9, 18).

• ඉශ්‍රායෙල් ජනයා සීනයි ගිවිසුම තුළින් ලද කැඳවීම නූතන කිතුනුවාට ද ප්‍රසාද ස්නාපනීය කැඳවීම තුළින් හිමි වේ.

• කිතුනුවා දෙවියන් වහන්සේට අයිති සම්පතකි. ඔහු අන් අය වෙනුවෙන් දෙවියන් වහන්සේ ඉදිරියේ මැදිහත්කරුවෙකි.

• ඔහුව දෙවියන් වහන්සේ විශේෂ දූත සේවාවක් සඳහා වෙන් කර ඇත.

**ගිවිසුම ස්ථිර කිරීම**

ගිවිසුම අදියර දෙකකදී ස්ථිර කරනු ලැබීය.

1. පළමු අදියර - නික්මයාම 24:3-4
2. දෙවන අදියර - නික්මයාම 24:5-8

**පළමු අදියර**

• මෝසස් සියලු ආඥා හා නියෝග සෙනඟට දැන්වීය.
• සෙනග ද මහත් හඬින් උත්තර දෙමින් එම ආඥා ඉටුකරන බවට ප්‍රතිඥා දුන්හ. (''සමිඳාණන් වහන්සේගේ ආඥා සියල්ලම අපි ඉටු කරන්නෙමු.'')
• අනතුරුව මෝසෙස් ඒවා ලියා තැබීය.
• මෝසෙස් සමග කන්දට නැගි ආරොන්, නාදාබ්, අබිහුම්, ඉශ්‍රායෙල්වරුන්ගේ ප්‍රජා මූලිකයන් 70 දෙනා සියලු ජනතාව නියෝජනය කළහ.

**දෙවන අදියර (ලේ පිළිවත)**

මරණ ලද සතාගේ ලෙයින් කොටසක් ගෙන පූජාසනය මත ඉසීම හා ගිවිසුම කියවා සෙනග ඒවා ඉටුකරන බවට පොරොන්දු දුන් පසු ඉතිරි රුධිරය ජනතාව මත ඉසී ය. එමඟින් ඉශ්‍රායෙල් ජනයා හා දෙවියන් වහන්සේ අතර ඇති වූ ගිවිසුම ස්ථිර කළේ ය (නික් 24:5-8).

## සීනයි ගිවිසුම හා දස පණත

• සීනයි ගිවිසුමේ හරය දස පණත මගින් පෙන්නුම් කරයි

• මෙය දේව නියෝග (නියමයන්) සම්පිණ්ඩනය කිරීමකි.

• මේ ගිවිසුම සදාචාරාත්මක වටිනාකම් හා ස්වාභාවික නීතියේ ආභාසය ලබා ඇත.

• ඉශ්‍රායෙල් ජනතාව සංක්‍රමික පිරිසක් ව සිටියදී අසංවර ආත්මාර්ථකාමී පිරිසක් වූ අතර දස පනත ලැබීමෙන් පසු සංවරශීලි දැහැමි දෙවියන්ගේ ජනතාව බවට පත් විය.

• එයින් ඔවුන්ට සුවිශේෂ වූ අනන්‍යතාවයක් ද හිමි විය.

• ක්‍රි.පූ. 13 වන සියවසේ සිට ක්‍රි.පූ. 10 වන සියවස දක්වා කාලය වන තෙක් දස පනත වාචික ව එක් පරම්පරාවකින් පසුව අනෙක් පරම්පරාව අතට පත් කරන ලදී.

• එය මතක තබා ගැනීම සඳහා කෙටි හා සරල ආකාරයට සකස් වී තිබුණු බව සිතිය හැක.

• පැරණි ගිවිසුම තුළ නීතිය විධායක හා අසම්භාව්‍ය ලෙස වර්ගකර තිබිණ.

• විධායක නීති සාමාන්‍යයෙන් කෙටි, සෘණාත්මක හා මධ්‍යම පුරුෂ ඒක වචනයෙන් ඉදිරිපත් කරයි.

• දස පනතේ මූලික වශයෙන් විධායක නීති ඇත. උදා:- නික්මයාම 20:3, 13-18.

• තව ද වාචික සම්ප්‍රදාය තුළ දස පනත මුළුමනින් ම විධායක ස්වරූපයක් ගත් බවට සාක්ෂි ඇත.

• පසුකාලයක විවිධ අවශ්‍යතා අනුව සමහර පනත් උදාහරණ: සබත සම්බන්ධ පනත තේරුම් කරදීම අවශ්‍ය විය. සබත සම්බන්ධ පනත, නික්මයාම 20:8-11 කොටසේ සවිස්තර ව ඉදිරිපත් කර ඇත. දස පනත නික්මයාම 20:3-17 හා ද්විතීය 5:7-21 සඳහන් වේ.

### දස පණතෙහි ලක්ෂණ

1. විධායක නීති පද්ධතියකි.
2. නිශේධාත්මක නීති 8 කි. (''නොකළ යුතු'')
3. ප්‍රතිශේධාත්මක නීති 2 කි. (''කළ යුතු'')
4. සර්වකාලීන නීති පද්ධතියකි. (සෑම කාලයට ම ගැළපෙන)
5. දෙවි-මිනිස් සහ මිනිස්-මිනිස් සබඳතාවය ගොඩනැගීමට දායක වෙයි.

• ඉශ්රායෙල් ජනයා එකම දෙවියන්ට වන්දනා කිරීමට ද උන්වහන්සේගේ අණ පනත් පිළිපැදීමට ද දස පනත මඟින් බැඳුණාහ.

• දෙවියන් වහන්සේ ඔවුන් දේව ජනතාවක් මෙන් සැලකීමට පොරොන්දු වූ සේක.

• දස පනත එහි බන්ධන සලකුණු විය.

• ඊට අදාළ ව්‍යවස්ථා, නීති රීති, සිරිත් විරිත් සඳහන් වේ. සාමූහික ජනතාවක් ලෙස අභිමානවත්, සාරධර්මයෙන් පෝෂිත ඉදිරි ගමනක් සඳහා ද දස පනත ඉවහල් විය.

• දෙවියන් වහන්සේ හා ඉශ්රායෙල් ජනතාව අතර නියෝජිතකු වශයෙන් ද ඉශ්රායෙල් ජනතාවගේ විමුක්තිදායක ජනනායකයා ලෙස ද දේව ජනතාවක් බිහි කිරීමේ මධ්‍යස්ථකයා ලෙස ද මෝසෙස් තුමා ව හැඳින්විය හැකි ය.

• එතුමා විසින් ඉදිරිපත් කරන ලද දස පනත ලෝක අවසානය දක්වා ම නොවෙනස් ව පවතිනු ඇත.

• යම් ආයතනයක්, රටක්, ජනතාවක් මෙහෙයවීමේ දී එහි විනය, සාර්ථකත්වය සඳහා නීති රීති සම්පාදනය හා ඒවා පිළිපැදීම අත්‍යාවශ්‍ය වේ.

• එලෙස ඉශ්රායෙල් ජනතාව ලද දස පනත නූතන කිතුනුවාට ද අත්‍යාවශ්‍ය බව දැක්විය හැකි ය.

• දස පනත පිළිගැනීම තුළ දේව සබඳතාවය පවත්වා ගත හැකි ය.

නිපුණතාව 3.0 : ප්‍රඥාවෙන් පූර්ණව දිවැසිවරයෙකු ලෙස සාක්ෂි දරයි.

නිපුණතා මට්ටම 3.1: පුරාණ ගිවිසුමේ දිවැසිවර සංකල්පය තුළින් ජීවිතය ආලෝකවත් කර ගනියි.

කාලච්ඡේද සංඛ්‍යාව : 10

**ඉගෙනුම් ඵල**

- දිවැසිවර සංකල්පයන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- දිවැසිවරයෙකු මෙන් කටයුතු කළ යුතු බව පිළිගනියි.
- දිවැසිවර සංකල්පයන් පිළිබඳ තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දිවැසිවරුන්ගේ ප්‍රධාන තේමා තම ජීවිතයට අදාල කර ගනියි.
- සදාචාරාත්මක දිවි පෙවතක් ගත කිරීමට ජීවිතාදර්ශයෙන් මග පෙන්වයි.

# දිවැසිවරු

**හැඳින්වීම:**

• දිවැසිවරයා යනු දෙවියන් වහන්සේ විසින් කැඳවනු ලැබ උන් වහන්සේගේ පණිවුඩය නිර්භය ව ප්‍රකාශ කරන්නෙකි. දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කළ මොවුන් කිසිවකුගේ නිලය, බලය, තත්ත්වය, තනතුර හෝ තමන්ට ලැබෙන ප්‍රතිචාරය මත ක්‍රියා කළ පිරිසක් නොවූහ.

• හෙබ්‍රෙව් බසින් දිවැසිවරයා "නබී" ලෙස හඳුන්වන අතර එහි අර්ථ තුනකි. ඒවා නම් කැඳවීම හා උතුරායාම වේ. පුරාණ ගිවිසුමෙහි ග්‍රීක පිටපත වන සෙප්ටුවාජින්තෙහි නබී යන හෙබ්‍රෙව් වචනය පරිවර්ථනය කරන්නේ "ප්‍රොෆේට්ස් " ලෙස ය. එහි අර්ථය"යමෙකු වෙනුවෙන් කථා කරන්නා" යනුයි. දිවැසිවරයා දෙවියන් වහන්සේ වෙනුවෙන් කථා කරන්නෙකි. දිවැසිවරුන් දිවැසි වදන් ප්‍රකාශ කිරීමේදී යොදා ගත් පද මාලා තුන එය සනාථ කරයි.

1. "සමිඳාණන් වහන්සේ මෙසේ වදාරන සේක." "සමිඳාණන් වහන්සේගේ පණිවුඩය මේය". (යෙසායා 1:2, එසකියෙල් 5:1)

2. "සමිඳාණන් වහන්සේගේ පණිවුඩය ..........වෙතට පැමිණියේය." (ජෙරමියා 1:3, එසකියෙල් 1:3)

3. "මෙසේ පවසන්නේ සමිඳාණන් වහන්සේ වන මමය". (ජෙරමියා 31:33, 34:2)

**ඉශ්‍රායෙල් දිවැසිවරුන් වර්ගීකරණය**

දිවැසිවරුන් ප්‍රධාන කොටස් දෙකකි.

1. පැරණි දිවැසිවරු

2. ශාස්ත්‍රීය දිවැසිවරු (සම්භාව්‍ය දිවැසිවරු)

පැරණි දිවැසිවරු - මොවුන්ගේ නමින් පොත් ශුද්ධ බයිබලයේ නැත. එහෙත් ඔවුන් කළ කී දෑ සාමුවෙල් හා රාජාවලිය යන ග්‍රන්ථවල සඳහන් වේ. උදාහරණ:

එලියා - 1 රාජාවලිය 17-19, 2 රාජාවලිය 1- 2

එලීෂා - 2 රාජාවලිය 2-13

නාතාන් - 2 සාමුවෙල් 7-12

හුල්දා (දිවැසිවරිය) - 2 රාජාවලිය 22: 14-20

අහියා - 1 රාජාවලිය 11:29, 12:15, 14:2

පැරණි දිවැසිවරුන්ගේ දූත මෙහෙවර තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ අතර ධ්‍යානයට සම වැදීම, කණ්ඩායම් වශයෙන් මෙහෙවරෙහි යෙදීම, තම දූත මෙහෙවර සනාථ කිරීම සඳහා හාස්කම් කිරීම සඳහන් කළ හැකි ය.

ශුාස්ත්‍රීය දිවැසිවරු - මොවුන් ප්‍රධාන කොටස් දෙකකි.

1. ප්‍රධාන දිවැසිවරු

2. සුළු දිවැසිවරු

ප්‍රධාන දිවැසිවරු - යෙසායා, ජෙරමියා හා එසකියෙල් ප්‍රධාන දිවැසිවරුන් තිදෙනාය.

සුළු දිවැසිවරු - හොසියා, ජෝවෙල්, ආමොස්, ඔබදියා, ජෝනා, මීකා, නාහුම්, හබක්කුක්, ශෙපනියා, හග්ගායි, සෙකරියා හා මලාකි සුළු දිවැසිවරු දොලොස් දෙනාය.
මෙම වර්ගී කරණයේ පදනම ඔවුන්ගේ පොත්වල විශාලත්වයයි.

දිවැසිවර ඉගැන්වීමෙහි ප්‍රධාන තේමා තුනකි

1. ඒක දේව වාදය
2. සදාචාරය
3. මෙසියානු සංකල්පය

## ඒක දේව වාදය

• ඒක දේව වාදය නැතහොත් එක ම වූ දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය පුරාණ ගිවිසුමේ දිවැසිවරුන්ගේ ප්‍රධාන ඉගැන්වීමකි. ඔවුන්ට අනුව වැඩසිටින්නේ එකම දෙවි කෙනෙකු පමණි. අන් සියළු දෙවිවරු, මැටි, ගල්, ලී යනාදියෙන් කරන ලද මිනිස් නිර්මාණ පමණි. එබැවින් ඒවාට වැඳුම් පිදුම් නොකල යුතුය.

• පැරණි ගිවිසුම තුළ පැවති දිවැසිවරයෙහි ඇති විශේෂත්වය වන්නේද දිවැසිවරුන් එක ම දෙවියන් වහන්සේගේ නියෝජිතයින් වශයෙන් දේව පණිවිඩය ප්‍රකාශ කිරීමයි.

## සදාචාරය

• ඉශ්‍රායෙල් ජනතාව නීතිගරුක, යුක්ති ගරුක හා ශිෂ්ඨ සම්පන්න ජනතාවක් බවට පත්වූයේ සීනයි ගිවිසුම හරහා ය. එසේ නම් ඔවුන් තුළ ශීල ධර්මය හා සදාචාරය ගොඩ නැගීමට දස පනත බෙහෙවින් පිටිවහලක් වූවාට සැක නැත දිවැසිවරුන් ද ඉශ්‍රායෙල් ජනතාව හැඳින්වූයේ ගිවිසුම් ජනතාවක් ලෙස ය. ඒක දේව වාදය හා සදාචාරය අතර සම්බන්ධය මැනවින් ඉදිරිපත් කරන ලද්දේ දිවැසිවරුන් විසිනි. දෙවිඳුන්ට ප්‍රිය වන්නේ දේව අණ පනත් ඉටු කරන්නා ය. යහපත් ජීවිතයක් ගතකරන්නා ය. එසේ නම් දිවැසිවර ආරාධනය වූයේ සදාචාර සම්පන්න ජීවිතයක් ගත කිරීමට ය. (යොසාය 1: 15-17).

ඔවුන් විශ්වාසවන්තකම, කරුණාව, ස්ථිර ප්‍රේමය ගිවිසුම් සම්බන්ධතාව පෙන්නුම් කරයි. දේශයේ තිබි යුතු විශ්වාස වන්ත කම දයා කරුණාව නැතිවී ගොස් බොරුකීම, මිනීමැරීම, සොරකම, කාමමිත්‍යාචාරය, ලේ වැගිරීම් යනාදිය දක්නට ඇත.
• අසල්වැසියාට එරෙහි ව කෙරෙන වැරදි නිසා විනිශ්වයේ දණ්ඩනය මනුෂ්‍යාට මෙන්ම සොබා දහම වෙතද බලපාන බව හොසියා 4:1-3 පැහැදිලි කරයි.

## මෙසියානු සංකල්පය

• ජුදා ජනතාවගේ බලාපොරොත්තු වන කේන්ද්‍රය වූයේ මෙසියස් වහන්සේය. හෙබ්‍රෙව් බසින් "මෂියාහ්" ලෙසද ග්‍රීක බසින් "ක්‍රිස්ටොස්" ලෙස ද මෙසියස් වහන්සේව හඳුන්වයි. එහි අර්ථය "ආලේප කරනු ලැබූ තැනැත්තා යන්නයි. පුරාණ ගිවිසුමෙහි පූජක වරු ද රජවරු ද දිවැසිවරු ද ආලේප කරනු ලැබුවෝ වෙති. මේ ත්‍රිවිධ කාර්යයන් ඒකරාශී වී මෙසියස් වරයාණන් තුළින් ප්‍රකාශ වන බව ඔවුන්ගේ විශ්වාසය විය. ජුදා සංකල්පයට අනුව මෙසියස් වහන්සේ පැමිණෙන්නේ දෙවියන් වහන්සේගේ රාජ්‍යය හෙවත් ආධිපත්‍යය ලොව තුළ ස්ථාපිත කිරීමට නිසා තමන්ට පැමිණෙන සියළු දුක් කරදර ඔවුන් ඉවසා සිටියේ අනාගත සෞභාග්‍යය ගැන සිහි කරමිනි.

පළමුවන මෙසියානික දිවැස් වැකිය නාතාන් දිවැසිවරයා දාවිත් රජුට ප්‍රකාශ කරයි. (2 සාමුවෙල් 7:10-17). එහි මෙසියස්තුමා සම්බන්ධ වැදගත් කරුණු 3 ක් අවධාරණය කරයි.

1. මෙසියස්තුමා දාවිත්ගේ පරපුරෙන් පැමිණෙන්නේ ය.

2. උන් වහන්සේගේ රාජ්‍යය දෙවියන් වහන්සේගේ රාජ්‍යය වන බැවින් එය සදාතනික ය.

3. මෙම රාජ්‍යය තුළ යුක්තිය, ධර්මිෂ්ඨකම හා සාධාරණත්වය ක්‍රියාත්මක වන හෙයින් එය සාමයේ රාජ්‍යයක් වන්නේ ය.

## එම්මානුවෙල් ලකුණ (යෙසායා 7 :10-17)

• ක්‍රිස්තු පූර්ව 734 සිට 732 කාලය සීරෝ - එෆ්‍රායිම් යුද සමය විය. අසිරියානු අධිරාජ්‍යයාට විරුද්ධව සටන් කිරීම සඳහා දමස්කයේ රජු වූ රේෂින් ද, උතුරු රාජධානියේ රජ වූ පෙකා ද සංවිධානය පෙරමුණට එකතු වීම ජෙරුසලමේ රජු වූ ආහාස් ප්‍රතික්ෂේප ක ලේ ය. අසිරියානු අධිරාජ්‍යයා වූ තෙවන තිග්ලත් ප්ලේසර් එම රාජධානි දෙක මත අධික බදු බර පටවා තිබිනි. යුද්ධ රථ 400 ක් පමණ අයත්ව සිටි ආහාස් රජතුමාගේ උපකාරය නොමැතිව උතුරේ රාජධානි වල අසිරියානු අධිරාජ්‍යයා සමග සටන් කළ නොහැක විය.
• ආහාස් රජුගේ සහාය නොලැබීම නිසා ඔහුට විරුද්ධව පෙරමුණ ගන්නට මෙම රජවරුන් තිදෙනා තීරණය කළ විට ආහාස් රජුට දිවැසිවරයා දේව පණිවිඩය ප්‍රකාශ කරයි. "කන්‍යාවක් පිළිසිඳගෙන පුත්‍රයෙකු බිහිකරන්නේය. එම්මානුවෙල් යන නාමය ඔහුට තබන්නේය. එහි අර්ථය "ස්වාමීන් වහන්සේ අප සමග ය'' යනුයි.

**එම්මානුවෙල්**

**එම්මානු** + එල්
අප සමග ය + දෙවියන් වහන්සේ

මෙම එම්මානුවෙල් ලකුණෙන් හඟවනු ලැබුවේ දෙවිඳුන්ගෙන් ඈත්ව සිටි ජනතාව සමග දෙවියන් වහන්සේ වැඩ සිට වික්‍රමාන්විතව ක්‍රියා කිරීමටත් ජනතාවට ජයග්‍රහණය හා සතුට උදා කර සාමය ලබා දෙන්නට ජනතාව අතරට පැමිණෙන බවත්ය.

## අනාගත සාම රජාණෝ (යෙසායා 1-7)

• බලාපොරොත්තු සුන් වූ පීඩිත ජනතාවක් වෙත දිවැසිවරයා ශුභාරංචිය පවසයි. "අන්ධකාරයෙහි ඇවිද්ද සෙනග මහත් ආලෝකයක් දුටුවෝ ය...."විදේශ ආක්‍රමණයන්ට හා ආධිපත්‍යයන්ට යටත් ව පැවති පලස්තීනයේ ප්‍රදේශයන්වල පවතින අඳුරු අසහනකාරී තත්ත්වය වෙනස් වී ඉශ්‍රායෙල් ජනතාවට ප්‍රීති ජනක බලාපොරොත්තුවක් ඇති කරවන දිවැස්වැකියකි. එයට හේතුව සතුරු ආක්‍රමණ සම්පූර්ණයෙන් ම අහෝසි වීමත් මෙතෙක් සතුරන් යටතට පත්ව තමන් අත්දුටු පීඩාවන් හා දරිද්‍රතාවයන්ගෙන් විමුක්තිය හා නිදහස ලැබීමත් ය. "අපට ළදරුවෙක් උපන්නේය..." මෙයින් අදහස් කරන්නේ මෙසියස් වහන්සේගේ උපතයි. මෙසියස් වහන්සේගේ සුලක්ෂණ හතරක් ගෙන හැර දක්වයි.

1. අසිරිමත් උපදේශකයාණෝ ය - දෙවියන් වහන්සේ වෙතින් උපදෙස් ලබන මෙතුමා මිනිස් ප්‍රඥාව මත පමණක් විශ්වාසය නොතබන බැවින් මිනිසාට මග පෙන්වීමක් කළ හැකි දේව ප්‍රඥාවෙන් පූර්ණ උත්තමයෙකි.

2. ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය - පුරාණයේ රජවරුන් සතු පරමාධිපත්‍යය පෙන්වීමට මෙම නාමයෙන් ආමන්ත්‍රණය කරනු ලැබී ය. පසුකාලීන ව මෙමගින් දේව අධිකාරිත්වය හඟවනු ලැබිණි. මෙසියස් වහන්සේ දේව අධිකාරි බලයෙන් සන්නද්ධ බව මින් ප්‍රකාශ වේ.

3. සදාතන පියාණෝ ය - මෙය දේව නාමයකි. මෙසියානික රාජ්‍යයේ සදාතනික බව මින් ඉස්මතු කෙරේ. පුරාණයේ දී රජතුමා එම රාජ්‍යයේ ජනතාවගේ පියා විය. එම නිසා සදාතනික රාජ්‍යයේ සදාතන පියාණන් වූයේ මෙසියස් වහන්සේ ය.

4. සාමයේ කුමාරයාණෝ ය - එතුමාණන්ගේ රාජ්‍යය සමය තුළ ජනතාවගේ සාධාරණ බලාපොරොත්තු හා අපේක්ෂාවන් ඉටුවීම හේතුකොට ගෙන අත්දකින සතුට, ආත්ම තෘප්තිය හා සංහිඳියාව මෙයින් ප්‍රකාශ කරයි. මෙසියස් වහන්සේගේ ආගමනය තුළ එය ඉටු වන්නේ ය. මෙසියස් වහන්සේ දාවිත් රාජ වංශයේ පෙළපත් උරුමය ලබන බවත් එම කුමාරයා තුළ ලබන රාජ්‍යයේ සදාතනික සාමයක් වැඩි වර්ධනය වන බවත් පවසන දිවැසිවරයා එවන් තිරසර වූ සාමයක් ඇති රාජ්‍යයක් ඇති කරන්නට එතුමාණෝ යුක්තියෙන් ද ධර්මිෂ්ටකමින් ද රජකම් කරන බවත් පැහැදිලි කරයි.

**සාම රාජ්‍යය (යෙසායා 11:1-9)**

දාවිත් රජ පරපුරෙහි රජවරු දෙවියන් වහන්සේට පිටුපා ඇත. එබැවින් දාවිත් රජ පරපුරෙන් අලුත් අංකුරයක් හට ගනී. "දාවිත්ගේ රජ පෙළපත නැමති වෘක්ෂයෙන් රාජ අංකුරයක් හටගන්නේ ය . . . . " එම රාජ අංකුරය නම් මෙසියස් වහන්සේය. උන් වහන්සේ මත දෙවියන් වහන්සේගේ ආත්මානුභාවය පතිත වේ. එමගින් ඇතිවන ප්‍රතිඵල දිවැසිවරයා පැහැදිලි කරයි. එම ප්‍රතිඵල නම්

ප්‍රඥාව (හොක්මා) - යුක්ති සහගත ව හා නිවැරදි ව ජීවිතයට මුහුණ දීමේ හැකියාව

නුවන - දේව කැමැත්ත තෝරා බේරා ගැනීමේ හැකියාව

අනුශාසනා බුද්ධිය - තව කෙනෙකුට හරි මග පෙන්වීමේ හැකියාව

බලය - බොහෝ විට ශාරීරික ව යොදනු ලබන්නාවූ පීඩනයක් ලෙස දැක්විය හැකි වුවත් මෙසියස් වහන්සේ තුළ පිහිටුවන බලය වනුයේ උන් වහන්සේගේ වචන හා එමගින් ඉදිරිපත් කරනු ලබන ක්‍රියාවන් තුළ ඇති බලගතු භාවයයි. එනම් දේව අභිමතය කරන්නට දක්වන පෙළඹවීමයි.

දැන ගැනීම අත්දැකීම් තුළින් ලබා ගන්නා අවබෝධයයි

දේව ගරු බිය දේව අණ පනත් පිළිපැදීමෙන් දෙවියන් වහන්සේට ගරු බිය දැක්වීම මෙයින් අදහස් කරයි.

• යුක්තිය හා විශ්වාසවන්තකම මත පදනම් වන මෙසියස් වහන්සේගේ රාජ්‍යය, සාමයේ රාජ්‍යයකි. එහෙයින් මිනිසා හා සත්වයා අතර ද සත්වයන් එකිනෙකා අතර ද සාමකාමිත්වය රජ කරයි. "වෘකයා බැටළුවා සමග වාසය කරන්නේ ය......කිරි දරුවා නාගයාගේ තුඹස පිට සෙල්ලම් කරන්නේ ය...."

• මෙය ලෝකාරම්භයෙහි පැවති සාමකාමී වතාවරණයට සමාන්තර වෙයි. පාපයට පෙර වූ සංහිඳියාව හා සාමය මෙසියස් වහන්සේගේ පැමිණීමත් සමග ඇති වන මෙම සංහිඳියාව සාම රාජ්‍යයේ ලක්ෂණය ය.

## ඉශ්රායෙල්ට අධිපතියෙක් ( මීකා 5:1-4)

බෙත්ලෙහෙම හෙවත් එප්‍රාතා වෙත අමතන මීකා දිවැසිවරයා විසිරී ගිය රාජකීයත්වය වෙනුවට ඉශ්රායෙල් හී නව නායකත්වයක් සඳහා මෙසියස්තුමා එම කුඩා ග්‍රාමයක උපදින බව කියයි. එප්‍රාතා යනු දාවිත් රජතුමා උපන් ගමයි. (සාමුවෙල් 17:12). දාවිත්ගේ පරපුර තුළින් නව නායකයෙක් බිහිවන බව මීකා දිවැසිවරයා තිරසාරව පවසයි.

• ක්‍රි. පූ. 701 දී ජෙරුසලම, අසිරියානු සෙනාකෙරීබ් රජුගේ ආක්‍රමණයට ලක් වූ පසු ඇති වූ අසරණ, බලාපොරොත්තු රහිත තත්ත්වය හමුවේ මීකා මෙසේ නව බලාපොරොත්තුවක් ඇති කරයි.

• දේශයන් හී විසිරී සිටින ජනතාව මෙසියස් වහන්සේගේ පැමිණීමත් සමග ඒක රාශි වන බවත්, දෙකඩ වූ රාජ්‍යයන් නැවත එක්වන බවත්, විප්‍රවාසයෙන් හා පීඩනයෙන් ඔවුන්ට මිදීම ලබා දෙන බවත් පවසන දිවැසිවරයා ජනතාව තුළ නැවුම් බලාපොරොත්තු ජනිත කරමින් නව නායකත්වයක් පිළිබඳ ව විශ්වාසය තහවුරු කරයි. උන් වහන්සේ පැමිණි විට පොළෝ තලයේ සීමාන්තය දක්වා සෑම දෙනා ම සමෘද්ධියත් සමාදානයත් අත් දකින බව මීකා දිවැසිවරයා අවධාරණය කරයි.

## සාම කුමාරයාගේ ආගමනය (සෙකරියා 9:9 -16)

• "සියොන් පුරගන සිප්‍රීති ප්‍රමෝද වන්න...." මේ ඇරයුම සමිඳුන්ගේ රාජ්‍යය බලයත් මෙසියානික සමයේ උදාවත් සැමරීම සඳහා ය. දාවිත් පරපුරෙන් එන රජ, දේව අභිමතය ඉටු කරමින් සාධාරණත්වය උදා කරයි.

• හෙබ්‍රෙව් ව්‍යවහාරයට අනුව එකළ රජවරු සාමයේ කාලයන්හී දී කොටළුවන් පිට ද නැගී ගිය බව කියවේ. ජනතාව වෙත පැමිණෙන මෙසියස්තුමා කොටළුවකු පිට පැමිණීම නිසා සාම යුගයක් උදාවන බව පැහැදිලි කරන අතර එතුමාණන් සාමයට ඇති ලැදි බව හා සාමකාමී බව පෙන්නුම් කරයි.

• මෙසියස්තුමාගේ පැමිණීමත් සමග යුද්ධයට සම්බන්ධ සියලු දේ අහෝසි වනවා පමණක් නොව යුද්ධයට දායක වූ සියල්ලම නිශ්ප්‍රභා කර දැමීමක් සිදු වේ. මෙසේ ස්ථාපිත බව රාජ්‍යයෙහි විශ්වීය බව ප්‍රකාශ කරන දිවැසිවරයා එහි සදාතනික ස්වභාවය ද පෙන්නුම් කරයි.

**නිපුණතාව** **3.0** : ප්‍රඥාවෙන් පූර්ණව දිවැසිවරයෙකු ලෙස සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** **3.2** : දිවැසිවර කැඳවීමට නොපසුබටව ප්‍රතිචාර දක්වයි

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් පල**

- දිවැසිවරුන් පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- වර්තමාන සමාජය තුළ දිවැසිවරුන් ලෙස දේව පණිවිඩය ප්‍රකාශ කළ යුතු බව පිළිගනියි.
- දිවැසිවරුන් පිළිබඳ ගොනුකරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- දිවැසිවර පණිවිඩය තුළ තම ජීවිතය හැඩගස්වා ගනියි.
- දිවැසිවර ආදර්ශය අනුව අන් අය යහමගට යොමු කරවයි.

# දිවැසිවර යෙසායා

## හැඳින්වීම

• යෙසායා යන්නෙහි තේරුම "සමිඳාණන් වහන්සේ ගලවන සේක"යන්නයි. දකුණු රාජ්‍යය වන ජුදයාවට හා ජෙරුසලම් වැසියන් හට යෙසායා කළ මෙහෙය ආරම්භ වූයේ උශ්ශියා රජ අපවත් වූ වර්ෂයේ දී ය.(යෙසායා 6:1)

• යෙසායාගේ දූත මෙහෙය ජුදයාවේ රජවරුන් වන ජෝතාම්, ආහාස් හා හෙසකියා යන තිදෙනාගේ රාජ්‍යය පාලන කාලයට සම්බන්ධය.(ක්‍රි. පූ. 742-701)

• ආමොස්ගේ පුත්‍ර යෙසායා පාලක පන්තියට අයත් වූ පුද්ගලයෙකු බව විශ්වාස කෙරේ. කෙසේ වුව ද යෙසායාගේ දිවැසිවර කාර්යය සිදු වූයේ ඉශ්‍රායෙල් ඉතිහාසයේ දේශපාලනමය ප්‍රශ්න පිරි යුගයක දී ය. ක්‍රි. පූ. 735-734 වූ සිරියානු - එප්‍රායිම් යුද්ධය ඔහුගේ කාලයේ දී සිදුවිය. යෙසායා ක්‍රි. පූ. 701 හි අසිරියානු රජ සෙනකෙරිබ් ජුදා දේශය ආක්‍රමණය කිරීම අත්දැක්කේය. මෙසේ ඉශ්‍රායෙල් රාජතන්ත්‍රය පිරිහීමකට ලක්ව තිබුණු යුගයක බලාපොරොත්තු හීන වූ ජනතාවකට බලාපොරොත්තු ඇති කිරීමට යෙසායාව තෝරා ගන්නා ලදී.

• පරිච්ඡේද 66 කින් යුත් යෙසායා ග්‍රන්ථය කතුවරුන් තිදෙනෙකුගේ කෘතියක් බව සාමාන්‍ය පිළිගැනීමයි. පරිච්ඡේද 1-39 කර්තෘ යෙසායා ලෙස ද 40-55 ද්විත්ව යෙසායා ලෙස ද 56-66 ත්‍රිත්ව යෙසායා ලෙසද බෙදා වෙන් කෙරේ.

## කැඳවීම

දිවැසිවර කැඳවීම දෙවියන් වහන්ස්ගෙන් ම ලද විශේෂිත කැඳවීමකි. එම කැඳවීම දේව ධර්මික ව්‍යුහයක් යටතේ ඉදිරිපත් කෙරේ. එම ව්‍යුහයට ආවේනික ලක්ෂන 5 කි.

1. දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම

මෙමගින් අවධාරණය වනුයේ දිවැසිවරයා තම කැඳවීම දෙවියන් වහන්සේ වෙතින් ම ලබා ගන්නා බව ය. ස්වාමින් වහන්සේගේ අති උත්කෘෂ්ඨභාවයත් දිවැසිවරය ලබන පුද්ගලයාගේ අසරණ බවත් මෙයින් පෙන්නුම් කරයි. මෙවන් දර්ශණ වල දී දෙවියන් වහන්සේගේ අති උත්කෘෂ්ඨ භාවයත් මහිමවත් වැඩ සිටීමත් මේඝ ගර්ජන, වලාකුළු, ඝන මීදුම, දුම, පොළවේ කම්පනය, සුළඟ ආදී දේ මගින් සංකේතවත් වේ. මෙසේ කැඳවනු ලැබූ දිවැසිවරයාගේ පණිවිඩය බලගතු ය, අධිකාරී බලයෙන් යුක්ත ය.
උදා :සමිඳාණන් වහන්සේ දේව මාලිගාවෙහි වැඩ සිටීම යෙසායා දර්ශනයක් මගින් අත් දකියි. (6:1-4)

2. දූත මෙහෙවර පැවරීම

එක් එක් වූ දිවැසිවරයාට දානය කරනු ලබන්නේ විශේෂිත වූ දූත මෙහෙවරකි. දිවැසිවරයාව තෝරා ගැනීම වෙනුවෙන් දේව කැමැත්ත වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීම දූත මෙහෙවර භාර දීමේ දී ප්‍රකාශ කෙරේ. එමගින් ඔහු යොමු විය යුතු කාර්යභාරය, කළයුතු ක්‍රියාදාමය දෙවියන් වහන්සේ ඔහු ඉදිරියේ අනාවරණය කරනු ලබයි. උදාහරණ: යෙසායාට පැවරෙන්නේ දැඩි සිත් ඇති හෙබ්‍රෙව් ජනතාව දැනුවත් කිරීමට ය. (6:9-10)

3. කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැලි වීම

දිවැසිවරයා තමාට පැවරෙන භාරදූර කාර්ය භාර ගැනීමට මැලිවෙයි. එය මග හැරීමට උත්සාහ කරයි. මෙයට හේතු වනුයේ ජනතාව අසන්නට අකමැති දේ දිවැසිවරයාට පවසන්නට සිදුවීම ය. එහි ප්‍රතිඵලයක් ලෙස ඔහුට බොහෝ දුක් වේදනා පීඩා හා ප්‍රතික්ෂේප කිරීම් වලට මුහුණ දීමට සිදුවන බව ඔහු දනියි. උදාහරණ: යෙසායා සිය අකමැත්ත ප්‍රකාශ කරන්නේ තමාගේ නුසුදුසු භාවය කියා පාමිනි. (6:5)

4. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්යවත් කරනු ලැබීම

දුක් කම්කටොළු, තර්ජන, අපවාද හා අවිනිශ්චිත හැඟීම් වලින් පීඩනයට පත් වූ වගකීම බාර ගැනීමට අකමැති වන දිවැසිවරයා ව ශක්තිමත් කරන දෙවියන් වහන්සේ ඔවුන් සමග වැඩ සිටිනා බවටත් දුෂ්කර අවස්ථාවන්ට මුහුණ දීමට ධෛර්යය හා ශක්තිය දෙන බවටත් ප්‍රතිඥා දෙයි. උදාහරණ: යෙසායාගේ තොල් පවිත්‍ර කරනු ලබයි (6:6-7)

5. දිවැසිවරයා යවනු ලැබීම

කිසිදු කොන්දේසියක් නොමැතිව, සිය ප්‍රතිඥාව මත ම දේව පණිවිඩය ප්‍රකාශ කරන්නට දිවැසිවරයාව යවනු ලබයි. මෙසේ දේව බලයෙන් සන්නද්ධ වන දිවැසිවරයා තමා ලද පණිවිඩය ප්‍රකාශ කිරීමට පිටත් වේ. උදාහරණ: යෙසායා යවනු ලබන්නේ දැඩි සිත් ඇති කොතෙක් සවන් දුන්නත් තේරුම් නොගන්නා ජනතාව වෙතට ය (6:9-13)

## ප්‍රධාන ඉගැන්වීම්

## ස්වාමීන් වහන්සේගේ සේවකයා

• ස්වාමීන් වහන්සේගේ සේවකයා" යන සංකල්පය දෙවන යෙසායා ග්‍රන්ථයෙහි දක්නට ලැබේ. මෙම සේවකයා දුක්විඳින සේවකයෙකි. ඔහු දුක් විඳින්නේ අන් අයගේ යහපත සඳහා ය.
• සේවකයා සම්බන්ධ ගීත හතරකි.
• මෙම ගීතයන්හි දුක් විඳින සේවකයා විටෙක තනි පුද්ගලයෙකු ලෙස ඉදිරිපත් කෙරේ. තනි පුද්ගලයා දිවැසිවරයෙකු හෝ යෙසායා දිවැසිවරයා ම විය හැකි ය. ඔහු ඇතැම් අවස්ථාවක ජනතාව නියෝජනය කරයි. එම ජනතාව බැබිලෝනියාවේ විප්‍රවාස ගතව සිටින ඉශ්‍රායෙල් ජාතිය විය හැකිය. මෙම දුක් විඳින සේවකයා පිළිබඳ දිවැස් වැකික්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණ විය.

## පළමුවන ගීතය (යෙසායා 42:1-9)

• මෙය " දාසයාගේ ගීතය" නමින් ද හැඳින්වේ. දෙවියන් වහන්සේ සුවිශේෂ මෙහෙයක් සඳහා සේවකයා ව තෝරා ගෙන ඇත. පැවරී ඇති මෙහෙය සම්පූර්ණ කිරීම සඳහා ඔහුට දේවාත්මානුභාවය ලැබී ඇත.
• පුරාණ ගිවිසුම තුළ නායකයින් හට දේවාත්මානුභාවය ලැබෙන්නේ දිවැසිවර හා පාලන කාර්යයන් සම්බන්ධයෙනි. (1 සාමුවෙල් 16:1 3, එසකියෙල් 2:2, ජෝවෙල් 2:28) මෙහි දී සේවකයා වෙත ද එම බලය, සේවය සපුරාලන්නට දෙවියන් වහන්සේ විසින් තිළිණ කරනු ලබන්නේ ය. "තැළුණු බට දණ්ඩක් කඩා දමන්නේ නැත. නිවීගෙන යන පහන් තිරයක් නිවා දමන්නේ නැත . . ." මෙය දුබල වූ අත් හරින ලද ජන කොටසක් පෙන්වන සංකේතයකි. සේවකයා තම කාර්යය ඉටු කිරීම සඳහා හිංසාකාරී පියවරක් නොගන්නා බව මෙයින් ඇඟවේ. ජාතීන් උදෙසා මැදිහත් වන ඔහු අධෛර්යයට පත් නොවන අතර යුක්තිය ඉටුවන තුරු ඉවසිලිවන්තව ක්‍රියා කරන්නේ කල කිරීමෙන් තොර ව ය.

## දෙවන ගීතය (යෙසායා 49:1-7)

• ජෙරමියා දිවැසිවරයා තෝරා ගත්තාක් මෙන් උපදින්නටත් පෙර සිට ම එනම් මව් කුසයෙහි දී ම සමිඳාණන් වහන්සේ මෙම සේවකයා තෝරා ගෙන ඇත. ඉශ්‍රායෙල් ජාතීන්ගේ පුනරුත්ථාපනය සඳහා සේවකයා දෙවියන් වහන්සේ තුළ යැපෙයි. මෙය විමුක්ති දායකයෙකුගේ කාර්යයකි.
• සියලු ම ජාතීන්ට ගැලවීම ගෙන ඒම ඔහුගේ කාර්ය වන අතර ජාතීන්ට ආලෝකයක් ලෙස මග පෙන්විය යුතුව ඇත. සිය දූත කාර්යයෙහි දී දෙවියන් වහන්සේ ඔහු ව ආරක්ෂා කරනවා පමණක් නොව ඔහුගේ ජයග්‍රහණය ද ඇත්තේ උන් වහන්සේ තුළය.

### තුන්වන ගීතය (යෙසායා 50:4-11)

• ස්වාමින් වහන්සේගේ සේවකයා වේදනා මැද්දේ වුව ද දෙවියන් වහන්සේට ඇහුම්කන් දීමට කැමති ව කීකරු ව සිටියි. ඔහුගේ ප්‍රධාන කාර්යය වන්නේ දෙවි සමිඳාණන් වහන්සේට විවෘත ව සවන් දීම ය ඔහු එසේ සවන් දෙන්නේ තමන් අනාවරණය කර ගත්තාවූ වචනය තුළින් අන් අය ගොඩනැංවීමට ය. මෙය දිවැසිවරයකු සතු ලක්ෂණයකි.
• තම කාර්යයට දක්වන පක්ෂපාති බව නිසා ම තමන් ප්‍රකාශ කරන වචනය හේතුකොට ගෙන සේවකයා පීඩාවට පත් වේ. හෙතෙම සියල්ල ඉවසීමෙන් දරා ගනියි. සිය නිර්දෝෂ බව ප්‍රකාශ කරලීම සඳහා සමිඳාණන් වහන්සේට බාර කරයි.
• සේවකයා තුළ ඇත්තේ නොසැලෙන ගැඹුරු විශ්වාසයකි. ඔහුට වද හිංසා පමුණුවන අය ඉදිරියේ ඔහු නිහඬ ව සිටින්නේ තමන්ව පරාජය කරන්නට නොහැකි බව දෙවියන් තුළ විශ්වාස කරන නිසාය.

### හතරවන ගීතය (යෙසායා 52: 13-53:12)

• මෙම ගීතය සේවකයා පිළිබඳ ඇති වඩා ප්‍රසිද්ධ වූ ගීතය වේ. මෙහි සේවකයා මුහුණ දෙන ශාරීරික වද හිංසා සජීවී ව විස්තර කරයි. සේවකයා විඳින වේදනාව කොපමණ තදබල ද යන්න පෙන්වා දීමට සේවකයා මිනිස් රූපයකට සමාන නොවන ආකාරයට විරූපී ව අවලස්සණ වී ඇති බවත් එම විරූපී බව නිසා ම ප්‍රතික්ෂේප කරනු ලබන බවත් පැහැදිලි කරයි.
• පව්කරුවන් උදෙසා ඔහු තම ශුද්ධ වූ ජීවිතය පූජා කරන හෙයින් දෙවිඳාණෝ ඔහුට ජයග්‍රහණය දෙන සේක.

• සේවකයාගේ දූත මෙහෙය හා ඔහුගේ ඔසවනු ලැබීම සමිඳාණන් වහන්සේ දැනුම් දුන්නේ ජාතීන්ගේ මවිතයට හේතු වන අයුරිනි. සේවකයා වෙනුවෙන් දෙවියන් වහන්සේගේ අභිරහස්‍යමය සැලැස්මක් ක්‍රියාත්මක වන බවත් ඔවුහු එමගින් තේරුම් ගනිති. විශේෂයෙන් රජවරුන් හා ජනතාව තුළ ඇතිවන ත්‍රාසයත්, භීතියත් පෙන්වා දෙමින් සේවකයාගේ දුක් විඳීම තුළින් දෙවියන් වහන්සේගේ බලවත් හස්තයේ බලපරාක්‍රමය අනාවරණය කරයි.

• දෙවියන් වහන්සේ එවැනි පුද්ගලයෙකු ඔසවනු ලැබීම විශ්වාස කළ නොහැකි දෙයකැයි සමහරු කියයි. වියලි බිමෙන් මතුවන අංකුරයක් සේ ද වැඩෙන පැළැටියක් සේ ද, ජනතාව තුළ බලාපොරොත්තු ඇති කළ කෙනෙකු සේ පෙන්වා දෙයි. එනමුත් බලාපොරොත්තු බිඳ දමමින් සේවකයා දුක් විඳීමට භාජනය වේ. ඔහු ව ජනතාව විසින් එපා කරනු ලබයි. නෙරපනු ලබයි. ජනතාව අවසානයේදී සේවකයා සම්බන්ධයෙන් තමන් දැරූ ආකල්පයන් පිළිබඳ ව තමන්ගේ වරද පිළිගන්නට පටන් ගනියි. පුරාණ ගිවිසුමෙහි සමාව ලබන පිණිස මිනිස් පූජාවක් කළ යුතු බවට සඳහන් කර ඇත්තේ මෙහි පමණි.
• එතුමාණන්ගේ එම දුක් විඳීම නිසා ජනතාව දේව සබඳතාවයට පත්වී දෙවියන් වහන්සේ සමග සමගි වේ. එහි දී තමන් මෙතෙක් මුළා වී දෙවියන් වහන්සේගෙන් ඈත් ව සිටි බව ජනතාව අවබෝධ කර ගනියි.
• මෙම පව් නසන පූජාව නිසා සේවකයා ව මහිමයට පත් කරනු ලබන්නේ ය.
• ජේසුස් වහන්සේගේ පාස්කු අභිරහස තුළ දුක් විඳින සේවකයාගේ ප්‍රතිරූපය පූර්ණ ලෙසින් ජීවමාන කළ සේක. සේවකයා ඉදිරිපත් කරන අවිහිංසාවාදී ජීවිත ක්‍රමය ක්‍රිස්තුස් වහන්සේ අනුගමනය කළ සේක.

## දිවැසිවර ජෙරමියා

### හැඳින්වීම

• ජෙරමියා යන්නෙහි තේරුම "සමිඳාණන් වහන්සේ උසස් කළ සේක" හෝ "ස්ථාපිත කළ සේක" යනුයි. ජෙරමියා 1:2-3 අනුව දිවැසිවරයාගේ දූත මෙහෙවර ජොෂියා (ක්‍රි. පූ. 640-609) ජෙහොයාකිම් (ක්‍රි. පූ. 609-598) හා ශෙදකියා (ක්‍රි. පූ. 598-587) යන රජුන්ගේ කාලයට සම්බන්ධ කර ඇත.
• ජෙරමියා දිවැසිවරයා තම දූත මෙහෙය ක්‍රියාත්මක කළේ බැබිලෝනියානු විප්‍රවාසයට පෙර ය. යාවේ දෙවියන් වහන්සේට පක්ෂපාතී ව උන් වහන්සේගේ ගිවිසුමේ නියමයන් පිළිපැදීම ඉශ්‍රායෙල් ජනතාවගේ වගකීම බව ජෙරමියා දිවැසිවරයා අවධාරණය කරයි.
• ජනතාව විසින් ගිවිසුම උල්ලංඝනය කරනු ලැබීම හේතු කොට ගෙන දැඩි දේව විනිශ්චයකට ඔවුන් යටත් වන බව දිවැසිවරයා තරයේ කියා සිටියි. ජනතාව සිත් හැරීමකට කැඳවන ජෙරමියා සමිඳාණන් වහන්සේ තීරණය කර ඇති දිනක මුළු මහත් දේව ජනතාව සමග නව ගිවිසුමක් ඇති කරන බව කියමින් (31:31-34) ඔවුන් තුළ ගැලවීමේ මතු බලාපොරොත්තුව ඇති කරයි.

## කැඳවීම

1. දර්ශනය හෝ විශේෂ අත්දැකීම

ජෙරමියා දිවැසිවරයාගේ කැඳවීමේ කථා පුවත ඔහු හා ස්වාමීන් වහන්සේ අතර ඇතිවූ දෙබසකින් ආරම්භ වේ. දිවැසිවරයාට මව් කුසෙහි පිළිසිඳ ගැනීමටත් පෙර සිටම තෝරාගෙන ඇති බව ප්‍රත්‍යක්ෂ වේ. (1:5) මෙයින් අදහස් වන්නේ ජෙරමියා දිවැසිවරයෙකු වන්නට නියමව සිටි බවයි. දිවැසිවරයෙකු පත් කිරීම තුළ ජාතීන්ගේ ගැළවීම සඳහා වූ නිශ්චිත සැලැස්මක් දෙවියන් වහන්සේ තුළ වූ බව මින් පෙන්නුම් කෙරේ.

2. දූත මෙහෙවර

ජාතීන් හට දිවැසිවරයෙකු ලෙස පත්කිරීම පිළිබඳ මෙහෙවර (1:1-3) ඓතිහාසික පසුබිමක දක්නට ලැබේ. එනම් රජවරු තිදෙනෙකු යටතේ මෙහෙවර ක්‍රියාත්මක කිරීම ය.

3. කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැලි වීම
දිවැසිවරයාගේ අකමැත්ත ප්‍රකාශ කරනුයේ මුහුණ දීමට සිදුවේ යැයි සිතූ අමාරුකම් නිසාවෙන් විය යුතු ය. (1:6)

4. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්යවත් කරනු ලැබීම.
දූත මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ දී දෙවියන් වහන්සේගේ සහයෝගය සනාථ කරමින් උන් වහන්සේ දිවැසිවරයා ව ධෛර්යවත් කරනු ලබයි. (1:7-8). අත දිගු කිරීමෙන් තම බලය ප්‍රධාන කිරීමත්, මුඛය ස්පර්ශ කිරීමෙන් තමන් වහන්සේ සමග ඇති සම්බන්ධතාවත් ප්‍රකාශ කරයි.
• සතුරන් ඔහුට විරුද්ධ ව කොපමණ සටනක් කළත් ඔහු ව පරාජය කරන්නට ඔවුන්ට නොහැකිය. සමිඳාණන් වහන්සේ ඔහුව ධෛර්යමත් කරමින් එය සනාථ කරන්නේය.

5. දිවැසිවරයා යවනු ලැබීම

යහපත් දෙය ගොඩනැගීමටත් අයහපත් දෙය සුනු විසුනු කිරීමටත් ජෙරමියාව යවනු ලබයි. (1:9-10) සිත් දැඩි වූ පව්වු අයට දඬුවම් සහිත විනිශ්චයක් සිත් හැරෙන්නාට සමාව, සාමය හා සෞභාග්‍ය ලඟා කර දීමත් දිවැසිවරයා දෙවියන් වහන්සේගේ ප්‍රබල මාධ්‍යයක් වීමට ක්‍රියා කළ යුතු බව පෙන්වයි.

## ප්‍රධාන ඉගැන්වීම්

### ගිවිසුම් ජීවිතය (ජෙරමියා 31:31-34)

• සීනයි ගිවිසුම බිඳ වැටී ඇත්තේ ජනතාවගේ වරදින්ය. ජෙරමියා ප්‍රකාශ කරන අළුත් ගිවිසුම සීනයි ගිවිසුම ට වඩා වෙනස් වේ. එය පැරණි සීනයි ගිවිසුමට නැවත පුණර්ජීවයක් දෙන්නට හෝ අලුත්වැඩියා කිරීමට හෝ කරන්නා වූ උත්සාහයක් නොවේ. එය සීනයි ගිවිසුමට වඩා වෙනස් වූ ජීවමාන එකකි.
• සීනයි ගිවිසුම ද්විපාර්ශවික ගිවිසුමක් වන අතර මෙම නව ගිවිසුම ඒක පාර්ශවික ගිවිසුමකි. එනම් ජනතාවගේ අවිශ්වාසවන්තකමින් බිඳිය නොහැකි සමාව පදනම් වූ ගිවිසුමකි. තව ද නීතිය හදවත් ගත කර ඇති නිසා දේව කැමැත්ත ජීවිතයට අන්තර් ගත වූ ජනතාවක් සමග ඇති කර ගන්නා ලද ගිවිසුමකි.
• මෙම නව වකවානුවේදී දෙවිඳුන් හා ජනතාව අතර මැදිහත් කරුවන් අවශ්‍ය නොවේ. මන්ද දෙවියන් වහන්සේ ඍජුව ම ජනතාව සමග සම්බන්ධ වන බැවිනි.
• එසේ ම උන් වහන්සේගේ අණ පනත් හදවතෙහි ලියා තබන විට දෙවිඳුන් දැන ගැනීම ද ඇතුලාන්තයෙන් ම සිදුවන්නකි. එහෙයින් මෙම ගිවිසුම බාහිර දෙයක් නොවන අතර සැමදා තම ජීවිතය තුළ ක්‍රියාවට නංවන සිත්වල ලියවුනු අලුත් ගිවිසුමකි.
• නීතිය හෙවත් අණ පනත් කෙනෙකුගේ හොඳ නරක මණින මිනුම් දණ්ඩක් නොවේ. එය දේව අභිමතය අනුව යහපත් දිවියකට මග පෙන්වන මාර්ගෝපදේශයකි. දේව අභිමතය ජනතාව තුළ ඇතිවීමෙන් මෙම ගිවිසුම් සබඳතාවය ඇතිවන්නේ ය. ගිවිසුම ඉදිරියට ම ගෙන යාම සඳහා සැබෑ සිත් හැරීමකින් පසු ව ඇති වන පව් සමාව අත්‍යාවශ්‍යය ය.
• දෙවියන් වහන්සේ ජනතාව සමග ඇති කර ගන්නා අලුත් ගිවිසුම තුළ ඔවුන්ගේ පාපයන්ට සමාව ලැබේ.
• පුරාණ ගිවිසුමෙහි දිවැසිවරුන් ප්‍රකාශ කළ නව ගිවිසුම ක්‍රිස්තුන් වහන්සේ තුළ සම්පූර්ණත්වයට පත් වූ බව ලූක් 22:20 මගින් තහවුරු කරයි.

# දිවැසිවර එසකියෙල්

## හැඳින්වීම

• එසකියෙල් යන්නෙහි තේරුම 'දෙවියන් වහන්සේ ශක්තිමත් කරන සේක" යනුයි. ක්‍රි. පූ. 597 දී නෙබුකද්නේශර් විසින් ජෙහොයාකින් රජු හා එසකියෙල් ඇතුලු 10,000ක් විප්‍රවාසය සඳහා බැබිලෝනියාවේ විප්‍රවාසයට ගෙන ගියේ ය. (2 රාජාවලිය 24-25 පරිච්ඡේද) එසකියෙල් එහි සිටිය දී දිවැසිවරයෙකු වීමට කැඳවීම ලැබුවේ ය. (1:1-3) පූජක පවුලකට අයත් ඔහු බුසී ගේ පුත්‍රයා ය. සිය දූත කාර්යයේ නියැලුනේ බබිලෝනියාවේ ය.
• දර්ශන, උපමා හා සංකේත මගින් දිවැසි පණිවුඩ ප්‍රකාශ කිරීම එසකියෙල් දිවැසිවරයාගේ විශේෂ ලක්ෂණ ය. සාමූහිකත්වයේ මුවාවෙන් පෞද්ගලික වැරදි සඟවා ගත නොහැකි බව ද එකිනෙකා තම තමාගේ වැරදිවලට වගකිව යුතු බව ද හෙතෙම දැඩි ලෙස අවධාරණය කලේ ජාතියේ පුනරුජ්ජීවනය පිළිබඳ ව බලාපොරොත්තුවක් ඇති කරමිනි. එසකියෙල් ගැඹුරු ඇදහිල්ලක් මෙන්ම උදාර චින්තන ශක්තියක් ද දුර දක්නා නුවණක් ද හිමි පුද්ගලයෙකි.

## කැඳවීම

1. දේව දර්ශනය හෝ විශේෂ අත්දැකීම

දිවැසිවරයා ඉතා සංකීර්ණ දර්ශනයක් දකියි. දෙවියන් වහන්සේගේ අභිරහස්මය වැඩ සිටීම එයින් සංකේතවත් කරයි.(1:1-3)

2. දූත මෙහෙවර පැවරීම

එසකියෙල් තුළට දේවානුභාවය ඇතුළුවීම තුළින් සංකේතවත් කෙරෙනුයේ දූත මෙහෙවර දියත් කිරීමට දිවැසිවරයා ලබන බලයයි ( 2:1-7)

3. කැඳවීම භාර ගැනීමට දිවැසිවරයා මැලිවීම

දිවැසිවරයාට පැවරී ඇත්තේ විප්‍රවාසී ව සිටින දැඩි සිත් ඇති සිය ජනතාවට දේශනා කිරීමට ය. මුරණ්ඩු ජනතාවකට මුහුණ දීමට දිවැසිවරයා අකමැති වෙයි.(3:14)4. දෙවියන් වහන්සේ විසින් දිවැසිවරයා ධෛර්වත් කරනු ලැබීම

දෙවියන් වහන්සේගේ හස්තයේ ඇති අකුලන පොතක් අනුභව කිරීම සඳහා දිවැසිවරයාට දෙනු ලබයි. සාමාන්‍යයෙන් හකුලන ලද ලියවිල්ලක ලියා තිබුණේ ඇතුළත පමණි. දෙපැත්තෙහිම ලියා ඇති මෙම අස්වාභාවික ලියවිල්ලෙන් අදහස් කෙරෙන්නේ එය දේව අණාවරණයන්ගෙන් පිරී ඇති බවයි (2:8-10)

5. දිවැසිවරයා යවනු ලැබීම.

ඉතා මුරණ්ඩු තද සිත් ඇති කැරළිකාර වංශයක් වන විප්‍රවාසගත ජනතාවගේ මුරණ්ඩු සිත් වෙනුවට මාංශමය හදවතක් ඇති කිරීමට එසකියල් ව යවනු ලබයි. ඔහු ව යවනු ලබන්නේ දෙවියන් වහන්සේට විරුද්ධව කැරළි ගැසූ ජනතාවක් වෙතට ය. ඔහුගේ සුවිශේෂී කාර්යය නම් දේව පණිවුඩය ජනතාවට පොදුවේත් පෞද්ගලිකවත් දන්වා සිටීමයි. එයට ලැබෙන ප්‍රතිචාරයට දිවැසිවරයා වගකිව යුතු නොවේ.(3:1-11)

## නව ජීවිතය (එසකියෙල් 37:1-14)

• දෙවියන් වහන්සේ ආශ්චර්යවත් ලෙස තම සෙනගට දෙන්නා වූ නව ජීවිතය පිළිබඳ සිත් ගන්නා රූපයක් ගොඩ නැගීමට ඇට කටු යොදාගෙන ඇත.
• විප්‍රවාසයෙන් මිදී නැවත පැමිණීම මළවුන්ගෙන් නැගිටීම හා සමාන අපූර්ව සිද්ධියකි. ඉශ්රායෙල් ජාතිය විප්‍රවාස ගත ව ඇත. ඔවුන් වියලි ඇටකටු මෙනි. එහෙත් ස්වාමීන් වහන්සේ ප්‍රකාශ කරන්නේ ඔවුන් ජීවත් වන පිණිස ඔවුන් මත ජීවන හුස්ම හෙලන බව ය. එනම්, ඔවුන් නැවත තම දේශයට යන බව ය.

## දිවැසිවර ආමොස්

• ජෙරුසලමේ සිට කිලෝමීටර් දහඅටක් පමණ දකුණින් පිහිටි තෙකෝවා නමැති ග්‍රාමයේ වැසියෙකු වන ආමොස් (1:1) වෘත්තියෙන් එඬේරෙක් මෙන් ම අත්තික්කා වගා කළ ගොවියෙකි (1:1, 7:14), අමොස් ගේ දිවැසිවර සේවාව ක්‍රි. පූ. 760 පමණ දෙවන ජෙරබෝවාම් රජුගේ පාලන සමයේ (ක්‍රි. පූ 767/747 ආරම්භ වන්නට ඇත.

• ආමොස් දිවැසිවරයාගේ පණිවිඩයට ඉලක්ක වූයේ උතුරු රාජධානියයි. උතුරේ වෙළඳාම සරුවීම නිසා ඉහළ සමාජ පන්තියක් බිහි විය. ඔවුන් දුගී දුප්පතුන් සූරා කෑමට ලක් කළේ ය. ඇති නැති පරතර වර්ධනය විය. ඉහළ තනතුරු දැරූ අය සුඛෝපභෝගී ජීවිත ගත කළහ. එහෙත් එඬේරුන් , කම්කරුවන් හා ගොවීන් දිළිඳු අසරණ තත්වයක සිටියේ ය. මෙම සමාජ පන්ති දෙක අතර පරතරය කැපී පෙනෙන්නට විය. ඉහත වාතාවරණය තුළ සොයුරු ජනතාව පීඩනයට පත් කරන අසාධාරණය දේව උදහසට ලක්වන බව ආමොස් නිර්භීත ව පෙන්වා දුන්නේ ය. මේ නිසාම "සමාජ සාධාරණත්වයේ දිවැසිවරයා ලෙස ආමොස් දිවැසි වරයාව හඳුන්වනු ලබයි.

• ඔහු සමාජ අසාධරණත්වය හා ආර්ථික අසමානතා දැඩි ලෙස හෙලා දුටුවේ ය. ඔහු 2:6-16 හි සැඟවුනු අසාධාරණත්වය ගැන දැඩි ලෙස කථා කරයි. තව ද දිළිඳුන් සූරා කෑම, ධනය රැස්කිරීමේ අසාධාරණත්වය හා වානිජ ලෝකයේ අයුක්තිය පිළිබඳ ව පැහැදිලි කරයි. (4:1-3, 6:1-7, 8:4-8) තරබාරු එළදෙනුන් සම්බන්ධ රූපකය අධික සැප සම්පත් විඳිමින් සමාරියේ උසස් සමාජයේ කතුන් ගත කල ජීවිතය ගැන උපහාසාත්මක ඉදිරිපත් කිරීමකි. එසේ ම සිය රැකියා කටයුතු වලදී ද ඉශ්‍රායෙල් ජනතාව එහි ශුද්ධත්වය කෙලසා දමා ඇති බව දිවැසිවරයා තව දුරටත් පැහැදිලි කරයි.

## දිවැසිවර හොසියා

• හොසියා යන්නෙහි අර්ථය 'සමිඳාණන් ඔබ මුදා ගන්නා සේක" හෝ "සමිඳාණන් ඔබේ සහායට වඩිනා සේක" යනුයි. උතුරු රාජ්‍යය වූ ඉශ්රායෙලයෙහි වැසියෙකු වූ හොසියා ආමොස් දිවැසිවරයාගේ සමකාලීනයෙකි. වෙනත් දෙවි වරුන්ට වන්දනාමාන කිරීමේ පාපය ගැන කථා කිරීමේ දී එම පාපය ගණිකා වෘත්තියක්, වෛශ්‍යාකමක් ලෙස ඔහු දකියි.

• දෙවියන් වහන්සේගේ ආදරය ගැන කථා කිරීමේ දී එම ආදරය සෑම වරදක් ම අමතක කර, සමාව තිළිණ කරන, මිය ඇදුන අතීතය අමතක කර දමා අනාගතයට මුහුණ දීමට සෑම විටම සූදානම් ව සිටින ස්වාමි පුරුෂයෙකුගේ අසීමිත ආදරයකට සමාන කරයි.

• අන් දෙවි වරුන් ඇදහීම හොසියා දැඩි ලෙස හෙලා දැක්කේ ය. සිය දේශයේ ඉතිහාසය ඇගයීමට ලක් කිරීමට දිවැසිවරයා යොදාගන්නා ඒකකය දෙවියන් වහන්සේගේ අසීමිත ආදරයයි. දිවැසිවර හොෂියා මනස්ථාපනය සඳහා ජනතාව කැඳවනු ලැබූ අතර දෙවියන් වහන්සේගේ යුක්තිය හා සාධාරණත්වය වෙතට ඔවුන් යොමු කලේ ය. "දෙවියන් වහන්සේගේ ආදරයේ දිවැසි වරයා" ලෙස ද හොසියා හඳුන්වනු ලබයි.

• හොසියාගේ ඉගැන්වීම් වල පදනම වූයේ ඔහුගේ පෞද්ගලික අත්දැකීමකි. හොසියාගේ බිරිඳ ගෝමෙර් සම්බන්ධව විවිධ අර්ථ කථන දක්නට ඇතත් ඇය සිය සැමියාට අවිශ්වාස වන්ත වී ඔහු අතහැර ගොස් ඇත. මෙම කටුක අත්දැකීම දෙවියන් වහන්සේ හා සිය සෙනග අතර ඇති සම්බන්ධය පැහැදිලි කිරීමට හොසියා යොදා ගනියි.

• හොසියාගේ ඉගැන්වීම්වල දී විවාහය නැමති සංකල්පය තුළින් දෙවියන් වහන්සේ හා සිය ජනතාව අතර ගිවිසුම් සබැඳියාව සංකේතවත් කරයි. හොසියා ගේ දරුවන්ට දෙනු ලබන්නේ ද සංකේතාත්මක නාම ය. "ජෙශ්‍රෙයෙල්'' "දෙවියන් වහන්සේ වපුරන සේක" "ලෝ - රුහාමා" "අනුකම්පා නොලද්දී" "ලෝඅම්මි" "මාගේ සෙනග නොවේ" වශයෙන් නම් කෙරිණි. ජනතාව දෙවියන් වහන්සේ හැර දමා ගිය ද උන 'වහන්සේ ඔවුන්ට අනුකම්පා කොට නැවත සම්බනධතාවක් ඇති කර ගැනීමට අධිෂ්ඨාන කරගෙන සිටින බව හොසියා දන්වයි. (හොසියා 1:1-11)

පරිශීලනය කළ ග්‍රන්ථ

ශුද්ධ බයිබලය

සිල්වා හෙන්රි ගරු පියතුමා, පුරාණ ගිවිසුමේ දිවැසිවරු, කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 2011

විජේසිංහ ෂර්ලි ලාල්, ඊශ්‍රායෙලයේ දිවැසිවරු, සමාජ හා සාමයික කේන්ද්‍රය, මරදාන, 1991

ඩයස් ඔස්ටින්, ක්‍රිස්තු ධර්මය විභාග අත්වැල, ශ්‍රී ලංකා කතෝලික ලේඛක සංගමය, කොළඹ 1998

ප්‍රනාන්දු ජේ. ආලෙක්ස් ගරු පියතුමා, ඊශ්‍රායෙල් ඉතිහාසයේ විකාශය, එම්. ඩී. ගුණසේන මුද්‍රණාලය කොළඹ. 1987

Geoffrey Chapman, New Jerome Biblical commentary , Great Britaion, 1989

**නිපුණතාව** **3.0** : ප්‍රඥාවෙන් පූර්ණව දිවැසිවරයෙකු ලෙස සාක්ෂි දරයි.

**නිපුණතා මට්ටම** **3.3** : ජීවිතය නිසි මග ගැන්වීම සඳහා ප්‍රඥා සාහිත්‍යයෙන් ආලෝකය ලබයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් ඵල**

- ප්‍රඥා සාහිත්‍ය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- යහපතින් අයහපත වෙන්කරගෙන යහපත පමණක් කළ යුතු බව පිළිගනියි.
- ප්‍රඥා සාහිත්‍ය පිළිබඳ ගොනු කරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ගීතාවලියෙහි ආභාෂය තුළ තම යාච්ඤා ජීවිතය පොහොණි කර ගනියි.
- ප්‍රඥාවන්තව කටයුතු කරන සමාජයක් ගොඩනැගීමට දායක වෙයි.

# ප්‍රඥා සාහිත්‍යය

## හැඳින්වීම

• "ප්‍රඥාව" සඳහා යෙදෙන හෙබ්‍රෙව් වචනය වන්නේ "හොක්මා" (Hokmah) ය. නිවැරදි දේ කරමින් මෙලොව සුරක්ෂිත භාවය හා ප්‍රීතිය අත්පත් කර ගැනීම මෙයින් අදහස් කරයි. එහි පරමාර්ථය මෙම මොහොතේ මෙම ස්ථානයෙහි යහපත් ජීවිතයක් ගත කිරීමේදී දේව ගරු බිය ප්‍රඥාව කරා යොමු කර වීම (ජෝබ්:28:28, ගීතාවලිය 111:10)

• එය ඥානික ව්‍යායාමයකට වඩා ප්‍රායෝගික ක්‍රියාකාරකමක් ලෙස සැලකේ. එහෙයින් ප්‍රඥාව යනු නිවැරදි ව සාර්ථක ව හා ධර්මිෂ්ඨ ව ජීවත් වීමේ හැකියාව ලෙස අර්ථ දැක්විය හැකි ය.

• ප්‍රඥාව විශ්වීය සංකල්පයකි. එම නිසා ජාතියකට හෝ දේශයකට සීමා නොවේ. ප්‍රඥා සාහිත්‍ය මනුෂ්‍ය ජීවිතයේ විවිධ අවස්ථා වලට වැඩි අවධානයක් යොමු කරයි. තවත් ආකාරයකට කියතොත් ප්‍රඥාව ජීවිතය විග්‍රහ කරයි. එසේ කරනුයේ ග්‍රීකයින් මෙන් දර්ශනයට යොමු වීමෙන් නොව අත්දැකීම්වලට අවදානය යොමු කරමිනි.

## ප්‍රඥා සාහිත්‍යයේ ආරම්භය

• පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යය හා පුරාණ මැදපෙරදිග ප්‍රඥා සාහිත්‍යය අතර සම්බන්ධතාවයක් ඇත. මැදපෙරදිග යනු යුප්‍රටීස් හා ටයිග්‍රීස් ගංගාවන්ගෙන් ජලය සැපයෙන පැරණි මෙසපොතේමියාව හා නයිල් ගඟ අසබඩ පිහිටි මිසරය ආශ්‍රිත ප්‍රදේශ ය.

## පැරණි මැදපෙරදිග ප්‍රඥා සම්ප්‍රදායයේ නිශ්චිත ප්‍රභේද දෙකකි

1. පැරණි ගිවිසුමේ සෙබයිට් ප්‍රඥාව (Sebayt)

2. මෙසපොතෝමියානු (විනයධරයන්) ගේ ප්‍රඥාව

• **ඊජිප්තුවේ සෙබයිට් ප්‍රඥාව** - මෙම ප්‍රඥාව පදනම් වූයේ සියළු බලැති දෙවියන්ගේ අභිමතය පිළිබිඹු කළ විශ්වයේ නියමිත සැලැස්ම (Right Order) නමැති "මඅට්" (Maat) මතය. "මඅට්" අනුව දිවි ගෙවීම සාර්ථක මෙන්ම යහපත් සදාචාරාත්මක පැවැත්මකට තුඩු දෙන බව පිළිගැනිණි. පාලනයට සුදුසුකම් ලැබූඅය සහ රාජ සභා සේවකයින් පුහුණු කිරීම සඳහා "සෙබයිට්" හෙවත් ඉගැන්වීම් (Instructions) යොදා ගන්නා ලදී. එහි සඳහන් වනුයේ ජීවිතය සහ යහපත් හැසිරීම පිළිබඳ අනුශාසනා පද්ධතියකි. මේවා ගුරුවරුන්ගෙන් ගෝලයින්ට නොකඩවා පැවත ආවේ ය. මෙම ලියවිලිත් පුරාණ ගිවිසුමේ ප්‍රඥා සාහිත්‍යයත් අතර සම්බන්ධතාවක් ඇත. සෙබයිට් ප්‍රඥාව රාජ සභා ප්‍රඥාවට මුල පිරූ බව සිතිය හැකිය. (හිතෝපදේශ 31:1-9, උපදේශකයා 10:1-5 ප්‍රඥාව 6:1-11)

• **මෙසපොතේනියානු (විනයධරයන්ගේ) ප්‍රඥාව** - වැඩවසම් ක්‍රමයක් තුළ පාළනය සඳහා ඉහල පැලැන්තියේ පරපුර පුහුණු කිරීමේ ක්‍රමවේදය හා රාජකීය ලියකියවිලි නඩත්තු කිරීමේ කලාව ඉගැන්වීම සඳහා විය.

• සමහර බයිබල් විශාරදයින් ප්‍රඥා සාහිත්‍යයේ ආරම්භය පවුල දක්වා දිවෙන බව සඳහන් කරයි. ඔවුන්ගේ මතය වනුයේ ප්‍රඥාව රාජ සභාවෙන් ආරම්භ නොවූ බවත් මුඛ පරම්පරා ගත සම්ප්‍රදායයන් තුළින් මේවා රාජ සභාවට සපැමිණි බවත් ය. ඒ අනුව ප්‍රඥා සාහිත්‍යය ආරම්භ වූයේ සලමොන් රජතුමාගෙන් නොවේ. ප්‍රඥාව පිළිබඳ අවබෝධය ඊට බොහෝ කලකට පෙර තිබිණි. එහි ආරම්භය සාමාන්‍ය පවුල් පරිසරය විය හැකිය.

• එදා තරුණයින්ට අධ්‍යාපනය දීම පවුල තුළ සිදු විය. පියෙක් තම පුතුට දෙන අවවාද ප්‍රඥා සාහිත්‍යයේ සඳහන් වේ. එම නිසා ප්‍රඥා සාහිත්‍යයේ උපත සහ වර්ධනය පවුල සහ රාජ සභාව තුළ සිදු වූවා යැයි නිගමනය කළ හැකි ය. තවද හිතෝපදේශය හා සිරාක් ග්‍රන්ථවල "මාගේ පුත්‍රය" යන යෙදුම බහුලව දක්නට ඇත. එමගින් පෙන්නුම් කරන්නේ පිය පුතු සබඳතාවයකට වැඩි ගුරු ගෝල සබඳතාවයකි.

• පුරාණ ගිවිසුමෙහි ප්‍රඥා සාහිත්‍යය පුරාතන මැද පෙරදිග ප්‍රඥා සාහිත්‍යය හා කිට්ටු සම්බන්ධතාවයක් දක්වන බව දැක්වීමු. එපමණක් ද නොව පුරාණ ගිවිසුමෙහි ප්‍රඥා සාහිත්‍යය පැරණි මැදපෙරදිග ප්‍රඥා සාහිත්‍යය සතු චින්තන රටාව අනුගමනය කරන්නේ සුළු වෙනස්කම් සහිතව ය. විශේෂයෙන් පුරාණ ගිවිසුමෙහි ඒක දේවවාදී ස්වරූපය නිසා මැද පෙරදිග ප්‍රඥා සාහිත්‍යයෙන් වෙනස් වෙයි.

• විප්‍රවාසයෙන් පසු ව දිවැසිවරුන් ක්‍රමයෙන් වියැකී යන යුගයක ප්‍රඥා සාහිත්‍යයේ ආරම්භය සිදු වූවා යැයි සිතිය හැකිය. එහෙයින් ඉශ්‍රායෙලෙහි ප්‍රඥාව ඔවුන්ගේ විශ්වාසය සමග පැවත එන්නක් බව පිළිගත හැකිය.

• ශුද්ධ බයිබලයේ අනෙක් පොත්වල මෙන් මෙහි රූප වන්දනාවට විරුද්ධ ව, ගිවිසුම් සංකල්පය පිළිබඳ ව, දේව මාලිගාව හා එහි වන්දනාව පිළිබඳව කිසිදු සඳහනක් නොකරයි. එහෙත් මිනිසා ඔහුගේ චර්යාව, පැවැත්ම, සිතුවිලි, දුර්වලතාව පිළිබඳව කථා කරයි. එහෙයින් ප්‍රඥා සාහිත්‍ය කේන්ද්‍ර කර ගනුයේ මිනිසා හා යහපත් ජීවිතයක් ගත කිරීම පිළිබඳවය. ඉශ්‍රායෙලයෙහි ප්‍රඥාව ලෞකික නොවේ. ආගමික ආචාර හා සදාචාරාත්මක පදනමක් මත ගොඩනැගී ඇති බව වටහා ගත හැකිය.

## හෙබ්‍රෙව් ප්‍රඥා සම්ප්‍රදායේ මූලික ලක්ෂණ

1. නික්මයාම, ගිවිසුම ආදී පීතෘ වරුන්ට දෙවියන් වහන්සේ දුන් පොරොන්දුව වැනි මූලික තේමා වෙත එතරම් අවධානයක් නොකිරීම

2. පැරණි මැද පෙරදිග ප්‍රඥාව(මිසරයේ සෙබයිට් ප්‍රඥාව හා මෙසපොතේමියානු විනයධරයන්ගේ ප්‍රඥාව) සමගා ඇති සමීප සම්බන්ධතාව

## පුරාණ ගිවිසුමෙහි ප්‍රඥා සාහිත්‍යය

පුරාණ ගිවිසුමේ පොත් හතක් ප්‍රඥා සාහිත්‍යයට අයත් වේ

1 ජෝබ්
2 ගීතාවලිය
3 ධර්මදේශකයා
4 උපදේශකයා/සිරාක්
5 ප්‍රේම ගී
6 සලමොන්ගේ ප්‍රඥාව
7 හිතෝපදේශය

## හෙබ්‍රෙව් ප්‍රඥාවේ ප්‍රබේද

1 **පවුල හා ගෝත්‍රික ප්‍රඥාව (Family or Tribal Wisdom)**

ගෝත්‍රය හා පවුල සංරක්ෂණය වීම සඳහා පිළිපැදිය යුතු වූ සම්ප්‍රදායයන්, උපදේශනයන හා නීති රීති මෙයට අයත්වේ. එහෙයින් ඉහත සඳහන් සංස්ථාවල අනන්‍යතාව සුරැකෙන පිණිස වූ අධ්‍යාපනයකි.
උදාහරණ:
සිරාක් 7: 23-38, හිතෝපදේශ 23:13-24, උපදේශකයා 30:1-13

2 **රාජ්‍ය සභාව හා ප්‍රඥාව (Court Wisdom)**

රාජ්‍ය පාලනය හා අනෙකුත් පරිපාන ක්ෂේත්‍රයන් ඉලක්ක කරගෙන යෞවනය පුහුණු කිරීම සඳහා වූ අධ්‍යාපන ක්‍රමයකි. එය බොහෝ දුරට සමාජයේ ප්‍රභූ පන්තිය සඳහා වූවකි.
උදාහරණ:
සලමොන්ගේ ප්‍රඥාව 6:1-11

3 අභිධාර්මික ප්‍රඥාව (**Reflective or Philosophical Wisdom)**
ජීවිතයේ හරය, එහි ගැටළු, විශ්වය පිළිබඳ සංකල්පනා ආශ්‍රිතව කෙරෙන විග්‍රහයකි.
උදාහරණ:
ජෝබ්ගේ පොත හා ධර්මදේශකයා

4 **එදිනෙදා ජීවිතය සම්බන්ධ ප්‍රඥා ආකල්ප (ප්‍රායෝගික ප්‍රඥාව)** (**Practical Wisdom)**

යමෙකු එදිනෙදා ජීවිතයේ මුහුණ දෙන අවස්ථා පිළිබඳ උපදේශනයන්ය. එනම් සාර්ථක දිවි පෙවතක් සඳහා වන ප්‍රායෝගික උපදෙස්ය.
උදාහරණ:
හිතෝපදේශය 15:1-33. 23:1-23, 29-35
සලමොන්ගේ ප්‍රඥාව 13:1-15,
සිරාක් 10 6-16, 10:23

• ඉශ්‍රායෙල් හි ප්‍රඥාවන්තයින් ඔවුන්ගේ දෙපා බිම තැබිය හැකි පුද්ගලයින් වූහ. මෙයින් අදහස් කරනුයේ අන් අයගේ සිතුම් පැතුම් තේරුම් ගත හැකි පුද්ගලයින් වූ බව ය. මේ අය ඉශ්රායෙලේ හී ගුරුවරුන්, උපදේශකවරුන්, අත්දැකීම් සහිත වැඩිහිටියන් හා උගත් ලේඛකයන් විය. ඔවුන්ගේ විෂය කරුණු වූයේ මිනිස් ක්‍රියාකාරිත්වයයි. මිනිසා ව අධ්‍යයනය කළේ හේතුව, අනාවරණය හා අත්දැකීම් මත ය. එම නිසා මේ අය දාර්ශනිකයන් යැයි නම් කළ හැකි ය. මොවුන්ට දැනුම ලබා ගැනීමට දෙවියන් වහන්සේ ගැන හා මනුෂ්‍යා පිළිබඳව තිබූ උවමනාව මේ සඳහා පාදක වූවා විය හැකි ය.

• මිනිස් ස්වභාවය ඔහුගේ හැසිරීම් රටාව, ශාරීරික මෙන් ම අධ්‍යාත්මිකත්වය නිසා ඔවුන් මානව හිතකාමීන් ලෙස හැඳින්විය හැකි ය. මොවුන් දේව වචනය අධ්‍යයනය කළ අතර දේව අනාවරණය පිළිබඳ ව භාවනා කළහ. දෙවියන් වහන්සේගේ කාර්යයන් පිළිබඳ ව මෙනෙහි කළ හ. බාහිර ලෝකය මෙන් ම මිනිසාගේ ප්‍රාතිහාර්යාත්මක මැවීම, මිනිස් චර්යාව ප්‍රගුණ කළ ඔවුන්ට පෙර සිටි ගුරුවරුන්ගේ ඉගැන්වීම් අධ්‍යයනය කළහ. දැහැමි සදාචාරාත්මක ජීවිතයක් නොමැති වුව ද ප්‍රඥාව ලබා ගැනීමට ඕනෑම කෙනෙකුටෙ හැකියාව තිබිණි. නමුත් ඉශ්රායෙලෙ හි ප්‍රඥාව එසේ නොවිනි.

• ඉශ්රායෙලෙහි ප්‍රඥාව යනු දෙවියන් හඳුනා ගැනීම හා සියල්ලට වැඩියෙන් උන් වහන්සේට ආදරය කිරීමයි. උන් වහන්සේට ගරු බිය දැක්වීමයි. එහෙයින් ප්‍රඥාව ශුද්ධවන්තය, අධ්‍යාත්මිකය, ප්‍රායෝගිකය.

ප්‍රඥාව ඉදිරිපත් කර ඇති සාහිත්‍යමය ස්වරූපයන්

1. ප්‍රස්ථා පිරුළු (Proverbs)
2. උපදේශ (Exhortations)
3. කියමන් (Sayings)
4. උපමා (Parables)
5. උපමාලංකාර (Figurative)
6. කථාන්දර (Stories)
7. ගීත (Songs)
8. රූපාලංකාර (Allegory)

.9. සංවාද (Diologue)

**ප්‍රඥා සාහිත්‍යය අරමුණ හා එහි අධ්‍යාත්මිකත්වය**

• ප්‍රඥා සාහිත්‍යයේ ප්‍රධානතම අරමුණ වූයේ ජීවිතය සාර්ථක ලෙසත්, දැහැමි ලෙසත් ගෙවීමට ජනතාවට මග පෙන්වීමයි. සමාජ පරිපාලනය හා ජීවිතයේ අරුත හා සීමාවන් අවබෝධ කර දීමයි. සමිඳුන්ට ප්‍රිය මනාප ලෙස අරුත්බර ජීවිතයක් ගත කිරීමට ප්‍රඥාව පිටිවහලක් වූ බව නොඅනුමාන ය. මේ නිසා හෙබ්‍රෙව් ප්‍රඥාව හුදෙක් බුද්ධිමය ව්‍යායාමයක් හෝ සංස්ථාවක් හෝ නොව ප්‍රායෝගික හා සාර්ථක දිවි පෙවතක් සඳහා සකස් වූවකි.

# ගීතාවලිය

## හැඳින්වීම

• ගීතාවලිය යනු යාච්ඤාමය ගීතිකා 150 ක එකතුවක් ලෙස සකස් වූ පොතකි. මේ සෑම පද්‍යයක්ම තත් සහිත වාද්‍ය භාණ්ඩයක් සමග ගායනා කල ඒවාය. මෙම ගීතිකා බොහොමයක් දෙවියන් වහන්සේගේ යහපත් කම නිසා පිරී ඉතිරී යන සතුටකින් හා ප්‍රශංසාවකින් කියන ලද ඒවාය. තවත් සමහර ගීතිකා, දුක, විලාපය හෝ මනස්ථාපනය ඇතිව ගයන ලද ඒවා ය.  තවත් සමහර ගීතිකා ඉලක්ක කර ගනු ලැබුවේ ලෙඩ දුක් හා ජීවිතයේ අම්හිරි අත්දැකීම් වෙනුවෙනි. එහෙයින් ගීතාවලිය බයිබලයෙහි අනෙක් පොත්වලට වඩා යාවේ දෙවිඳුන් වෙත ඉශ්රායෙල් ජනතාවගේ ආකල්පයන්හි පුළුල් බව හා ගැඹුරු බව විදහා පායි.

• ඉශ්‍රායෙල් ජනතාවගේ යැදුම් පොත හා ගී කළඹ ලෙස පිළිගැනුණු ගීතාවලිය හෙබ්‍රෙව් බසින් "සේෆර් තෙහෙලීම්" (Tehillin) හෙවත් ප්‍රශංසා පොත නමින් හඳුන්වනු ලබයි. "තෙහෙලීම්" යනු තත් සහිත සංගීත භාණ්ඩයක් උපයෝගී කර ගිනිමින් ගැයෙන ගීයකි. සෙප්තුවාජින්ත පිටපතෙහි "ප්සල්මොයි"(psalmoi) ලෙස හැඳින්වෙන අතර එහි අර්ථය ගීය වේ. ගීතාවලිය සඳහා ඉංග්‍රීසි බසින් යෙදෙන වචනය "සෝල්ටර්" (psalter) යන්නයි. මෙය ග්‍රීක භාෂාවේ "සල්ටේරියොන්" (psalterion) යන වචනයෙන් ප්‍රභවය ලැබූවකි.

## පසුබිම

• ගීතාවලියට පසුබිම් වී ඇත්තේ ඊශ්රායෙලයේ ජනවන්දනාව (නමස්කාරය) බව පොදු පිළිගැනීමයි. එය පෞද්ගලික යාච්ඤා පොතකට වඩා ජන වන්දනාත්මක කෘතියකි.

• ගීතාවලිය සම්බන්ධයෙන් ගැඹුරු අධ්‍යයනයක් ප්‍රථම වරට කරණ ලද්දේ හර්මන් ගුන්කල් නමැති බයිබල් විශාරදයා ය. පැරණි ජන වන්දනාව තුළ ගීතිකා බිහි වූ බව ඔහුගේ පිළිගැනීම විය. ආතර් වයිසර් එය ගිවිසුම් මංගල්‍යය ආශ්‍රිත ව සම්පාදනය වී ඇති බව ප්‍රකාශ කළේය.

• සිග්මන් මොවින්කල්ට අනුව සමිඳාණන් වහන්සේගේ සිංහාසනාරූඪ මංගල්‍යය පසුබිමෙන් ගීතාවලිය බිහිවී ඇති බව දැක්වී ය.

• කෙසේ වුව ද කුඩා කොටස්වල එකතුවකින් ගීතාවලය බිහිවී ඇත. උදාහරණඃ දාවිත්ගේ ගීත (Davidic) කෝරාගේ ගීත (Korah),  ආසාක්ගේ ගීත (Asach). මෙමගින් හඟවනු ලබන්නේ දාවිත් හෝ ආසාක් හෝ කෝරා හෝ මේවා ලිවූ බව නොවේ. බොහෝ දාවිතීය ගීතිකා රාජකීය ගීතිකා වශයෙන් සැලකිය හැකිවන අතර ආසාක් ගේ ගීතිකා දේව මාලිගා ගිතිකා එකතුවකින් ලැබුණු ඒවා බව කිව හැකිය. කුඩා ගීතිකා කොටස් වලින් සැදුම් ලත් මෙම සංගීත පොත කුඩා පොත් පහකට බෙදා ඇති අතර එය බොහෝ දුරට පංච පුස්තකය හා සම්බන්ධ බවට කරන ඉඟියකි.

පළමු පොත    - ගීත   1  - 41<br>
දෙවන පොත -  ගීත  42 - 72<br>
තෙවන පොත - ගීත   73 - 89<br>
සිව්වන පොත - ගීත  90 - 106<br>
පස්වන පොත - ගීත 107 - 150

• මේ සෑම පොතක් අවසානයේ  දි ම ඇති පදය තුල යාච්ඤාමය ස්වරූපයක් දක්නට ලැබේ. එහෙයින් දෙවි සමිඳුන්ට කරන්නා වූ ප්‍රශංසාවක් මගින් සෑම පොතක් ම අවසන් කර ඇත. (41:13, 72:19, 89:52, 106:48, 150 :-6)

• තෙහෙලි ගීතිකා සඳහා අනු අංක යෙදීමේදී පුරාණ ගිවිසුමෙහි හෙබ්‍රෙව් පිටපත හා ග්‍රීක පිටපත අතර එක් තෙහෙලි ගීතිකාවක වෙනසක් දක්නට ඇත. එයට හේතුව හෙබ්‍රෙව් පිටපතෙහි අංක 9 හා 10 එක් ගීතිකාවක් ලෙස ගන්නා අතර ග්‍රීක පිටපතහෙි 9 එක් ගීතිකාවක් ලෙසද, 10 තවත් ගීතිකාවක් ලෙසද වෙන් වෙන්ව සලකනු ලැබීමයි.

## ගීතාවලියෙහි කර්තෘත්වය

• සම්ප්‍රදායිකව දාවිත් රජතුමා ගීතාවලියෙහි කර්තෘ ලෙස දැක්වුව ද ගීතාවලියෙහ් ඇති ගීත වල දක්නට ලැබෙන පොදු බවත්, ඒවා තුළ භාවිතා කර ඇති භාෂාමය විලාශයේ විවිධත්වයත්, පසුකාලීන සිද්ධි පිළිබඳ ව ඉදිරිපත් කරන ඉඟි සියල්ලත්, කර්තෘත්වය සම්බන්ධව ගැටලු සහගත තත්වයක් මතු කරයි.

• දාවිත් රජතුමාගේ නමින් ම වෙන් කරන ලද ගීතිකාවල පසුකාලීන භාෂා විලාෂයන් දක්නට ලැබීමත් පසුකාලීන සිද්ධීන් ඉදිරිපත් කිරීමත් දක්නට ඇත. උදාහරණයක් ලෙස ගීතිකා 51:18 - 19 ජෙරුසලම් විනාශයට පසු අවධියක් පිළිබඳව ඉඟි කෙරෙයි. මෙම ගීතයේ හෙබ්‍රෙව් ශෛලියද විප්‍රවාසී යුගයකට බව විශාරදයන්ගේ පිළිගැනීමයි.

• එසේ ම ගීතාවලියෙහි සමහර ගීතිකා ඉතා පැරණි බව පෙනේ. (110 ගීතිකාව) ගීතාවලියෙහි ආරම්භය දාවිත් රජ දවස වන්නට පුළුවන. එහෙත් එහි ඇති විවිධත්වය නිසා ම කතෘ පිළිබඳ ප්‍රශ්නයක් මතු වෙයි. එසේ වුව ද බොහෝ දෙනාගේ පිළිගැනීම අනුව දාවිත් රජතුමාට කතෘත්වය ආරෝපනය කර තිබෙන බව පැහැදිලිය.

• මෙම පොතෙහි අඩංගු සංගීතයන්හි අලංකාරය අගය කිරීමට නම් ඒ එක් එක් සංගීතයේ භාෂාවද එමගින් හඟවනු ලබන ප්‍රතිරූපයද එහි අද්විතීය බව හා පුද්ගලිකත්වය ද දෙස බලා ගීතාවලිය ඇගයීමට ලක් කල යුතු ය.

## ගීතාවලියෙ හි ගීතිකා වර්ගීකරණය

තෙහිලි ගීත වර්ගීකරණය පිලිළිබඳ ව විවිධ මත පවති යි.
1.ප්‍රශංසා ගීත - දෙවියන් වහන්සේගේ මැවීමේ හා ගැලවීමේ ක්‍රියාවලිය මෙන් ම උන් වහන්සේගේ ගුණාංග වන යහපත්කම, කරුණාව, දයාව, උදාරත්වය, රාජකීයත්වය වැනි ලක්ෂණ වර්ණනා කරමින් ප්‍රශංසා කිරීමට යොමු වූ ගීත මෙම වර්ගයට අයත් වේ.
උදාහරණ: (8, 19, 29, 93, 145-150)

2. විලාප ගීත - කරදර හා ආපදා අවස්ථා වල සහය පතා දෙවියන් වහන්සේට ආයාචනා කරන ගීත විලාප ගීත වේ. මේවා දෙවර්ගයකි.
උදාහරණ 1 පෞද්ගලික විලාප ගීත 3, 51, 109
2 සාංඝික හෝ ජාතික ආයාචන ගීත 44, 129, 137

3. තුති දීමේ ගීතඃ - දෙවියන් වහන්සේගෙන් ලද වරප්‍රසාද හෝ දීමනා වෙනුවෙන් කෘතඥතාවය ප්‍රකාශ කරන ගීත මේ නමින් හැඳින්වේ.
උදාහරණ 18, 30, 34, 67, 107, 116

4 ප්‍රඥා ගීත - ධර්මිෂ්ඨ ජීවිතයක් ගත කිරීම සඳහා ජනතාව දිරි ගන්වන ඉගැන්වීම් අන්තර්ගත ගීත මේ නමින් හැඳින්වේ.
උදාහරණ:1, 37, 49, 73, 112, 133

5 රාජකීය ගීත - රාජ අභිෂේක හා රාජකීය විවාහ මංගල්‍යය අවස්ථා වලදී භාවිත කරන ගීත මේ නමින් හැඳින්වේ.
උදාහරණ: 2, 18, 45, 72, 110

6 සියොන් ගීත හෙවත් වන්දනා ගීත - ජෙරුසලමේ ශ්‍රී විභූතිය ගැන ප්‍රශංසා කිරීමට විශේෂයෙන් වන්දනා ගමන්වලදී භාවිත වූ ගීත මේ නමින් හැඳින්වෙයි.
උදාහරණ 46, 48, 84, 87, 122

7 විශ්වාසයේ ගීත - දෙවිඳුන් කෙරෙහි අචල විශ්වාසය ප්‍රකාශ කරමින් ඒ මත යැපෙමින් ගායනාකරන ගීත මේ නමින් හැඳින්වේ.
උදාහරණ 11, 23, 27, 62, 63, 91

## ජනවන්දනාව සඳහා භාවිතය

• ගීතාවලිය යාච්ඤාව පිළිබඳ නිධානයකි. ඉශ්‍රායෙල් ජනතාවගේ සමිඳාණන් වහන්සේගේ මනහර ක්‍රියා හෙවත් විශ්වය මැවීම, ඉතිහාසයෙහි බලවත් ලෙස මැදිහත්වීම හා උන් වහන්සේගේ විශේෂ ගුණාංග සම්බන්ධ අත්දැකීම් ආදියට ප්‍රතිචාරයක් වශයෙන් ප්‍රශංසා ගී නිර්මාණය කර ඇත.

• මිනිසාගේ අබල දුබලකම් හේතු කොට ගෙන ඇති වන විවිධ කටුක අත්දැකීම් හා මරණය සම්බන්ධයෙන් උන් වහන්සේට කන්නලව් කිරීම, ඒවා සම්බන්ධයෙන් උන් වහන්සේගේ බලවත් මැදිහත්වීම පිළිබඳ ස්තුති දීම ආදි විවිධ මානව අත්දැකීම් සම්බන්ධ ප්‍රතිචාර ඉතා පැහැදිලිව මෙම ගීතිකා වල දක්නට ඇත.

• ගීතාවලිය ඉශ්‍රායෙල් ජනතාවගේ ජන ජීවිතය තුළ දෙවි සමිඳාණන් වහන්සේ ව අත්දුටු බවට ඇති හොඳම සාක්ෂියකි. ජීවිතයේ සෑම සිද්ධියක් සමග ම බැඳුනු අත්දැකීම් දෙවිඳුන් වෙත මෙහි ගීත වලින් ඉදිරිපත් කරයි.

• ගීතාවලියෙහි සඳහන් ගීතිකා ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ විශේෂ අවස්ථාවන් හි දී ද උන් වහන්සේගේ ඉගැන්වීම්වල දී ද භාවිත කර ඇත. උදාහරණ ලෙස කන්ද උඩ දේශනාවේදී ගීතාවලියේදී 6:8, 24:3-4, 37:11, 48:2 හා කුරුස ගසේදී 22:1 භාවිත කර ඇත.

• වර්ථමානයේද ජනවන්දනාව තුළ ගීතාවලියට ලැබෙනුයේ විශේෂ ස්ථානයකි. අද පවා අපගේ යාච්ඤා වලදී මෙම ගීත කෙතරම් අප ජීවිත වලට සමීපදැයි අප දනිමු. අප ජීවිත වල සතුට ජයග්‍රහණය වෙනුවෙන් දෙවිඳුන්ට ස්තුති ප්‍රශංසා කරන අපි වේදනාවේ දී කරදරයේ දී දෙවිඳුන්ට කන්නලව් කරමු. එතුමන්ගේ පිහිට පතමු. පවට නැඹුරු වූ විට මනස්ථාප වන්නෙමු. දෙවිඳුන් සොයා නැවත හැරෙන්නෙමු. සමාව යදින්නෙමු. මෙම සියළුම අත්දැකීම් අප යාච්ඤාවට ගොනු කරනුයේ ගීතාවලියෙහි ගීතිකා ආශ්‍රයෙනි.

• ජන වන්දනාවේ උතුම්ම අංගයක් වූ දිව්‍ය පූජාවේ දී ද දේව වචනයට පිළිතුරක් ලෙස යොදා ගනුයේ ගීතාවලියෙන් ගන්නා ලද විවිධ ගීතය. එහෙයින් ගීතාවලිය එදා මෙන් ම අදත් සාමාන්‍ය ජන ජීවිතයට සමීප,දෙවිඳුන් කරා බැතිමතුන්ගේ සිත් සතන් එසවීමට උපකාර වන යැදුම් පොතකි. තවද යාම යැදුමෙහි අනිවාර්ය අංගයක් වන්නේ ගීතාවලියෙහි ගීත භාවිත කරමින් දෙවියන් වහන්සේට යාච්ඤා කිරීමයි.

නිපුනතාව 4.0 : ක්‍රිස්තුන්වහන්සේ ලෝකයේ නව විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේට සාක්ෂි දරයි.

නිපුනතා මට්ටම 4.1 : ශුභාරංචිය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා නව ගිවිසුමේ පසුබිම භාවිත කරයි.

කාලච්ඡේද සංඛ්‍යාව : 20

**ඉගෙනුම් ඵල**

- නව ගිවිසුමේ දේශපාලන, සමාජීය හා ආගමික පසුබිම පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- තම බලතල අයුතු ලෙස භාවිත නොකළ යුතු බව පිළිගනියි.
- නව ගිවිසුමේ දේශපාලන, සමාජීය හා ආගමික පසුබිම පිළිබඳ ගොනුකරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- නව ගිවිසුමේ දේශපාලන සමාජීය හා ආගමික පසුබිම තුළ නව ගිවිසුම අර්ථ කථනය කරයි.
- තම තනතුරු අන් අයගේ සුබසෙත සඳහා යොදවයි.

# නව ගිවිසුමේ පසුබිම

- මුළු මධ්‍යධරණී ප්‍රදේශයත් ඉන් ඔබ්බටත් පාලනය කළ ග්‍රීක අධිරාජ්‍යයේ බිඳ වැටීමත් සමගම රෝම අධිරාජ්‍යය බලගතු අධිරාජ්‍යයක් විය. රෝම අධිරාජ්‍යය පාලන හමුදාව පලස්තීන දේශය ද යටත්කර ගැනීම නිසා පලස්තීන ජන ජීවිතය ද හැඩ ගැසුනේ රෝම පරිපාලනයට අනුකූලව ය.

- ක්‍රි.පූ. 63 දී පලස්තීන දේශය තුළ දේශපාලන ආර්ථික හා සමාජයීය වශයෙන් විවිධ බලපෑම්වලට ලක්වීමට සිදු වුවත් ජුදෙව් ජනතාවට රෝමවරුන් යටතේ ආගමික නිදහස හිමි විය.

- මෙවැනි පසුබිමක් තුළ උපත ලද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ පලස්තීන ජන ජීවිතයේ දේශපාලන, ආර්ථික, සමාජීය තත්ත්වය පිළිබඳ ව විමසා බැලීම වැදගත් වේ.

## නව ගිවිසුමේ දේශපාලන පසුබිම

**පාලන බලය**

- ක්‍රිස්තුස් වහන්සේගේ කාලයේ පලස්තීනයේ පාලන බලය හිමිවූයේ රෝමවරුන්ට ය. යටත් විජිත රාජ්‍යයන් පාලනය හා නීති ක්‍රියාත්මක කිරීමේ බලතල හිමිවූයේ රෝම අධිරාජ්‍යයා විසින් පත්කරනු ලැබූ ආණ්ඩුකාරයාට ය.

- ජුදයාව, සමාරිය හා ඉදුමිය එක ම ප්‍රදේශයක් වූ අතර එහි පාලකයා වශයෙන් තිබේරියස් අධිරාජ්‍යයා විසින් 5 වන ආණ්ඩුකාරවරයා ලෙස පොන්තියුස් පිලාත් පත්කරන ලදි. ඒ අනුව පලස්තීන ප්‍රදේශයේ සියලු කටයුතු භාර ව පොන්තියුස් පිලාත් කටයුතු කළ අතර ගලීලයාව හා පෙරයා ප්‍රදේශ භාර ව ගලීලයේ ආණ්ඩුකාරයා ලෙස හෙරෝද් ඇන්ටිපස් කටයුතු කළේය.

- රෝම පාලන බලයට යටත් වුවද ජුදෙව්වන්ට ආගමික නිදහස භුක්ති විඳිමින් ජුදෙව් ආගමික වත් පිළිවෙත් හා ව්‍යවස්ථාව අනුගමනය කරමින් ක්‍රියා කිරීමට නිදහස හිමි විය.

- ආගමික මූලස්ථානය ජෙරුසලම් දේව මාලිගාව වූ අතර ආගමික නායකත්වය දැරුවේ උත්තම පූජකයා ය.

- මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව අනුව ආගමික ගැටලු විසඳීම සිදු කරනු ලැබුවේ ජුදෙව් ශ්‍රේෂ්ඨාධිකරණය හෙවත් සැන්හෙන්ඩ්‍රින් මන්ත්‍රණ සභාව මගිනි. වරදකරුවන් කුරුසිපත් කිරීම ප්‍රධානතම දඬුවම විය. එම මරණීය දඬුවම දීමේ සියලු බලතල හිමි වූයේ රෝම ආණ්ඩුකාරයාට පමණි. රෝම වැසියෙකුට කුරුසියේ මරණය අත් නොවේ.

- තව ද එකල දේශපාලන කණ්ඩායමක් ලෙස ක්‍රියා කළ හෙරොදිවරු රෝම අධිරාජ්‍යයේ බලයෙන් වැඩි වාසි ප්‍රයෝජන ගනු සඳහා රෝම පාලකයනට පක්ෂපාත ව ජුදා සමාජය තුළ ක්‍රියා කළහ. ජුදෙව් දේශපාලන පක්ෂයක සාමාජිකයන් ව සිටි මොවුන් හෙරොද්ගේ පෙලපතින් පැවතෙන්නෙකු තම ආණ්ඩුකාරයා වනු ඇතැයි අපේක්ෂා කළහ. ඔවුහු ජේසුස් වහන්සේට එරෙහි වූ පිරිසක් වූහ. (මාක් 3:6, ලූක් 13:31-32)

## ආර්ථිකය

- පලස්තීන වැසියන්ගේ ආර්ථිකයට බලපෑ ජීවනෝපායන් අතර වෙළඳාම, ගොවි, ධීවර හා එඬේර ආදී වෘත්තීන් විය. එමෙන්ම ඉඩම් හිමි ධනපති පන්තිය මෙන් ම ගොවි, එඬේර, කම්කරු වැනි නිර්ධන පන්තීන් ද විය.

- ධීවරයෝ ගලීල මුහුද ආශ්‍රිත ව මසුන් මැරීම සිදු කළහ. ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට ධීවර කර්මාන්තය ඉවහල් වූ නමුත් ධීවරයන් සමාජයේ පිළිගැනීමට ලක් නොවූ පිරිසකි. (මාක් 1:16)

• එමෙන්ම එඬේර වෘත්තියේ ද බොහෝ පිරිසක් නියැලුනි. දිළිඳුන් ලෙස සැලකුනු මොවුන් සමාජයේ එතරම් පිළිගැනීමකට ලක් නොවූ පිරිසක් විය. මොවුන් දෙවිඳුන් නමස්කාර කිරීමට ප්‍රසිද්ධ ස්ථාන වලට පැමිණීමෙන් වැලකී කඳු මුදුන්වල, තැනිතලා බිම්හි දේව නමස්කාරයේ යෙදුනු පිරිසක් විය. සතුන් රැකබලා ගනිමින් ඔවුන් පෝෂණය කරමින් සත්ව කරුණා ගුණයෙන් යුත් මෘගයින්ගෙන් තම සතුන් බේරා ගැනීමට කටයුතු කළේය. ජේසුස් වහන්සේගේ උපත පිළිබඳ ප්‍රථම ශුභාරංචිය එඬේරුන්ට ලැබීම ඔවුන් ලද වරප්‍රසාදයක් ලෙස සැලකිය හැකි ය. (ලූක් 2:8-20).

• ජුදෙව් ජනතාවට, තම නිෂ්පාදන විකුණා ලද ආදායමෙන් රෝම අධිරාජ්‍යයාට බදු ගෙවීමට සිදුවූ නිසා ආර්ථික තත්වය පහත වැටීමට හේතු විය.

• තව ද, ජනතාව මත පමණ ඉක්මවා බදු අයකරමින්, අධික බදු බර පැටවීමෙන් ජනතාව දරුණු සූරා කෑමකට ලක් කෙරිණි.

• පලස්තීන වැසියන් සියලු දෙනා අධික බදු බර නිසා පීඩාවට පත්විය. ජුදෙව් ජනතාවට බදු වර්ග 2 ක් ගෙවීමට සිදුවිය.

1. රෝම අධිරාජ්‍යයාට ගෙවිය යුතු බද්ද.
   රෝම අධිරාජ්‍යයා බදු අයකිරීම පිණිස බදු අයකරන්නන් හෙවත් අයකැමියන් (සුංගම් අයකරන්නන්) පත් කරන ලදි. රෝම අධිරාජ්‍යයා ප්‍රධාන අයකැමියන් පත් කළ අතර එක් එක් අයකැමියාට නියෝජිතයන් ද සිටියේය. අයකැමියෝ රෝම අධිරාජ්‍යයට පක්ෂපාතීව කටයුතු කළහ (මාර්ක් 2:13-17, ලූක් 19:1-10).
2. දේව මාලිගා බද්ද
   දේව මාලිගයේ ධනවත්කම ඉහළ නැංවීමේ ප්‍රධාන ආදායම වූයේ ශෙකෙල් භාගයේ දේව මාලිගා බද්ද ය. කම්කරුවකු දින දෙකක දී ලබන කුලියට සමාන වන ඩ්‍රැක්මා කාසි දෙකක් දේව මාලිගා බද්ද ලෙස ගෙවනු ලැබී ය.
   දේව මාලිගා බද්ද ගෙවිය යුතු වූයේ ජුදෙව් කාසිවලිනි ("ශෙකෙල්"). මන්ද රෝම කාසියේ සීසර්ගේ රූපය සටහන් ව ඇති බැවින් ජුදා ජනතාවට එම කාසි භාවිත කිරීමට තහනම් විය. එබැවින් දේව මාලිගාව ආශ්‍රිත ව මුදල් මාරු කරන්නන් ද විය.

• එදිනෙදා ජීවිතයේදී ඔවුන් රෝම දිනාර් හා ග්‍රීක ඩ්‍රැක්මා නමැති කාසි වර්ග භාවිත කළහ (මතෙව් 18: 23-32, ලූක් 15:8-9).

## නව ගිවිසුමේ සමාජීය පසුබිම

• පලස්තීන ජනතාව අතර විවිධ තරාතිරම් මත පදනම් වූ සමාජ රටාවන් පැවතිණ. සමාජය තුළ පිළිගත් ජන පිරිසක් ලෙස ධනවතුන්, පූජකයන්, පරිසිවරුන්, සද්දුසිවරුන් මෙන් ම විනයධරයන් ද විය. තව ද දුගීන්, අයකැමියන් හෙවත් සුංගම් අයකරන්නන්, කාන්තාවන්, වහලුන්, එඬේරුන්, කම්කරුවන් වැනි අය සමාජයේ මෙන් ම ආගමික නායකයින්ගේ නොපිළිගැනීමට ලක්වීම කණගාටුවට කරුණකි. සමාජයේ කොන් කරන ලද අය අතර, කාන්තාවන්, වහලුන්, රෝගීන්, අයකැමියන්, පව්කරුවන් සහ සමරිතානුවන් වේ.

## කාන්තාවන්

- පුරුෂාධිපත්‍යය පැවති ජුදෙව් සමාජය තුළ කාන්තාවන්ට නිසි සමාජ අයිතිවාසිකම් නොමැති විය.
- මොවුන් පුරුෂාධිපත්‍යයට යටත් වූ අතර අධ්‍යාපනික හා රැකියා අවස්ථා ද අහිමි වූ පිරිසක් විය.

- ආගමික වශයෙන් ද එතරම් සැලකිල්ලක් නොලැබිණ.
- මොවුනට පිරිමින් හා සම අයිතිවාසිකම් නොලැබිණ.
- යම් අයුරකින් කාන්තාවන් වැන්දඹුවන් වූ කල ඉතා අන්ත අසරණ තත්වයට පත්විය. එම නිසා මුල් කිතුනු සභාව තුළ සහනාධාර දීමේ ක්‍රමය ද ක්‍රියාත්මක විය (ක්‍රියා 6:1-6).

• ජේසුස් වහන්සේ මොවුන් පිළිගෙන දේව රාජ්‍යය තුළ හිමි ස්ථානය පිළිබඳ ව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ සේක; කටයුතු කළ සේක (ලූක් 8:1-3). බෙතානියේ මාර්තා හා මරියාගේ නිවසේ දී මාර්තා අමතමින් "මරියා වඩා යහපත් දේ තෝරාගෙන ඇත" යනුවෙන් පවසමින් ඇයගේ ක්‍රියාව අගය කළ සේක. ( ලූක් 10: 38-42)

## වහලුන්

• එම යුගයේ වහල් වෙළඳාම සිදු විය. ජුදෙව් ධනපති පන්තියට සේවය කළ වහලුන් හට පාලකයින්ගේ යටත් සේවාවන් ඉටුකිරීමට සිදු විය. විශේෂයෙන් නිවසට පැමිණෙන්නන්ගේ පාද සේදීම වහලුන්ට පැවරුන කාර්යයක් විය.

• ජේසුස් වහන්සේ මෙම ක්‍රියාවලිය අනුගමනය කරමින් එකිනෙකා අතර බැහැපත්කම මතු කරමින් නායකයා සේවකයා මෙන් විය යුතු බව ඉගැන්වීම පිණිස තම ශ්‍රාවකයන්ගේ ද පාද සෝදා ආදර්ශයක් ලබාදුන් සේක (ජොහාන් 13:1-20).

## රෝගීන්

• යම් අයෙක් හෝ ඔහුගේ පරම්පරාවේ අයෙක් කරන ලද පාප කරණ කොට ගෙන ඊට දඬුවමක් ලෙස රෝගීන් බවට පත්වන බව ජුදෙව්වන්ගේ මතය විය. රෝගීන් සමාජයේ ශාපලත් අය ලෙස කොන් කරනු ලැබිණි.

• රෝගීන් අතරේ ලාදුරු රෝගීන් හා කුෂ්ට රෝගීන් වෙන්කොට තැබීම නිසා ඔවුන් ශාරීරික ව. මානසික ව මෙන් ම අධ්‍යාත්මික ව ද පීඩාවට ලක්විය (මාක් 1:40-45). එවැනි රෝගීන් ස්පර්ශ කළහොත් තමා ද අපවිත්‍ර වේ යයි ඔවුන්ගේ හැඟීම විය. එම නිසා ඔවුන් ගැවසෙන ස්ථානයන්හි ද, ඔවුන් භාවිත කරන සියල්ල ද කෙරෙහි දැඩි අවදානයෙන් පසු විය. ඔවුන් ගමන් කරන විට සීනුවක් නාද කිරීම තුළින් ජනතාව දැනුවත් කිරීමක් සිදු විය.

• එහෙත් ජේසුස් වහන්සේ එම රෝගීන් ස්පර්ශ කොට සුවය ලබා දී ඔවුන් නැවත සමාජයට පිළිගැනීමට ලක් කළ සේක. උදාහරණ ලෙස ලාදුරු රෝගීන් දස දෙනාට පූජකයා ඉදිරියේ පෙනී සිටීමට යොමු කිරීමේ සිද්ධිය ලක් විය හැකි ය (ලූක් 17: 11-19). ජේසුස් වහන්සේ සබත් දින රෝගීන් සුව කිරීමත් ස්පර්ශ කොට සුවය ලබා දීමට කටයුතු කිරීමත් නිසා පරිසිවරුන්, විනයධරයන් හා සද්දුසිවරන්ගේ විවේචනයට භාජනය විය (ලූක් 5: 12-14, 6: 6-11).

## අයකැමියන්

• රෝම අධිරාජ්‍යයාට බදු අයකිරීමේ දී අයකැමියන් විසින් ගත් අසාධාරණ පියවර නිසා ජුදෙව් ජනතාව අයකැමියන් ප්‍රතික්ෂේප කර නින්දා කලහ. ඔවුන් ජාති ද්‍රෝහීන් ලෙස සලකනු ලැබී ය. මන්ද,

1. තමන් ව පීඩාවට පත්කළ රෝම අධිරාජ්‍යයාට බදු එකතු කිරීම.
2. පමණ ඉක්මවා බදු එකතු කිරීම.

• එහෙත් එවන් තත්ත්වයක් යටතේ පවා ජේසුස් වහන්සේ ඔවුන් පිළිගෙන කටයුතු කිරීමෙන් උන්වහන්සේ අපේක්ෂා කළේ ඔවුන් නිවැරදි යහපත් මඟට ගැනීම ය. දේව රාජ්‍යයේ පංගුකරුවන් කර ගැනීම ය. සාකෙවුස් නම් අයකැමියාගේ නිවසේ ආහාර ගැනීම ලූක් 19:1-10) හා මතෙව් හෙවත් ලෙවී නම් අයකැමියා තම ශ්‍රාවක පිරිස අතරට එක් කර ගැනීම තුළ ජේසුස් වහන්සේ ඔවුන් නිවැරදි මාර්ගයට ගැනීමට කටයුතු කළ සේක.

## පව්කරුවන්

- ජුදෙව් සමාජය තුළ විවිධ හේතූන් නිසා පහත සඳහන් කණ්ඩායම් පව්කරුවන් ලෙස සලකනු ලැබීය.
- රෝගින්, අයකැමියන්, පාපිෂ්ට වෘත්තීන් ලෙස සැලකූ රැකියාවල නිරත වූ වෛශ්‍යාවන්, සොරුන්,

එඬේරුන්, ගිනි පොලිකරුවන් මෙන් ම තම ධනයෙන් දසයෙන් එකක් නොගෙවූ දුප්පතුන් ද පව්කරුවන් ලෙස හංවඩු ගසනු ලැබී ය.

• මොවුන්ගේ අඩුපාඩුකම්, දුර්වලකම් වෙනුවෙන් ජුදා නීතිය ඉදිරියේ මොවුන්ට සමාවක් හිමි නොවී ය. විශේෂයෙන් වෛශ්‍යාවන් ගල් ගසා මරණයට පත් කිරීම මෝසෙස්ගේ නීතිය ප්‍රකාර අකුරට ම ඉටු කිරීමට මොවුන් පෙළඹිණි (ද්වි. 22:23).

• ජේසුස් වහන්සේ නීතියට වඩා මනුෂ්‍යත්වය අගය කරමින් පව්කාර ස්ත්‍රියට ගල් ගැසීමේ සිද්ධියේ දී පවක් නොකළ අයකු පළමු ගල ගසන ලෙස අභියෝගය කළ සේක.

• ජේසුස් වහන්සේ 'පාපය' ප්‍රතික්ෂේප කොට පව්කරුවන් පිළිගත්තේ ඔවුන් ව යහමග යැවීමට ය. පව්කරුවන් ලෙස සමාජයේ කොන්කරන ලද අයට දේව වචනය තුළ හැඩ ගැසෙන්නටත්, මනස්ථාපනයටත් කැඳවමින් නැවත ඔවුන් සමාජයට පිළිගත් සේක. උදාහරණ ලෙස සමාරිය ස්ත්‍රිය(ජොහාන් 4) පව්කාර ස්ත්‍රිය (ලූක් 7: 36-50) පිළිබඳ සිද්ධීන් ඉදිරිපත් කළ හැකි ය.

### සමරිතානුවන්

• ක්‍රි. පූ. 722 අසිරියානු ආක්‍රමණයෙන් පසු අන්‍ය ජාතීන් හා මිශ්‍ර වීම නිසා අපිරිසිදු පිරිසක් ලෙස සලකා සමරිතානුවන් සමඟ කිසිදු ගනුදෙනුවක් ජුදෙව්වෝ නොකළහ (2 රාජාවලිය 17). ඔවුන් ජීවත් වූ සමාරියාව මැදින් ගමන් කිරීම පවා ජුදෙව්වෝ ප්‍රතික්ෂේප කළහ.

• ජේසුස් වහන්සේගේ කාලය වන විට සමරිතානුවන් හා ජුදෙව්වන් අතර පරතරය ඉතා දැඩි විය. මේ ගැටුම සමනය කිරීම ජේසුස් වහන්සේගේ අධිෂ්ඨානය විය.

• ජේසුස් වහන්සේ යහපත් සමාරිතයාපිළිබඳ උපමාවෙන් ජුදයන් පිළිකුල් ක සමාරිය ජාතිකයන්ව අගය කළ සේක. තව ද සීකාර් නම් නුවර ජාකොබ්ගේ ළිඳ අසල දී සමරිතානු ස්ත්‍රියකගෙන් වතුර ඉල්ලීමේ සිද්ධිය තුළින් ජේසුස් වහන්සේ ඔවුන් පිළිගෙන කටයුතු කළ ආකාරය ඉතා පැහැදිලි ය (ජොහාන් 4:1-42).

## නව ගිවිසුමේ ආගමික පසුබිම

• ඒක දේවවාදය මුල්කර ගනිමින් තම නමස්කාරයේ යෙදුනු ජුදෙව් ජනතාවගේ ප්‍රධානතම ආගමික වන්දනා ස්ථානය වූයේ ජෙරුසලම් දේව මාලිගාව ය.

• වාර්ෂික ව පාස්කු මංගල්‍යය සැමරීමේදී ජෙරුසලම් දේව මාලිගාව වෙත යාම වැදගත් විය. ජනවන්දනාත්මක චාරිත්‍ර වාරිත්‍ර ඉටු කිරීම මෙහි දී සිදු කිරීම වැදගත් කාර්යයන් ලෙස සැලකිනි.

### ධර්මශාලාව - සිනගෝගය

• සිනගෝගය යන වචනය ග්‍රීක භාෂාවෙන් භාවිත වේ. එහි අරුත 'ජනතාව එකතු කිරීම', 'රැස්වීම' යන්නයි.

• ජුදා ජනතාව බබිලෝනියානු විප්‍රවාසයට ගෙන ගිය කාලයේ තම ආගමික කටයුතු සඳහා දේව මාලිගයට යාමට නොහැකි විය. එසේම බැබිලෝනි හමුදාව විසින් දේව මාලිගාව විනාශ කිරීම හේතුවෙන් ඔවුන් දුරක් ගෙවා එහි ගියත් දෙවියන්වහන්සේට වන්දනා කිරීමට දේව මාලිගාවක් නොතිබිණි (ගීතාවලිය 137:3-4). එම කාලයේ සිනගෝග ආරම්භ විය.

• ඔවුන් ධර්මශාලා හෙවත් සිනගෝග පිහිටුවාගත් නමුත් මෙහි දී වත් පිළිවෙත් ඉටු කිරීමක් සිදු නොවිණි. ඉගැන්වීම, යාච්ඤා කිරීම හා භාවනා කිරීම එහි දී සිදු කරන ලදි. ධර්මශාලා මගින් ජුදා විශ්වාසය පවත්වා ගැනීමට විශාල සේවයක් සිදු විය.

• ජේසුස් වහන්සේද නාසරෙත්, ගලීලයේ, කපර්ණවුමේ ධර්මශාලාවල ඉගැන්වීම හා සුවකිරීම් සිදු කළ බව මතෙව් 4:23, 13:54 හා ලූක් 7:5 හි සඳහන් වේ.

## ආගමික නීතිය

• ජුදා ජන ජීවිතය තුළ ආගමික නීති රීති පිළිපැදීම කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු විය.

• දෙවියන් වහන්සේ විසින් තෝරාගත් ජනතාවක් ලෙස තමන් විසින් කළ යුතු හා නොකළ යුතු සියල්ල පිළිබඳ මූලික නීති පද්ධතිය තුළ ඇතුළත් විය.

• නීති පිළිපැදීමෙන්, ඒවාට අවනත වීමෙන් දෙවිඳුන්ට ප්‍රසන්න පිරිසිදු දිවි පෙවෙතක් ගත කළ හැකි බව ජුදයන්ගේ විශ්වාසය විය.

• එබැවින් ඔවුන් සබත පැවැත්වීම කෙරෙහි වැඩි සැලකිල්ලක් යොමු කළහ. සබත් දින ලෞකික කාර්යයගෙන් බැහැර ව ආගමික වත්පිළිවෙත් ඉටු කිරීමට පමණක් මොවුන් සීමා වූහ. සබත් දින, යහපත ඉටු කිරීමට වඩා නීතියට මුල් තැනක් දුන්හ.

• නමුත් ජේසුස් වහන්සේ නීතියට වඩා මනුෂ්‍යත්වය අගයමින් ''මිනිසා සබත උදෙසා නොව සබත මිනිසා උදෙසා ය" යි පවසන්නේ සබත් දින ඇති වැදගත්කම මනා ලෙස ඉස්මතුකළ සේක (මාක් 2:27-28).

## සැන්හෙඩ්‍රින් සභාව - (ජුදා මන්ත්‍රණ සභාව)

• මෝසෙස් තුමාගේ නීතිය අනුව විනිශ්චයන් කළේ "සැන්හෙඩ්‍රින් සභාව" හෙවත් ජුදා මන්ත්‍රණ සභාව තුළ ය.

• සැන්හෙඩ්‍රින් සභාව තුළ උත්තම පූජකයා ද ඇතුළු ව සාමාජිකයින් සැත්තෑ එක් දෙනෙකු (71) විය. එහි සාමාජිකත්වය දැරුවේ නායක පූජකයන්, ප්‍රජා මූලිකයන්, පරිසිවරු, සද්දුසිවරු හා පූජක පේරු 24 හි නියෝජිතයින් විය.

• සැන්හෙඩ්‍රින් සභාව ජෙරුසලමේ දේව මාලිගයේ දී පැවැත්විණ. ජුදා ආගමික නීතියට අනුකූල ව ගැටලු විසඳීම හා විනිශ්චය කිරීම මෙහි දී සිදු විය.

• මරණ දණ්ඩනය පැනවීම සඳහා මෙම සභාවට තිබූ බලතල ජුදයාව රෝම ප්‍රාන්තයක් බවට පත්වීමෙන් පසු අහෝසි විය. එබැවින් කිසිවකු මරණයට පත් කිරීමේ බලය සැන්හෙඩ්‍රින් සභාවට නොතිබිණ.

• ජේසුස් වහන්සේ ව ද වරදකරුවකු ලෙස චෝදනා කරමින් ප්‍රථමයෙන් රැගෙන ගියේ ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය වන සැන්හෙඩ්‍රින් සභාවට ය. එහි සභාපතිත්වය දරණ ලද්දේ උත්තම පූජකයාය.

• අරිමාතියේ ජෝසෙප්, නිකදේමුස්, පාවුළුතුමාගේ ගුරුවරයා වූ ගමාලියෙල් සැන්හෙඩ්‍රින් සභාවේ සාමාජිකත්වය දරා ඇත.

## ආගමික පුද පූජා

• ජුදා පාස්කුව සැමරීම, කුඩාරම් මංගල්‍යය පැවැත්වීම, පෙන්තකොස්ත මංගල්‍යය පැවැත්වීම වාර්ෂික ව සිදුකළ ප්‍රධාන ආගමික මංගල්‍යයන් විය. මේ සඳහා ජෙරුසලම් දේව මාලිගාව මූලික විය.

• දේව නමස්කාරයට පෙර අත් පා සෝදා පිරිසිදු වීම ප්‍රධාන කාර්යයක් විය.

• කුලුඳුල් පිරිමි දරුවන් කැප කිරීම, චර්මඡේදනය කිරීම දේව මාලිගය ආශ්‍රිතව සිදු කළ ආගමික පිළිවෙත් විය. එමෙන් ම පිරිමි දරුවන් වයස අවුරුදු 12 ක් වූ විට දේව මාලිගයට ගෙන ගොස් පූජකයා ඉදිරියේ ව්‍යවස්ථාවේ පුත්‍රයෙකු කිරීම ජුදෙව් සම්ප්‍රදාය විය. ජුදෙව් පිරිමි දරුවන් දේව මාලිගයට හෝ සිනගෝගයට ගොස් නීතිය හැදෑරීම සිදුකිරීම මූලික ආගමික අවශ්‍යතාවක් විය. මෝසෙස් තුමාගේ ව්‍යවස්ථාව පිළිපැදීම ජුදා ජාතියට අනිවාර්ය විය එබැවින් ව්‍යවස්ථාව පිළිබඳ මූලික කරුණු විනයධරයන් විසින් උගන්වන ලදි.

• ජේසුස් වහන්සේගේ දෙමාපියන් ද තම කුළුඳුල් පුත්‍රයා වෙනුවෙන් ඉහත ජුදා චාරිත්‍ර වාරිත්‍ර ඉටුකරන ලදි.

## පලස්තීනයේ විසූ ආගමික කණ්ඩායම්

## පරිසිවරු හා විනයධරයන්

• සැම පරිසිවරයෙක් ම විනයධරයෙක් නොවූව ද විනයධරයන්ගෙන් බහුතරයක් පරිසිවරු වූහ.

• "පරිසි" යන්න "පරෂ්" යන වචනයෙන් බිඳී එන්නකි. පරිසි යන්නෙහි අරුත "වෙන්වී සිටීම" "වෙන්වුන"

යන්නයි. මොවුන් අන්‍ය ජාතීන්, පව්කරුවන්, සමරිතානුවන්, අයකැමියන්, සාමාන්‍ය දුප්පත් ජනතාව හා ව්‍යවස්ථාව පිළිපැදීම පිළිබඳ උනන්දුවක් නොදැක්වූ පිරිසගෙන් ඈත්ව, වෙන්ව ජීවත් වූහ.

• තම ධනයෙන් දහයෙන් එක ගෙවීමට නොහැකි දුප්පතුන් ද, ආගමික නීතිය ඉටු නොකල ජනතාව ද පව්කරුවන් ලෙස සැලකීමට යොමුවූහ.

• ඔවුන් ජුදා ජනතාව අතරින් වෙන් වූ අති විශේෂ පිරිසක් ලෙස සැලකූ කණ්ඩායමකි.

• එලෙස ජුදෙව් සමාජයේ නීති රීති සම්පාදනය සඳහා මූලික ව කටයුතු කළ අය අතර, විනයධරයන්ට ( ලේකම්වරුන්ට/ලියන්නන්ට) හිමිවන්නේ ප්‍රධාන ස්ථානයකි. මෝසෙස්ගේ නීතිය ලියා තැබීම, එය අර්ථකථනය කිරීම, ආරක්ෂා කිරීම, ඒවාට අලුවාවන් සැපයීම ඔවුන්ගේ ප්‍රධාන කාර්යයන් විය. දස පනතට අමතර ව නව නීති විනයධරයන් විසින් හඳුන්වා දී තිබුණි. ඒවා "කළ යුතු" කාර්යයන් හෙවත් ප්‍රතිජනනාත්මක නීති මෙන්ම "නොකලයුතු" කාර්යයන් හෙවත් ප්‍රතිශේධාත්මක නීති විය (මාක් 7:1-23, ලූක් 11:37-54, මතෙව් 16:1).

• ආගමික නිදහස භුක්ති වින්දාවූ ජුදෙව්වෝ තම ආගමික පිළිවෙත් හා ජුදෙව් ව්‍යවස්ථාව අකුරට ම පිළිපැදීමට ඇප කැප වී සිටි ජන පිරිසක් වූහ. ශුද්ධ ලියවිල්ල තුළ අන්තර්ගත දේව කැමැත්ත සොයා බලමින් එය ඉටුකිරීම ඔවුන්ගේ අභිප්‍රාය විය.

• ජුදෙව් ආගමික ජන කොටස් අතර පරිසිවරුන් වඩාත් ම ගෞරවයෙන් සලකන ලද බල සම්පන්න කණ්ඩායමක් විය.

• පරිසිවරුන් විසින් ලිඛිත නීතිය සමග වාචික නීතිය වන "මිෂ්නා" එනම් ලිඛිත නීතිය වාචික අර්ථ නිරූපණය ද පිළිපදින ලදි. මේ වන විට ටෝරාව හෙවත් මෝසෙස්තුමාගේ නීතිය ලිඛිත ව පැවතින. ටෝරාවේ අභ්‍යන්තර හරය ගැඹුරින් හැදෑරීම වෙනුවට එම නීති රීතිවල බාහිර ස්වරූපය ඉස්මතු කරමින් ඒවා ඍජු ලෙස පිළිපැදීමට පරිසිවරු යුහුසුළු වූහ. ඒවා අකුරට ම පිළිපැදීමට සාමාන්‍ය ජනතාව පීඩාකාරි ලෙස යොමුකළහ. තමන් ආගමික චාරිත්‍ර හා නීති රීති ආරක්ෂා කරන බව පෙන්නුම් කළ පරිසිවරු තමන්ගේ ධාර්මික බව ගැන උනන්දු වූහ. ඒ බව පරිසිවරයා හා අයකැමියා පිළිබඳ උපමාව තුළින් ජේසුස් වහන්සේ ඉදිරිපත් කළ සේක.

• පරිසිවරුන්ගේ ගති පැවතුම් අතර විශේෂයෙන් හඳුනාගත හැකි වන්නේ

1. දේව දූතයන් හා ආත්මවල පැවැත්ම, මළවුන්ගෙන් නැගිටීම පිළිබඳ විශ්වාස කිරීම
2. ලිඛිත මෙන් ම වාචික සම්ප්‍රදායයන්ද පිළිගැනීම
3. දාවිත්ගේ වංශයෙන් මෙසියස් වහන්සේ පැමිණෙන තෙක් බලාපොරොත්තු තැබීම
4. පරම්පරාගත සම්ප්‍රදායයන් ව්‍යවස්ථාව තරමටම වැදගත් ලෙස සලකමින් ඒ සියල්ල අකුරට ම පිළිපැදීම.
5. චාරිත්‍රානුකූල ආගමික පිළිවෙත් ඉතා වැදගත්කොට සැලකීම
6. ඇඳුම් විශේෂ ආකාරයට සකස් කර ගැනීම

• මොවුහු මංසන්ධි වල ප්‍රසිද්ධියේ යාච්ඤා කළහ. ඔවුන්ගේ වස්ත්‍ර වල දාවල්ල පළල් කළහ. අතේ හා නළලේ දේව වචනය සටහන් කරමින් පෙන්නුම් කළේ ඔවුන්ගේ ධාර්මික භාවයයි නළලේ සටහන් කිරීම තුළ දේව වචනය මනසේ රැඳේ යනුවෙන් ද අතේ සටහන් කිරීම තුළ දේව වචනය ක්‍රියාවේ යෙදීම යනුවෙන්ද ඔවුන්ගේ අදහස වූ නමුත් ඔවුන් තමන්ධර්මිෂ්ඨ ලෙසින් පෙනී සිට ජනතාව ඉදිරියේ කැපී පෙනීමට උත්සාහ කළහ.

• මොවුන් නිතර ජේසුස් වහන්සේට සබත කඩ කිරීම , පව් කමා කිරීම යනාදිය පිළිබඳ ව, චෝදනා ඉදිරිපත් කිරීමට යුහුසුළු වූ පිරිසක් විය.

• සබත පිළිබඳ නියම අරුත ජේසුස් වහන්සේ ජනතාවට හෙළි කරමින් ප්‍රකාශ කළේ සබත මිනිසා උදෙසා මිස මිනිසා සබත උදෙසා නොවන බව ය. බාහිර පිළිවෙත් ගැන උවමනාවටත් වඩා සැලකිල්ලක් දැක්වූහ. බාහිර වත් පිළිවෙත හා පිරිසිදුකම පිළිබඳ සැලකිලිමත් වූ මොවුහු සාමාන්‍ය ජනතාවට සහනය සලසනු වෙනුවට ආගමික වත් පිළිවෙත් නාමයෙන් ඔවුන් පීඩනයට ලක් කළහ. ඒ පිළිබඳ ව ජේසුස් වහන්සේ තරයේ හෙළා දකිමින් හුදෙක් ප්‍රේමයේ පදනම මත කටයුතු කළයුතු බව පහදා දුන් සේක.

## සද්දුසිවරු

• "ශාදොක්" (2 සාමු. 8: 17) නමැති පූජකයාගෙන් පැවතෙන්නන් ලෙස සද්දුසිවරුන් සැලකේ.

• මොවුහු ධනවතුන් වූහ.

- මොවුන් ජෙරුසලමට සම්බන්ධ පූජකයින් සමග සමීප සම්බන්ධතාවයක් ඇති ව සිටි රදල කණ්ඩායමකි.
- උත්තම පූජකයා වූයේ සද්දුසිවරුන් අතරින් එක් අයෙකි.
- මොවුහු ජුදා ආගමික බල ව්‍යුහයේ ආධිපත්‍යය හෙබවූහ.
- සියලු ම සද්දුසිවරු පූජකයෝ නොවූ අතර සියලු පූජකවරු සද්දුසිවරුද නොවූහ.
- ආගමික වත්පිළිවෙත් ඉටුකිරීම සඳහා ජෙරුසලම් දේව මාලිගාව සද්දුසිවරුන්ගේ කේන්ද්‍රස්ථානය විය.
- තමන්ගේ තත්ත්වය හා බලය ආරක්‍ෂා කර ගැනීමට බොහෝ වෙහෙස දැරූ පිරිසකි. මෙම ආගමික කණ්ඩායම පරිසිවරුන් මෙන් නොව,
    1. වාචික සම්ප්‍රදායේ (මිෂ්නා) නීති රීති ප්‍රතික්ෂේප කළ අතර ලිඛිත ව්‍යවස්ථාවම පමණක් පිළිගත් හ.
    2. දේව දූතයින් හා යක්ෂයින් ගැන විශ්වාස නොකලහ.
    3. පුනරුජ්ජීවනය (උත්ථානය) පිළිබඳ විශ්වාස නොකළහ. අමරණීය ආත්මයක් හෝ මරණින් මතු සැපතක් පිළිබඳ විශ්වාස නොකලහ (මාක් 12:18-23).
- මොවුන් සතු ව පැවති දේශපාලනිකව හා ආර්ථිකව පැවති බලය ආගමික ක්ෂේත්‍ර කෙරෙහිද පැතිරිණ.
- සැමවිට නායක පූජකයාගේ පැත්ත ගැනීමට යොමුවිය.
- ප්‍රතිපත්ති විරහිත රෝම පාලකයන්ට පක්ෂපාතීව කටයුතු කළ පිරිසක්ද විය. දේශපාලන හා ආගමික වශයෙන් විශේෂ බලපෑමක් ඇතිකිරීමේ ශක්තියක් ඔවුන්ට තිබුණි.
- ජුදයාව රෝමයට යටත්ව විසූ රෝම අධිරාජ්‍යයා සමඟ සහයෝගයෙන් ක්‍රියා කරන ලෙස ජනයාට උපදෙස් දුන් පිරිසක්ද විය

## සෙලට්වරු

- ගලීලයේ ජූදස් සෙලට්වරුන්ගේ නිර්මාතෘ විය.
- විප්ලවවාදියෙකු වූ ඔහු රෝම හමුදාවට විරුද්ධ ව කැරැල්ලක් මෙහෙයවී ය.
- සෙලට්වරු තම රට පාලනය කළ රෝමවරුන්ට විරුද්ධව ක්‍රියාකොට ජුදෙව් බලය පිහිටුවීමට මව්බිම වෙනුවෙන් කැප වී විප්ලවවාදි ලෙස කටයුතු කළහ.
- රෝම අධිරාජ්‍යයට විරුද්ධ වූ මොවුහු මෙසියස් වහන්සේගේ පැමිණීම පිළිබඳ ව බලාපොරොත්තු තබා සිටි පිරිසකි. එතුමා පැමිණි කල රෝම පාලනය බිඳ දැමීමට හැකිවේ යයි ඔවුහු විශ්වාස කළහ.
- ඔවුන් සටන් කළේ දෙවියන් වහන්සේ හා දේව ජනතාව වෙනුවෙනි.
- එබැවින් ඔවුන් කළේ ශුද්ධ වූ ක්‍රියාවක් හා ශුද්ධ වූ අරගලයක් බව ඔවුහු සිතූහ. එබැවින් මෙසියානු ආගමනය යම් දිනක සිදුවන තුරු බලා නොසිට ඒ දිනය උදාකිරීමට දායක වීම ඔවුන්ගේ අපේක්ෂාව විය. ඒ නිසා ඔවුන් විවිධ කැරලි ඇති කළහ.
- දෙවියන් වහන්සේ පමණක් රජයන බව ඔවුහු විශ්වාස කළ බැවින් රෝම අධිරාජ්‍යයට බදු ගෙවීමට පවා විරුද්ධ වූහ.

## එසේනිවරු

- ක්‍රි.පූ. 152 දී ජුදස් මකබියස් ගේ සහෝදරයන් වන ජොනතන් සිරියානු රජවරුන් ලෙසින් උත්තම පූජක තනතුරට පත්කරන ලදී.
- සිරියානු පාලකයන් විසින් එසේ කරන ලද්දේ ශාදොක්ගේ පරම්පරාවට අයත් වූවන්ට උත්තම පූජක පදවිය අහිමි කරමිනි. මෙයට විරෝධය පළකරමින් කණ්ඩායමක් මළමුහුද අසල ගුහාවල පදිංචි වූහ. ඔවුන් ව එසේනි වරුන් නමින් හඳුන්වනු ලැබේ.
- මොවුන් පිළිබඳ ව බයිබලයේ සඳහන් නොවේ. පලස්තීනයේ මළ මුහුද අසල කුම්රාන්හි කළ කැණීම් වලින් මොවුන් පිළිබඳ තොරතුරු අනාවරණය වී. ඇත.
- නීත්‍යානුකූල නොවන හා නුසුදුසු පූජකවරය මගින් දේව මාලිගාව අපවිත්‍ර වී ඇති බව ප්‍රකාශ කළ අතර දේව මාලිගාව හා පූජකවරය යන දෙක ම ප්‍රතික්ෂේප කළහ. මොවුන් ජුදා ආගමෙහි දෙවෙනි වන්නේ පරිසිවරුන්ට හා සද්දුසිවරුන්ට පමණි.

• ශුද්ධ ලියවිල්ල අත්පිටපත් කිරීම විශේෂ කාර්යයක් ලෙස සැලකුවා පමණක් නොව ඒවා සුරක්ෂිත කිරීම ද සිදුකළහ. සමහර විශාරදයෝ ස්නාවක ජොහන් තුමා එසේනි පසුබිමක ජීවත්වන්නට ඇතැයි පවසති.

• විවාහ නොවීම, නායකයාට කීකරු වීම, සුදු වස්ත්‍ර ඇඳීම, පොදු යැදුම්, පොදු වැඩ, පොදු උපදේශනය සහ පොදුවේ වැළඳීම මොවුන්ගේ ජීවිත පැවැත්මෙහි විශේෂිත විය.

• තවද මොවුන් මෝසෙස්තුමාගේ ඉගැන්වීම් පිළිබඳ ව වැඩි උනන්දුවක් දැක්වූහ. යුගාන්තයේදී සියලු අයහපත පරාජය වී යහපත උදාවන බව ඔවුන්ගේ බලාපොරොත්තුව විය. මෙසියස් වහන්සේ නුදුරු අනාගතයේ දී වඩින බවත්, එසේනිවරුන්ගේ සතුරන්ට දඬුවම් දෙන බවත් ඔවුන්ගේ විශ්වාසය විය.

• ජුදා රෝම යුද්ධය අවසානයත් සමඟම ක්‍රිස්තු වර්ෂ පළවෙනි සියවසේ සෙලට්වරු, එසේනිවරු, සද්දුසිවරු අහෝසි වූ බව සඳහන් වේ.

ආශ්‍රිත ග්‍රන්ථ
දසනායක, ජූඩ් (පියතුමා) (දේව අනාවරණ 3)
ශු. බයිබලයේ සමාජ, ආගමික, දේශපාලනික හා භූගෝලීය පසුබිම
කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 8. 2011

| | | |
|---|---|---|
| නිපුනතාව | 4.0 : | ක්‍රිස්තුන්වහන්සේ ලෝකයේ නව විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේට සාක්ෂි දරයි. |
| නිපුනතා මට්ටම | 4.2 : | ශුභාරංචිය හා ක්‍රියා පොත පිළිබඳ අවබෝධය කිතුනු වටිනාකම් ප්‍රචලිත කිරීමට යොදාගනියි. |
| කාලච්ඡේද සංඛ්‍යාව | : | 25 |

**ඉගෙනුම් ඵල**

- ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුභාරංචිය ප්‍රචලිත කිරීමට ඇප කැප විය යුතු බව පිළිගනියි.
- ශුභාරංචි හා ක්‍රියා පොත පිළිබඳ ගොනුකරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- ශුභාරංචියේ ආලෝකය තුළ තම ජීවිතය හැඩගස්වා ගනියි.
- ජීවිත පැවැත්ම අන් අයට ශුභාරංචියක් වෙයි.

## 4.2.1 ශුභාරංචිය යනු කුමක්ද?

• ශුභාරංචියක් යනු යමකුට යහපත් ආරංචියක් සවනට පත්වීමක් හෝ සෙත උදාකර දීමකි.

• 'ශුභාරංචිය' යන්නෙහි ප්‍රභවය ඈත ජුදා ඉතිහාසය දක්වා දිවයයි. පැරණි ගිවිසුමෙහි වර්ධනයත් සමගම යහපත් ආරංචියක් පැවසීම යන්නට එහි භාවිත වන මූලික ක්‍රියා පදය 'බසාර් ' (Basar) යන්නයි.

• ඉන් විද්‍යාමාන වන අදහස එම ක්‍රියා පදයේ මූලය විදහා දක්වයි. එනම් යහපත් ආරංචියක් ගෙන ඒම, යහපත් ආරංචියක් පැවසීම යන්න ඉන් ධ්වනිත වේ.

• මුල් කාලවල මෙම ක්‍රියාපදය මගින් ප්‍රකාශ වූයේ යුධ ජයග්‍රහණයක් පිළිබඳ යහපත් ආරංචියකි.

• 2 සාමුවෙල් 4:10 හි දැක්වෙන ආකාරයට දෙවියන් වහන්සේ ඉශ්‍රායෙල් ජනතාවගේ එදිනෙදා ජීවිත තුළ ක්‍රියාශීලීත්වයට පත්වීමෙන් ඔවුහු යුධ ජයග්‍රහණ හිමිකරගත්හ.

• එම ජයග්‍රහණ පිළිබඳ ශුභාරංචිය 'බසාර් ' යන්න මගින් පැවසිණ.

• රජමාළිගයට සම්බන්ධ අය මගින් රජතුමා වෙත ප්‍රකාශ කෙරුණු මෙම ශුභාරංචිය හැඳින්වීමට පැරණි ගිවිසුමෙහි 'බසාර් ' යන පදය යොදා ගැනිණි.

• තව තවත් එම අදහස සංවර්ධනය වී 'සතුරන් පරාජය කළ දෙවිඳාණන් පිළිබඳ යහපත් ආරංචිය' යනුවෙන් එය අර්ථ වෙනස් වී , ආගමික මුහුණුවරක් ගැනීම හේතුකොටගෙන බසාර් යන්න බෙසෝරා (Besorah) බවට පරිවර්තනය වන ආකාරය පැහැදිලිව දක්නට ලැබේ.

• එනම් 'දෙවිඳුන් කෙරෙන් ලැබෙන ගැලවීමේ සුබ පණිවුඩය' යන්නයි.
(යෙසායා 52:7)

• යෙසායා 40:9 , 4:27 , 52:7 පදයන්හි සියොන් එනම්, ඉශ්රායෙල් ජනතාවට ගැලවීම උදාකරදීම පිළිබඳ ශුභාරංචිය සඳහන් වේ.

• යෙසායා 61:1 අනුව දිළිඳුන් බිඳිනු සිත් ඇත්තන්, වහලුන් හා සිරකරුවන්ටද ගැලවීමේ 'ශුභාරංචිය' හිමි වේ.

• නව ගිවිසුමේ දී ද අධිරාජ්‍යයාගේ උපත සිහසුන් ප්‍රාප්තවීම යන සිදුවීම්ද යනාදිය ශුභාරංචි ලෙස සැලකිණ.

• සෙප්තුවාජින්තයේ ශුභාරංචිය යන්නට ලබාදෙන 'එවුඅන්ගේලියොන්' යන වදන මගින් යුද්ධයකට පසු ලබන ජයග්‍රහණය දැන්වීම හෝ නව රජ කෙනෙකු පත්වූ බව දැක්වීම අර්ථ ගන්වා ඇත.

• පැරණි ඉංග්‍රීසි වදනක් වූ ගෝඩ්ස්පෙල් (Godspell) යන්නෙන් 'ගොස්පල්' යන්න පැවත ගෙන එයි. යහපත් වූ යම් දෙයක් පිළිබඳව කරනු ලබන දැනුම් දීම ඉන් අර්ථවත් වේ.

• මෙය ආගමික අරුතකට පරිවර්තනය වී ක්‍රිස්තියානි ලෝකය තුළ දෙවියන් වහන්සේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළින් ලෝකයට අනාවරණය වීමේ පණිවුඩය හඳුන්වා දීමට මෙම ගොස්පල් (Gospel) යන පදය යොදා ගැනිණ.

• පැරණි ගිවිසුමේ පොරොන්දු , දිවැස් වැකි සනාථ කරමින් දෙවියන්වහන්සේ නව ගිවිසුමේදී ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ගැලවීම උදාකරවීම සඳහා මාංශවත්වීම 'ශුභාරංචිය' යන වදන තුළින් ආලෝකවත් විය.

• ඒ අනුව ශුභාරංචිය වන්නේ ජේසුස් වහන්සේ ම ය.

• මුළු මිනිස් සංහතිය පාපයෙන් මුදාගැනීම සඳහා මාංශගත දේව පුත්‍රයාගේ ජීවිතය, පණිවිඩය, සේවාව, දුක්විඳීම, කුරුසිය මත ජීවිත පූජාව හා උත්ථානය (පුනර්ජ්ජීවනය) තුළින් හිමි වන බලාපොරොත්තුව ' 'ශුභාරංචිය' ලෙස අර්ථ දැක්විය හැකි ය.

• උන්වහන්සේ අදහමින් උන්වහන්සේගේ කැමැත්ත ලෙස දිවිගෙවන්නට එය ජීවමාන ශුභාරංචි පණිවිඩයකි.

### 4.2.2 ශුභාරංචි ලේඛන ගතවීමේ අවධි

• ශුභාරංචි ලේඛන සම්ප්‍රදාය සංකීර්ණ ක්‍රියාවලියක් තුළ වර්ධනය වූවකි.

• මෙම ක්‍රියාවලිය තුළ අදියර තුනක් නිරීක්ෂණය කළ හැකිය. උන්වහන්සේ ප්‍රකාශ කළ වදන් හා සිදු කළ ක්‍රියා ඇසූ දුටු සාක්ෂිකරුවන් වූයේ උන්වහන්සේගේ ශ්‍රාවකයන් ය.

• ජුදෙව් රබ්බිවරුන් මෙන් උන්වහන්සේ තම ඉගැන්වීම් කටපාඩම් කිරීමෙන් මතක තබා ගැනීමට ශ්‍රාවකයන් යොමු කළ බව පැවසේ.

• මෙසේ කිරීම තුළින් ශුභාරංචිය දෙසීමට , එය ඉගැන්වීමට හා නමස්කාරය සඳහා එය යොදා ගැනීමට හැකිවීමෙන් ශුභාරංචි ආදීම සම්ප්‍රදාය බිහිවීමට එය හේතුකාරක විය.

• ජේසුස් වහන්සේගේ මරණයට හා උත්ථානයට පසු උන්වහන්සේගේ දූත සේවාව ඉදිරියට ගෙනයෑමේ වගකීම පැවරුණේ ශ්‍රාවකයන්ටය.

• ඔවුන් විසින් මුල් කිතුනු සභාවේ ආරම්භක දින එනම් පෙන්තකොස්ත දින ශුද්ධාත්ම බලයෙන් පූර්ණව ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණ අවස්ථාවේ උන්වහන්සේ ඔවුන්ගෙන් අයැද සිටි පරිදි පොළොවේ සියලු සීමාන්තයන් දක්වා උන්වහන්සේගේ ගැලවීමේ මහා ක්‍රියාදාමයේ සාක්ෂිකරුවන් වීමට කැපවූහ. (ක්‍රියා 2:32)

• ජේසුස්වහන්සේ හා එක්ව සේවය කිරීමෙන් ලද අත්දැකීම් හා ඉගෙන ගත් දෑ ඇසුරෙන් ජේසුස්වහන්සේ 'ජනතාව පාපයෙන් මුදවාලීමට පැමිණි මෙසියස් වහන්සේය' යන ශුභාරංචිය නිර්භීත ලෙස පතල කරමින්ද, ජේසුස්වහන්සේගේ ඉගැන්වීම් දේශනා කරමින් හා උන්වහන්සේ කේන්ද්‍ර කොටගත් ජනවන්දනා පිළිවෙත් සභාව තුළ වර්ධනය කරමින්ද ක්‍රියාකිරීම හේතුකොටගෙන ශුභාරංචි වාචික සම්ප්‍රදාය බිහිවූ බව පැහැදිලි වේ.

• පැරණි ගිවිසුමේ පූර්ණත්වය ලෙසින් නව ගිවිසුමේදී මාංශවත් වූ ජේසුස් වහන්සේ පිළිබඳ ශුභාරංචිය උන්වහන්සේගේ මරණින් පසු වසර 50 ක් පමණ වාචික සම්ප්‍රදායයක් ව පැවතුණි. ජේසුස් වහන්සේ හා එක්ව සේවය කළ ශ්‍රාවකයන් ඇසූ දුටු උන්වහන්සේගේ ජීවිතය , දූත මෙහෙය, දුක් ප්‍රාප්තිය හා මරණය, නැවත උත්ථානය හා ස්වර්ගාරෝහණය යන සියලු සිදුවීම් එම වාචික සම්ප්‍රදාය තුළ අන්තර්ගත විය.

• ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ශ්‍රාවක පිරිස හා මුල් කිතුනු සංඝයන් විසින් එම ශුභාරංචි ආදී සම්ප්‍රදාය සුරැකීමේ වගකීමට උර දුන්හ.

• එනමුත් කාලයත් සමග එම වාචික සම්ප්‍රදාය එලෙසම පවත්වා ගත නොහැකි වීමේ අභියෝගයට මුහුණපෑමට සිදුවිය.

ඊට හේතු වූයේ,

• සභාව ශීඝ්‍රයෙන් වර්ධනය වීම.

• වාචික සම්ප්‍රදායෙහි අන්තර්ගත වූ සමහර සිදුවීම් කාලයත් සමග මතකයෙන් ගිලිහී යෑම.

• එම සිදුවීම්වලට පංගුකාර වූ සාක්ෂිකාර ශ්‍රාවක පිරිස් මියයාම.

• මූලික සත්‍යයන් නොවෙනස්ව පවත්වා ගෙන යෑමේ දැඩි අභියෝගයට මුහුණදීමට සිදුවීම.

• ජේසුස් වහන්සේගේ ජීවිත සිදුවීම් හා ඉගැන්වීම්වලට මිත්‍යා මත සම්බන්ධවීම වළක්වාලිය යුතුවීම.

• ජේසුස් වහන්සේගේ පුනරාගමනය අපේක්ෂාවෙන් සිටි කිතුනුවන් අතර එය ප්‍රමාද වීමෙන් ආධ්‍යාත්මික නොසන්සුන්තාවක් ඇතිවීම වැනි දෑය.

එනිසා ශුභාරංචි වාචික සම්ප්‍රදාය සුරැකීමේ යෝග්‍යතම පියවර එය ලේඛනගත කිරීම බව පැහැදිලි විය. එම පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා අවධීන් / අදියර තුනක් යටතේ තොරතුරු සම්පාදනය කොටගෙන ඇත.

■ පළමු අවධිය / අදියර (ක්‍රි.ව. 0 - 33)

ජේසුස් වහන්සේගේ ජීවිතය හා ඊට අදාළ සිදුවීම්ද උන්වහන්සේ කළ කී දෑ ජේසුස්වහන්සේගේ උපතේ පටන් මුලු මහත් දූත සේවාව පිළිබඳවත්, එහිදී උන්වහන්සේ කළ කී දෑ පිළිබඳවත් මේ අදියරට අයත් වේ.

■ දෙවන අවධිය / අදියර (ක්‍රි.ව. 33 - 50)

• ජේසුස් වහන්සේගේ උත්ථානය හා ස්වර්ගාරෝහණයෙන් පසු ශුද්ධාත්ම දානය ලැබූ ශ්‍රාවකයන් ඇතුළු මුල් කිතුනුවන්ගේ සාක්ෂි හා වාචිකව තොරතුරු මෙම අදියරට අයත්ය.
• මුල් කිතුනුවන්ට පාස්කුවට පෙර හා සමහර පසු සිදුවීම් පිළිබඳව මතකය සම්ප්‍රේෂිත මතකයකි. නමුත් ශුද්ධාත්ම දානයෙන් පසු ඔවුන් අත්දුටු , ඇසූ දුටු දෑ , ශ්‍රාවකයන්ගේ දේශන හා ඉගැන්වීම් , පීඩා ප්‍රශ්න ගැටළු , අභියෝග හමුවේ ඔවුන් ක්‍රියාකළ ආකාරය, සිදුවූ ප්‍රාතිහාර්ය ආදි වාචික තොරතුරු රැසක් දෙවන අදියරට අයත් වේ.

■ තෙවන අවධිය / අදියර (ක්‍රි.ව. 70 - 100)

• ශුභාරංචි කතුවරුන්ගේ පරමාර්ථ , දර්ශන හා දැක්මට අනුගතව ශුභාරංචි වාචික සම්ප්‍රදාය ලේඛනගතවීම තෙවන අදියර වේ.

• ජේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගැලවීමේ අභිරහස පිළිබඳ ශුභාරංචිය ලේඛනගත වනුයේ වාචික සම්ප්‍රදාය පූර්ණත්වයට පත් කරවමිනි.
• ශුද්ධාත්මානුභාවයෙන් තෝරාගත් කතුවරුන් සිවුදෙනකු සිය දැනගැන්මේ ප්‍රකාරයට, සිය දේවධාර්මික දැක්ම පෙරදැරිකරගනිමින් දැක්මකට ශුභාරංචිය ග්‍රන්ථාරූඪ කර ඇත.
• ශුභාරංචි ග්‍රන්ථ යොමුකළ ජන සංඝයන්ගේ පසුබිම හා අවශ්‍යතාවය පදනම් කරගනිමින්ද, ඔවුන්ට ආවේණික ලේඛන ශෛලීන් භාවිත කරමින්ද, මෙය සම්පාදනය කර ඇත.

### 4.2.3 ශුභාරංචි ග්‍රන්ථ

නව ගිවිසුමට අයත් කරනු ලැබූ ග්‍රන්ථ 27 අතුරෙන් ශුභාරංචි ග්‍රන්ථ 4 ට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. ජේසුස් වහන්සේගේ ජීවිත සිදුවීම් හා දූත මෙහෙවර පිළිබඳ තොරතුරු ලබාදෙන අතිවිශේෂ ග්‍රන්ථ පෙළ මෙම ශුභාරංචි ග්‍රන්ථයි. මේ අනුව,

• ශු.මතෙව් තුමාගේ ශුභාරංචිය

• ශු.මාර්ක් තුමාගේ ශුභාරංචිය

• ශු.ලූක් තුමාගේ ශුභාරංචිය හා

• ශු.ජොහාන් තුමාගේ ශුභාරංචිය යන ග්‍රන්ථ නව ගිවිසුමේ මුල් ග්‍රන්ථ හතර ලෙස අනුපිළිවෙලින් ඇතුලත් කරනු ලැබ ඇත. තවද මුල් ශුභාරංචි ග්‍රන්ථ අතර ඇති සමානකම් නිසා ඒවා 'සමදර්ශක ශුභාරංචි' ලෙස හැඳින්වේ.

## ශු.මතෙව්-තුමාගේ ශුභාරංචිය

• ශු.මතෙව්තුමාගේ ශුභාරංචිය නව ගිවිසුමේ සම්මත ග්‍රන්ථාවලියේ පළමුවෙන්ම ඇතුළත් කර ඇති ග්‍රන්ථයයි.

• එම ග්‍රන්ථය දැඩි ලෙස ජුදා පසුබිමක් තුළ විස්තර කර ඇති බව විද්‍යාමාන වේ. නාසරෙත්හි ජේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ තෝරාගත් දේව ජනතාවගේ සම්ප්‍රදායන් තුළ ස්ථානගත කරමින් උන්වහන්සේ එම ගිවිසුම් හා සම්ප්‍රදායයන් පූර්ණත්වය කරා ගෙනයන ආකාරය මෙම ශුභාරංචිය තුළින් එළිදැක්වීමේ ප්‍රයත්නයක් දරා තිබේ.

• මෙහි ආරම්භයේ සිට අවසානය දක්වාම සම්ප්‍රදාය හා නම්‍යතාවය අතර යම් සබඳතාවයක් ගොඩනැගීමට උත්සාහ දරා ඇති ආකාරය පැහැදිලිය.

## කර්තෘත්වය

• මෙම ශුභාරංචියේ කර්තෘත්වය පිළිබඳව විශාරදයන් අතර විවිධ මත ඇත.

• සම්ප්‍රදායිකව පිළිගැනෙන මතය වනුයේ මෙම ශුභාරංචියෙහි කතෘ ජුදා සම්භවයක් ඇති මුල් කාලයේ අයකැමියකු ලෙස රෝම රජයට සේවය කළ, පසුව ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයකු වූ ලෙවී හෙවත් මතෙව්තුමා ලෙස පිළිගැනේ. (ශුද්ධවූ මතෙව් 9:9)

• එනමුත් මෙහි කතෘවරයා මෙහි සඳහන් කෙරෙන සිදුවීම් සියැසින් දුටු පුද්ගලයෙකු බව සනාථ කිරීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොපවතී.

• එහෙත් මෙම ශුභාරංචියේ කතෘවරයා ජුදා ඉගැන්වීම් ක්‍රම පිළිබඳව හසල දැනුමක් ඇති කිතුනු ධර්මදූතවරයෙකු බව පැහැදිලිවන අතර, ජුදා ආභාසය ඉතා ප්‍රබලව තිබුණු සිරියාවේ හෝ වෙනත් ප්‍රදේශයක පදිංචිව සිටි බව පිළිගැනේ.

## කාලය හා ස්ථානය

• සභාවේ පැරණිතම සම්ප්‍රදායට අනුව මතෙව් තුමාගේ ශුභාරංචිය ක්‍රි.ව. 80 - 90 අතර කාලයේ ලියැවුණු බව පිළිගැනේ.

• රෝම සොල්දාදුවන් විසින් ක්‍රි.ව. 70 දී සිදු කළ ජෙරුසලම් විනාශය හේතුවෙන් කිතුනුවන් බොහොමයක් සිරියාවේ අන්තියෝකිය ඇතුළු විවිධ ප්‍රදේශවලට පලායන ලදී.

• මෙම ශුභාරංචිය ඊට මදකලකට පසු සිරියාවේ අන්තියෝකියේදී ලියන ලද බව පිළිගැනේ.

• මතෙව් තුමා සිය ශුභාරංචිය මුලින්, එකල ජුදෙව්වන්ගේ බස වූ ඇරමෙයික් බසින් ලියන්නට ඇති බවත් පසුව මතියානු සංසය විසින් මුළු අධිරාජ්‍යයේ පිළිගත් භාෂාව වූ ග්‍රීක් බසින්ද ඉදිරිපත් කරන්නට ඇතැයි බොහෝ විද්වතුන් ප්‍රකාශ කරයි.

## පරමාර්ථ

• මතෙව් ශුභාරංචියේ ප්‍රධාන පරමාර්ථය නම්, මාංශවත් වූ ජේසුස් ක්‍රිස්තුස්වහන්සේ ජුදා ජනතාව අපේක්ෂාවෙන් සිටි මෙසියස් වහන්සේ බව අවධාරණය කිරීමය.

• පැරණි ගිවිසුමෙහි මෙසියස් වහන්සේ සම්බන්ධ අනාවැකි සියල්ල නව ගිවිසුමෙහි ජේසුස් වහන්සේ තුළින් පරිපූර්ණ වූ බව තහවුරු කිරීමට මතෙව් තුමා විශේෂ ප්‍රයත්නයක් දරා ඇත.

• මතෙව් තුමා ජේසුස් ස්වාමීන් වහන්සේගේ අසහාය ගුරුවරයා (මතෙව් 5:1) නොහොත් දහම් ඇදුරාණන් ලෙස ඉදිරිපත් කරයි. (මතෙව් 28 : 18 - 20)

## ආවේණික ලක්ෂණ

1. සම්ප්‍රදායිකව මෝසෙස් තුමාගේ පංච පුස්තකය ආභාසයෙන් මතෙව් තුමා තම කෘතිය සම්පාදනය කර ඇති බව විශාරදයින් පෙන්වා දෙයි. පංච පුස්තකයේ ග්‍රන්ථ 5 ක් ඇති අතර , ඊට සමාන්තරව මතෙව් ශුභාරංචියේ ජේසුස් වහන්සේගේ දේශනා පහක් අන්තර්ගත වේ.

හැඳින්වීම - ජේසුස්වහන්සේගේ ළමා කාලය (ශු.මතෙව් 1 - 4 පරිච්ඡේද)

පළමු පොත - ස්නාවක ජොහාන්ගේ මනස්ථාපනයේ මෙහෙය හා කන්ද උඩ දේශනය (ශු.මතෙව් 3 - 4 පරිච්ඡේද , 5 - 7 පරිච්ඡේද)

දෙවන දේශනය- ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා මෙහෙය පිළිබඳ දෙසුම (ශු.මතෙව් 8 - 9 පරිච්ඡේද හා 10:1 - 11:1)

තෙවන දේශනය - ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා උපමා (ශු.මතෙව් 11 - 12 පරිච්ඡේද 13:1 - 52)

සිවුවන දේශනය- ජේසුස් වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා ප්‍රජාව පිළිබඳ දෙසුම (ශු.මතෙව් 13:58 , 18 පරිච්ඡේදය)

පස්වන දේශනය- ජේසුස්වහන්සේගේ දූත සේවයේ අවස්ථා හා අවසාන විනිශ්චය පිළිබඳ දෙසුම (ශු.මතෙව් 19 , 25 පරිච්ඡේද)

සමාප්තිය - ජේසුස්වහන්සේගේ දුක් ප්‍රාප්තිය , මරණය හා නැවත උත්ථානය (ශු.මතෙව් 26 - 28 පරිච්ඡේද)

2. විශේෂයෙන් ජුදෙව් කිතුනුවන් වෙනුවෙන් සිය ශුභාරංචිය ඉදිරිපත් කරන අතර ජුදෙව් ලක්ෂණ බොහොමයක් එහි ගැබ්ව ඇත.

පෙළපත් දැක්වීම මගින් ජේසුස් වහන්සේ ආබ්‍රහම්ගේ හා දාවිත්ගේ පුත්‍රයා ලෙස ඉදිරිපත් කිරීම. (ශු.මතෙව් 1:1-17)

ජේසුස්වහන්සේ පැරණි ගිවිසුමේ පූර්ණත්වය ලෙස ඉදිරිපත් කිරීම. (ශු.මතෙව් 1:22-23 , 2:15 , 2:17-18)

ජේසුස්වහන්සේ ජුදෙව් ව්‍යවස්ථාවට නව මඟපෙන්වීමක් ලබාදෙන බව දැක්වීම. (ශු.මතෙව් 5:17-48)

සමහර ජුදෙව් පිළිවෙත් හා සම්ප්‍රදායයන් ඉදිරිපත් කිරීම. (ශු.මතෙව් 5:19 , 6:1-6 , 12:5 , 15 , 23, 27)

ඉශ්‍රායෙල් ජනතාව වෙනුවෙන් ජේසුස් වහන්සේගේ පෞද්ගලික මෙහෙය එළිදැක්වීම (ශු.මතෙව් 10:15)

කන්ද උඩ දේශනයේදී ජේසුස් වහන්සේ නව නීතියක් දානය කරන නව මෝසෙස් ලෙස ඉදිරිපත් කිරීම.

ජේසුස් වහන්සේ ජුදෙව්වරුන්ගේ රජ ලෙස ඉදිරිපත් කිරීම. (මතෙව් 2:2)

ජේසුස් වහන්සේ ඉගැන්වීමේ සේවාවට මුල්තැන දෙන සැබෑ බලධාරී ගුරුවරයකු බව එළිදැක්වීම. (ශු.මතෙව් 5:21 , 27)

ජේසුස්වහන්සේ දේව පුත්‍රයා (මතෙව් 3:17) හා මනුෂ්‍ය පුත්‍රයා (මතෙව් 8:20) යන තත්ත්ව දෙකෙහි සංකලනයක් වශයෙන් ඉදිරිපත් කිරීම.

දේව රාජ්‍ය පිළිබඳ දහම් සත්‍යතා 5 ක් පිළිගැන්වීම.

දේව රාජ්‍යයේ ප්‍රඥප්තිය (ශු.මතෙව් 5 - 7 පරිච්ඡේද)
දේව රාජ්‍යයේ විකාශනය (ශු.මතෙව් 10)
දේව රාජ්‍යයේ ස්වභාවය (ශු.මතෙව් 13)
දේව රාජ්‍යයේ ජීවන රටාව (ශු.මතෙව් 18)
දේව රාජ්‍යයේ අනාගතය (ශු.මතෙව් 24 - 25 පරිච්ඡේද)

## ශු.මාර්ක් තුමාගේ ශුභාරංචිය

• මාර්ක් ශුභාරංචිය සම්මත ග්‍රන්ථාවලිය අනුව  නව ගිවිසුමේ දෙවන ග්‍රන්ථය වුවද ප්‍රථමයෙන් ලියැවුණු හා ඉතා 'කෙටිම ශුභාරංචිය' ලෙස බොහෝ විද්වතුන් පිළිගනියි.
• එය මතෙව් හා ලූක් ශුභාරංචි සඳහා මූලික මූලාශ්‍රය වූ බවද, විශාරද මතය වේ.
• ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය හා මරණය තුළින් ජීවිතය හා මරණය පිළිබඳව අර්ථාන්විතව අවබෝධ කරගැනීමට මෙම ශුභාරංචිය මහත් පිටිවහලක් වූ බව පිළිගැනේ.

## කර්තෘත්වය

• පැපියස් (ක්‍රි.ව. 135) ඉරනේයස් (ක්‍රි.ව. 200) හා ඔරිගන් (ක්‍රි.ව. 250) වැනි සභා පියවරුන් දක්වන පරිදි මාර්ක් ශුභාරංචියේ කර්තෘ පේදුරුතුමාගේ සහයක හා භාෂා පරිවර්තක ලෙස ක්‍රියාකළ මාර්ක් නැමැත්තකු වේ.
• අපොස්තුළුවරුන්ගේ ක්‍රියාපොතෙහි ජොහාන් මාර්ක් නැමැති පුද්ගලයකු හා පේදුරු තුමාගේ සේවය අතර සම්බන්ධතාවයක් පෙන්වා දෙන බැවින් (ක්‍රියා. 12 ： 12) එය එකම පුද්ගලයකු බව අනුමාන කළ හැකිය.
• පේදුරුතුමා සිය ප්‍රථම ලිපියේ 'මාගේ පුත්‍ර මාර්ක්' යනුවෙන් සඳහන් කරයි. (1 පේදුරු 5 ： 13) කෙසේ වුවද එම පුද්ගලයාගේ ජීවිතයට පේදුරු තුමාගෙන් ලැබුණු ආභාසය මාර්ක් ශුභාරංචිය පුරා විහිදී ඇති බව විද්වත් මතයයි.

• ඒ තුළින් ඓතිහාසික ආභාසයකට වඩා ප්‍රායෝගික ආභාසයක් මෙම ශුභාරංචියට ලැබී ඇති බවත්, එමගින් අපොස්තලික අධිකාරිත්වයක් මෙම ශුභාරංචියට හිමිවී ඇති බවත්, සභා සම්ප්‍රදායෙහි දැක්වේ.
• මෙම අධිකාරීත්වය මුල් කිතුනු සභාවේ පළමු වසර කීපය සඳහා ඉතා වැදගත් වූවක් බව එහි වැඩිදුරටත් සඳහන් වේ.
• කෙසේ වුවද මාර්ක් ශුභාරංචියෙහි කර්තෘ මුල් කිතුනු සභාවේ ඇදහිලිවන්ත බැතිමතෙකු වූ දෙවන පරම්පරා සභා සාමාජිකයෙකු බව පිළිගැනේ.

• ජේසුස් වහන්සේ කවරෙක්ද යන්නත් උන්වහන්සේගේ අනුගාමිකයෙකු වීමේ වැදගත්කමත් අවබෝධ කරගැනීමට මාර්ක් ශුභාරංචිය අත්වැලක් සපයන බව විශාරද පිළිගැනීමයි.
• ජේසුස් වහන්සේගේ අනන්‍යතාවය මනාව වටහා ගැනීමටත් ජේසුස් වහන්සේගේ මාර්ගය කිතුනුවන්ගේ මාර්ගය බව පෙන්වාදීමටත් (මාර්ක් 8 ： 34) මෙම ශුභාරංචිය මගින් ප්‍රයත්න දරා ඇත.

## කාලය හා ස්ථානය

• රෝම සොල්දාදුවන් විසින් ජෙරුසලමේ විනාශය කිරීමට මද කලකට පෙර එනම් ක්‍රි.ව. 65 - 70 ත් අතර කාලයේ රෝමයේදී මෙම ශුභාරංචිය ලියැවුණු බව විශ්වාස කරයි.
• පේදුරු තුමාගේ මරණින් පසු මෙය ලියවී ඇති බව පිළිගැනේ.
• නීරෝ වැනි කෲර රෝම පාලකයන්ගේ දරුණු පීඩා සමයක බොහෝ කිතුනුවන්ට ප්‍රාණ පරිත්‍යාගීන් ලෙස සිය දිවි හමාර කිරීමට සිදුවූ බොහෝ බිහිසුණු යුගයක මෙම ශුභාරංචිය සම්පාදනය වී ඇත.

## පරමාර්ථ

• මෙය ඉදිරිපත් කිරීමේ මුඛ්‍ය පරමාර්ථය ලෙස පැහැදිලි වනුයේ නීරෝ නැමැති කෲර අධිරාජ්‍යයින්ගේ පීඩන සමයන්හි දිවිගෙවූ කිතු බැතියන්ට අධ්‍යාත්මික වශයෙන් සැනසීමක් ලබාදීමය.
• එම කිතුනුවන්ට කාලය ඉතා ළඟ බව දැක්වීම සඳහා මෙමගින් උත්සාහ දරා ඇත.
• මෙහි කාලය ලෙස හඳුන්වා දෙනුයේ 'ජේසුස් වහන්සේගේ මහිමාන්විත දෙවැනි පැමිණීම' විය හැකි බව විශාරද මතයයි. (මාර්ක් 9:1 , 13:30-31)

## ආවේණික ලක්ෂණ

1. දේව පුත්‍රයා වූ ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය වර්ධනය කරනු ලබන විශ්වාස ප්‍රකාශයක් ලෙස මෙය එළිදක්වා ඇත.

   ඉතා කල්පනාකාරීව විශ්වාස ප්‍රකාශන දෙකක් මගින් ජේසුස්වහන්සේ නමැති දේව පුත්‍රයා පිළිබඳ පුවත ගොඩ නංවා ඇත. (මාර්ක් 1:1-15:39) ඉන් පළමුවැන්න ජේසුස් වහන්සේ තුළ විශ්වාසය ගොඩ නංවන්නකි. දෙවැන්න උන්වහන්සේගේ මෙහෙය හා කුරුසිය මත දිවි පිදීම හරහා උන්වහන්සේ දේවපුත්‍රයා ලෙස එළිදැක්වීමයි. (මාර්ක් 15)

2. මාර්ක් තුමා ඉතා කෙටි සරළ අද්විතීය රචනා ශෛලියක් භාවිත කරයි. භාවිත කර ඇති වදන් සැලකීමෙන් 'ප්‍රමාද නොවී ඉක්මන් කරවීමක්' හැඟෙන්නට සලස්වා ඇත. (මාර්ක් 1 : 14) එම ඇසිල්ලෙහිම , එකෙනෙහිම යන වචනය 40 වතාවක් පමණ දක්වා තිබීම විශේෂත්වයකි.

3. අරමීය භාෂාවේ වදන් හා වාක්‍යාංශ කිහිපයක් භාවිත කිරීමෙන් ජේසුස්වහන්සේට ඉතා සමීප වූ හා උන්වහන්සේ භාවිත කළ බස ඉදිරිපත් කිරීමට ගත් උත්සාහයක් දක්නට ඇත.

4. ක්‍රිස්තු ශ්‍රාවකයන්ගේ සැබෑ ජීවන මාර්ගය මාර්ක් තුමා සිය ශුභාරංචිය මගින් ඉදිරිපත් කරයි.

   මූලික ලක්ෂණ 3 ක් මගින් එතුමා මෙය පැහැදිලි කරයි. උන්වහන්සේ සමඟ සිටීම, දේශනා කරනු ලබන පිණිස පිටතට යැවීම , යක්ෂාත්ම දුරු කරන පිණිස අධිකාරීත්වය ඇතුව සිටිම ශ්‍රාවකයකුගේ අපේක්ෂා කෙරිණි. (ශු.මාර්ක් 3:13-19) එය මෙම ශුභාරංචියේ කැපීපෙනෙන ලක්ෂණයකි.

5. ජුදෙව් නොවන , සුළු ආසියාවේ හා රෝමයේ දිවිගෙවූ ජනතාවක් අරමුණු කරගනිමින් ශුභාරංචිය ඉදිරිපත් කිරීමට එතුමා ප්‍රයත්න දරා ඇති බව පැහැදිලි වේ. (ශු.මාක් 7:24 - 30 , 3:7-12) ලතින් පාරිභාෂිත වදන් උපයෝගී කරගැනීම , රෝම ක්‍රමයට කාල සීමා දැක්වීම ආදිය මගින්ද මෙය සනාථ වේ.

6. ජේසුස් වහන්සේගේ ජීවිතයේ වැදගත් අවස්ථා හා උන්වහන්සේගේ දූත සේවය හා මෙහෙය පිළිබඳ විශේෂ අවධානයක් දක්වා ඇත. මාර්ක් තුමා විශේෂයෙන්ම ජේසුස්වහන්සේගේ බලවත් ක්‍රියාවන් පිළිබඳව අවධාරණය කරයි. ගලීලයේ සිට ජෙරුසලම දක්වා ජේසුස්වහන්සේ ඉටුකළ මෙහෙය තුළ ප්‍රාතිහාර්ය සිදුකිරීම උපමා ඇසුරෙන් දේශනා කිරීම ඉස්මතු කර ඇත. දේව රාජ්‍යය පිළිබඳ ඉගැන්වීම් (මාක් 11:15 , 9:4) හා යුගාන්ත ධර්මය පිළිබඳ ඉගැන්වීම් සඳහා (ශු:මාක් 13:1-3) ප්‍රමුඛත්වයක් ලබාදී ඇත. එලෙසම ජේසුස් වහන්සේගේ ජීවිතයේ අවසාන කාලයේ සිදුවීම් සවිස්තරාත්මකව ඉදිරිපත් කරයි. දුක් ප්‍රාප්ති සිදුවීම් , මරණය හා උත්ථානයට එහිදී වැදගත් ස්ථානයක් හිමිවී තිබේ.

7.මාර්ක් තුමාගේ ශුභාරංචියේ තවත් විශේෂ ලක්ෂණයක් වනුයේ බොහෝ අවස්ථාවල එතුමා 'මෙසියානික රහස' හඳුන්වාදීමයි. ජේසුස් වහන්සේ තමා 'මහිමාන්විත දේව පුත්‍රයාවූ මෙසියස්වහන්සේ' බව රහසක්ව තබාගැනීමට දැරූ උත්සාහය මාර්ක් තුමාගේ ශුභාරංචිය මගින් අවස්ථා බොහොමයකදී පැහැදිලි වේ. යක්ෂාත්ම දුරු කළ බොහෝ අවස්ථාවල උන්වහන්සේ මෙම රහස හෙළි කිරීමෙන් ඔවුන් වළක්වාලූ ආකාරයත් (ශු.මාක් 1:24 , 34 , 3:12) ලාදුරු රෝගියකු සුවකළ අවස්ථාවේ එය කිසිවකුට නොකියන්නට යැයි පවසමින් ඔහු වළකාලූ ආකාරයත් (ශු.මාක් 1:44) අනුව මේ බව පැහැදිලි වේ.

## ශු.ලූක් තුමාගේ ශුභාරංචිය

• මානවවාදී ගුණාංග හා හැසිරීම් ඉස්මතු කරන ලේඛන ප්‍රවේශයක් අනුගමනය කරන සුවිශේෂී ශුභාරංචිය වශයෙන් ශු.ලූක් ශුභාරංචිය හඳුන්වාදිය හැකිය.
• ශුභාරංචි හතර අතුරින් වඩාත්ම කතාන්තර රූපී ශෛලියකින් යුත් ශුභාරංචිය මෙය වේ.
• ජේසුස් වහන්සේගේ ජීවිතය හා සම්බන්ධ බොහෝ දේ පිළිබඳව විවිධ ක්ෂේත්‍ර අළලා වාර්තාවන් රැසක් මෙම ශුභාරංචිය තුළ අන්තර්ගතවීම විශේෂත්වයකි.

## කර්තෘත්වය

• මෙහි කර්තෘ ලූක් නමැති එවකට රෝම අධිරාජ්‍යය යටතේ තෙවන විශාල නගරය වූ සිරියාවේ අන්තියෝකියෙන් පැමිණෙන ජුදෙව් නොවන වෛද්‍යවරයකු බව පිළිගෙන ඇත.
• ඉරේනියස් , ටර්ටුලියන් , ඔරිගන් , යුසේබියස් හා ජෙරොම් නමැති සභා පියවරුන් ඒ බව සනාථ කර ඇත. සහකාර සේවකයකු වශයෙන් පාවුළු තුමාගේ ධර්මදූත ගමන්වලට එතුමා සහභාගී වූ බවට සාක්ෂි පවතී. (කොලොස්සි 4:14 , 2 තිමෝති 4:11 , පිලමොන් 24)
• මුල් කිතුනු සභාව තුළ එනම් ප්‍රථම වරට 'ක්‍රිස්තියානි' යන නාමය ලැබූ සිරියාවේ අන්තියෝකියේ සභාවේ දිවැසිවරයකු හා ගුරුවරයෙකු ලෙස සේවය කළ සිරේනියේ ලූසියස් (ක්‍රියා 13:1) සමඟ , ලූක්තුමාද වැදගත්, ජුදෙව් නොවන චරිතයක් ලෙස හඳුනාගෙන ඇත. මෙම ශුභාරංචිය හා ක්‍රියාපොතද ලූක් තුමා විසින්ම ලියන ලදැයි පිළිගැනේ.
• නම සඳහන් නො වුවද භාෂා ශෛලිය සැලකීමෙන් හා එකම පුද්ගලයකුට පිළිගන්වා තිබීමෙන් මෙය සනාථ වේ.
• ශු.ලූක්තුමා සිය ග්‍රන්ථ දෙකම පිළිගන්වා ඇත්තේ ශ්‍රීමත් තියෝපිලස්තුමාටය. එතුමා එකල සමාජයේ කිතුනු සංසයක නායකත්වය නියෝජනය කළ ප්‍රභූවරයෙකු ලෙස පිළිගැණින.
• තවද එතුමාගේ නාමය වූ 'තියෝපිලස්' යන්නට ග්‍රීක් බසින් යෙදෙන ආකාරය අනුව සංකේතාත්මක වශයෙන් තියෝපිලස් (දෙවිඳුන් විසින් ආදරය කරනු ලබන්නා) යන අරුත සපයයි. (ලූක් 1:1 , 3:1)
• කිතුනු නොවන බුද්ධිමත් ප්‍රධාන නිලධාරීන්ට පවා ජේසුස් වහන්සේගේ ගැලවීමේ ශුභාරංචිය පිළිගැන්වීම සඳහා ලූක් තුමා දරා ඇති ප්‍රයත්නය මෙමඟින් මනාව සාක්ෂාත් වේ.
• පාවුලු තුමා සමග විජාතීන් අතර ධර්මදූත සේවයේ යෙදීමෙන්, ලූක් තුමාට මෙම අවශ්‍යතාවය මනාව ප්‍රත්‍යක්ෂ වන්නට ඇත.
• එකල රෝම අධිරාජ්‍යය යටතේ පැවති කිතුනු විරෝධී ආකල්ප මගහරවා ගැනීමට මෙම උත්සාහය මහත් පිටිවහලක් වූවා නො අනුමානය.

• මෙම ශුභාරංචියේ කර්තෘ ලෙස පිළිගැනෙන ලූක් තුමා මනා අධ්‍යාපඥයකු මෙන්ම ව්‍යක්ත ලෙස බස හසුරන්නකු බවද පැහැදිලි වේ.

• එතුමා වෘත්තියෙන් වෛද්‍යවරයකු බව මනාව ඔප්පු වන්නේ ජේසුස් වහන්සේගේ සුවකිරීම් සම්බන්ධව වෛද්‍යවරයෙකුගේ අත්දැකීම් ඇසුරෙන් වාර්තා ඉදිරිපත් කිරීම හේතුවෙනි. (ශු.ලූක් 4:38 , 5:12)
• ලූක්තුමා අද්විතීය ඉතිහාසඥයකු බවද පැහැදිලි වේ.
• යම් සිදුවීමක් විස්තර කිරීමේදී ඓතිහාසික කරුණු මැනවින් ඉදිරිපත් කර තිබීමෙන් ඒ බව සනාථ කළ හැකිය. (ශු.ලූක් 2: 2) (ක්‍රියා 1:1)

## කාලය හා ස්ථානය

• ශු.ලූක් ශුභාරංචිය ලියැවුණු කාලය පිළිබඳ විවිධ මත පවතී.
• සමහර විද්වතුන් පවසන්නේ එය ක්‍රිස්තු වර්ෂ 70ට පෙර ලියවුණු බවය.
• නීරෝ වැනි අධිරාජ්‍යයන්ගේ දරුණු පීඩා යුගයක මෙය ලියැවුණු බව සනාථ කිරීමට තරම් සාධක නො පවතී.
• දැනට පිළිගෙන ඇති බහුතර මතය වනුයේ ලූක් තුමාගේ ශුභාරංචිය ජෙරුසලමේ විනාශයෙන් (ක්‍රි.ව. 70) පසු ක්‍රි.ව. 80 - 90 ත් අතර කාලයේ ලියැවුණු බවයි.
• මෙම ශුභාරංචිය අකයියාවේදී ලියන්නට ඇති බව පිළිගැනේ.

## පරමාර්ථ

• ජේසුස් වහන්සේගේ ජීවිතය පිළිබඳව නිවැරදි හා සවිස්තරාත්මක වාර්තාවක් සැපයීමත් ජේසුස් වහන්සේ , මානව දයාවෙන් හා කරුණාවෙන් පිරි උතුම් මිනිසත් බව ගරුකරන විශ්වීය ගැලවුම්කරු ලෙස හඳුන්වා දීමත් ලූක්තුමාගේ ප්‍රධාන පරමාර්ථය බව පැහැදිලි වේ.

## ආවේණික ලක්ෂණ

1. සිය ශුභාරංචිය මගින් ජේසුස් වහන්සේගේ මෙහෙයේ අරමුණුවලට අනුකූලව උන්වහන්සේගේ මෙහෙය ඉටු වූ බව දැක්වීම.(ලූක් 4:16-19) ලූක්තුමා වෙතින් දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණයකි. යෙසායා 61:1 හි සඳහන් මෙසියස් වහන්සේගේ මෙහෙයේ අරමුණු වන දිළිඳුන්ට ශුභාරංචිය දේශනා කිරීම , අන්ධයන්ට පෙනීම ලබාදීම (ලූක් 18:35-43) වහලුන් මිදීම (ලූක් 19:1-10) ආදිය ජේසුස් වහන්සේගේ මෙහෙය මගින් ඉටුවූ බව ලූක් තුමා පෙන්වා දෙයි.

2. මානව සංහතියට පොදු ගැලවීම විශ්වීය සංකල්පයක් බව ලූක්තුමා සිය කෘතිය තුළින් මනාව ඉදිරිපත් කරයි. එසේම ජේසුස් වහන්සේගේ විවිධ හැඟීම් හා ආකල්ප ඉස්මතු කරමින් එදා යුදා සමාජයේ ප්‍රතික්ෂේපිත ජන කොටස්වලට දයානුකම්පාව දැක්වූ ජේසුස් වහන්සේ නව මිනිසත් බවක් ගෙනහැර පෑ බව සිය ශුභාරංචියේ සිද්ධීන් මගින් ලූක් තුමා පෙන්වා දෙයි. කාන්තාවන් , දරුවන් (ලූක් 18:15-17), අයකැමියන් (ලූක් 19:1-10) ලාදුරු රෝගීන් (ලූක් 17:11-19) පව්කරුවන් (ලූක් 7:36-50) යන සැමදෙනා ජේසුස් වහන්සේ පිළිගෙන මනස්ථාපනය වීමෙන් ගැලවීම උරුමවන බව සිය කෘතිය මගින් එතුමා පෙන්වාදෙයි.

3. ලූක් තුමා වෛද්‍යවරයෙකුගේ අත්දැකීම් සමගින් විශේෂයෙන් සුවකිරීම පිළිබඳ විස්තර ඉදිරිපත් කරයි.එතුමා ජේසුස් වහන්සේ සුවකළ බොහෝ රෝගීන්ගේ සිදුවීම් ඉදිරිපත් කරයි. (ලූක් 10 - 17) , (ලූක් 14:1-6) එසේම ඔලිව කන්දේ දෙවිඳුන් යදින ජේසුස් වහන්සේ වෙතින් දාබිඳු රුධිරය මෙන් වැගිරුණු බව පවසන්නේ ශුභාරංචි කතෘවරුන් අතුරෙන් ලූක් තුමා පමණි. (ලූක් 22:44)

4. ලූක් තුමා සිය ශුභාරංචිය රචනා කිරීමේදි සෙප්තුවාජින්තයේ දක්නට ලැබෙන ග්‍රීක් භාෂා ශෛලියක් (කොයිනේ) භාවිත කිරීම විශේෂ ලක්ෂණයකි. විශේෂයෙන්ම වෛද්‍ය වෘත්තියේ යෙදෙනහ

කෙනෙකු ලෙස වෛද්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ වදන් බොහොමයක් භාවිත කර ඇති බවත්, මතෙව් හා මාර්ක් ශුභාරංචිවලට වඩා සිත්ගන්නා සුළු භාෂාවක් යොදාගෙන ඇති බවත්, පැහැදිලිය.

5. ග්‍රීක් ඉතිහාසඥයන්ට අදාළ වාර්තාමය රටාවක් ලූක්තුමා උපයෝගී කරගැනීමද විශේෂ ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය. එනම්, සිය ශුභාරංචියේ ප්‍රාරම්භය ලෙස ඓතිහාසික වාර්තාවක් එතුමා ඉදිරිපත් කිරීමෙන් එය මනාව සනාථ වේ. (ලූක් 1:1-4)

## ශු.ජොහාන් තුමාගේ ශුභාරංචිය

• නව ගිවිසුමේ ශුභාරංචි පොත් හතර ඇසුරෙන් වෙනස් ආරකින් ඉදිරිපත් වන ශුභාරංචිය මෙය වේ.

• මතෙව් , මාර්ක් හා ලූක් ශුභාරංචි තුන තුළ සමාන රටාවක් දක්නට ලැබුණද ශු.ජොහන් ශුභාරංචිය වෙනස් ක්‍රමවේදයක් හා රටාවක් අනුගමනය කරන බව පැහැදිලි වේ.

### කර්තෘත්වය

• අභ්‍යන්තරික සාක්ෂි අනුව මෙම ශුභාරංචියේ කර්තෘ කවරෙක් දැයි පැහැදිලිව අවබෝධ කරගත නොහැකිය.

• මෙහි සඳහන් සමහර වාක්‍ය ඛණ්ඩ මගින් පැවසෙන "ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා" යන යෙදුම මෙම ග්‍රන්ථයේ කර්තෘත්වය හා බැඳී ඇති බව පැහැදිලිව පෙනේ. (ජොහන් 21:24)

• එම නාමය දේව ධාර්මික වශයෙන් මෙම ශුභාරංචියට අදාළ වැදගත් සංකල්පයක් ලෙස විද්වත්හූ පෙන්වා දෙති. ඒ සෙබදීගේ පුත්, ජාකොබ්ගේ සොහොයුරු වූ ජොහාන් බව හැඟේ. (ශු.ජොහාන් 19:26 , 13:23 35:21 , 20:2-20) ඔහු ජේසුස් වහන්සේගේ සමහර සිදුවීම් සියැසින් දුටු ශ්‍රාවකයා ලෙසද, ශුභාරංචිය ලියූ ශ්‍රාවකයා ලෙසද සඳහන් වේ. (21:24)

• එහෙත් ශුභාරංචිය තුළ ඔහුගේ නම සඳහන් නොවේ.

• සභා සම්ප්‍රදායේ පිළිගැනීම අනුව අයිරේනියස් සභා පියා ජේසුස් වහන්සේගේ ශ්‍රාවක ජොහන් අනෙකුත් ශුභාරංචිවලට පසුව තමා විසින් ලියන ලද ශුභාරංචිය එපීසයේදී ප්‍රකාශයට පත්කළ බව සිය කෘතියක සඳහන් කරයි.

• ඉරනේයස්තුමා වැනි සභා පියවරු පවසනුයේ මෙම තොරතුරු ස්මර්ණාවේ පොලිකාප් තුමාගෙන් ලබාගත් බවයි.

• මෙම සාක්ෂි අනුව ජොහාන් ශුභාරංචියේ කර්තෘ ජේසුස් වහන්සේගේ ශ්‍රාවක වූ ජේසුස් වහන්සේ ප්‍රේම කළ ශ්‍රාවකයා ලෙස හැඳින්වූ, එපීසයේ දිවි ගෙවමින් තම මහලු වියේදී ශුභාරංචියක් ප්‍රකාශයට පත්කළ පුද්ගලයා බව බොහෝ විද්වත්හූ පිළිගනිති.

### කාලය හා ස්ථානය

• මෙම ශුභාරංචිය ක්‍රි.ව. 90 - 100 දක්වා කාලයේ ලියන ලදැයි පිළිගැනේ.

• නව ගිවිසුමෙහි දනට හමුව ඇති පැරණිතම අත්පිටපත ක්‍රි.ව. 110 - 125 ත් අතර කාලයට අයත් බව බොහෝ දෙනාගේ පිළිගැනීමයි. එය ජොහාන් තුමාගේ ශුභාරංචියේ පිටපතකි.

• එපීසයේදී මෙම ශුභාරංචිය ලියැවුණු බවට බොහෝ සාක්ෂි පවතී.

• පළමු සියවස අගභාගයේ හා දෙවන සියවස තුළ කිතුනුවන් පීඩා විඳි සමයක මෙම ශුභාරංචිය ලියැවුණු බව විශාරද මතයයි.

• සංකීර්ණ දාර්ශනික හා ආගමික පසුබිමක් තුළ කිතුනුවන්ට පීඩා පැවති සමයක මෙම ශුභාරංචිය ලියැවුණු බවට සාක්ෂි පවතී.

## පරමාර්ථ

මෙම ශුභාරංචිය ලිවීමේ මුඛ්‍ය පරමාර්ථය නම් කිතු බැතියන්ගේ අධ්‍යාත්මික හා ආගමික අවශ්‍යතා සපුරාලීමයි.

• මෙහි කතුවරයාම ඒ බව මනාව සනාථ කර ඇත. (ජොහාන් 20:31) ඇදහිල්ල තුළින් සදාතන ජීවනය උරුම වන බව අවධාරණය කිරීම මෙහි මුඛය පරමාර්ථය වේ.

ඊට අනුරූපව ඒ හා බැඳුණු අනුපරමාර්ථ 3 ක් මෙහි දැකිය හැකියි

1. ක්‍රිස්තුස් වහන්සේගේ මෙසියානු අනන්‍යතාවය තහවුරු කිරීම.

ජේසුස් වහන්සේ ජුදාවරුන් අපේක්ෂා කල මෙසියස් වහන්සේ බවත් උන්වහන්සේ ව්‍යවස්ථාව සම්පූර්ණ කරන තැනැන්වහන්සේ බවත් පෙන්වා දෙයි. ජුදෙව්වරුන් , ජේසුස් වහන්සේගේ සාක්ෂිය පිළිගැනීමෙන් බැහැරව ජුදෙව් නෛතික ප්‍රතිපත්තීන් මත පමණක් පිහිටා ක්‍රියාකිරීමට උත්සාහ දැරීම හේතුවෙන් එය ඉවත් කිරීමට මෙම ශුභාරංචිය මගින් උත්සාහයක් දරා ඇත.

2. ස්නාවක ජොහන් මෙසියස් තුමා යනුවෙන් ජුදෙව්වරු අතර පැවති වැරදි මතය දුරුකරලීම.

මෙම මතය දුරුකොට , ජේසුස් වහන්සේ වඩාත් උසස් බවත් ස්නාවක ජොහන් ම ඒ බව පිළිගත් බවත් සඳහන් කරයි. (ජොහන් 1:8-9 , 3:30)

3. කිතුබැතිමතුන් ඇදහිල්ල තුළ දිරිමත් කිරීම.

කිතුනුවන්ට තම විශ්වාසය රැකගනිමින් ඇදහිල්ලේ ගැඹුරට ළඟාවීම සඳහා ජේසුස් වහන්සේ දේවපුත්‍රයා බව සනාථ කරමින් උන්වහන්සේගේ ප්‍රේමය තුළ ගොඩනැංවෙන ලෝකයේ උන්වහන්සේ ජීවය බව ප්‍රකාශ කරයි. (ජොහාන් 3:16)

**<u>ජොහාන් ශුභාරංචියට අදාළ මූලාශ්‍ර</u>**

ජොහාන් ශුභාරංචියට පාදක වූ මූලාශ්‍ර පිළිබඳව විවිධ මතිමතාන්තර ඇතත් , ඒ පිළිබඳව අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වන මූලාශ්‍ර පහත පරිදි පෙළගැස්විය හැකිය.

- ⋆ සමදර්ශක ශුභාරංචි මූලාශ්‍ර ලෙස භාවිත කිරීම.
  ජේසුස් වහන්සේගේ ජීවිතය , මෙහෙය හා දුක් ප්‍රාප්තිය පිළිබඳ කරුණු සමදර්ශක ශුභාරංචි වලින් ගෙන ඇති බවට මත පළවී ඇත.

- ⋆ ජේසුස් වහන්සේගේ ප්‍රාතිහාර්යයන් පිළිබඳ ලියැවුණු මූලාශ්‍ර වලින් තොරතුරු ලබාගැනීම්
  දේවරාජ්‍යයේ ලකුණු වශයෙන් ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්යයන් පිළිබඳව තොරතුරු යම් මූලාශ්‍රයක් වෙතින් ලබාගත් බවට කරුණු සනාථ වේ.

- ⋆ ජේසුස් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතයට සම්බන්ධ තොරතුර ඒවා සිදුවූ ප්‍රදේශවලින් සොයාගත් විශේෂ මූලාශ්‍රයකින් කරුණු උකහා ගැනීම.
  විශේෂයෙන් ජෙරුසලම , ජුදය , ගලීලය වැනි ප්‍රදේශවලට අදාළ මූලාශ්‍ර වලින් තොරතුරු ලබාගෙන ඇති බව පෙනේ.

- ⋆ ජොහාන් තුමාගේ අත්දැකීම්
  ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයකුව සිටිමින් එතුමා ලබාගත් අත්දැකීම් එමෙන්ම දේව අනාවරණ මෙහිදී පාදක කොටගෙන ඇති බව පෙනේ.

**ආවේණික ලක්ෂණ**

1. ජේසුස් වහන්සේ කවරෙක්ද යන්න සනාථ කිරීමට දැඩි උත්සාහක් දරා ඇත.
ජේසුස් වහන්සේගේ අනන්‍යතාවය වඩාත් තහවුරු කිරීමට උත්සාහ ගෙන ඇති බව පැහැදිලිය. (ජොහන් 10:34-36) - ස්වයං අනාවරණ ප්‍රකාශන

2. විශේෂයෙන්ම ජුදා සංදර්භයකට ආමන්ත්‍රණය කරයි.
ජුදෙව්වරුන්ට පැහැදිලි වන සේ ශුභාරංචිය ඉදිරිපත් කිරීමට එතුමා ක්‍රියාකර ඇති බව පෙනේ. (ශු.ජොහන් 1:1-18) ජුදෙව්වන් ජේසුස් වහන්සේ දේව පුත්‍රයා ලෙස විශ්වාස නොකිරීමේ අර්බුදය විසඳීමට මේ මගින් ක්‍රියාකර ඇති බව පැහැදිලිය.

3. ගැඹුරු දේවධාර්මික පදනමක් මත ශුභාරංචිය ගොඩනගා ඇත.
විශේෂයෙන්ම ජොහාන් පළමු පරිච්ඡේදය ඒ බව සනාථ කරයි. පෙර වදනෙහි ඇති ධර්මය අනුව (ග්‍රීක් බසින් ලෝගෝස්- Logos) යන්න මෙම ශුභාරංචියට ආවේණික වූ දේවධාර්මික සංකල්පයක් බව පෙන්වාදිය හැකිය.

4. සමදර්ශක ශුභාරංචි 'පුදුම ක්‍රියා' සඳහා ඉදිරිපත් කරන ප්‍රාතිහාර්ය යන්නට ජොහාන්තුමා 'ලකුණු' (සෙමෙයියොන්) යන වදන භාවිත කරයි.
කානාහී සරණ මංගල්‍යයේ ජලය මිදි යුෂ බවට හැරවීම. (ජොහන් 2:1- 11)
රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා සුවපත් කිරීම (ජොහාන් 4:46-53)
ලාසරස් මරණින් නැගිටුවීම (ජොහාන් 11:1-44)
වැනි ප්‍රාතිහාර්ය ලකුණු ලෙසින් ඉදිරිපත් කරයි.

5. "මම වෙමි" යනුවෙන් ස්වයං අනාවරණ ප්‍රකාශන රැසක් ඉදිරිපත් කිරීම විශේෂත්වයකි.
ඒවා වැදගත් වන්නේ ජේසුස් වහන්සේගේ දේව පුත්‍රභාවය එළි දක්වමින් උන්වහන්සේගේ විශේෂ ප්‍රකාශන ලෙස ඒවා දක්වා තිබීමයි. විශාරදයන් පෙන්වා දෙන ආකාරයට ඒවා පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේගේ ස්වයං අනාවරණ පසුබිමෙන් ඉදිරිපත් කෙරේ. "'මම ස්වයංභූ' නම් තැනැත් වහන්සේ වෙමි." (නික්මයාම 3 : 17)

| | |
|---|---|
| ජීවනදායක භෝජනය මම වෙමි. | (ජොහාන් 6:35) |
| ලෝකයේ ආලෝකය මම වෙමි. | (ජොහාන් 8:12) |
| බැටළුවන්ට දොරටුව මම වෙමි. | (ජොහාන් 10:7) |
| යහපත් බැටළු එඬේරා මම වෙමි. | (ජොහාන් 10:14) |
| පුනර්ජීවනයද , ජීවනයද මම වෙමි. | (ජොහාන් 11:25) |
| මාර්ගයද සත්‍යද ජීවනයද මම වෙමි. | (ජොහාන් 14:6) |
| සැබෑ මිදිවැල මම වෙමි. | (ජොහාන් 15:1) |

ඒවා වැදගත් වන්නේ ජේසුස්වහන්සේගේ දේවපුත්‍ර භාවය එළි දක්වමින් උන්වහන්සේ විශේෂ ප්‍රකාශන ලෙස ඒවා දක්වා තිබීම නිසාය.

ශුභාරංචි කතුවරුන් ජේසුස් වහන්සේ නමැති ශුභාරංචිය ප්‍රචලිත කිරීමට සිය කෘතීන් තුළින් දරා ඇති වෙහෙස අපමණය. එම ශුභාරංචියේ ආලෝකය තුළ ජීවිත හැඩගස්වා ගැනීම සෑම කිතු බැතියකුගේම වගකීම වේ. ශුභාරංචිය තුළ දිවිගෙවමින් තම දිවිපැවැත්ම අන් අයට ශුභාරංචියක් සේ පිළිගැන්වීම වත්මන් කිතුනු පරපුරෙන් දෙවියන් වහන්සේ බලාපොරොත්තු වන සේක. ඒ සඳහා දිරි දෑරීම සෑම යුගයකම කිතුනුවන්ගේ යුතුකම හා මහඟු වගකීම වේ.

### 4.2.4 සමදර්ශක ශුභාරංචි

#### සමදර්ශක ශුභාරංචි යනු මොනවාද?

• තමාටම ආවේණික පරමාර්ථ පැවතියද , තමා විසින් රැස්කර ගත් විශේෂ තොරතුරු පැවතියද , එකම දර්ශනයක්, රටාවක් සැලැස්මක් හා බොහෝ දුරට සමාන රචනා ශෛලියකින් එක හා සමාන බොහෝ කරුණු ඉදිරිපත් කරන ශුභාරංචි 'සමදර්ශක ශුභාරංචි' ලෙස හැඳින්වේ.
• ශු.මතෙව් ,ශු.මාර්ක් හා ශු.ලූක් යන කතුවරුන්ට අනුව ලියන ලද ශුභාරංචි ත්‍රිත්වය මේ ගනයෙහි ලා සැලකේ. මෙම ශුභාරංචි ත්‍රිත්වය මගින් ඉදිරිපත් කරනු ලබන එකම කතා පුවත නම් මාංශවත් වූ දේවපුත්‍ර ජේසුස් වහන්සේ පිළිබඳ ශුභාරංචියයි.
• උන්වහන්සේගේ උපතේ සිට මරණින් උත්ථානවීම දක්වා කතා පුවත වරෙක සමාන තොරතුරු ගෙන හැර දක්වමින් ද තවත් විටෙක තමාට ආවේණික විශේෂ තොරතුරු එළිදැක්වීමෙන් ද මෙම කතුවරු ඉදිරිපත් කරති.

• පලස්තීනයේ සමාජ , ආර්ථික හා දේශපාලන සංදර්භය මත පදනම් වූ ජේසුස් වහන්සේගේ ජීවිතය හා මෙහෙය මැනවින් මෙම ශුභාරංචි තුළින් පිළිබිඹු කර ඇත.
• කාලෝචිතව හා යුගයේ අවශ්‍යතාව මත එළිදැක්වුණු ජේසුස් වහන්සේගේ මෙහෙය තුළ දිළිඳුන්ට හා සමාජයේ ප්‍රතික්ෂේපිත කණ්ඩායම්වලට විශේෂ අවධානයක් යොමුවූ බව මෙම ශුභාරංචි මගින් පැහැදිලි කෙරේ.

#### සමදර්ශක ශුභාරංචි ගැටලුව

• සමදර්ශක ශුභාරංචි දෙස එකම දෘෂ්ටි කෝණයකින් බැලිය හැකිවුවද එහි වෙනස් කරුණුද දැකිය හැකිය.
• එමෙන්ම ශුභාරංචි දෙකක් පමණක් වාර්තා කරන කරුණුද එක් එක් ශුභාරංචියට ආවේණික කරුණු ද දක්නට ලැබේ.
• මෙසේ සමදර්ශක ශුභාරංචි සම්බන්ධව පවතින මෙම තත්ත්වය 'සමදර්ශක ශුභාරංචි ගැටලුව' ලෙස හඳුන්වයි.

#### සමදර්ශක ශුභාරංචි සම්බන්ධ විවිධ මත

1. මුඛ පරම්පරාගතව පවතින කතා


   මුල්කාලයේදී අපොස්තුළුවරුන් විසින් කරන ලද දේශනා , ඒවාට සංදර්භය වූ විවිධ ප්‍රාදේශීය ව්‍යවහාර සමඟ අරමීය හා ග්‍රීක් භාෂාවලින් රචනාවූ බවත්, පසුව ඒවා ශුභාරංචි තුනක් ලෙස සම්පාදනය කරන ලද බවත් පැවසේ.

2. මතෙව් පළමු ශුභාරංචිය බව

ශු.මතෙව් තුමාට අනුව ලියන ලද ශුභාරංචිය ප්‍රථම ලිඛිත ශුභාරංචිය බවත්, එය අත්පොත වශයෙන් භාවිත කොට අන් ශුභාරංචි ලියැවුණු බවත් පැවසේ. තවද මතෙව්තුමා ජේසුස් වහන්සේගේ දේශනා අරමීය බසින් රචනා කොට පසුව ග්‍රීක් බසට පරිවර්තනය කළ බවත්, එම දේශනා ශුභාරංචියක් ලෙස සකසා නිර්මාණය කළ බවත් වැඩිදුරටත් මෙහි සඳහන් වේ. මෙම මතය සනාථ කිරීම සඳහා සාක්ෂි නොමැති බව බොහෝ විද්වතුන්ගේ පිළිගැනීමයි.


3. මාර්ක් ප්‍රථම ශුභාරංචිය බව

මුල්ම ශුභාරංචිය ලෙස ලියැවුණු මාර්ක් තුමාගේ ශුභාරංචිය මතෙව් හා ලූක් ශුභාරංචි සඳහා මූලාශ්‍රයක් ලෙස උපයෝගී කොටගෙන ඇති බව සඳහන් වේ. මුල් කාලයේ ශු.මාර්ක් ශුභාරංචිය 'අපෝස්තලික අත්පොත' ලෙස පිළිගැනුණු බව පැවසේ.





4. ද්වි ලේඛන උප න්‍යාස

ශු.මාර්ක් ශුභාරංචිය අත්පොත ලෙස භාවිත කරමින් ශු.මතෙව් හා ශු.ලූක් ශුභාරංචි ලියැවී ඇති බවත් ඊට අමතරව දෙදෙනාම වෙනත් ප්‍රකාශන ලෙසින් සම්පාදිත පොදු මූලාශ්‍රයකින් කරුණු සපයා ගෙන ඇති බවත් පැවසේ. මෙම මූලාශ්‍රයට විශේෂ නමක් සඳහන් නොවන අතර එය Q යැයි (Quelle – ජර්මන් බසින් උල්පත) නම්කර ඇත. එය ක්‍රි.ව. 55 ට පෙර සිටම පවතින මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇත. 1833 දී ජේ. හුවයිස් විසින් මෙය ඉදිරිපත් කරන ලදී. පසුව එච්.ජේ.හොල්ස්මන් විසින් ද මෙය පිළිගෙන ඇත.



5. චතුර්විධ ලේඛන මූලාශ්‍ර උප න්‍යාසය

මුල්ම ශුභාරංචිය වූ මාක් ශුභාරංචියෙන් ශු.මතෙව් හා ශු.ලූක් ශුභාරංචි තම ශුභාරංචි සඳහා කරුණු ලබාගෙන ඇත. ඊට අමතරව එම ශුභාරංචි දෙකට පමණක් පොදු කරුණු Q නමැති මූලාශ්‍රයකින් ලබාගත් බව විශ්වාස කෙරේ. එම කරුණු හා සමඟම මතෙව් ශුභාරංචිය තමාට විශේෂිත වූ ලියැවිල්ලකින් කරුණු ලබාගෙන ඇති බවත්, ලූක් ශුභාරංචිය තමාට විශේෂිත වූ මූලාශ්‍ර ලියවිල්ලක් භාවිත කර ඇති බවත් සඳහන් වේ. මතෙව්තුමාට විශේෂිත වූ ලියැවිල්ල M මූලාශ්‍රය ලෙසත් ලූක්තුමාට විශේෂිත වූ ලියැවිල්ල L මූලාශ්‍රය ලෙසත් නම්කර ඇත.




මෙම මත හැදෑරීමෙන් සමදර්ශක ගැටළුවට පාදක වී ඇති හේතු මනාව අවබෝධ කරගත හැකියි

## සමදර්ශක ශුභාරංචි අතර දක්නට ඇති සමානකම්

1. සමදර්ශක කතුවරුන් තිදෙනාම ජේසුස් වහන්සේගේ සේවයට ප්‍රධාන ස්ථානයක් දී තිබේ. විශේෂයෙන් ගලීලයෙහි සේවය අවධාරණය කර ඇත.

2. ජේසුස්වහන්සේගේ මෙහෙයේ හා දෙසුම් හී ප්‍රධාන තේමාව වන 'දේවරාජ්‍යය' පිළිබඳ සමදර්ශක කතුවරුන් සැමදෙනාම සිය ශුභාරංචි මගින් ඉදිරිපත් කරනු ලැබ ඇත. එසේම 'දේව රාජ්‍යය' යන වදන තිදෙනාම භාවිත කරති. දේවරාජ්‍යය ඉදිරිපත් කිරීම සඳහා උපමා භාවිත කරති.

3. ජේසුස් වහන්සේගේ රෝග සුවකිරීම් වැනි සමහර සිදුවීම් බොහෝදුරට එක සමාන ලෙස ඉදිරිපත් කරති.
   උදා : අංශභාග රෝගියා (ශු.මතෙව් 9:1- 8 , ශු.මාක් 2:1-12 ශු.ලූක් 5:17-26) අශුද්ධාත්ම දුරුකිරීම් පිළිබඳ විශේෂයෙන් සඳහන් කරයි.

4. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය , මරණය හා උත්ථානය ශුභාරංචි තුනෙහිම සඳහන් වේ.

5. ජේසුස් වහන්සේගේ මිනිසත් බව එළිදක්වමින් ශුභාරංචිය අරඹා උන්වහන්සේගේ දේවපුත්‍රභාවය ඉස්මතු කරයි.

6. මාර්ක් තුමාගේ ශුභාරංචිය ශුභාරංචි තුනටම පොදු අත්පිටපත වන අතර, ශුභාරංචි තුනටම පොදුවූ වගන්ති 365 ක් පමණ ඇති බව විශාරදයින්ගේ පිළිගැනීමයි.

## සමදර්ශක ශුභාරංචි අතර දක්නට ලැබෙන අසමානතා

1. ශුභාරංචිය කතුවරුන්ගේ පරමාර්ථවල වෙනස්කම්වලට අනුගතව ශුභාරංචි සැකසී ඇත.

2. සමහර සමදර්ශක ශුභාරංචිවල සමහර සිදුවීම් සමානව දක්නට ලැබෙන අතර අන් සමහර ශුභාරංචිවල ඒවා සඳහන් නොවේ.
   උදා : ශාස්ත්‍රවන්තයන්ගේ පැමිණීම පිළිබඳ සිදුවීම ශු.මතෙව් ශුභාරංචියෙහි පමණක් සඳහන් වන අතර (ශු.මතෙව් 2:1-12) ශු.මාක් හා ශු.ලූක් ශුභාරංචිවල සඳහන් නොවේ. තවද ශු.ලූක් 1 වන පරිච්ඡේදයේ දැක්වෙන ප්‍රශංසා ගීත ශු.මතෙව් හා ශු.මාක් ශුභාරංචිවල සඳහන් නොවේ
   සමදර්ශක ශුභාරංචි ග්‍රන්ථ තුනම ග්‍රීක් බසින් සම්පාදනය වී ඇති අතර, කතෘවරුන්ගේ ලේඛන ශෛලීන්හී වෙනස්කම් හා භාෂා ඥානය අනුව, වෙනස්කම් දැකිය හැකිය.

3. ශුභාරංචි සැකැස්ම තුළද අසමානතා දක්නට ලැබේ.
   උදා : ශු.මතෙව්තුමා ජේසුස් වහන්සේගේ දේශනා කොටස් 5 කට බෙදා දක්වන අතර අනෙකුත් සමදර්ශක ශුභාරංචිවල එවැනි සැකැස්මක් දක්නට නොලැබේ.

4. කතුවරුන් යොදාගත් මූලාශ්‍රවල වෙනස්කම්ද ඉස්මතු වේ. ශු.මතෙව්තුමා හා ශු.ලූක්තුමා ජේසුස් වහන්සේගේ උපත දක්වන අතර මාක්තුමා ජේසුස්වහන්සේගේ උපතේ තොරතුරු කිසිවක් ගෙනහැර නො දක්වයි. මෙයට හේතුව ලෙස ශු.මතෙව් හා ශු.ලූක් , ශු. මාක් යොදා නොගත් , Q මූලාශ්‍රය භාවිත කිරීම බව විශාරද මතයයි.

## සමදර්ශක ශුභාරංචි හා ජොහාන් ශුභාරංචිය අතර සමානතා

1. සමදර්ශක ශුභාරංචි හා ශු.ජොහාන්ගේ ශුභාරංචි යන දෙකම ස්නාවක ජොහාන් තුමාගේ මෙහෙය පිළිබඳව ඉදිරිපත් කරයි. මූලික පරිච්ඡේදවල ජේසුස් වහන්සේ සිය මෙහෙය ඇරඹීමට පෙර ස්නාවක ජොහාන් තුමා සිරගත කර ඇති බව දක්වයි.

2. සමදර්ශක ශුභාරංචි තුන හා ශු.ජොහාන් ශුභාරංචිය යන පොත් හතරෙහිම ජේසුස් වහන්සේගේ මුල් ශ්‍රාවකයන් පිළිබඳව සඳහන් වේ

3. පන්දහසකට කෑම දීම , මුහුද මත ඇවිදීම වැනි ප්‍රාතිහාර්යයන් සමදර්ශක හා ජොහාන් යන ශුභාරංචි සියල්ලම වාර්තා කරයි.

4. ජේසුස් වහන්සේගේ දුක් ප්‍රාප්තිය , මරණය හා උත්ථානයට අදාළ සිදුවීම් සමදර්ශක මෙන්ම ශු.ජොහාන්ගේ ශුභාරංචියද ඉදිරිපත් කරයි.

### සමදර්ශක ශුභාරංචිය හා ජොහාන් ශුභාරංචිය අතර අසමානතා

1. සමදර්ශක ශුභාරංචිවලට වඩා ජොහාන් ශුභාරංචිය ගැඹුරු දේව ධර්මයක් ඉදිරිපත් කරන බව විශාරද මතයයි. ඒ අනුව සදාතන ජීවිතය යන තේමාව කිතුනුවන්ට සඳහා ඉදිරිපත් කර ඇත.

2. සමදර්ශක ශුභාරංචි ජේසුස් වහන්සේගේ මෙහෙය ගලීලය ආශ්‍රිතව සිදුවූ බව දක්වුවද ජොහාන් ශුභාරංචිය වැඩි වශයෙන්ම ඉදිරිපත් කරනුයේ උන්වහන්සේගේ මෙහෙයට අදාළ ජුදය හා ඒ අවට සිදුවීම්ය.

3. සමදර්ශකවල සඳහන් නොවන වතුර මිදියුෂ බවට පත්කිරිම , බෙත්සයිදා නුවර කොරවූ මිනිසකු සුව කිරීම , ජාත්‍යන්ධයකුට පෙනීම දීම. ලාසරස් මරණින් නැගිටුවීම වැනි ප්‍රාතිහාර්යයන් ජොහාන් ශුභාරංචියෙහි සඳහන් වේ.

4. සමදර්ශකවල සඳහන් වන පරිදි දේව රාජ්‍යය තේමාව ඉගැන්වීම සඳහා ජේසුස් වහන්සේ භාවිත කළ මාධ්‍යය වූ උපමා ශු.ජොහාන් ශුභාරචියේ සඳහන් නොවේ. ඒ වෙනුවට සදාතන ජීවනය යන්න සඳහන් වේ.

5. 'මම වෙමි' යනුවෙන් ජේසුස්වහන්සේ ඉදිරිපත් කරන විශේෂ ප්‍රකාශන 7 ක් ජොහාන් ශුභාරංචියෙහි සඳහන් වුවද ඒවා සමදර්ශක ශුභාරංචිවල අන්තර්ගත නොවේ.

### 4.2.5 අපොස්තුළුවරුන්ගේ ක්‍රියාපොත

- ජේසුස් වහන්සේගේ ස්වර්ගාරෝහණයේ සිට මුල් කිතුනු සභාවේ බිහිවීමෙන් පසු වසර 30 ක පමණ කාලයක් එනම් පාවුලු රෝමයේ සිරගතවීම දක්වා සහා ඉතිහාසයක තොරතුරු ක්‍රියා පොතෙහි අන්තර්ගත වේ.
- ලොව පුරා ශුභාරංචිය (ක්‍රියා 1 : 8) විශේෂයෙන් උතුරු මධ්‍යධරණී ප්‍රදේශ හරහා වත්මන් සිරියාව , තුර්කිය පුරා ශුභාරංචි ව්‍යාප්තිය ක්‍රියා පොතෙහි ඇතුලත් වේ.
- ශුද්ධාත්මයාණන් වහන්සේ පේදුරු හා පාවුළු වැනි අපොස්තුලු වරුන්ගේ ජීවිත හරහා ක්‍රියාකළ අන්දම ක්‍රියා පොත කියවීමෙන් අවබෝධ කරගත හැකිය.
- නව ගිවිසුමේ ගැලවීමේ ඉතිහාසය එළි දක්වන ග්‍රන්ථය ක්‍රියා පොත වේ.
- උත්ථාන වූ ජේසුස් වහන්සේ ස්වර්ගාරෝහණය වූ පසු එම මෙහෙය බාර වූයේ අපොස්තුලු වරුන්ගෙන් සමන්විත වූ මුල් සභාවටයි.
- මුල් සභාව එම කාර්යය ඉටුකළ අන්දම ක්‍රියා පොතෙහි මනාව සඳහන් වේ.
- ශු.ලූක් ශුභාරංචියේ දෙවැනි කොටස වශයෙන් මෙම ග්‍රන්ථය හඳුන්වා දිය හැකිය.
- ක්‍රියාපොත මුල් කිතුනු සභාවේ ඉතිහාසය මනාව ඉදිරිපත් කරන ඉතිහාස ග්‍රන්ථයක් මෙන්ම එය ශ්‍රේෂ්ඨ දේව ධාර්මික ග්‍රන්ථයක්ද වේ.
- ජෙරුසලමෙන් ආරම්භ වී ජුදය හා සමාරිය දක්වාද ඉන්පසු පොළොවේ සීමාන්තයන් වෙතද ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා ශුද්ධාත්ම ක්‍රියාකාරිත්වය තුළ අපොස්තුලු වරුන් ජීවිත පරිත්‍යාගයෙන් ක්‍රියාකළ අන්දම ක්‍රියා පොතෙන් කියවා දැනගැනීමෙන් වත්මන් ධර්මදූත සේවය ඉදිරියට ගෙනයාම සඳහා කිතුනුවන්ට ඉමහත් පන්නරයක් ලැබෙන බව පැහැදිලිය.

## කර්තෘත්වය

• ශුභාරංචි ග්‍රන්ථ හතර සේම අපෝස්තුලු වරුන්ගේ ක්‍රියා පොතද කර්තෘ සෘජුවම අනාවරණය නොකරයි.

• ශු.ලූක් ශුභාරංචිය මෙන්ම අපෝස්තුලු වරුන්ගේ ක්‍රියා පොතද එකම පුද්ගලයෙකුට එනම්, ශු.තියෝපිලස් නම් විද්වත් රෝම නිලධාරියෙකුට පිළිගන්වා තිබීමෙන් මෙම ක්‍රියා පොතෙහි කර්තෘද විජාතික වෛද්‍යවරයෙකු වූ ලූක් තුමාම බව විශ්වාස කරයි.

• ශු.ලූක් ශුභාරංචිය මගින් ජේසුස් වහන්සේගේ ජීවිත කතාව ඔහුට පිළිගැන්වීමටත් ක්‍රියා පොතෙන් මුල් සභාව ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වය තුළ ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට දැරූ ප්‍රයත්නය ඔහුට වටහා දීමටත් උත්සාහයක් දරා ඇති බව පැහැදිලිය.

• වියත් රචනා ශෛලියක් භාවිත කරමින් ශ්‍රේෂ්ඨ ඉතිහාසඥයෙකුගේ ලක්ෂණ විදහා දක්වමින් මෙම ග්‍රන්ථය ඉදිරිපත් කර ඇත.

• පාවුලුතුමාගේ සහකාර ධර්මදූත වරයෙකු ලෙස ලූක් තුමා සිය අත්දැකීම් අනුසාරයෙන් රචනා කර ඇති ශ්‍රේෂ්ඨ දේව ධාර්මික ග්‍රන්ථයක් ලෙස ක්‍රියාපොත හඳුන්වාදිය හැකිය.

## කාලය හා ස්ථානය

• ශු.ලූක් තුමා , ශු.ලූක් ශුභාරංචියෙහි දෙවන අදියර ලෙස ක්‍රියා පොත රචනා කර ඇති බව පැහැදිලි වේ.

• කිතුනු සභාවට දරුණු පීඩා එල්ල වූ කාලයක එනම්, ක්‍රි.ව. 63 - 70 අතර කාලයේ මෙය රචනා කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

• ක්‍රියා පොතේ අවසාන අදියරට පසු වසර දෙකකට පාවුලුතුමා සිරගත කරන ලද බව පැහැදිලි වේ.

• එතුමා නිදහස් කිරීම හෝ නීරෝගේ පීඩන සමයේ ප්‍රාණපරිත්‍යාගීවරයෙකු ලෙස මියයාම පිළිබඳ තොරතුරු කිසිවක් එහි අඩංගු නොවේ. එනිසා විද්වතුන්ගේ පිළිගැනීම ක්‍රියා පොත රෝමයේදී ලියන්නට ඇති බවය.

## පරමාර්ථය

• ශුද්ධාත්ම දානය තුළ මුල් සභාව බිහිවූ ආකාරයත් ඉන්පසුව මුල් සභාව ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට දැරූ ප්‍රයත්නයත් පිළිබඳ නිරවද්‍ය හා කාලීන වාර්තාවක් හරහා දේව ධාර්මික සත්‍යතාවක් පිළිගැන්වීම මෙහි ප්‍රමුඛ පරමාර්ථය බව පැහැදිලිය.

## ආවේණික ලක්ෂණ

1. අපෝස්තුලුවරුන්ගේ ක්‍රියාපොත ඓතිහාසික කරුණු බොහොමයක් සමන්විත වේ.
   ශු.ලූක් තුමා ක්‍රියා පොත සඳහා බොහෝ ඓතිහාසික වාර්තා ඇතුලත් කර ඇත.
2. ක්‍රියාපොත තුළ දේශනාවන් බොහොමයක් අන්තර්ගත කර තිබීම විශේෂත්වයකි.
   - පේදුරුතුමාගේ දේශනා (ක්‍රියා 2:14-47)
   - පාවුලුතුමාගේ දේශනා (ක්‍රියා 17:16-34)
3. විජාතීන් අතරට ශුභාරංචිය ගෙනයෑම හා ශුභාරංචිය ව්‍යාප්ත වීම පිළිබඳ වාර්තා හා සංදේශ බොහොමයක් දක්නට ලැබේ.
   - උදා : ක්‍රියා 11:1-18 , ක්‍රියා 15:22-30
4. රචනා ශෛලිය තුළ හෙලනිස්ත (ග්‍රීක්) ආභාසය වඩාත් ඉස්මතුව ඇති බව පෙනේ. (ක්‍රියා 17:4-5)
5. අත්දැකීම් ආශ්‍රයෙන් ලියන බවක් පැහැදිලි වේ.
   උදා : අප , අපි , ගියෙමු වැනි පද භාවිතය (ක්‍රියා 27:1-8)
6. වියත් බස උපයෝගීත්වයෙන් පැහැදිලි ලෙස ලියා ඇත.

නිපුනතාව 4.0 : ක්‍රිස්තුන්වහන්සේ ලෝකයේ නව විමුක්තිදායකයාණන් බව අවබෝධ කර ගනිමින් උන්වහන්සේට සාක්ෂි දරයි.

නිපුනතා මට්ටම 4.3 : ශුද්ධ පාවුලු තුමා අනුගමනය කරමින් ධර්මදූත සේවයේ නියැලෙයි

කාලච්ඡේද සංඛ්‍යාව : 20

**ඉගෙනුම් පල**

- ශුද්ධවූ පාවුලු තුමාගේ දූත සේවාව පිළිබඳ තොරතුරු ගොනු කරයි.
- ශුද්ධ වු පාවුලු තුමාගේ ජීවිතාදර්ශය තුල ධර්මදූත සේවාව සඳහා ඇප කැප විය යුතු බව පිළිගනියි.
- ශුද්ධවූ පාවුලු තුමාගේ දූත සේවාව පිළිබඳ ගොනුකරගත් තොරතුරු නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- තම ජීවිත සාක්ෂියෙන් ධර්මදූතයෙකු වෙයි.
- ධර්මදානය මගින් අන් අය දේව රාජ්‍යය වෙත ළං කරවයි.

### 4.3.1 ශු.පාවුලු තුමාගේ ජීවිත පසුබිම හා හැරීම. (ක්‍රියා 7 : 58 , 9 : 1 - 30 , 11 :25 -30)

• කිතුනු සභාවට අද්විතීය මෙහෙවරක් ඉටුකළ ශුද්ධ වූ පාවුළු තුමා ක්‍රි.ව. 5 - 10 කාලයේදී සිලිසියාවේ තාර්සස් නුවර උපත ලැබූ බව සඳහන් වේ. (ක්‍රියා 22 : 3)

• සුළු ආසියාවේ පිහිටි වැදගත් වෙළඳ නගරයක් හා සංස්කෘතික කේන්ද්‍රයක් සේ සැලකුණු තාර්සස් බහුජාතික හා බහු ආගමික නගරයක් ලෙසද හැඳින්විය හැකිය.

• අධික ජනගහනයකින් සමන්විත මෙම විශාල තාර්සස් නගරය කරා බොහෝ ජනකායක් ඇදී එන ලද්දේ අධ්‍යාපනය , රැකී රක්ෂා වැනි අභිප්‍රායන් සපුරාගැනීම සඳහාය.

• පලස්තීනය පුරා විසිරී සිටි ජුදෙව්වන් බොහෝදෙනෙකු විදේශීය සතුරු ආක්‍රමණ හේතු කොටගෙන තාර්සස් නගරයට පලා ආ බව සඳහන් වේ.

• එබැවින් ශු.පාවුලු තුමා ඉපදෙන සමයේ තාර්සස් , විශාල ජුදෙව් ජන සමූහයකට නිවහන සැලසූ නගරයක් විය.

• ජුදෙව්වරු ග්‍රීක අධිරාජ්‍යයේ කොටසක් වූවාට පසු ඔවුන්ගේ කොටසක් ග්‍රීක අධිරාජ්‍ය තුළ ව්‍යාප්ත වූහ. මව් රටෙන් ඈත් වූ මෙම පිරිස රටට , ජාතියට , භාෂාවට , දහමට තිබූ බැඳීමෙන් ලිහිල් වන්නට වූහ.

• ඒ විදේශගත වූවන්ගෙන් ක්‍රිස්තියානි සභාවේ අත්තිවාරම ගොඩනගන්නට පාවුලු තුමාට පහසුවිය. මේ අය හෙළනිස්ත ජුදෙව්වරු වූහ.

• මෙසේ පලස්තීනයෙන් බැහැරව ග්‍රීක අධිරාජ්‍යය තුළ ව්‍යාප්ත වූ (Diaspora) ජුදෙව්වරු පාවුලු තුමා හා සම තත්වයට පැමිණියහ.

• බෙන්ජමින් ගෝත්‍රයට අයත් ජුදා ජාතික පියකුට දාව ඉපදුණු පාවුලු තුමා ග්‍රීක බස මෙන්ම හෙබ්‍රෙව් බස මනාව දැන සිටි කෙනෙකි. (ක්‍රියා 21 : 39 , ක්‍රියා 22 : 2)

• සාවුල් හා පාවුලු යන නම් දෙකෙන්ම ඔහු හඳුන්වනු ලැබීය.

• පසුකලෙක විජාතීන් අතර සේවය කිරීමේදී ඔහු පාවුලු / පාවුලස් යන ග්‍රීක / රෝම නාමය භාවිතයට ගත් අතර , ග්‍රීක් සංස්කෘතියට අනුකූලව ක්‍රියාකිරීමට හා ග්‍රීක් බසින් ලිපිලේඛන සම්පාදනය කිරීමට එමගින් මහත් පහසුවක් ඇතිවිය.

• එකල රෝම නාමය නිසා අයකුට සමාජ පිළිගැනීමක් හිමිවූ බව පැහැදිලි වේ.

• තාර්සස්හී ග්‍රීක් සංස්කෘතියට අනුව හැදී වැඩුණද ජුදෙව් ජාතිකයකු ලෙස පාවුලු තුමා සිය පරිසි දෙමාපියන්ගෙන් ජුදෙව් සංස්කෘතික වටිනාකම්, ජුදා ගමේ මූලික හරයන් හා සිරිත් විරිත් මෙන්ම ලැබූ ග්‍රීක , රෝම ආභාසය ඉමහත් විය.

• වයස අවුරුදු 5 සම්පූර්ණ වූ ජුදෙව් පිරිමි දරුවකු ලෙස ජුදා ආගමික අධ්‍යාපනයට යොමු කෙරුණු පාවුලු තුමාට වයස අවුරුදු 12 දී විශේෂ ආගමික උත්සව සඳහා ජෙරුසලමේ දේව මාළිගයට යෑමට හා ශුද්ධ ලියවිල්ල හා ව්‍යවස්ථාව හැදෑරීම සඳහා සිනගෝග අධ්‍යාපනයට යොමුවීමට අවකාශ ලැබිණ.

• තරුණ වියෙහිදී ජෙරුසලමට ගොස් සැනෙහෙඩ්‍රින් සභාවේ සාමාජික ගමාලියෙල් නම් ව්‍යවස්ථාචාරී රබ්බිවරයෙකු යටතේ වැඩිපුර අධ්‍යාපනය ලැබීමට පාවුලු තුමාට හැකි විය.

පාවුලු තුමාගේ පියා රෝම පුරවැසිභාවය ලබා සිටි හෙයින්, උපතින් රෝම පුරවැසියෙකුවීමට එතුමාට අවකාශ ලැබිණි.

- එය එතුමාගේ පසුකාලීන සේවය අර්ථවත් කිරීමට හා පහසු කරවීමට මහත් ආධාරකයක් විය.
- රෝම පුරවැසිභාවයට හිමිකම් කියනු ලබන පුද්ගලයින් සඳහා නෛතික සාධාරණත්වය ලැබීම දේශපාලන අයිතිවාසිකම් සඳහා හිමිකම් කීම , ආර්ථික වාසි ලබාගැනීම වැනි වරප්‍රසාද සමූහයක් අත්විය. (ක්‍රියා 22 : 25 - 29)
- එතුමා ඇරමෙයික් හා ග්‍රීක් භාෂාව කථා කළේය. රෝම පුරවැසියෙකු ලෙස ග්‍රීක් භාෂාව දැන සිටීම එතුමා ලද වරප්‍රසාදයක් විය.
- රෝම රජය තාර්සස්හී දිවිගෙවූ රෝම රජය සඳහා අනුපමේය සේවාවක් ඉටුකල පවුල්වල සිව්වන පරපුර දක්වා රෝම පුරවැසිභාවය පිරිනමන ලදී.
- සිය පියාගේ ඇවෑමෙන් පාවුලු තුමාට මෙම රෝම පුරවැසිභාවය හිමිවූ අතර, එම පුරවැසිභාවය ලැබීමත් සමගම ඔහුට හිමිවූ රෝම නාමය මතින් ඔහුගේ රෝම වරප්‍රසාද හෙළිදරව් කෙරුණි.
- විජාතීන් අතර, සේවය කිරීමේදී රෝම පුරවැසිභාවය හිමිවීම කෙතරම් වැදගත් වූයේද යන්න පිලිප්පියේ සිරගතවීම , රෝමයට යෑම වැනි සිදුවීම් මගින් පැහැදිලි වේ. (පිලිප්පි 1 : 7 ක්‍රියා 27 : 1)

- ජනාකීර්ණ වෙළඳ නගරයක් මෙන්ම අධ්‍යාපනික තෝතැන්නක් වූ තාර්සස් නගරයේ උපත ලැබීමෙන් එහි පිහිටි සුවිශේෂී විශ්වවිද්‍යාල මෙන්ම සංස්කෘතික මධ්‍යස්ථාන වෙත ඇදී ආ බොහෝ බුද්ධිමත් විද්වතුන් , අධ්‍යාපනඥයන් හා දාර්ශනිකයින් ඇසුරු කිරීමට පාවුලු තුමාට අවස්ථාව උදාවිය.

- එහිදී ඔවුන්ගේ සංස්කෘතින් , භාෂා , ඇදහිලි ක්‍රම , සිරිත් විරිත් ආදිය පිළිබඳ දැනුම් සම්භාරයක් හා හසල අත්දැකීම් සමූහයක් ලැබීමට එතුමා ලද මහත් වරප්‍රසාදය හේතුකොටගෙන භාෂා විශාරදයකු ලෙස විශේෂයෙන් ග්‍රීක , රෝම භාෂා නිපුණත්වයක් ලබමින් විජාතීන්ගේ අපෝස්තුළුවරයා ලෙස අමරණීය සේවාවක් ඉටුකිරීමට මඟපෑදිණි. (පිලිප්පි 3 : 5)

- ජුදෙව් පිරිමි දරුවෙකු යම් හස්ත කර්මාන්තයක් ප්‍රගුණ කළයුතු විය.
- පාවුලු තුමා සිය පවුලේ ආභාසයෙන් කුඩාරම් කර්මාන්තය ප්‍රගුණ කළ අයෙකු විය. (ක්‍රියා 18 : 13)
- තාර්සස් නගරය කුඩාරම් කර්මාන්තය සඳහා වඩා ප්‍රසිද්ධත්වයක් ඉසිලීය.
- තාර්සස් නගරයේ කඳුකර ප්‍රදේශ ආශ්‍රිතව කළු එළුවන් ඇති කිරීම බහුලව කෙරුණි.
- මෙම කළු එළුවන්ගෙන් ලබාගන්නා ලෝම ආශ්‍රයෙන් 'සිලිසියම්' නම් දැඩි රෙදිමය ආවරණ වියනු ලැබීය.
- ඒවා කබායන් , පාපිසි හා කුඩාරම් කර්මාන්තය සඳහා යොදා ගැණිනි.
- තාර්සස් නුවර ජීවත්වී කුඩාරම් කර්මාන්තය වඩාත් නිපුණ ලෙස ප්‍රගුණ කිරීම හේතුවෙන් කොරින්තියේ ධර්මදූත සේවයේ යෙදෙන අතර, අකිලා හා ප්‍රිස්කිලා නම් ඉතාලි ජාතික යුවල සමග එක්ව එම කර්මාන්තයේ යෙදීමට පාවුලුතුමාට අවකාශ ලැබිණි. එමඟින් සිය අවශ්‍යතා සපුරාගැනීමට එතුමා පසුබට නොවීය.
- මෙවැනි පසුබිමක දිවිගෙවූ පාවුලු තුමාගේ ජීවිතය හා අත්දැකීම් පසුකාලීනව 'විජාතීන්ගේ අපොස්තුළුවරයා' ලෙස විශාල සේවාවක් ඉටුකිරීමට මෙතුමාට මඟ සැලසූ බව පැහැදිලිය.

- දැඩි ජුදා ආගමික මතධාරීයෙකු ලෙස ක්‍රියාකළ පාවුලු තුමා සිය දහම සුරැකීම සඳහා නොපසුබට වීර්යයෙන් ක්‍රියා කළේය. මෙකල 'මාර්ගයේ අනුගාමිකයින් හෙවත් නසරීය පක්ෂය' යැයි හඳුන්වනු ලැබූ කණ්ඩායමක් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නම් කෙනෙකුට නමස්කාර කරමින් සමාජය තුළ ගෙනගිය ව්‍යාපාරය ජුදාගමට එරෙහිව නව ආගමක් පතල කිරීමට ඔවුන් දරූ උත්සාහයක් ලෙස පාවුලු තුමාට පෙනෙන්නට ඇත.
- කෙසේ හෝ ඔවුන්ගේ තැත ව්‍යර්ථ කොට තම දහමෙහි නිර්මලභාවය සුරැකීම සඳහා පාවුලු තුමා නිර්භීතව හා කැපවීමෙන් ඉදිරිපත් වූ අයුරු ශුද්ධ ලියවිලි ඇසුරෙන් මනාව විදහා දැක්වේ.
- මෙම ඇදහිල්ලට අයත් ස්තේපන් නම් කෙනෙකු ගල් ගසා මරණු ලබන අවස්ථාවේ ගල් ගසන පුද්ගලයින්ගේ ඇඳුම් රැකබලා ගැනීමටත් (ක්‍රියා : 7 : 57 -- 60) එම මරණය පිළිබඳ සතුට පළකිරීමටත් (ක්‍රියා : 8 : 1) සාවුල් නොබියව ක්‍රියාකරන්නේ යථොක්ත පරමාර්ථය හේතුකොට ගෙනය.

• තවද, ස්තේපන්ගේ මරණය පිළිබඳ සැදැහැවතුන් දුක්වී වැළපෙන අවස්ථාවේදී සාවුල් තම ඒකායන පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම සඳහා ගෙයින් ගෙට ගොස් එම ඇදහිල්ලට අයත් ස්ත්‍රීන් හා පුරුෂයින් අල්ලා සිර භාරයට ගනිමින් එම ඇදහිල්ල වැනසීමට දිරි දූරූ බව ක්‍රියා පොත හෙළි කරයි. (ක්‍රියා 8 ፡ 2-3) එපමණකින් නොනැවතී ඔහු ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් වෙත ගොස් ඔවුන්ටද මරණ තර්ජන එල්ල කළ බව කිතු දහමට අයත් පුරුෂයින් හා ස්ත්‍රීන් අල්ලා ජෙරුසලමට ගෙන ඒමට දමස්කයේ ධර්මශාලාව වෙත ඉදිරිපත් කිරීම සඳහා උත්තම පූජකයින් වෙතින් බලපත්‍ර ලැබ සිටි බව සඳහන් වේ. (ක්‍රියා ፡ 9 ፡ 1 -2)

• කිතුනුවන් මර්දනය කිරීම සඳහා ජෙරුසලමේ සිට දමස්කය බලා යමින් සිටි පාවුලු තුමා මුහුණදුන් සිදුවීම මවිතකරය.

• හදිසියෙන් අහසින් බැබළුණු ආලෝකයත්

බියවී බිම වැටීමත්

'සාවුල් සාවුල් ' ඔබ මට පීඩා කරන්නේ මන්ද යනුවෙන් එසැණින් ඇසුණු හඬත් ඔහුට මුහුණදීමට සිදුවූ අනපේක්ෂිත සිදුවීම මනාව පැහැදිලි කරයි. එයට ප්‍රතිචාර වශයෙන් ස්වාමීනි , ඔබ කවරෙක් ද යනුවෙන් ඔහු පිළිවදන් දුන්නේ කිසිදින නොහැඳින සිටි ජේසුස් වහන්සේටය.

• එදින එම සිදුවීමෙන් කිතුනුවන් නමස්කාර කළ ජේසුස් වහන්සේ සමග පෞද්ගලික අත්දැකීමකට යොමුවීමට පාවුලු තුමාට හැකිවිය.

• කිතුනු සැදැහැවතුන් සමග අනන්‍යව සිටින ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ හඳුනාගැනීමට මෙම අත්දැකීම පාදක විණි.(ක්‍රියා ፡ 9 ፡ 3-4)

• කිතුනු ශුභාරංචි මෙහෙවර විනාශ කිරීමසඳහා අනුගමනය කළ විශේෂ ප්‍රයත්නය මොහොතකින් පරාජයට පත්කරමින් ඒ වෙනුවටකිතුනුවන්ගේ ස්වාමීන් වහන්සේ වූ ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ වෙනුවෙන් අපරාජිත ධර්මදූත මෙහෙවරක යෙදීමට එතුමාට මඟපෑදිණි.

• උන්වහන්සේගේ නාමය විජාතීන්ද රජුන්ද, ඊශ්‍රායෙල් පුත්‍රයන්ද වෙත ගෙනයාමට උන්වහන්සේ විසින් තෝරාගත් භාජනයක් ලෙස ක්‍රියා කිරීමට කැඳවීම ලබමින් හා මෙතෙක් ගතකල දිවිමග අර්ථවත් වෙනසකට භාජනය කරමින් සැබෑ සත්‍යයේ ගැලවීම අවබෝධ කරගැනීමට එතුමා යොමු කෙරිණි.

• කෙළින් වීදියේ ජුදස්ගේ ගෙදර සිටියදී දමස්කයේ අනනියස් නම් ශ්‍රාවකයා විසින් අත් තබනු ලැබ ඇස් වලින් කොරපොතු වැන්නක් වැටී ඔහු පෙනීම ලැබීය.

• ඔහු නැගිට ප්‍රසාද ස්නාපනය ලැබ ආහාර ගැනීමෙන් සවිමත් විය.

• ශාරීරිකව මෙන්ම ශුද්ධාත්ම බෞතීස්මය මගින්ද සවිමත් කරනු ලැබූ පාවුලුතුමා , කිතුනුවන් විසින් ඇදහූ ජේසුස් වහන්සේ දෙවියන් වහන්සේගේ පුත්‍රයා බව දේශනා කරමින්, තමා කැඳවූ විශේෂ ධර්මදූත මෙහෙය එනම්, සුපුවත අන් අයට ගෙනයන භාජනයක් සේ ක්‍රියා කිරීම ආරම්භ කළ බව ක්‍රියා පොත ඇසුරෙන් පැහැදිලි වේ. (ක්‍රියා 9 ፡ 15)

• කිතු දහම වනසාලීම සඳහා ඔහු හා එක්වූ ජුදාගමිකයින්ට මෙය මහත් ප්‍රහේලිකාවක් වූ අතර, සාවුල් තුළ සිදුවූ මහත් චින්තන විපර්යාසය හා ඊට අනුකූල ඔහුගේ ක්‍රියා කලාපය අවබෝධ කරගත නොහැකිවූ ඔවුන්ගෙන් පාවුලුට ජීවිත තර්ජන පවා එල්ල වූ බව පෙනේ. කෙසේ හෝ එම ජීවිත තර්ජන මධ්‍යයේ නොබියව ජෙරුසලමට පැමිණ බාර්ණබස් විසින් ජෙරුසලමේ කිතුනු සහෝදරත්වයට එතුමා හඳුන්වාදීමෙන් අනතුරුව නැවතත් තාර්සස් නගරය කරා පියමන් කරනු ලැබුවේ කිතු දහම වනසාලීමේ අරමුණ සාක්ෂාත් කරගැනීමේ අභිප්‍රාය වෙනුවට කිතු දහම ලොව පුරා පතල කිරීමේ දේව අභිප්‍රායට උරදීම සඳහා කැපවීමේ අධිෂ්ඨානය පෙරදූරි කරගෙනය.

• එතුමාගේ ඉදිරි ජීවිතය තුළ එය මල්ඵල ගැන්වුනු අයුරු ක්‍රියා පොත හැදෑරීමේදී සක්සුදක් සේ පැහැදිලි වේ.

### 4.3.2 ශුද්ධ පාවුලු තුමාගේ ධර්මදූත චාරිකා (ක්‍රියා 13 - 20 දක්වා පරිච්ඡේද)

• කිතු බැතියකු ලෙස තාර්සස් නගරය ලෙස ගිය සාවුල් ඉගැන්වීමෙන් හා දේශනා කිරීමෙන් කිතු දහම ප්‍රචලිත කිරීමේ ධර්ම දූත සේවයට උරදී ක්‍රියා කළේය.

• සාවුල් දමස්කය හා ජෙරුසලමේ කිතුනු සහෝදරත්වයට හඳුන්වා දුන් ශුද්ධාත්මයෙන් පූර්ණ ඇදහිලිවන්තයෙකු වූ බාර්ණබස් , ඔහු සිරියාවේ අන්තියෝකියට කැඳවාගත් බව ශුද්ධ ලියවිලි ඇසුරෙන් පැහැදිලි වේ. (ක්‍රියා 13 ፥ 1 - 3)

• සිරියාවේ අන්තියෝකියේ පැවති ජුදෙව් හා ජුදෙව් නොවන සාමාජිකයින්ගේ යුත් මිශ්‍ර සභාවේ සේවය කිරීම සඳහා මෙමඟින් සාවුල්ට දොරගුළු විවර විය.

• බාර්ණබස් , නීගර් නම් සිමියොන් , සිරේනියේ ලුසියස් , මානායින් වැනි අය දිවැසිවරුන් හා ගුරුවරුන් ලෙස සේවයේ යෙදී සිටි මෙම සභාවට එකතුවීම සඳහා සාවුල්ට ද එමඟින් හැකි විය.

• ප්‍රථම වතාවට ක්‍රිස්තියානි යන නමින් ශ්‍රාවකයන් හඳුන්වනු ලැබූයේ සිරියාවේ අන්තියෝකියේදීය. සිරියාවේ අන්තියෝකියේ සභාව නිරාහාර යාච්ඤාව , අපොස්තලික ඉගැන්වීම් සහනාධාර සේවය , නමස්කාරය හා සහභාගීකම වැනි පිළිවෙත් වඩාත් ජනතාව වෙත සමීප කරමින් ජනතාව ශුද්ධාත්ම මඟපෙන්වීමෙන් පෝෂණය කිරීමට දැරූ ප්‍රයත්නය ප්‍රශංසනීයය.

• පාවුලු හා බාර්ණබස් ලොවපුරා දහම් සේවය සඳහා පිටත්කර යැවීම වෙනුවෙන් ශුද්ධාත්ම මඟපෙන්වීම ලැබෙනුයේ මෙසේ ඔවුන් දෙදෙනාම සිරියාවේ අන්තයෝකියේ කිතුනු සභාව සම්බන්ධව යාච්ඤාවේ යෙදී සිටි අතරතුරය.
• ඊට නිසි ප්‍රතිචාර දක්වූ එම සභාව රැස්වී එකමුතුව උපවාසයේ යෙදී යාච්ඤා කොට ශුද්ධාත්ම මඟපෙන්වීමෙන් ඔවුන් දෙදෙනා මත අත් තබා ඔවුන් අදාළ මෙහෙය සඳහා පිටත්කර යැවූ බව ක්‍රියා පොත හෙළි කරයි. (ක්‍රියා 13 ፥ 3)
• මෙසේ පාවුලු තුමා ධර්මදූත ගමන් තුනක යෙදී දහම් ප්‍රචාරය කිරීමෙහි යෙදුණු බව ක්‍රියා පොත සාක්ෂි දරයි.

## <u>පාවුළු තුමාගේ ප්‍රථම ධර්මදූත චාරිකාව (ක්‍රියා 13 , 14 පරිච්ඡේද)</u>

චාරිකාවට සහභාගී වූ අය - පාවුලු, බර්ණබස් , ජොහාන් මාක්

කාලය - ක්‍රි.ව. 45 - 49

චාරිකාවේ අරමුණ - අන්තියෝකියේ සභාවේදී ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් ලද මඟපෙන්වීම සාක්ෂාත් කරගැනීම (ක්‍රියා 13 ፥ 2)

චාරිකාවට අයත් ප්‍රදේශ -
සිලුකිය සයිප්‍රස් දූපත සලමිස පාපස් පම්පිලියේ පර්ගාය පිසිදියේ අන්තියෝකිය ඉකෝණිය ලුස්ත්‍රාව දර්භය නැවත හැරීම අත්තාලිය සිරියාවේ අන්තියෝකිය

### සිලුකිය (ක්‍රියා 13 ፥ 4)
සිරියාවේ අන්තියෝකියේ වරාය නගරයක් වූ මෙහිදී නැව් නැග ගමන ඇරඹීය.

### සයිප්‍රස් දූපත (ක්‍රියා 13 ፥ 4)
බාර්ණස්බස් තුමාගේ උපන් රට වන මෙම දූපතට ධර්මදූත සේවකයින් මුලින්ම පැමිණි බව සඳහන් වේ. මෙහි බොහෝ ජුදා ජනතාවක් විසූ බව පැවසේ.

### සලමිස (ක්‍රියා 13 ፥ 5)
ජුදෙව් ධර්මශාලාවල ශුභාරංචිය දෙසීමට අවස්ථාව ලැබිණි. මෙහි ධර්මදූත සේවය සවිමත් කිරීම සඳහා ජොහාන් මාක් එක්වූ බව පැවසේ.

### පාපස් (ක්‍රියා 13 ⁝ 6 - 12)

• මෙම නගරය සයිප්‍රසයේ අගනුවර විය.
• සර්ගියස් පාවුලස් නම් බුද්ධිමත් රෝම දේශාධිපතියා හා ඔහු සමඟ සිටි ඉන්ද්‍රජාලිකයෙකු හා බොරු දිවැසිවරයෙකු වූ බාර් ජේසුස් නම් ජුදෙව් ජාතිකයෙකු මෙහිදී පාවුලු ඇතුළු ධර්මදූතයන්ට හමුවිය.
• සර්ගියස් පාවුලස් ශුභාරංචිය පිළිගැනීමට කැමති වුවද එය වැලැක්වීමට ක්‍රියාකළ 'එළිමස් මැගෝස්' යන ග්‍රීක් නාමයකින් හඳුන්වනු ලැබූ බාර් ජේසුස් පාවුලු විසින් කෛරාටික යක්ෂයාගේ පුත්‍රයකු ලෙස හඳුන්වමින් දේව මඟ නොමඟට පෙරළීමට ක්‍රියාකළ ඔහු අන්ධභාවයට පත්වන බව පවසන ලදී.
• එකෙනෙහිම ඔහුගේ ඇස් යම් පටලයකින් වැසී අන්ධභාවයට පත්විය.
• ඒ දුටු රෝම දේශාධිපතියා ස්වාමින් වහන්සේගේ ඉගැන්වීම ගැන විස්ම පත්වී එය පිළිගෙන නව ජීවිතයකට යොමුවිය.
• ශුද්ධාත්ම බලය තුළ දිරියෙන් පාවුලු හා බාර්ණබස් අයහපත පිටුදැක යහපත ඉස්මතු කළ අයුරු සැමටම ආදර්ශයකි.
• ඉන්ද්‍රජාලිකයකු හා බොරු දිවැසිවරයකු මෙහිදී පාවුලු ඇතුළු ධර්මදූතයන්ට හමුවිය.
• සර්ගියස් පාවුලස් ශුභාරංචිය පිළිගැනීම වැළැක්වීමට ක්‍රියාකළ බාර් ජේසුස් අන්ධභාවයට පත්විය.
• නමුත් රෝම දේශාධිපතියා ශුභාරංචිය පිළිගෙන නව ජීවිතයකට යොමු විය.

### පම්පිලියේ පර්ගාය (ක්‍රියා 13 ⁝ 13)
• ජොහාන් මාක් ධර්මදූත චාරිකාවෙන් සමුගෙන නැවත හැරී යන ලදී.
• නමුත් ඔහු බාර්ණබස් හා එක්වී සයිප්‍රසය බලා ගිය බවට ශුද්ධ ලියවිල්ල සාක්ෂි දරයි. (කොලොස්සි 4 ⁝ 10) පළමු චාරිකාවේදී අධෛර්‍යය වුවද පසුව ජොහාන් මාක් පාවුල්තුමා හා එක්වූ ආකාරය සංදේශවල සඳහන් වේ. ජොහාන් මාක් හැරී ගියද පාවුලු හා බාර්ණබස් හවුල් නායකත්වයෙන් ඉදිරියටම ගිය බව පෙනේ.

### පිසීදියේ අන්තියෝකිය (ක්‍රියා 14 - 52)
• විශාල ව්‍යාපාරික නගරයක් වූ මෙම නගරය තුළ විශාල ජනකායක් විසූහ.
• පළමු සබත් දින මෙහි ධර්මශාලාවට පිවිසි පාවුළු හා බාර්ණබස්ට ඉශ්‍රායෙල් ඉතිහාසය ගෙනහැර දක්වෙන දීර්ඝ ධර්මානුශාසනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව උදාවිය.

• දෙවියන් වහන්සේ මිසරයේ විදේශීය සිටි ඉශ්‍රායෙල් සෙනඟ උසස් කොට සිය බාහු බලයෙන් නිදහස් කිරීම.
• හතලිස් වසක් පාළුකරයේ ඔවුන් ගෙනැවිත් කානාන් දේශය ඔවුන්ට හිමිකර දීම.
• දිවැසිවර සාමුවෙල් දක්වා විනිශ්චයකාරයන් ලබාදීම.
• උන්වහන්සේ ඉශ්‍රායෙල් රාජතන්ත්‍රය අරඹා එය සාවුල් , දාවිත් ආදින්ගෙන් ඉදිරියට ගෙනයාම.
• දාවිත්ගේ වංශයෙන් ජේසුස් නම් ගැලවුම්කරුවෙක් ලබාදීම.
• උන්වහන්සේගේ මඟ පිළියෙල කිරීමට ස්නාවක ජොහාන්ගේ පැමිණීම.
• ජේසුස් වහන්සේ කුරුසියෙහි ඇණ ගසා මරනු ලැබීම.
• දෙවියන් වහන්සේ විසින් උන්වහන්සේ තෙවැනිදා උත්ථාන කරනු ලැබීම.
• උන්වහන්සේ තුළ අදහන සැමට හිමිවන ගැලවීම.
වැනි ධාර්මික කරුණු වලින් එම ධර්මානුශාසනාව සමන්විත විය.
• ඊළඟ සබත් දිනද දේශනා කිරීමට ඔවුහු ආරාධනා ලදහ. බොහෝ දෙනෙක් අදහා ගත්හ.
• නැවත දෙවන සබත් දිනද ශුභාරංචිය ප්‍රකාශ කිරීමෙන් බොහෝ ජනතාවක් ඔවුන් අනුගාමී වූ අතර මේ හේතුවෙන් ජුදෙව්වන් ඊර්ෂ්‍යාවෙන් පිරි ඔවුන්ට එරෙහිව නැගී සිටිමින් ඔවුන් පීඩනයට පත්කිරිමට උත්සාහ කළද ඔවුන් එඩිතරව කතා කරමින් විජාතීන් අතරට යෑමට හේතුව පහදා දුන්හ.
• ශුද්ධාත්ම බලය තුල ජය ගනිමින් ඉදිරියට ගමන් කළහ. අභියෝග වලට දිරිමත්ව මුහුණදෙමින් ඔවුහු ශුභාරංචිය පතල කිරීමේ කාර්යයෙහි යෙදුණාහ.

**ඉකෝනිය (ක්‍රියා 14 : 1 - 4)**

- ඉකෝනියේ ධර්මශාලාවල ශුභාරංචිය බෙදාගත් පාවුලු හා බාර්ණබස් බොහෝ ජුදෙව් හා ග්‍රීක් ජනතාවකගේ ගැළවීමට මඟපාදන ලදී.
- අදහා නොගත් ජුදෙව්වරු කැළඹීම් ඇතිකළ ද ශුද්ධාත්ම බලය තුළ සියලු බාධක ජයගැනීමට හා දේවබලය විදහා දක්වෙන ප්‍රාතිහාර්ය එඩිතරව සිදුකිරීමට ඔවුන්ට හැකිවිය.
- ඒ නගරයේ ජනයා දෙකට බෙදී කොටසක් ජුදෙව්වරුන්ගේ පක්ෂයද, තවත් කොටසක් පාවුලු හා බාර්ණබස්ගේ පක්ෂයද ගන්නා ලදී.
- පීඩන වැඩිවෙත්ම දිරියෙන් ඔවුහු අන් නගර කරා ගමන් කර ශුභාරංචිය පතල කළහ.

**ලුස්ත්‍රාව (ක්‍රියා 14 : 8 - 20)**

- ලුකෝනීය නගරයක්වූ ලුස්ත්‍රාවේදී උපන් දා පටන් තොරව සිටි මිනිසකු සුවපත් කිරීමෙන් පාවුලුට හා බාර්ණබස්ට දේවත්වයෙන් ගෞරව පිරිනැමීමට ලුස්ත්‍රාවේ ජනයා ප්‍රයත්න දැරූහ. 'දෙවිවරු මිනිස් වෙසින් අප වෙත බැස සිටිතියි ' කියමින් බාර්ණබස් 'සියුස්' නමින්ද පාවුලු 'හර්මිස්' නමින්ද ඇමතීමට උත්සාහ කළහ.
- එමෙන්ම පුද පූජා පැවැත්වීමට උත්සුක වූහ.
- ඒ අවස්ථාවේ දෙවියන් වහන්සේට හිමි ගෞරවයට මිනිසා කිසිසේත් හිමිකාරත්වයක් නො දැක්විය යුතු බව පාවුලු තුමා දැඩි සේ අවධාරණය කරන ලදී.
- 'අපිත් ඔබ හා සමාන මිනිසුන්ය' කියමින් පාවුලු සිය වස්ත්‍ර ඉරාගෙන එම දේවල්හී නිෂ්ඵල භාවය පහදා දීමට ප්‍රයත්න දැරීය.
- පුද පූජා ඔප්පු කිරීමෙන් අමාරුවෙන් ජනයා වළක්වාගත්තද, අන්තියෝකියෙන් හා ඉකෝනියෙන් පැමිණි ජුදෙව්වරු පාවුලුට ගල්ගසා ඔහු මරණයට පත්වූ බව සිතා ඔහු නුවරින් පිටතට ඇද දමන ලදී.
- එහෙත් ගෝලයන් ඔහු අවට රැස්ව ඔහුට ආරක්ෂාව සැපයූ අතර, පසුදා බාර්ණබස් සමග ඔහු දර්බය බලා පිටත්විය.
- මෙම නගරයේදී බොහෝ සෙයින් පීඩාවන්ට මුහුණදීමට සිදුවුවත් ඉන් අධෛර්යට පත් නොවී ඉදිරියට ගමන් කිරීමට ඔවුනට හැකිවිය.
- ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ සවිමත් වූ ධර්මදූතයන්ට පීඩා මධ්‍යයේ සේවය කිරීමට සිදුවන බව ඔවුන් පසක් කරන ලදී.

**දර්බය (ක්‍රියා 14 : 21)**

- ලුස්ත්‍රාවේ පීඩනයෙන් පසු දර්බය බලා ගිය පාවුලුට හා බාර්ණබස්ට මෙහිදී ශුභාරංචිය දෙසීමෙන් බොහෝ අය කිතුනු ශ්‍රාවකත්වයට යොමු කිරීමේ අවස්ථාව උදාවිය.

**නැවත හැරීයාම (ක්‍රියා 14 : 22 - 28)**

- දර්බයෙන් - ලුස්ත්‍රාවට - ඉකෝණියට - පිසීදියේ අන්තියෝකියට - පම්පිලියේ පර්ගායට

- එම නගරවලදී සභාවන් පිහිටුවා එම සභාවන්හී ක්‍රියාකිරීමට නායකයන් පත්කරන ලදී.
- එමෙන්ම දේව රාජ්‍යය වෙනුවෙන් දුක්විඳීමේ අවශ්‍යතාවය එහිදී පහදා දෙමින් ශුභාරංචිය තුළ ජනතාව දිරිමත් කිරීමට ඔවුහු අමතක නොකළහ.

- අත්තාලියෙන් නැව් නැග නැවත සිරියාවේ අන්තියෝකිය කරා පැමිණි පාවුලු හා බාර්ණබස් තමා ධර්මදූත මෙහෙය සඳහා පිටත් කර හරින ලද සිරියාවේ අන්තියෝකියේ සභාව වෙත ධර්මදූත චාරිකාවේදී ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට ඔවුන්ට හැකිවූ ආකාරය පිළිබඳ සමාලෝචනයක් ඉදිරිපත් කරමින් දෙවිඳුන්ට තුති පිදූහ.

## ජෙරුසලමේ මන්ත්‍රණ සභාව (ක්‍රියා 15 : 1 - 35)

කාලය : ක්‍රි.ව. 50

ස්ථානය : ජෙරුසලම

රැස්වූ සාමාජිකයින් : පේදුරු තුමා , ජාකොබ් තුමා/පාවුලු තුමා/බාර්ණබස් තුමා ඇතුළු ප්‍රේරිතයින් හා සභා මූලිකයින් මෙන්ම ජුදාවාදීන් හා පරිසිවරු

මන්ත්‍රණ සභා නායකත්වය : ජාකොබ් තුමා (ජේම්ස් තුමා) විසින් දැරීම.

රැස්වීමට හේතුවු ගැටළුව : සභාවට එක්වන විජාතීන් ගැලවීම ලැබීම සඳහා චර්මච්ඡේදන පිළිවෙත ඉටුකළ යුතුද? යන්නට විසඳුම් සෙවීම.

ක්‍රමවේදය :

- අදහස් ඉදිරිපත් කිරීමට දීර්ඝ විවාදයක් සඳහා ඉඩකඩ සැපයීම
- තර්ක විතර්ක සඳහා අවකාශ සැලසීම
- පේදුරු තුමා සභාව ඇමතීම.
- ජුදාවරුන් හා විජාතිකයින් යන දෙපක්ෂයමට දෙවියන් වහන්සේ ශුද්ධාත්මයාණන් ප්‍රදානය කළ බව හා ශුද්ධාව කරන කොට ගෙන විජාතීන්ගේ සිත් පවිත්‍ර කළ බව සභාව වෙත ඉදිරිපත් කිරීම.
- තවද ජුදාවරුන් මෙන්ම විජාතීන්ද ගැලවෙන්නේ ජේසුස් ස්වාමීන් වහන්සේගේ වරප්‍රසාදයෙන් බව විශ්වාස කිරීමට සභාවට ආරාධනා කිරීම.
- පාවුලු තුමා හා බාර්ණබස් තුමා තමා ලවා දෙවියන් වහන්සේ විජාතීන් අතර සිදුකළ අරුම පුදුම දේ හා ලකුණු පිළිබඳව අදහස් පළකිරීම.
- ජාකොබ් තුමා පේදුරු තුමාගේ කතාව අනුමත කොට දිවැසිවරුන්ගේ වචනයෙන්ද, අනුශාසනා කිරීම.

ජාකොබ්තුමා විසින් දෙන ලද
අවසාන නිගමනය :

- විජාතීන්ට හිරිහැර කිරීම නතර කිරීම.
- විජාතීන් වෙත යවන ලද සංදේශයක් මගින් පහත
- නිගමන දැනුම් දීම.
- රූප සම්බන්ධ දූෂණකම් වලින් වැළකීම.
- කාමමිථ්‍යාචාරයෙන් වැළකීම.
- බොටුව මිරිකා මැරූ සතුන්ගේ මස් කෑමෙන් වැළකීම.
- ලෙයින් වැළකීම. (ක්‍රියා 15 : 20)
- ප්‍රේරිතයන්ගේ හා සභාමූලිකයන්ගේ අනුමැතිය නොලත් සමහර අය ඔවුන් කළඹවමින් හා ඔවුන්ගේ
- සිත් අවුල් කරමින් කරන ක්‍රියා නතර කිරීම. මෙය මෝසස් තුමා ඉදිරිපත් කළව්‍යවස්ථාවට වඩාත් ගැඹුරින් අනුකූල වීමක් වීම.

| | | |
|---|---|---|
| සංදේශය ගෙනයාමට තෝරාගනු ලැබූවන් | : | පාවුලු තුමා , බාර්ණබස් තුමා හා දිවැසිවරයන් වූ බර්සබස් නම් ජූදස් තුමා හා සීලස් තුමා |
| සංදේශය ලැබිය යුතු අය | : | අන්තියෝකියේ සිරියාවේ හා සිලිසියාවේ වසන විජාතික කිතුනු සහෝදරයන් |
| සංදේශය ලැබූවන්ගේ ප්‍රතිචාරය | : | එම සංදේශය ගැන ප්‍රීති වීම. |
| ජෙරුසලමේ මන්ත්‍රණ සභාව කිතුනුවන්ට ත්‍යාග කරන ආදර්ශය | : | ප්‍රශ්න , ගැටළු හා අභියෝග මධ්‍යයේ නොසැලී එකමුතුව එම අභියෝගවලට මුහුණදෙමින් සාකච්ඡාවෙන් ගැටළු නිරාකරණය කර ගැනීම හා නිරතුරුව ශුද්ධාත්ම මගපෙන්වීම තුළ නිවැරදි තීරණ ගැනීමට උත්සුකවීම. |

## <u>පාවුලු තුමාගේ දෙවන ධර්මදූත චාරිකාව (ක්‍රියා 15 : 36 - 18 : 22)</u>

සහභාගීවූ අය - පාවුලු , සීලස් , තිමෝති , ලූක්

කාලය - ක්‍රි.ව. 49 - 52

චාරිකාවේ අරමුණ - ප්‍රථම චාරිකාවේ අවසාන අදියර තුළ ස්ථාපනය කරන ලද සභාවන් නැවත බැහැදකීම ඇදහිලිවතුන් කිතුනු ඇදහිල්ල තුළ සවිමත් කිරීම හා ජෙරුසලමේ මන්ත්‍රණ සභා තීරණ සභාවන් වෙත දැනුම්දීම.

චාරිකාවට අයත් ප්‍රදේශ -

සිරියාවේ අන්තියෝකිය ⇨ දර්බය ⇨ ලුස්ත්‍රාව ⇨ ත්‍රෝවස ⇨ පිලිප්පිය තෙසලෝනිකය ⇨ බෙරියාව ⇨ ඇතන්ස් ⇨ කොරින්තිය ⇨ එපීසය කෙන්ක්‍රෙයාව ⇨ සිරියාවේ අන්තියෝකිය

( ක්‍රියා 15 : 36 -16 : 7)

• පළමු චාරිකාවට සහභාගී වී පම්පිලියේ පර්ගායේදී හැරී ගිය ජොහාන් මාර්ක් සම්බන්ධයෙන් පාවුලු හා බාර්ණබස් අතර ඇතිවූ මත ගැටුම හේතුවෙන් , පාවුලු , ජොහාන් මාර්ක් දෙවන ධර්මදූත චාරිකාවට සහභාගී කරගැනීමට අකමැති වූ නිසා බාර්ණබස් ජොහාන් මාර්ක් සමග යළි සයිප්‍රසය බලා පිටත්ව ගිය අතර රෝම පුරවැසියකු හා දිවැසිවරයකුද වූ සීලස් පාවුලුට එකතු විය. (ක්‍රියා 15 : 40) දර්බයේදී සභාව ශක්තිමත් කරමින් පිටත්ව ගිය ඔවුන් දෙදෙනාට ලුස්ත්‍රාවේදී තිමෝතියස් නම් ග්‍රීක් කිතුනුවකු එක්වූ අතර (ක්‍රියා 16 : 1- 3) ජුදෙව් ධර්මදූත සේවයේදී ගැටළු මතු නොවන පිණිස පාවුලු විසින් ග්‍රීක් කිතුනුවකු වූ තිමෝතියස් චර්මච්ඡේදනය කරන ලදී.

• ආසියාවේ වචනය දේශනා නොකරන පිණිස ශුද්ධාත්ම මඟපෙන්වීම ලද අතර, පිරීගිය හා ගලාතිය මැදින් ගොස් බිතනියට යෑමද තහනම් කරන ලදී.

• එබැවින් ඔවුහු මිසිය හරහා ගොස් ත්‍රෝවසට පැමිණියහ.

### ත්‍රෝවස (ක්‍රියා 16 : 8 - 16)

• පාවුලු තුමා මෙහිදී දර්ශනයක් දුටුවේය.

• ආසියාව වෙනුවට යුරෝපයට යාමට එහිදී මඟපෙන්වීම ලැබීය.

• පාවුලු තුමාගේ ධර්මදූත සේවය ශුද්ධාත්ම මඟපෙන්වීම මත සැලසුම් කරන ලද බවට එය මනා සාක්ෂියකි.

• එහි ප්‍රතිඵලයක් ලෙස මසිදෝනියාවට ගමන් කරන ලදී. ධර්මදූත සේවය සඳහා ලූක් තුමා ඔවුනට එක්වීය.

• වෘත්තියෙන් වෛද්‍යවරයෙකු වූ ලූක් තුමාගේ සේවය සභාවට මහත් පිටිවහලක් වූ බව පැහැදිලිය.

**පිලිප්පිය (ක්‍රියා 16 : 11 - 12)**

මසිදෝනියාවේ ප්‍රධාන නගරය හා රෝම ජනපදයක් වූ පිලිප්පියේ බොහෝ ජුදෙව් ජනතාවක්ද වාසය කළහ.

**පළමු සිදුවීම (ක්‍රියා 16 : 13 - 15)**

• ලිදියා නම් තියාතිරා නුවරින් පැමිණි දම්පාට සායම් විකිණීමේ යෙදී සිටි බැතිමත් ස්ත්‍රියක් ගංඉවුරේ යාච්ඤා ස්ථානයේ දී පාවුලුට හා සීලස්ට හමුවූ අතර , ඈ දෙවියන් වහන්සේ තුළ බෞතිස්ම ස්නාපනය ලැබුවාය.

• පාවුලු තුමාගේ පිලිප්පි ධර්මදූත මෙහෙයේ කේන්ද්‍රස්ථානය ලෙස ඇගේ නිවස තෝරාගන්නා ලද්දේ ඇගේ ඉල්ලීම පරිදිය.

• ලිදියාගේ නිවසේ සභාව 'ගෘහස්ථ සභාවක් ' දක්වා වර්ධනය වූ බව සඳහන් වේ.

**දෙවන සිදුවීම (ක්‍රියා 16 : 16 - 22)**

• සිය ස්වාමිවරුන්ට බොහෝ ලාභ අත්කර දුන් ආත්මයක් ආවේශ වීමෙන් පේන කීමෙහි යෙදුණු වහල් ස්ත්‍රියක් ඔවුනට හමුවූ අතර, ඈ පාවුල් හා සීලස් ගැලවීමේ මාර්ගය ප්‍රකාශ කරන පරමෝත්තම දෙවියන් වහන්සේගේ දාසයන් ලෙස හඳුන්වන ලදී.

• පාවුලු එම ආත්මයට ඇගෙන් ඉවත්වීමට අණකළ අතර, සිය ආදායම් මාර්ගය නතර වූ බව දුටු ඇගේ ස්වාමිවරුන් විසින් සිය ආර්ථික ව්‍යාපාරය බිඳ වැටුණු බව දැක පාවුලුට හා සීලස්ට විරුද්ධව බොරු චෝදනා ඉදිරිපත් කළේය. ඔවුන් ප්‍රකාශ කළේ රෝමවරුන්වූ ඔවුනට පිළිගැනීමටවත් නොහැකි වූ නීති විරෝධී චාරිත්‍ර මොවුන් උගන්වන බවය.

• එබැවින්, ඔවුන් සිරගත කිරීමට කටයුතු කරන ලදී. ශුභාරංචිය වෙනුවෙන් පීඩා විඳීමේ අභියෝගයට ඔවුන් විසින් මුහුණදෙන ලදී.

**තෙවන සිදුවීම (ක්‍රියා 16 : 23 - 34)**

• සිරගෙයිදී පාද දඬු කඳන්වල ගසා බොහෝ රැකවල් මැද ඔවුන් තබන ලදී.

• දෙවියන් වහන්සේ තුළ දිරිය හා සවිය ලැබ මධ්‍යම රාත්‍රියේදී ගී ගයමින් උන්වහන්සේට ප්‍රශංසා කරමින් සිටි කල්හී හදිසියේ ඇතිවූ පොළොකම්පාවක් හේතුවෙන් සිරගෙය අත්තිවාරම් සෙලවී සිරගෙයි දොරටුව ඇරී සිරිකරුවන්ගේ බැඳුම් ලිහී සිරගෙයි මුලැදෑනියා සිරකරුවන් පැනගියේ යයි සිතා සියදිවි හානිකර ගැනීමට උත්සාහ කළ විට පාවුලු ඊට මැදිහත්ව ඔහු එයින් වලක්වා ගත්තේය.

• එවිට සිරගෙදර මුලැදෑනියා පාවුලු හා සීලස් ඉදිරියේ වැටී ගැලවීම ලබන පිණිස කළයුතු දෙය ඔවුන්ගෙන් විමසීය.

• ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහා ගන්නා ලෙස ඔවුන් පැවසීමෙන් සිරගෙයි මුලැදෑනියා හා ඔහුගේ පවුලේ අය ස්වාමින් වහන්සේ අදහා ගන්නා ලදී.

• ඔහු සහ ඔහුගේ පවුලේ අය බෞතිස්ම ස්නාපනය ලැබූ අතර, ශුද්ධාත්ම ප්‍රීතිය එම නිවසෙහි ඇතිවිය.

**සිව්වන සිදුවීම (ක්‍රියා 16 : 35 - 40)**

• නියමිත නඩු විභාගයකින් තොරව සිරගත කරන ලද රෝම පුරවැසියන් වූ පාවුලු හා සීලස් රහසින් සිරගෙයින් පිටත් කර හැරීමට එම නිලධාරීන් ක්‍රියාකළ අවස්ථාවේ පාවුලු ශුද්ධාත්ම දිරිය තුළ ඔවුන්ගේ අත්තනෝමතික ක්‍රියාකලාපයට විරුද්ධව නැගී සිටියේය.

• එවිට නඩුකාරයන්ම පැමිණ ඔවුන්ට කන්නලව් කර පිටත් කර හරින ලදී.

• ශුද්ධාත්ම මඟපෙන්වීම හා දිරිය තුළ දුක්විඳීමේ අභියෝගයට මුහුණදෙමින් ශුභාරංචි මෙහෙයේ යෙදීම විශේෂයෙන් පිලිප්පි ධර්මදූත සේවයේදී කැපීපෙනිණ.

### තෙසලෝනිකය (ක්‍රියා 17 : 1 - 9)

• සබත් දින තුනක් ධර්මශාලාවේ දේශනා කළ අතර ඊර්ෂ්‍යාවෙන් පිරුණ ජුදෙව්වරුන්ගෙන් බොහෝ සෙනඟක් දෙවියන් වහන්සේ අදහාගන්නා ලදී.
• ඒ අතර ග්‍රීක් ස්ත්‍රී පුරුෂ කීපදෙනෙක්ද වූහ. නමුත් ජුදෙව් පීඩනවලට මුහුණදීමට ඔවුන්ට සිදුවිය.
• මැරවරයන් යොදවා ජාසොන්ගේ නිවසෙන් පාවුල් පිටතට ගැනීමට තැත් කළ අතර, එසේ නොහැකිවූ විට ජාසොන් හා අනෙක් සහෝදරයන් අල්ලාගෙන නුවර මුලාදෑනින් ළඟට ඇදගෙන ගොස් 'ලෝකය පෙරළූ අය මෙහි පැමිණ සිටිතියි ප්‍රකාශ කළහ.
• එසේම ජේසුස් නම් වෙන රජෙක් ගැන ප්‍රකාශ කරමින් සීසර් අධිරාජ්‍යයාගේ නියෝග කඩකරතියි මොරගැසූහ.
• එසේ වුවත් ඔවුහු අධෛර්ය නොවී ධර්මදූත සේවයෙහි යෙදුණාහ.

### බෙරියාව (ක්‍රියා 17 : 10 - 16)

• තෙසලෝනිකයේ සිදුවූ ජුදෙව් පීඩන හේතුකොටගෙන සහෝදරයන් විසින් ඔවුන් බෙරියාවට පිටත් කර යැවූහ. එහි සිටි අය උදාර ගතිගුණ ඇත්තෝ වූහ.
• එහිදීද ඔවුහු නොසැලී බොහෝ ජනකායක් දහම් මගට ගෙනඒම සඳහා ධර්මශාලාවේ දේශනා කරන ලදී.
• එහි සිටි බොහෝ අය දවස් පතා ශුද්ධ ලියවිල්ල පිරික්සමින් මුළු සිතින් ධර්මය පිළිගත්හ.
• ග්‍රීක් කුල කාන්තාවන් හා පුරුෂයන්ගෙන් කිහිපදෙනෙක්ද, ජුදෙව්වරුන්ගෙන් සමහරෙක්ද, අදහා ගන්නා ලදී. ඊට විරෝධතාව දැක්වූ ජුදෙව්වරු මෙම නගරයේද විශාල කැළඹීමක් ඇති කළහ.
• කෙසේවුවත් සීලස් හා තිමෝතියස් මෙහි නැවතී තවදුරටත් ධර්මදූත සේවයෙහි යෙදිණ. පාවුලු ඇතන්ස් නගරය බලා ගමන් කරන ලදී.

### ඇතන්ස් (ක්‍රියා 17 : 16 - 34)

• දේව රූප වලින් පිරී තිබූ මෙම නුවර ධර්මශාලාවේ ජුදෙව්වරුන් හා භක්තිවන්තයන් සමඟද වෙළඳාම්පලේ හමුවූවන් සමඟද පාවුලු වාද කළේය.
• පාවුලු එපිකූරිය හා ස්තෝයික දාර්ශනිකයින් සමග වාද කිරීමෙන් එඩිතරව තම මතවාද ඔවුන් වෙත ඉදිරිපත් කළේය.
• එනම්, ජේසුස්වහන්සේ හා උන්වහන්සේගේ පුනරුජ්ජීවනය පිළිබඳවය.
• නව මතිමතාන්තර පිළිබඳව කථා බහ කරමින් හෝ ඒවාට සවන් දෙමින් ඔවුහු කල්ගත කළහ.
• බහු ආගමික නගරයක් මෙන්ම වාණිජ මධ්‍යස්ථානයක් හා සංස්කෘතික කේන්ද්‍රයක් වූ මෙම ඇතන්ස් නුවර මාර්ස් කන්ද මත පිහිටා තිබූ අරියෝපගය ශාලාවේ එක්රැස් වන උගතුන් ඉදිරියේ දේශනයක් මගින් ඔහු උගන්වන ධර්මය පහදා දීමට ඔහුට අවස්ථාව උදාවිය.
• ඒ සඳහා එහි තිබූ 'නාඳුනන දෙවියන්ටය' යන පූජාසනය හා ඇතන්ස් වාසීන්ගේ ආගමික හා දාර්ශනික මත සහ සාහිත්‍ය උපයෝගි කර ගැනීමට ඔහු අමතක නොකළේය.
• සිය ස්ථානෝචිත ප්‍රඥාව විදහා දක්වමින් දෙවියන්වහන්සේගේ මහඟු බලධාරිත්වය ඔහු සිය දේශනය තුළින් ඉස්මතු කළේය.

- ලෝකය හා එහි ඇති සියල්ල මවා වදාළ දෙවියන් වහන්සේ ස්වර්ගයටත් , පොළොවටත් ස්වාමින්ව සිටින බව.
- උන්වහන්සේ මිනිස් අතින් සාදන මාළිගාවල නොවසන බව.
- උන්වහන්සේ මිනිස් අත් වලින් උපස්ථාන නොලබන බව.
- උන්වහන්සේ සියල්ලන්ටම ජීවිතය, හුස්ම හා අන් සියල්ල ලබාදෙන බව.
- උන්වහන්සේ එක් මිනිසෙකුගෙන් සකල මිනිස් සංහතිය මවා වදාළ බව.
- දෙවියන්වහන්සේ ගැන හැඟීමකින්ද, හමුවන බලාපොරොත්තුවකින්ද යුතුව උන්වහන්සේ සොයන පිණිස නියමිත කාලයන්ද, වාසස්ථානවල සීමාද නියම කළ බව.

▫ අප දේව දරුවන් බව්
▫ උන්වහන්සේ පසුතැවීමට අපට ආරාධනා කරන බව.
▫ මිනිසා ධර්මිෂ්ඨකමින් විනිශ්චය කිරීමට එක දවසක් නියම කර ඇති බව.
▫ දෙවියන් වහන්සේ , ජේසුස්වහන්සේ මරණින් උත්ථාන කිරීමෙන් සියල්ලන්ට සහතිකයක් දී තිබෙන බව.වැනි වැදගත් අදහස් රාශියකින් එම දේශනය පිරිපුන් විය.

• පාවුලුගේ දේශනය පිළිබඳ විවිධ ප්‍රතිචාර පැවතියද, දමරිස් හා දියෝනිසියස් වැනි සමහර ඇතන්ස් වැසියන් දෙවිඳුන් අදහාගත් බව සඳහන් වේ.

• නිර්භීතව හා ප්‍රඥාවෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීමට පාවුලුතුමා දැරූ ප්‍රයත්නය කිතුනුවන්ට තමන්ගේ ධර්මදූතික වගකීම් ඉටුකිරීමෙහිලා ආදර්ශයකි.

### කොරින්තිය (ක්‍රියා 18 : 1 - 17)

• පාවුලුතුමාට ග්‍රීසියේ ප්‍රධාන ව්‍යාපාරික මධ්‍යස්ථානයක්වූ කොරින්තියේදී මෑතකදී එහි පැමිණි අකිලා හා ප්‍රිස්කිලා නම් ජුදෙව් යුවලක් හමුවිය.

• පාවුලුතුමා දැනසිටි හස්ත කර්මාන්තය වූ කූඩාරම් කර්මාන්තය එම යුවළගේද ජීවනෝපාය වූයෙන් දෙපිරිසටම එක්වී එකම කර්මාන්තයේ නියැලීමට අවස්ථාව උදාවිය.

• එසේම සියලු සබත් දිනවල ධර්මශාලාවේ වාදකර ජුදෙව් හා ග්‍රීක් බොහෝ සමූහයක් ඇදහිල්ලට පමුණුවා ගත්තේය. සීලස් හා තිමෝතියස් සමඟ එක්වෙමින් පාවුලුතුමා ජේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේම යැයි ජුදෙව්වරුන් වෙත සාක්ෂි දැරීය.

• ඔවුන් ඔහුට විරුද්ධව අපහසකළ විට පාවුලු ඔහුගේ වස්ත්‍රවල දූවිලි ගසා දමා 'ඔබගේම ලේ ඔබගේම හිස්පිට වැගිරේවා' මම නිදොස් වෙමි. මෙතැන් පටන් විජාතීන් වෙතට යමියි කීය.

• ඔහු එතැනින් තීතස් ජුස්තස් නම්, භක්තිවන්ත මිනිසෙකුගේ නිවසට යන ලදී.

• එක් රාත්‍රියක එතුමා දුටු දර්ශනයක් මගින් සමිඳාණන් වහන්සේ ඔහු සමඟ සිටින බවත්, ඔහු සියල්ලෙන් සුරකින බවත් කියමින් ඔහු දිරිමත් කරන ලදි.

• ඉන් සවිමත් වී වසර එකහමාරක් එම නගරයේ නතර වී ශුභාරංචි මෙහෙයේ යෙදීමට හැකියාව ලැබූ අතර, එසේ කිරීමෙන් බොහෝ ජනතාවක් දෙවියන්වහන්සේ වෙත දිනාගැනීමට එතුමා සමත්වියි

• විශේෂයෙන් තීතස් ජුස්තස් , ධර්මශාලා ප්‍රධානියාවූ ක්‍රිස්පස් හා ඔහුගේ පවුලේ අය සඳහන් කළ හැකිය.

• නමුත් ජුදෙව්වරු පාවුලුට විරුද්ධව නැඟී සිටිමින් ඔහු අකයියාවේ අධිපති වූ ගලියෝ වෙත ගෙනැවිත් පාවුලු දෙවියන්වහන්සේට හා ව්‍යවස්ථාවලියට විරුද්ධව නමස්කාරකිරීමට මිනිසුන් පොළඹවන බවට චෝදනා ඉදිරිපත් කළහ.

• නමුත් එය ව්‍යවස්ථාවලිය සම්බන්ධ ප්‍රශ්නයක් වූ බැවින්, ගලියෝ එය සැලකුවේ නැත.

• අකිලා සහ ප්‍රිස්කිලා පාවුලු තුමා සමග දහම් සේවාවේ නියැලුනේ කැපවීමෙනි. අපොල්ලොස්ට සැබෑ දහම පහදා දීමට පියවර ගත් අයුරු ආදර්ශවත්ය. (ක්‍රියා 18 : 26)

### කෙන්ක්‍රෙයාව (ක්‍රියා 18 : 18)

•මෙහිදී භාරයක් වෙනුවෙන් පාවුලු හිස මුඩු කරගැනීම විශේෂ ලක්ෂණයකි.

### එපීසය (ක්‍රියා 18 : 19 - 23)

එපීසයේදී අකිලා හා ප්‍රිස්කිලා නතර කොට එයින් නැව් නැග කායිසාරියට ගොඩබැස ජෙරුසලම බලා ගොස් නැවත සිරියාවේ අන්තියෝකියට ගමන් කරන ලදී.

• එය අභියෝග මැඩලමින් ශුද්ධාත්ම බලය තුළ ධර්මදූත සේවය නංවාලූ චාරිකාවක් විය.

## <u>පාවුලු තුමාගේ තුන්වන ධර්මදූත චාරිකාව (ක්‍රියා 18 : 23 - 21 : 30)</u>

| | | |
|---|---|---|
| චාරිකාවට සහභාගී වූ අය | - | පාවුලු , සීලස් , තිමෝතියස් , එරස්තස් , තීතස් |
| කාලය | - | ක්‍රි.ව. 53 - 58 දක්වා |
| චාරිකාවේ අරමුණ | - | ස්ථාපිත කල සභාවන්ගේ වර්ධනය විමසීම හා එම සභා සාමාජිකයන් දිරිමත් කිරීම |

චාරිකාවට අයත් ප්‍රදේශ - සිරියාවේ අන්තියෝකිය ⇒ ගලාතිය ⇒ පිරිගිය ⇒ එපීසය ⇒ (කේන්ද්‍රීක නගරය) මසිදෝනිය ⇒ පිලිප්පිය ⇒ ත්‍රෝවස ⇒ මිලේතසය ⇒ තීර් ⇒ කායිසාරිය ⇒ ජෙරුසලම

**ගලාතිය හා පිරිගිය (ක්‍රියා 18 : 23)**

මෙම නගර හා පළාත්වලට ගමන් කළ පාවුල්තුමා එහි සිටි ශ්‍රාවකයන් දිරිමත් කළ බව සඳහන් වේ.

**එපීසය (ක්‍රියා 18 : 24 - 19 : 41)**

- එපීසය ආසියාවේ රෝම පාලනය තුළ අගනුවරක් විය.
- වඩාත් වැදගත් ව්‍යාපාරික නගරයක් වූ මෙහි ලොව පුදුම හතෙන් එකක් සේ සැලකෙන අර්තේමිස් හෙවත් ඩයනා දෙවඟන නමින් තනා ඇති දේවාලයක් ඉදිකර ඇත.
- මේ හේතුවෙන් බොහෝ සංචාරක පිරිස් මෙම නගරයට ඇදී ඒම දැකිය හැකි විය.

## පළමු සිදුවීම

- එපීස නගරයේදී අකිලා හා ප්‍රිස්කිලා විසින් ව්‍යක්ත කථිකයෙකු හා බහුශ්‍රැත දේශකයෙකු වූ අපොල්ලොස් නමැති ඇලෙක්සැන්ඩ්‍රියාවේ උපන් ජුදෙව්වරයෙකුට ධර්මය පහදා දෙන ලදි.
- ඔහු ස්වාමින්වහන්සේගේ මාර්ගය ගැන ඉගෙනීම ලැබුවද, දැන සිටියේ ස්නාවක ජොහාන්ගේ බෞතිස්ම ස්නාපනය පමණි.
- අකිලා සහ ප්‍රිස්කිලා ඔහු දේව වචනය දේශනා කිරීමට සුදුසු ලෙස දේව වරප්‍රසාදයෙන් පෝෂණය කළහ.
- ඔහු ග්‍රීසියට ගොස් ජේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව පෙන්වා දෙමින් නිර්භීතව ජුදෙව් තර්ක බිඳහෙළීය.

## දෙවන සිදුවීම

- ස්නාවක ජොහාන් තුමාගේ ශ්‍රාවකයින් දොළොස්දෙනෙකු එපීසයේදී පාවුලු තුමාට හමුවිය.
- ඔවුන් දැනසිටියේ ස්නාවක ජොහාන්ගේ බෞතිස්ම ස්නාපනය පමණි. ශුද්ධාත්මයාණන් වහන්සේ පිළිබඳව පවා ඔවුහු දැන නොසිටියහ.
- පාවුලු තුමා ඔවුන්ට ශුභාරංචිය දේශනා කොට ඔවුන් බෞතීස්ම ස්නාපනය කිරීමෙන් ශුද්ධාත්ම ක්‍රියාකාරීත්වයට ඔවුන් විවෘත කරන ලදී.
- තවද පාවුලු ධර්මශාලාවට ඇතුල්වී තුන් මසක් නිර්භීත ලෙස තර්ක කරමින් දේව වචනය දේශනා කළද සමහර අය තම මුරණ්ඩුකම හේතුවෙන් සත්‍යයේ මග අත්නොදැක්කාහ.
- එවිට පාවුලු තුරාණුස්ගේ ශිල්ප ශාලාවට දවස්පතා ගොස් එහි තර්ක කරමින් බොහෝ ජුදෙව්වරුන් හා ග්‍රීක්වරුන් සමූහයක් වෙත ශුභාරංචිය ත්‍යාග කළේය.

## තුන්වන සිදුවීම

- නායක පූජකවරයෙකු වූ 'ස්කේවා' නම් පූජකවරයාගේ පුතුන් හා සංචාරක යකැදුරන් සම්බන්ධ සිදුවීමකට එපීසයේදී පාවුලු තුමාට මුහුණදීමට සිදුවිය.
- පාවුලු තුමා අතින් සිදුවන ප්‍රාතිහාර්යය දැක තමන්ද ජේසුස් වහන්සේගේ නාමය භාවිතා කොට ප්‍රාතිහාර්ය සිදුකිරීමට යාමෙන් දුෂ්ඨාත්මය ඔවුනට හිරිහැර කිරීම නිසා විශාල අර්බුදයකට ඔවුනට මුහුණදීමට සිදුවූ ආකාරය පිළිබඳව ක්‍රියාපොත සාක්ෂි දරයි. මෙම සිදුවීමෙන් එපීසය පුරා සිටි ග්‍රීක්වරුන් තුළ විශාල බියක් ඇති විය.
- ජේසුස් ස්වාමීන් වහන්සේගෙ නාමයටද ගෞරව ඇති විය.
- ඔවුන්ගේ ජීවිත වල ඇති වූ වෙනස පැහැදිලිය.

  තමා යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වල යෙදී සිටි බව ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීමෙන්
  රිදී මිල 50000 ක් පමණ වටිනා තමන්ගේ යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් පොත්පත් සියල්ලන් ඉදිරියේ පුළුස්සා දැමීමෙන් පැහැදිලි වේ.

**හතරවන සිදුවීම.**

• පාවුලු තුමා 'අතින් සෑදූ දෙවිවරු දෙවිවරු නොවේය' යනුවෙන් දේශනා කිරීම හේතුවෙන් අර්තේමිස් (ඩයනා) දෙවඟනගේ රිදී රූප අලෙවිය පහත වැටිණි.

• මේනිසා දෙමෙත්‍රියස් නම් රිදී රූප කලාකරුවාගේ ව්‍යාපාරයට මහත් ගැටලු ඇතිවිය.

• එවිට පාවුලුට විරුද්ධව එපීසයේ විශාල කෝලාහලයක් ඇතිවූ අතර, මහත් ප්‍රයත්නයකින් පසු ස්ථානෝචිත පියවර ගනිමින් නගර සභා ලේකම් තැන විසින් කෝලාහලය සංසිඳුවන ලදී.

• ඉන් අධෛර්‍යමත් නොවූ පාවුලු එපීසයේ ශ්‍රාවකයින් කැඳවා ඔවුන් දිරිමත් කොට ඔවුන්ගෙන් සමුගත්තේය.

**මසිදෝනිය ඔස්සේ ග්‍රීසියට (ක්‍රියා 20 ׃ 1 - 3)**

එහි තුන්මසක් ගතකල අතර ජුදෙව් කුට උපායයන්ට මුහුණදීමට සිදුවිය.

**නැවත මසිදෝනිය හරහා පිලිප්පියෙන් නැව් නැගී ත්‍රෝවසට (ක්‍රියා 20 ׃ 4 - 12)**

• ඔවුහු අනෙකුත් ශ්‍රාවකයන් සමග ත්‍රෝවසයෙහි සත්දිනක් නැවතී සිටියහ.

• සතියේ පළමුවැනිදා රොටි කඩන්නට ඔවුන් රැස්වූ විට පාවුලු මැදියම් රැය දක්වා ඔවුනට ශුභාරංචිය දේශනා කළේය. බර නින්ද නිසා ඔවුන් සිටි උඩුමහලේ තුන්වැනි මහලින් බිමට වැටී මරණයට පත්වූ යුතිකස් නම් තරුණයෙකුට පාවුලු විසින් නැවත පණ ලබාදෙන ලදී.

• එය පාවුලු තුමා මගින් ශුද්ධාත්ම දෙවිඳුන් ඉටුකළ බලවත් ප්‍රාතිහාර්යයකි.

• එම සිදුවීමට පසු නැවත උඩුමහලේ රොටි කැඩීමේ කෘත්‍යය ඉටුකිරීමට ඔහුට හැකිවිණි.

**මිලේතසය (ක්‍රියා 20 ׃ 13 - 21 ׃ 2)**

• මිලේතසය පිහිටා ඇත්තේ එපීසයට දකුණෙනි.

• පාවුලු මෙම නගරයට පැමිණි පසු එපීසයේ සභා මූලිකයන් කැඳවා දීර්ඝ දේශනයක් පවත්වා ඔවුන්ගෙන් සමුගත්තේය.

• එම දේශනයෙන් එතුමා බොහෝ කරුණු ඉස්මතු කළේය.

▲ තමා යටහත්පහත් කමින්ද, ශෝකයෙන්ද ජුදෙව්වරුන්ගේ උපායයන් නිසා පැමිණි දුෂ්කරතාවලින්ද, යුක්තව ස්වාමින් වහන්සේට සේවය කළ බව.

▲ වැඩදායක දෙය පවසමින් හා ගෙයින් ගෙයට යමින් උගන්වමින් මනස්ථාපනයෙන් දෙවිඳුන් වෙත හැරෙන ලෙසත්, ස්වාමීන් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරන ලෙසත්, ජුදෙව්වරුන්ට හා අන්‍ය ජාතිකයින්ට තදින් අනුශාසනා කළ බව.

▲ තම අනාගතය පිළිබඳ ඇති අවිනිශ්චිතතාවය

▲ශුද්ධාත්මයාණන් වහන්සේ මගින් ලැබූ මඟපෙන්වීම්

▲ තම ජීවිත අගය තුළ දිවිගෙවීමට වඩා දෙවියන් වහන්සේගේ කරුණාවේ ශුභාරංචියට සාක්ෂි දීමෙන් ස්වාමීන් වන ජේසුස් වහන්සේගෙන් පැවරුණු දූත මෙහෙය සපුරාලීම වැදගත් වන බව.

• මෙය ඉතා හැඟුම්බර අවස්ථාවක් විය.

• මින් මතු තවත් ඔහුගේ මුහුණ නොදකින බව කීම එයට හේතුව වන්නට ඇත.

• සභා නායකයන්ට උපදෙස් දීමටද එතුමා අමතක නොකළේය.

**තීර්**

• මෙහිදී පාවුලු ශ්‍රාවකයන් සමග සත්දිනක් නැවතී සිටියේය.

• ඔවුන් ශුද්ධාත්ම මගපෙන්වීම ඇතිව ජෙරුසලමට නොයන ලෙස පාවුලු ගෙන් අයැද සිටින ලදී.

• පාවුලුට සමුදීම සඳහා ශ්‍රාවකයන් සිය පවුල්වල අය සමග මුහුදු වෙරළට පැමිණි බව සඳහන් වේ.

**කායිසාරිය**

• දිවැස් වැකි කීමේ වරයලත් කන්‍යා දූවරුන් හතර දෙනෙකු සිටි, උපස්ථායක කණ්ඩායමේ සාමාජිකයෙකු හා ධර්මදූතවරයෙකු වූ පිලිප් සමඟ ඔහුගේ නිවසේ පාවුලු නවාතැන් ගත්තේය.

• එම නිවසේදී අගබස් නම් ජුදයෙන් පැමිණි එක් දිවැසිවරයෙකු ඔහුට හමුවූ අතර, ඔවුහු පාවුලුට අයත් ඉඟපටියෙන් තම අත්පා බැඳගනිමින් ශුද්ධාත්ම මඟපෙන්වීම ඇතිව පාවුලු ජෙරුසලමේදී විජාතීන් වෙත පාවාදෙනු ලබන බවට අනාවැකියක් ප්‍රකාශ කළේය.

• මෙම දිවැස් වැකිය හේතුවෙන් බොහෝ වේදනාවට පත්වූ පාවුලු ගේ හිතවත් ශ්‍රාවකයින් ජෙරුසලමට නොයන ලෙස ඔහු වෙත කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප වූයේ ශුභාරංචිය වෙනුවෙන් පරිත්‍යාගශීලි වීමට ඔහු තුළ තිබූ දැඩි අධිෂ්ඨානය නිසාය.

**ජෙරුසලම**

සියලුම ගෝලයන් විසින් ජෙරුසලමට පැමිණි පාවුලු තුමා සාදරයෙන් පිළිගන්නා ලදී.

• එකල සභාවේ ප්‍රධානියා ලෙස ක්‍රියාකළ ජාකොබ් හමුවී ඔහුට තම සේවය පිළිබඳ සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීමට පාවුලු අමතක නොකළේය.

• ඒ පිළිබඳව එම ස්ථානයේ සිටි සැමදෙනා දෙවියන් වහන්සේට තුති පිදූහ.

• ඊට පසුදින පාවුලු සියලු පවිත්‍රවීමේ වත් පිළිවෙත් ඉටුකිරීම සඳහා ජෙරුසලමේ දේව මාළිගයට ඇතුලු විය.

• එහිදී එම වත් පිළිවෙත් ඉටුකල පසු ආසියාවෙන් පැමිණි ජුදෙව්වන් විසින් මුළු නුවර කලඹා පාවුලුට විරුද්ධව බොරු චෝදනා ඉදිරිපත් කොට පාවුලු අත්අඩංගුවට ගනු ලැබීය.

• ශු.පාවුලු තුමා ජීවිත පරිත්‍යාගයෙන් ශුභාරංචිය විජාතීන් අතර මෙන්ම ජුදෙව්වන් අතරද පතල කිරීම සඳහා දැරූ ප්‍රයත්නය අතිශ්‍රේෂ්ඨ වේ.

<u>**පාවුලු තුමාගේ ජීවිතයෙන් කිතුනුවන්ට චරිතායනය කළ හැකි ගුණාංග**</u>

| | | | |
|---|---|---|---|
| 1. නිර්භීත බව | 2. නොපසුබට වීර්යය | 3. කැපවීම. | 4.අවංක බව |
| 5. දේවගරුබිය | 6. ප්‍රඥාව | 7. සත්‍යවාදී බව | 8.අධිෂ්ඨානශීලිත්වය |
| 9. අනන්‍යයන් වෙත සංවේදී බව | | 10. පරිත්‍යාගශීලි බව | |

<u>**පාවුලු තුමාගෙන් කිතුනුවන්ට ආදර්ශ**</u>

1. එඩිතරව ශුභාරංචිය වෙනුවෙන් කැපවීමට
2. ශුභාරංචිය පතල කිරීම සඳහා නොපසුබට වීර්යයෙන් ක්‍රියාකිරීමට තම කුසලතා ඒ සඳහා පූර්ණව යෙදීමට
3. නිරතුරුවම දේව කැමැත්ත සෙවීමට
4. දෙවිඳුන්ට හිමි ගෞරවය උන්වහන්සේට නොපසුබටව පුද කිරීමට
5. ශුභාරංචිය වෙනුවෙන් දුක්පීඩා විඳීමට සිදුවුවද ඒවාට දිරියෙන් මුහුණදීමට
6. සැමවිටම , කුමන පසුබිමකදී වුවද දෙවිඳුන් පසසමින් උන්වහන්සේට නමස්කාර කිරීමට
7. ලෞකික දේ පිළිබඳ ආශා නොවීමට
8. අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහා වැඩ කිරීට
9. දුබලයන්ට උපකාර කිරීමට කැපවීට
10. නිරතුරුවම යාච්ඤාවේ යෙදීමට

පාවුලුතුමා කිතුනුවන්ට ආදර්ශයක් ගෙන දෙයි.

### 4.3.3 ශු.පාවුලු තුමාගේ ලිපි / සංදේශ වර්ගීකරණය

• සාමාන්‍යයෙන් ලිපියක් හා සංදේශයක් යන වදන් එකම අරුතකින් භාවිත වේ.

• නමුත් ගැඹුරින් විග්‍රහ කර බැලීමේදී ලිපියක් හා සංදේශයක් අතර වෙනසක් දක්නට ලැබේ. බොහෝදුර බැහැර වෙසෙන පුද්ගලයන් දෙදෙනකු අතර තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ලිපි භාවිත කෙරේ.

• ලිපියක අඩංගු තොරතුරු බොහෝ පෞද්ගලික වේ.

• ලියන හා ලබන තැනැත්තන් හඳුන්වා දෙයි. (නමින් ආමන්ත්‍රණය කරයි.) එහි කරුණු ප්‍රසිද්ධ නොකරයි. ලිපියක් මගින් නිදහස් අදහස් ඕනෑම ප්‍රමාණයක් ඉදිරිපත් කළ හැකිය.

• මෙහිදී ලිපිය යන්න පොදු වශයෙන් අදහස් , ඉගැන්වීම් , අවවාද අනුශාසනා ඉදිරිපත් කිරීමේ මාධ්‍යයක් ලෙසින් සැලකිණ.

• සමහර ලිපි කෙටිය. ඉතා පෞද්ගලික ලෙසින් සම්පාදනය වී ඇත. (පිලමොන්) සමහරක් ඒවා තුළින් ගැඹුරු තර්කානුකූල අදහස් ඉදිරිපත් වීම දැකිය හැකිය. (රෝම , 1 කොරින්ති)

• සංදේශයක් ඉදිරිපත් කරන ක්‍රමය ලිපියකට සමාන වෙයි.

• නමුත් ලිපියක්ට වඩා එයින් සාහිත්‍යම වටිනාකමක් හුවා දක්වයි. බොහෝවිට දේශනයක් , සංවාදශීලි වාර්තාවක් සංදේශයක් මගින් එළිදැක්වේ.

• යම් සිදුවීමක්, අවස්ථාවක් හෝ පුද්ගලයකු පිළිබඳ පොදු පණිවුඩයක් එමගින් ඉදිරිපත් කෙරේ. පෞද්ගලික එක් අයකු වෙත ඉදිරිපත් කෙරෙන කරුණුවලට වඩා යම් කණ්ඩායමකට යම් විශේෂිත අරමුණක් අරබයා යැවෙන පොදු පණිවුඩයක් සංදේශයක් තුළින් දැකිය හැකිය.

• ඒ තුළ අවවාද, අනුශාසනා , වාද , විවාද බොහොමයක් අන්තර්ගත වන බව පැහැදිලි වේ.

• මේ අනුව පාවුලුතුමාගේ හසුන්පත් සංදේශ වශයෙන් හඳුන්වාදිය හැකිය.

• එතුමා විසින් රචනා කරන ලදැයි සැලකෙන සංදේශ 13 ක් නව ගිවිසුමට ඇතුළත් වේ.

• විවිධ අරමුණු අරබයා පාවුලු තුමා එම සංදේශ රචනා කර ඇත.

• නව ගිවිසුමේ පළමු කෘතිය වන්නේ පාවුලු තුමා තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමු සංදේශය බව විශාරද මතයයි.

#### පාවුලු තුමාගේ සංදේශවල දක්නට ලැබෙන ලක්ෂණ

1. යම් විශේෂ අවස්ථාවක් / සිදුවීමක් / පුද්ගලයකු මුල්වී තිබීම.
2. පොදු කණ්ඩායමක් බොහෝවිට ඉලක්ක කිරීම.
3. සභාවන්හි අධ්‍යාත්මික වර්ධනය සඳහා උපදෙස් දීම.
4. පාවුලු තුමා ඔවුන් සමඟ සිටින බවට සහතිකයක් පිරිනැමීම.
5. පාවුලු තුමාගේ ජුදා උරුමය අවධාරණය කිරීම.
6. දේශනාවාදී ස්වරූපයෙන් ලියා තිබීම.
7. කිතුනු සංඝවල වගකීම ගෙනහැර දැක්වීම.
8. කිතුනු සත්‍යතා සදාතනික පණිවුඩයක් ලෙස ඉදිරිපත් කිරීම.
9. විශේෂ ප්‍රාර්ථනයක් නිරතුරුව ඉදිරිපත් කිරීම.
10. ගීතිකා හා ගීතිකා කොටස් යොදා තිබීම. (උදා : පිලිප්පි 2 : 6- 11)
11. කෙටි අනුශාසනා යෙදීම. (උදා : රෝම 1 : 10 - 0)
12. ජන වන්දනාවේ භාවිත වන වාක්‍ය ඛණ්ඩ යෙදීම. (උදා : 1 කොරින්ති 11 : 24 - 25)

• විශේෂයෙන්ම දක්ෂ කථිකයකු වූ පාවුලු තුමා තමාගේ අවබෝධ රටාවට අනුව තමාට පෞද්ගලික යා නොහැකි පරිසරවලට ලේඛනයෙන් ශුභාරංචිය ඉදිරිපත් කිරීමට දරා ඇති ප්‍රයත්නය අති ප්‍රශංසනීයය.

• පෞද්ගලික ලිපි හෝ පොදු සංදේශ යන දෙවර්ගයටම අයත් හසුන්පත් වර්තමාන කිතුනුවන්ටද භාවිතයට ගත හැකි අයුරින් එතුමා ඉදිරිපත් කර ඇත.

• ග්‍රීක රෝම සම්බන්ධකමක් ඇති සෙමිතික් ක්‍රමයට සමාන ලෙස මෙම හසුන්පත් ලියා ඇති බව පිළිගැනේ.

## පාවුලු තුමාගේ සංදේශ වර්ගීකරණය

ශු.පාවුලු තුමා විසින් ලියන ලදැයි සැලකෙන සංදේශ / හසුන්පත් 13 කි. ඒවා ශු.බයිබලයේ නව ගිවිසුමේ දැක්වෙන අනුපිළිවෙලින් පහත දැක්වේ.

(i) රෝමවරුන්ට ලියන ලද හසුන
(ii) කොරින්තිවරුන්ට ලියන ලද ප්‍රථම හසුන
(iii) කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුන
(iv) ගලාතිවරුන්ට ලියන ලද හසුන
(v) එපීසවරුන්ට ලියන ලද හසුන
(vi) පිලිප්පිවරුන්ට ලියන ලද හසුන
(vii) කොලොස්සිවරුන්ට ලියන ලද හසුන
(viii) තෙසලෝනිකවරුන්ට ලියන ලද ප්‍රථම හසුන
(ix) තෙසලෝනිකවරුන්ට ලියන ලද දෙවන හසුන
(x) තිමෝතියස්ට ලියන ලද ප්‍රථම හසුන
(xi) තිමෝතියස්ට ලියන ලද දෙවන හසුන
(xii) තීතස්ට ලියන ලද හසුන
(xiii) පිලමොන්ට ලියන ලද හසුන

පාවුලු තුමා විසින් ලියන ලද සංදේශ ලියැවුණු කාලය අනුව වර්ගීකරණය

**සංදේශ 13**

ක්‍රි.ව. 51 - 53
- ★ 1 තෙසලෝනික
- ★ 2 තෙසලෝනික

ක්‍රි.ව. 54 - 58
- ★ 1 කොරින්ති
- ★ 2 කොරින්ති
- ★ ගලාති
- ★ රෝම

ක්‍රි.ව. 61 - 63
- ★ පිලිප්පි
- ★ කොලොස්සි
- ★ එපීස
- ★ පිලමොන්

ක්‍රි.ව. 65 - 67
- ★ තීතස්
- ★ 1 තිමෝති
- ★ 2 තිමෝති

පාවුලු තුමා විසින් ලියන ලද ලිපි / සංදේශ කර්තෘත්වය අනුව වර්ගීකරණය

**සංදේශ 13**

පාවුලුතුමා අතින්ම ලියූ බව සැලකෙන
- ★ 1 තෙසලෝනික
- ★ ගලාති
- ★ පිලිප්පි
- ★ 1 කොරින්ති
- ★ 2 කොරින්ති
- ★ රෝම
- ★ පිලමොන්

ලේඛකයකු මගින් ලියැවුණු හෝ එතුමා ලිව්යැයි සැකකරන
- ★ 2 තෙසලෝනික
- ★ කොලොස්සි
- ★ එපීස

පාවුලුතුමාගේ මරණින් පසු එතුමාගේ ශ්‍රාවකයින් විසින් එතුමාගේ අදහස් අනුසාරයෙන් ලියන්නට ඇතැයි සිතන
- ★ 1 තිමෝති
- ★ 2 තිමෝති
- ★ තීතස්

## පාවුලු තුමාගේ සංදේශ / සංදේශවල සැලැස්ම (ආකෘතිය)

පාවුලු තුමාගේ ලිපි වල පොදු වශයෙන් ග්‍රීක රෝම සාහිත්‍යමය අංග ඇසුරෙන් කරුණු පැහැදිලි කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කර. ඇති බව පැහැදිලිව පෙනේ.

(i) සංදේශයේ ආමන්ත්‍රණය- යවන්නා සහ ලබන්නාගේ නම් සඳහන් කරයි.

(ii) කෙටි ආචාරයක් හෝ සුබ පැතීමක් - ලබන්නාගේ පරිසරයට යෝග්‍ය ආචාරයක් හෝ සුබපැතීමක් සඳහන් වේ

(iii) තුතිදීමක් හෝ යාච්ඤාවක් - සංදේශය ලිවීමේ අරමුණ සඳහන් කර ඒ පිළිබඳව තුතිපිදීමට හෝ යැදුමකින් දක්වීමට උත්සුක වී ඇති

(iv) පණිවුඩය - ධාර්මික ඉගැන්වීම් හා අනුශාසනා ලෙස කොටස් දෙකකින් ඉදිරිපත් කරයි

(v) අවසානය හා සුබ පැතුම , ආශිර්වාද යැදුම මෙයින් බොහෝවිට ඉදිරිපත් කරනුයේ පෞද්ගලික තොරතුරු හා විනය සම්බන්ධ සරල එහෙත් විශේෂ අනුශාසනාවකි. අවසාන ප්‍රාර්ථනයෙන් විශේෂ ආශිර්වාදයක් පිරිනමයි.

## ලිපි / සංදේශ පිළිබඳ තොරතුරු

### රෝමවරුන්ට ලියන ලද හසුන (ක්‍රි.ව. 57 - 58 අතර)

මෙම ලිපිය පාවුලු තුමා විසින් රෝමයේ විසූ කිතුනුවන්ට සිය තුන්වන ධර්මදූත චාරිකාවේදී ලියන ලදැයි සැලකේ. ධාර්මික ලියවිල්ලක ස්වරූපය දරන මෙය , රෝමයට යෑමට පෙර එතුමා ලියූ වැදගත් සංවිධානාත්මක සංදේශයක් බව බොහෝදෙනාගේ පිළිගැනීමයි. මෙය එතුමාගේ සංදේශ අතුරෙන් දිගම සංදේශය වේ. එතුමා එය බොහෝවිට කොරින්ති නගරයේ සිට රචනා කරන්නට ඇති බව පැවසේ.

### ලිවීමේ අරමුණ

සිය පැමිණීම රෝමවරුන්ට දැන්වීමටත් , ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුළ විශ්වාසය තැබීමෙන් විජාතීන්ට අත්වන ගැලවීම පිළිබඳ දැන්වීමටත් මෙය ලියා ඇත.

### තේමාව

ක්‍රිස්තුස්වහන්සේ හා උන්වහන්සේගේ ශුභාරංචිය කෙරෙහි විශ්වාසය තබන ඕනෑම අයකු දෙවියන් වහන්සේගේ අනන්ත කරුණාව මගින් ගැලවීම ලබන බව (රෝම 1 : 16 - 17)

### විශේෂ කරුණු

1. දෙවියන් වහන්සේගේ සත්‍යවාදී බව ප්‍රකාශ වන්නේත් අවබෝධ කරගත හැකි වන්නේත් ක්‍රිස්තුස් වහන්සේ මගිනි.
2. ශුභාරංචියේ අර්ථය නම් ජුදාගම හා කිතුදහම අතර ඇති සබඳතාවයයි.
3. ක්‍රිස්තු ධර්මයේ අර්ථය නම් විශ්වාසය ඇති සියලුදෙනාටම ගැලවීමත් , දේව බලයත් වන්නේ ශුභාරංචිය බවයි.
4. දෙවියන් වහන්සේගේ කරුණාව සදාකාලිකය. එය සියල්ලන්ටම විවෘතය.

## කොරින්තිවරුන්ට ලියන ලද ප්‍රථම හසුන (ක්‍රි.ව. 54 - 56)

ශු.පාවුලු තුමාගේ තෙවන ධර්මදූත චාරිකාවේදී කොරින්තියේ සිටි කිතුනුවන්ට ලියූ මෙය 'ධර්මදූත හසුනක්' ලෙස හැඳින්වේ. එපීසයේදී ලියන ලදැයි විශ්වාස කෙරේ. සොස්තේනස්ද මෙය ලිවීමට හවුල් වූ බව පිළිගැනේ.

## ලිවීමේ අරමුණ

• විශාල හා වැදගත් වෙළඳ නගරයක් ලෙස ප්‍රසිද්ධියට පත් කොරින්තියේ බොහෝ දුෂ්ටකම් හා අනාචාරකම් මැද දිවිගෙවූ කිතුනුවන්ට ශුභාරංචිය නිවැරදි ආකාරයට වටහාගනිමින් සිය විශ්වාස , සාරධර්ම , විවාහය සුරකිමින් සත්‍ය හෘද සාක්ෂියකින් යුත් නියම කිතුනු ජීවිතයක් ගත කිරීම සඳහා උපදෙස් දීමට මෙම සංදේශය රචනා කර ඇත.
• බහු ආගමික පරිසරයක් තුළ කිතුනු ඉගැන්වීම් නිවැරදි ලෙස ඉදිරිපත් කිරීමට ගත් වෑයමක් මෙහි දිස්වේ.

## තේමාව

ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ නමැති අත්තිවාරම මත ගොඩ නැගුණු දේවරාජ්‍යය (1 කොරින්ති 3 : 11)

## විශේෂ කරුණු

1. ශුද්ධාත්ම දීමනා තුළ සැබෑ ප්‍රේමය කරා ගමන් කළ යුතුය.
2. නව ආරම්භයක් ඇතිකළ නව ආදම් ක්‍රිස්තුස් වහන්සේය.
3. විවාහයේ ශුද්ධවන්ත බව සුරැකිය යුතුය.
4. කිතුනු සභාව ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් බිහිවියි

## කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුන (ක්‍රි.ව. 57 දී පමණ)

• තෙවන ධර්මදූත චාරිකාවේදී පාවුලු තුමා හා තිමෝතියස් විසින් ලියා ඇති බව පිළිගැනේ.

• මසිදෝනියේ නුවරක් වූ පිලිප්පි නුවර සිට ලියා ඇත.

• කොරින්තියේ සියලුම කිතුනුවන් හා අකයියාවේ ස්වාමින් වහන්සේ පිළිගත් සියලුම ජනතාව අරමුණු කර ඇත.

• කොරින්තියට යැවූ ප්‍රථම ලිපිය නිසා හටගත් ආරවුල නිරාකරණය කිරීම සඳහා මෙමඟින් උත්සාහ දරා ඇත.

• පාවුලු තුමා පුරාණ ගිවිසුමද පදනම් කරගෙන ගැඹුරු ධාර්මික අදහස් පැහැදිලි හා තර්කානුකූල ලෙස ඉදිරිපත් කරයි.

## ලිවීමේ අරමුණ

පාවුලු තුමා ක්‍රිස්තුස් වහන්සේ විසින්ම යවන ලද අපෝස්තුළුවරයා බව තහවුරු කිරීමටත්, කොරින්ති ජනතාව හමුවීමට පාවුලු තුමා තුළ තිබූ දැඩි ආශාව ප්‍රකාශ කිරීම සඳහාත් මෙම හසුන ලියා ඇත.

## තේමාව

ක්‍රිස්තුස් වහන්සේට විශ්වාසවන්තව සේවය කිරීමෙන් විඳීමට ඇති දුක් කරදර බොහෝ වුවද ඒවා දරා ගැනීමට උන්වහන්සේ උපකාර කරන බව. (1 කොරින්ති 11 : 21 - 32)

## විශේෂ කරුණු

1. පාවුලු තුමා ශුභාරංචිය ව්‍යාප්ත කිරීම සඳහා තමා සතු සියල්ල ත්‍යාජකර ඇති බව ප්‍රකාශ කරයි.
2. මාංශය තුළ ක්‍රිස්තුස් වහන්සේගේ මරණය හා උත්ථානයේ අභිරහස ජීවත් කරවීම වැදගත් වේ.
3. ශුද්ධාත්මයාණන් වහන්සේ මිනිස් හදවත තුළ ක්‍රියාකරන සේක.
4. මිනිසා මිනිසා සමඟත් , දෙවියන් වහන්සේ සමඟත් සමගි කරවීම අත්‍යවශ්‍ය වේ.

## ගලාතිවරුන්ට ලියන ලද හසුන (ක්‍රි.ව. 54 - 66)

• සුළු ආසියාවේ මධ්‍යම ප්‍රදේශයේ පිහිටි නගරයක්වූ ගලාතියේ කිතුනු සංඝ කිහිපයකට ලියන ලද වැදගත් ධර්මදූත හසුනකි.

• තුන්වැනි ධර්මදූත චාරිකාවට සම්බන්ධ මෙම හසුන සිරියාවේ අන්තියෝකියේදී හෝ එපීසයේදී ලියන්නට ඇතැයි සැක කෙරේ. පාවුලු තුමා හා එතුමාගේ හිතවත් සහෝදරයන් විසින් ලියා ඇති බව පිළිගැනේ.

## ලිවීමේ අරමුණ

ජුදෙව්වන් විසින් පාවුලු තුමාට එරෙහිව එල්ල කර ඇති විවිධ චෝදනා හේතුවෙන් ඇදහිල්ල චංචලභාවයට පැමිණ සිටින ගලාතිවරුන්ට සත්‍ය පහදා දීම සඳහා මෙය ලියැවී ඇත.
• පුරාණ ගිවිසුමේ ඉගැන්වීම් නිවැරදිව වටහාගෙන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ගැලවීමදායක නිවහල් බවේ සුපුවත නිසි ලෙස වටහා ගැනීමට මඟපෙන්වීමක් කෙරේ.

## තේමාව

කිතුනුවකු වීම සඳහා ජාතිය වැදගත් නොවන බව

## විශේෂ කරුණු

1. දේවදරුවන්ට නිදහස ලැබී ඇත්තේ ක්‍රිස්තුස් වහන්සේ පාපයෙන් අප මුදාගත් හෙයිනි.
2. ශුභාරංචිය ක්‍රිස්තුස් වහන්සේම වේ.
3. ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහන්නා පාපයෙන් මුදාලන අතර ඔහු වෙත ශුද්ධාත්මයාණන් වහන්සේ වැඩම කරන සේක.
4. ක්‍රිස්තුස් වහන්සේ තුළ කිසිදු භේදයක් නැත. සියල්ලෝම එක සමාන වෙති.

## එපීසවරුන්ට ලියන ලද හසුන (ක්‍රි.ව. 61 - 63)

• එපීසවරුන්ට පමණක් නොව සුළු ආසියාවේ සියලු සභා වෙත මෙය ලියා ඇති

• පාවුලු තුමා රෝමයේ සිරගතව සිටියදී මෙය ලියා ඇති බව සැලකේ. සියලුම ලිපිවල සුසංයෝගයක් ලෙසින් මෙය හැඳින්වේ. අන්තර්ගතය හා භාෂා ශෛලිය අතින් කොලොස්සි ලිපියට සමානකමක් දක්වයි.

• සියලු ධාර්මික ඉගැන්වීම් සමබර තත්වයකින් ඉදිරිපත් කර ඇත.

### ලිවීමේ අරමුණ

• සියලු දේව ධාර්මික ඉගැන්වීම් තුළ විශ්ව සභාවම සවිමත් කරමින් අධ්‍යාත්මිකත්වය රැකගැනීම සභාව සතු වගකීමක් බව පෙන්වාදීමයි.

• කිතුනු සභා දිවියේ ඒකත්වයේ පදනම ද ශීල ධාර්මික වටිනාකම් තුළින් උදාවන නවෝදය ගැන ද ගැඹුරු ඉගැන්වීමක් ඉදිරිපත් කෙරේ.

### තේමාව

සභාව නමැති ක්‍රිස්තු දේහයේ හිස වන ක්‍රිස්තුස් වහන්සේ මගින් සැමකෙනෙකුම සමගි කරවන බව.

### විශේෂ කරුණු

1. ක්‍රිස්තු අභිරහස හා සභාවේ අභිරහස දෙවියන් වහන්සේගේ සදාකාලික සැලැස්ම තුළ පවතී.
2. විවාහයේදී ස්ත්‍රී පුරුෂ දෙදෙනාටම වගකීම් පැවරේ.
3. ජේසුස් වහන්සේ විමුක්තියේ ජයග්‍රහණය මුළු මහත් විශ්වය විසින්ම බෙදාගත යුතුය.
4. ජේසුස් වහන්සේ අපට ලබාදුන් ගැලවීම මුළු මහත් විශ්වය තුළම ව්‍යාප්ත කළ යුතුය.

## පිලිප්පිවරුන්ට ලියන ලද හසුන (ක්‍රි.ව. 61 - 63)

පාවුලු තුමා හා තිමෝතියස් විසින් පිලිප්පි නුවර සිට කිතුනුවන් වෙත මෙය යවනු ලැබූයේ රෝමයේ සිරගතව සිටි කාලයේදීය.

### ලිවීමේ අරමුණ

• ක්‍රිස්තුස් වහන්සේගේ ජීවිත යාගයේ මාහැඟිකම හුවා දැක්වීම තුළින් පිලිප්පිවරුන්ගේ විශ්වාසය ස්ථිර කිරීම සඳහා මෙය සම්පාදනය කොට ඇත.

• පිලිප්පි කිතුනු සභාවට සංවේදී වෙමින් කිතුනු ප්‍රතිපත්ති අනුව, ජීවත්වීමේ අභියෝගය මෙන්ම ආනන්දය ද පැහැදිලි ලෙස පෙන්වා ඇත.

### තේමාව

ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් දුක්විඳීම ප්‍රීතියක් බව (පිලිප්පි 1 : 18 - 19)

### විශේෂ කරුණු

1. ක්‍රිස්තුස් වහන්සේ උදෙසා ජීවත්වීම ප්‍රීතියකි.
2. මිනිස් දිවිය තුළ වෙනස්කම් ඇතිවනුයේ ජේසුස් වහන්සේගේ ගැලවීමේ බලයෙනි.
3. ජේසුස් වහන්සේගේ දූත කාර්යය හරහා උන්වහන්සේගේ දේවපුත්‍රභාවය අනාවරණය වේ.
4. කිතුනුවා පීඩාවලදී ඉවසිලිවන්තව ශුභාරංචිය වෙනුවෙන් සාක්ෂි දැරිය යුතුය

### කොලොස්සිවරුන්ට ලියන ලද හසුන (ක්‍රි.ව. 61 - 63)

• සුළු ආසියාවේ එපේසස් නුවරට සැතපුම් 200 ක් පමණ නැගෙනහිරින් පිහිටි කොලොස්සි නුවර විසූ කිතුනුවන් වෙත යැවූ හසුනකි.
• රෝමයේ සිරගතව සිටි පාවුල්තුමා හා තිමෝතියස් විසින් ලියන ලදැයි පිළිගැනේ. පාවුලු තුමාගේ සමීප ධර්මදූතවරයකු වූ එපප්‍රොඩිතස් විසින් පිහිටවූ කොලොස්සි සභාවට විශේෂයෙන් මෙය යවා ඇත.

### ලිවීමේ අරමුණ

• කොලොස්සිය පුරා පැතිරී තිබූ මිථ්‍යා මත ප්‍රතික්ෂේප කරමින්, දෙවියන් වහන්සේ සියල්ලන්ටම වඩා ඉහලින් වැජඹෙන තැනැන්වහන්සේ බව කොලොස්සිවරුන්ට අවබෝධ කරදීම සඳහා මෙය ලියා ඇත.
• කිතුනු ශුභාරංචිය මිනිස් සම්බන්ධතා කෙරෙහි විශ්වීය බලපෑමක් ඇති කළ හැකි අන්දම විස්තර කරයි.

### තේමාව

ක්‍රිස්තුස් වහන්සේ පරම ශ්‍රේෂ්ඨත්වය බව (කොලො 1 : 15 - 18)

### විශේෂ කරුණු

1. ක්‍රිස්තුස් වහන්සේගේ පරම අභිරහස දෙවියන් වහන්සේ තුළ සැඟවී තිබී දැන් ශුභාරංචිය තුළින් අනාවරණය වේ.
2. උන්වහන්සේ දුන් පූජා යාගය හා උත්ථානය සියලු බලවේග පරාජයට පත්කරයි.
3. ප්‍රසාද ස්නාපනය මගින් සෑම කිතුනුවකුම උත්ථාන වූ ක්‍රිස්තුස් වහන්සේගේ ශරීරයට ඒකාබද්ධ වේ.
4. කිතුනුවන්ගේ උපරිම අරමුණ විය යුත්තේ ක්‍රිස්තුස් වහන්සේ හා ජීවත්වීමයි.

### තෙසලෝනිකවරුන් වෙත ලියන ලද ප්‍රථම හසුන (ක්‍රි.ව. 51 - 52)

• දෙවැනි ධර්මදූත චාරිකාවේ යෙදී කොරින්තියේ නතර වී සිටි කාලයේ මෙම ලිපිය ලියන ලද බව පිළිගැනේ.
• ආසියාවේ සිට රෝමය දක්වා වැටී තිබෙන මාර්ගයේ පිහිටා ඇති මෙම තෙසලෝනික නගරය එදා වඩාත් දියුණුවට පත් නගරයකි.
• මෙය රෝම අධිරාජ්‍ය යටතේ සියවස් දෙකක් පමණ මසිදෝනියාවේ අගනගරය විය. ධර්මදූත ලිපියක් වන මෙය පාවුලු තිමෝතියස් හා සිල්වානස් යන අය විසින් ලියා ඇති බව සඳහන් වේ.

### ලිවීමේ අරමුණ

තෙසලෝනිකයේ කිතුනුවන් අතර පැවති සමහර වැරදි වැටහීම් දුරු කිරීම සඳහා මෙය ලියා ඇති බව පැහැදිලි වේ.

උදා : මියගිය අය පිළිබඳව (1 තෙස 4 - 13) කිතුනුවන් තම මතු දිවියේ ක්‍රිස්තු කේන්ද්‍රීක බලාපොරොත්තුවකට යොමු කරයි.

### තේමාව

ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය හා සම්බන්ධ බලාපොරොත්තුවක් ඇතිකර ගැනීම.

### විශේෂ කරුණු

1. කිතුනු පැවැත්ම බලාපොරොත්තුවේ ජීවිතයකි.
2. ක්‍රිස්තුස් වහන්සේ සමග එකමුතුව උන්වහන්සේ තුළින් දෙවියන් වහන්සේ වෙතට යායුතුය.
3. ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය අපේක්ෂාවෙන් සිටිය යුතුය.
4. ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය හදිසියෙන් සිදුවිය හැකිය.

## තෙසලෝනිකවරුන් වෙත යවන ලද දෙවන හසුන (ක්‍රි.ව. 51 - 52)

• පාවුලු තුමාගේ දෙවන ධර්මදූත චාරිකාව තුළ කොරින්තියේ නතර වී සිටි කාලය තුළ මෙය ලියා ඇති බව පිළිගැනේ. පාවුලු තිමෝතියස් හා සිල්වානස් යන අය විසින් ලියූ බව පිළිගනියි.

### ලිවීමේ අරමුණ

• පළමු ලිපියේ මෙන්ම කිතුනුවන්ගේ උද්යෝගය සහ සාංගික වර්ධනය අගයන අතර, ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය වෙනුවෙන් සියල්ල අතහැර දමා කිසිවක් නොකරමින් කාලය ගතකළ කිතුනුවන්ගේ වැරදි මත දුරුකිරීම සඳහා මෙය ලියා තිබේ.

### තේමාව

ක්‍රිස්තුස් වහන්සේගේ පුනරාගමනය දැන්ම සිදුනොවන බව

### විශේෂ කරුණු

1. ක්‍රිස්තුස් වහන්සේ අප බලාපොරොත්තු නොවන මොහොතක වඩින සේක.
2. දාමරිකයා හෙවත් සාතන් ඇතිකරන විනාශයෙන් පසු ස්වාමින්වහන්සේ මහිමාලංකාරයෙන් වඩින සේක.
3. මෙය තවම සිදුනොවුන හෙයින් සමාදානයෙන් දිවිගෙවීම වැදගත් වේ.
4. ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන ආගමනයට සූදානම්ව් දිවිගෙවීම අත්‍යවශ්‍ය වේ.

## තිමෝතියස්ට ලියන ලද ප්‍රථම හසුන (ක්‍රි.ව. 63 - 64)

• ස්පාඤ්ඤයේ හා මසිදෝනියාවේ සිට පාවුලුතුමා විසින් එපීසයේ සිටි විශ්වාසවන්ත ශ්‍රාවක තිමෝතියස්ට ලියූවකි.

• පාවුලු තුමාගේ මරණින් පසු එතුමාගේ ශ්‍රාවකයා එතුමාගේ අදහස් අනුසාරයෙන් ලියන ලද බවට මතයක් පවති.

### ලිවීමේ අරමුණ

• සත්‍ය විශ්වාසයට හා අපෝස්තලික ඉගැන්වීම්වලට අනුකූලව විශ්වාසවන්ත ජීවිතයක් ගතකිරීමේ වැදගත්කම හුවා දැක්වීම සඳහා මෙය රචනා කර ඇත.
• ධර්මය නිවැරදිව ඉගැන්වීමද සභාව තුළ ඇති වගකීම් හා නීතිරීති කිතුනු ප්‍රතිපත්තීන්ට අනුව ඉටු කිරීමටද මඟපෙන්වීමක් ඉදිරිපත් කරයි.

### තේමාව

දේශීය සභාවල පාලනය හා සංවිධානය

### විශේෂ කරුණු

1. කිතුනු සභා එකමුතුකව නිරතුරුව වර්ධනය කළ යුතුය.
2. මිථ්‍යා මත පිළිගැනීමෙන් ඉවත්ව ජීවත්විය යුතුය.
3. දෙවියන් වහන්සේගේ දයා කරුණාව අන් අයට ප්‍රකාශ කළ යුතුය.
4. සභා නායකයන් අන් අය ඉදිරියේ මනාව හැසිරිය යුතුය.

## තිමෝතියස්ට ලියන ලද දෙවන ලිපිය (ක්‍රි.ව. 65 - 67)

• මෙම හසුන පාවුලු තුමාගේ 'අවසාන කැමැත්ත' ලෙස නම් කෙරේ.
• මෙය ලියා ඇත්තේ එතුමා දෙවන වරටත් රෝමයේ සිරගතව සිටියදී මරණයට පත්වීමට ආසන්න කලකදීය.

### ලිවීමේ අරමුණ

පාවුලු තුමා දේශනා කළ ක්‍රිස්තු ශුභාරංචිය සුරැක, වැරදි මත හා ඉගැන්වීම් හමුවේ ශුභාරංචියේ වටිනාකම්වලට සාක්ෂි දරමින් එය අන් අය වෙත බෙදාදෙන ලෙස අයැදීම සඳහා මෙය ලියා ඇත.

### තේමාව

ඉවසීමෙන් දූත කාර්යයේ යෙදිය යුතු බව

### විශේෂ කරුණු

1. කිතුනු නායකත්වයට පත්වන්නන් තුළ, විශේෂ ගුණාංග පැවතිය යුතුය.
2. ක්‍රිස්තුස් වහන්සේ තුළ පැමිණෙන දුක්වේදනා සඳහා දිරියෙන් ඉවසිලිවන්තව මුහුණදීම අවශ්‍ය වේ.
3. සෑම කලටම දේව වචනය අත්තිවාරම විය යුතුය.
4. විශ්වාසයේ ස්ථිරව සිටිමින් ජීවිතාන්තය දක්වා එය සුරැකිය යුතුය.

## තීතස් වෙත ලියන ලද හසුන (ක්‍රි.ව. 63 - 64)

• විජාතික ග්‍රීක් පසුබිමක් ඇති තීතස් ජෙරුසලමට ගිය ගමනේදී පාවුලු තුමා සමග සිටි අයෙකි.
• ඔහු ශ්‍රද්ධාවත් විශ්වාසවන්ත ශ්‍රාවකයෙකි. පාවුලු තුමා විසින් ඔහු කිතු බැතියකු බවට පත්කරන ලදී. පසුව පාවුලු තුමා විසින් ඔහු ක්‍රීතයේ සභා පාලක ලෙස පත්කරන ලදී. මසිදෝනියාවේ සිටි පාවුලු තුමා ක්‍රීතයේ සිටි තීතස්ට මෙය ලියා ඇත.

### ලිවීමේ අරමුණ

• ක්‍රිත සභාව සංවිධානත්මකව පවත්වාගෙන යෑම සඳහා තීතස්ට උපදෙස් දීමට මෙය ලියා ඇත.
• එඬේරික කාර්යයට එල්ල වන අභියෝග හමුවේ කිතුනු ගුණාංග වර්ධනය කරගනිමින් සමාජය තුළ මුහුන් ලෙස දිවිගෙවීමට දිරිමත් කෙරේ.

### තේමාව

දේශීය සභාවල පාලනය සංවිධානාත්මකව පවත්වාගෙන යෑම අවශ්‍ය බව.

### විශේෂ කරුණු

1. නායකයින් තෝරාගැනීමේදී ප්‍රඥාවන්තව කටයුතු කළ යුතුය.
2. බව්තීස්ම ස්නාපනය ලැබීමෙන් පසු සෑම කිතුනුවකුම ශුද්ධාත්ම වරමින් ධර්මිෂ්ඨ පුද්ගලයකු බවට පත්වේ.
3. සභාව තුළ කිතුනු හැසිරීමෙන් ක්‍රියාකළ යුතුය.
4. ලෝකය තුළ කිතුනු හැසිරීම ව්‍යාප්ත කළ යුතුය.

## පිලමොන්ට ලියන ලද හසුන (ක්‍රි.ව. 61 - 63)

• රෝමයේ සිරගතව සිටියදී පාවුලු තුමා විසින් පිලමොන් නමැත්තකුට මෙය යැවූ බව සඳහන් වේ.
• ඔහු කොලොස්සි සභාවේ සාමාජිකයකු සතු වන අතර පාවුලුතුමා විසින් කිතු දහම වැළඳ ගැනීමට මඟපෙන්වූවෙකි.
• මෙය පෞද්ගලික ලිපියක ස්වරූපයෙන් ලියා ඇති කෙටි හසුනකි.

### ලිවීමේ අරමුණ

නවක කිතුනුවකු වූ ඔනේසිමස් නම් පුද්ගලයකු වහල්බවින් නිදහස් කර ඔහු කිතුනු සහෝදරත්වයෙන් පිළිගන්නා ලෙස අයැදීමට මෙය රචනා කර ඇත.

### තේමාව

ඔනේසිමස් වහලකු නොවන බව දැක්වීම.

### විශේෂ කරුණු

1. පිලමොන්ගේ විශ්වාසය හා ප්‍රේමය අගය කරයි.
2. ඔනේසිමස් දැන් වහලකු නොවන බව පවසයි.
3. ඔනේසිමස් සහෝදරත්වයෙන් පිළිගන්නා ලෙස ආයාචනා කරයි.
4. ඔනේසිමස් කිතු බැතියකු වු බව පවසයි.

පාවුලු තුමා සිය සංදේශ මගින් පෞද්ගලිකව කිතුනුවන් මෙන්ම කිතුනු සභාව වර්ධනය කිරීමට දැරූ ප්‍රයත්නය දෙවියන් වහන්සේ ඉදිරියේ අනගිභවනීය සේවයක්ව පැවති බව අපට පැහැදිලි වේ.

**නිපුනතාව 5** - කිතුනු ඉගැන්වීම්වලින් පරිපූර්ණ වී ස්වර්ග රාජ්‍යයේ පංගුකාරත්වය ලබයි.

**නිපුනතා මට්ටම 5: 1** - දේව රාජ්‍යයේ වටිනාකම් චරිතායනය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** - 30

**ඉගෙනුම් ඵල** - 1. මතෙව් සුභාරංචිය පිළිබඳ තොරතුරු ගොනු කරයි.
2. දේව රාජ්‍යයේ වටිනාකම් අනුව ජීවත් විය යුතු බව පිළිගනියි.
3. මතෙව් සුභාරංචිය පිළිබඳව ගොනු කළ තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත් කරයි.
4. දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීමේදී අත්දකින දුක් වේදනා සතුටින් දරා ගනියි.
5. දේව රාජ්‍යයේ වටිනාකම් අත්පත් කර ගැනීම සඳහා අන් අය සමග සහයෝගයෙන් කටයුතු කරයි.

• ශුද්ධවූ මතෙව් තුමාගේ අරමුණ වන්නේ යුගයෙන් යුගයට ජුදෙව් ජනතාව බලාපොරොත්තුවෙන් සිටි විමුක්තිදායකයාණන් වහන්සේ ජේසුස් වහන්සේ බව පෙන්වා දීමය.

• තවද ජේසුස් වහන්සේව ඉදිරිපත් කරන්නේ නව මෝසෙස් මෙන් ම බලාපොරොත්තුවෙන් සිටි මෙසියානික ගුරුතුමාණන් ලෙසය. මේ හේතුව නිසා මෙතුමා ක්‍රිස්තුන් වහන්සේගේ ඉගැන්වීම ප්‍රධාන දේශනා පහකට (පැරණි ගිවිසුමේ පංච පුස්තකය මෙන්) ගොනු කර ඇත.

• මෝසෙස්තුමා සීනයි කන්දේදී දුන් ව්‍යවස්ථාවේ මැදිහත්කරුවා වූවා සේ, ජේසුස් වහන්සේ කන්ද උඩ දේශනාවේ දී අලුත් ව්‍යවස්ථාවක් ස්ථාපිත කරයි.(මතෙව් 5:1) මෝසෙස්තුමාගේ පනත් දහය මෙන් ජේසුස් වහන්සේ ද ප්‍රතිපත්ති අටක් ලබා දෙයි. (මතෙව් 5:3-10)

• ජේසුස් වහන්සේගේ ඉගැන්වීමේ කාර්යයට අනෙකුත් සිද්ධීන්වලට වඩා වැඩි තැනක් දෙන මතෙව්තුමා ජේසුස් වහන්සේගේ විවිධ ඉගැන්වීම් ඒකරාශිකොට ක්‍රමානුකූල ව දක්වයි.

• තව ද ජේසුස් වහන්සේ නව ව්‍යවස්ථාදායකයාණන් හා ඇදුරුතුමා ලෙස ව්‍යවස්ථාව හා දිවැසාවලිය සම්පූර්ණ කරන බව ද දක්වයි. (මතෙව් 5:17) මතෙව්තුමා ඉදිරිපත් කරන දේශනා පහ මෙසේ ය.

1. කන්ද උඩ දේශනය - 5-7 ( දේව රාජ්‍යයේ ශුද්ධත්වය)

2. ධර්මදූත සේවය පිළිබඳ දේශනය -10 ( දේව රාජ්‍යය පිළිබඳ දූත මෙහෙය)

3. උපමා පිළිබඳ දේශනය - 13 ( දේව රාජ්‍යයේ ස්වභාවය)

4. ශුද්ධවූ සභාව හා එහි අධිකාරිත්වය පිළිබඳ දේශනය -18 ( දේව රාජ්‍යයේ අධිකාරි බලය)

5. යුගාන්තය පිළිබඳ දේශනය -24-25 ( දේව රාජ්‍යයේ අනාගතය)

මේ සෑම දේශනයකම අවසානය පිළිබඳ පැහැදිලි ඉඟියක් මතෙව් සුභාරංචියේ දැකගත හැකි ය.

7:28 - "ජේසුස් වහන්සේ මේ වචන කියා නිම වූ කල්හී ......"
11:1 -"ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයින් දොළොස් දෙනාට උපදෙස් දී නිමකළ පසු.....''
13: 53 - "ජේසුස් වහන්සේ මේ උපමා කියා නිම කළ පසු...."
19:1 - "තවද ජේසුස් වහන්සේ මේ වචන වදාරා නිමකොට...."
26:1 -"තවද ජේසුස් වහන්සේ මේ සියල්ල වදාරා නිමකොට...."

## කන්ද උඩ දේශනාව (5:1-7:29)

මෙහි සඳහන් භාග්‍ය අට සාර ධර්ම සංග්‍රහයකි. පැරණි ගිවිසුම තුළ ජනතාවට මාර්ගෝපදේශය වූයේ දස පනත යි. ක්‍රිස්තුන් වහන්සේ එම පනත්වලට නව අර්ථයක් දෙමින් ජීවිත යහපත් කර ගන්නට මාර්ගය පෙන්වා දුන් සේක.

• මේ මගින් ජනතාව දෙවිඳුන් වෙතත් තම කිතුනු යුතුකම් හා වගකීම් වෙතත් යොමු කළ සේක. කන්ද උඩ දේශනාව තුළින් ගුණ ගරුක යහපත් දිවි පෙවතක ගුණාංග පැහැදිලි කර ඇත.

• මෙහි සරල විධාන (5:41) අනතුරු ඇඟවීම් (5:25-26) හිතෝපදේශ හා පඬි වදන් (6:27-34) උපහැරණ (6:26) හා අනාවැකි (6:31-33) යනාදියෙන් අලංකාර වී ඇත.

• 'මකාරියෝයි' යන ග්‍රීක වදනින් "ප්‍රීති ප්‍රමෝද වන්නෝ" "භාග්‍යවන්තයෝ" "ආශීර්වාද ලද්දෝ" යන අර්ථ ඇතුලත් ය.

• මෙම මංගල වාක්‍යය ගැඹුරු ජීවන රටාවක් කැටි කොට ඉදිරිපත් කරයි.

• භාග්‍ය අට අනුව දිවි ගෙවීම තුළ ශුද්ධවන්ත මගකට පිවිසිය හැකි ය. භාග්‍ය 8 කිතුනුවාගේ ජීවිතයේ කැඩපත විය යුතු ය.

• ජේසුස් වහන්සේ අනුගාමී වූ පසු සදාචාරාත්මක හා ශීල ධර්මානුකූල දිවි පැවැත්මක් අනුගමනය කිරීම සඳහා මෙයින් ඇරයුම් කරයි.

• ජේසුස් වහන්සේ ඉදිරිපත් කල භාග්‍ය 8 දේව රාජ්‍යය උරුම කර ගත හැකි ආර්ය අෂ්ඨාංගික මාර්ගයක් වශයෙන් ද හඳුන්වා දිය හැකි ය.

• දේව රාජ්‍යයේ උරුමක්කාරයන් සිතින් දිළින්දන්ය.

• ලොවේ සෑම මනුෂ්‍යයෙකුගේ ම අරමුණ භාග්‍ය වන්තයෙකු වීම ය. සාමාන්‍ය ජීවිතයේ දී භාග්‍ය හෝ වාසනාව වශයෙන් පිළිගන්නා දේ වලට සම්පූර්ණයෙන් වෙනස් දේ කිතුනු ජීවිතයේ අගයයන් ලෙස ජේසුස් වහන්සේ ඉදිරිපත් කරයි. සතුටින් හා සොම්නසින් ජීවත් වීමට හැකි නම්, එය වාසනාවක්, භාග්‍යයක් බව අදහමින් සිටි අයට දිළිඳු කම , ශෝකය, නිහතමානිත්වය, යුක්ති ගරුක බව, දයාව, පිරිසිදු සිත, සාමය හා යුක්තිය උදෙසා පීඩා විඳීම වැනි ගුණාංග තුළින් වාසනාව උදා කර ගත හැකි බව අවධාරණය කළ සේක.

• ලෞකික් මට්ටමින් බෙහෙවින් අගය ඇතැයි සලකන දේ දේව රාජ්‍යය තුළ කිසිදු වටිනාකමක් නැති දේවල් ය.

• ලෞකික වශයෙන් වටිනාකමක් නැති දේට දේව රාජ්‍යය තුල ඉමහත් අගයක් ඇත. දුක් වේදනා විඳීම ලෝකය තුළ අවාසනාවකි. එහෙත් දුක් වේදනා විඳින්නේ යුක්තිය උදෙසා නම් ඔවුන් දේව රාජ්‍යය තුළ භාග්‍යවන්තයෝය.

• උන් වහන්සේ පෙන්වා දෙන භාග්‍ය මරණින් මතු උදා වන තත්වයක් නොව මෙලොවේ දී ම අත්දැක ආශ්වාදය ලැබිය හැකි භාග්‍යයකි. එසේ ම භාග්‍යවන්ත බාවයෙහි පරිසමාප්තිය මරණින් පසු ව ය.

• මතෙව් තුමා ජේසුස් වහන්සේ හඳුන්වා දෙන්නේ ලෝකයාට දේව රාජ්‍යයට ප්‍රකාශ කළ ගුරුදේවයාණන් ලෙස ය.

• මෙතුමා පෙන්වා දී ඇති අන්දමට ජේසුස් වහන්සේ දේව රාජ්‍යයේ වැසියන්ගේ ගුණාංග, වරප්‍රසාද හා යුතුකම් කන්ද උඩ දේශනය හෙවත් මහා මංගල දේශනය මගින් ඉිදිරිපත් කර සේක

## කන්ද උඩ දේශනාවේ පරමාර්ථ

1. ශ්‍රාවකයින්ගේ ධර්මිෂ්ඨකම විනයධරයින්ගේ හා පරිසිවරුන්ගේ ධර්මිෂ්ටකම අභිබවා යා යුතු බව
2. ජේසුස් වහන්සේ නව මෝසෙස් ලෙස නව කන්දක් මත නව ව්‍යවස්ථාවක් දානය කරන බව
3. පැරණි ව්‍යාවස්ථාව සම්පූර්ණ කර නව ව්‍යවස්ථාවක් (ප්‍රේමයේ ව්‍යවස්ථාවක්) දානය කරන බව
4. දේව රාජ්‍යයට ඇතුළු වීමට කැමති අය පෙළොවේ ලවණ මෙන්ද ලෝකයේ ආලෝකය මෙන්ද ක්‍රියා කළ යුතු බව
5. මිනිස් සිත් තුළ ඇති අධම ගති ඉවත් කර ඇතුලාන්ත පිරිසිඳු බවකින් ජීවත් විය යුතු බව

**2. ධර්ම දූත සේවය පිළිබඳ දේශනය (10:1-42)**

10:1 සිට 15 හි ප්‍රධාන කරුණු 3ක් සඳහන් වේ.

1. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන් දොලොස් දෙනා කැඳවීම. (10:1-4)
2 උන් වහන්සේ ඔවුන් පිට බලය පවරා සේවයට පිටතක් කර යැවීම. (10:5-15)
3. ඔවුන්ට කෙබඳු ප්‍රතිචාරයක් ලැබේදැයි උන් වහන්සේ කලින් දැනුම් දීම (10:16-22)

ජේසුස් වහන්සේ තම මෙහෙවර නොකඩවා ඉදිරියට ගෙන යාමට තෝරා ගත් මුල් පිරිසට අයත් වුයේ සාමාජිකයන් 12 දෙනෙකි. තමන් වහන්සේ ශුභ අස්න ප්‍රකාශ කරමින් දේව රාජ්‍යයේ සලකුණු වශයෙන් ප්‍රබල ක්‍රියාවන් කරමින් ප්‍රායෝගික පුහුණුවක් මේ දොලොස් දෙනාට ලබා දීම ජේසුස් වහන්සේගේ අරමුණ විය. උන් වහන්සේ සමග ලෝකය තුළ දේව රාජ්‍යය ගොඩ නැගීමට සහය වූ 12දෙනා නම්

1. පේදුරු නම් ලත් සීමොන්
2 පේදුරුගේ සොහොයුරු ඇන්ඩෲ
3 සෙබදීගේ පුත් ජාකොබ් (මහ ජාකොබ්)
4 ජාකොබ්ගේ සොහොයුරු ජොහාන්
5 පිලිප්
6 බර්තලමෙව් (නතානියෙල්)
7 තෝමස්
8 අයකැමියෙකු වූ මතෙව් (ලෙවී)
9 අල්පෙවුස්ගේ පුත් ජාකොබ් (කුඩා ජාකොබ්)
10 ජූඩ් තද්දෙවුස්
11 අන්තවාදී සීමොන්
12 ජූදාස් ස්කාරියොත්

• ජේසුස් වහන්සේගේ පණිවිඩකරුවන් ලෙස ද, ශුද්ධවූ සභාවේ මුල් සාමාජික පිරිස ලෙස ද තෝරාගත් මේ පිරිස ශුද්ධවූ සභාවේ න්‍යෂ්ඨිය වශයෙන් පිළිගත හැකිය.

• බදු අය කරන්නේකු වූ මතෙව් ද ව්‍යවස්ථාව පිළිබඳ ගුරුවරයෙකු වූ බර්තලමෙව්ද හැර අන් සියළු දෙනාම පොදු ජන සමාජයෙන් කැඳවා ගත් අය ය. එයින් ද වැඩි පිරිස ධීවරයෝ වූහ.

• ක්‍රිස්තුන් වහන්සේගේ සුබ අස්න ප්‍රකාශ කිරීම සඳහා කැඳවීම ලබන අය අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති මාලාව එදාට මෙන්ම අදටත් වලංගුය.

• ශ්‍රාවකයන් සඳහා යොදාගෙන ඇති ග්‍රීක වචනය 'මතෙටේස් ය එහි තේරුම 'වෙනත් අයෙකුගෙන් ඉගෙනුම ලබන තැනැත්තා' යන්නයි.

• ජේසුස් වහන්සේ සමග ගැවසෙමින්, ඉගෙන ගනිමින්, උන් වහන්සේගේ ජීවිතයෙහි හා මෙහෙයෙහි පංගුකාර වූ අය 'ශ්‍රාවකයින් යනුවෙන් නව ගිවිසුමෙහි හැඳින්වේ. "යවන ලද තැනැත්තා" යන අදහස ඇති 'අපොස්ටොලොස්' යන ග්‍රීක වචනයේ සිංහල අනුවාදය අපෝස්තුලුවරයා (ප්‍රේරිත) වේ. මෙකී දොලොස්දෙනා අපෝස්තුලුවරු වූහ. මොවුන් දොලොස්දෙනා ක්‍රිස්තුන් වහන්සේගේ ප්‍රසිද්ධ ජීවිතය, මරණය හා උත්ථානය සියැසින් දුටු සාක්ෂිකාරයෝ වූහ. ඔවුහු උන් වහන්සේගේ බලය ලත් නියෝජිත පිරිසක් වූහ. (මාක් 3:14, ක්‍රියා 1:21-22, රෝම 1:1)

• ඉශ්රායෙලයෙහි නැතිවූ බැටළුවන් වෙතට පමණක් ධර්මදූත සේවය දියත් කිරීමට උන් වහන්සේ අණ කළ නමුත් (10:5-6) ධර්මදූත සේවය පිළිබඳ දේශනාව සම්පූර්ණත්වයට පත් වන්නේ ශුභ අස්න අවසානයේ දී ය. (28:16-20)

**10:5-15 ධර්මදූත මෙහෙයට සූදානම**

දේශනා කිරීමට, සුව කිරීමට, මළවුන් උත්ථාන කිරීමට හා යක්ෂයින් දුරු කිරීමට උන් වහන්සේ අපෝස්තුලුවරුන් පිටත් කර යවන සේක. දේව රාජ්‍යය පිළිබඳ ශුභාරංචිය පළමු ව ජුදෙව් ජනයා වෙත පමණක් රැගෙන යා යුතුය.

• දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් වැඩිපුර යමක් නොගෙන සැහැල්ලුවෙන් ගමන් කල යුතු ය. මන්ද ශ්‍රාවකයා දිව්‍ය සංරක්ෂනය මත යැපිය යුතු ය.

• ධර්මදූත සේවය සඳහා දෙදෙනෙකු බැගින් යා යුත්තේ සාක්ෂි කරුවන් වනු සඳහා ය.

• අල්පේච්ඡ ජීවිතයත්, සරල පැවැත්මතක් අත්‍යාවශ්‍ය ය.

• සාමයේ පණිවිඩකරුවන් වන අපෝස්තුළුවරුන් ජනතාව අතරට යා යුත්තේ ඔවුන් වෙනුවෙන් පරිත්‍යාග වීමට ය. සේවයට ය. එනම් වග වලසුන් අතරට බැටළුවන් මෙනි.

• ධර්මදූත සේවය කඩිනමින් ඉටු කළ යුතු බැවින් චාරිත්‍රානුකූල ආචාර කිරීමක් සඳහා කාලය ගත කිරීමට සුදුසු නැත. අදාළ දීමනා ද ලැබෙනු ඇත. සේවය සඳහා සේවකයාට වේතනය ලැබියයුතු ය. (ද්විතීය 25:4)

• සාමය පැතීම ජුදෙව්වන්ගේ සාම්ප්‍රදායික ආචාර ක්‍රමයකි. සමාදාන ශුභ පැතීම කල පමණින් ම, සාමය හා සුගතිය එය දෙනු ලැබුවන් හට අත්වේ යැයි යන එකල පැවති ජුදා විශ්වාසය මෙයින් දැක්වේ.

• පාද වල දූවිලි ගසා දැමීම දෙවියන් වහන්සේගේ ශුභාරංචි පණිවිඩය ප්‍රතික්ෂේප කරන අය වෙත වගකීම පවරනු ලබන බව හඟවන සලකුණකි.

• සුබ අස්නේ පණිවිඩකරුවා ඔහු ව නොපිළිගන්නාගෙන් ඉවත් විය යුතු ය.

• සොදොම් හා ගොමෝරා නගර වල වාසය කළ මිනිසුන්ගේ දුෂ්ටකම නිසා ඒවා විනාශ විය. ශුභාරංචි පණිවිඩය නොපිළිගන්නාගේ ඉරණම ඊටත් වඩා දරුණු විය හැකිය.

**<u>10:16-25 - පැමිණෙන්නට ඇති දුක් පීඩා සම්බන්ධ කරුණු</u>**
ශ්‍රාවකයින්ට පැවරී ඇති මෙහෙය ලෙහෙසි පහසු කාර්යයක් නොවන බව මින් පැහැදිලි වේ. ශාරීරික පමණක් නොව නීතිමය බලපෑම් වලට ද ඔවුන් යටත් විය හැකි ය.

• මෙහි සඳහන් උසාවි, ප්‍රභූ සාමාජිකයින් විසිතුන් දෙනෙකුගෙන් සමන්විත වූ ප්‍රාදේශීය ධර්මශාලාවලට අනුබද්ධිත ව ක්‍රියා කල බල මණ්ඩල විය හැකි ය. ඒවා වටා විසූ ජන සමූහයා අතර සාමය සුරැකීම ඒවා සතු වගකීම විය. (10:24-26) අධ්‍යාත්මික උඩගුකම හා අහංකාර කමට විරුද්ධව කෙරෙන අනතුරු ඇඟවීමකි. බෙල්සෙබුල් යක්ෂයින්ගේ අදිපතියා ය. ජේසුස් වහන්සේට බෙස්සෙබුල් යැයි කියත් නම් ශ්‍රාවකයින්ට ඊට වඩා යමක් කියනු ඇත.

**10:26-42 - ශ්‍රාවකත්වයේ ස්වභාවය හා අභියෝග**

• ගේ කුරුල්ලකුගේ වටිනාකම එකල වෙළඳපොළේ අඩු ම වූ මිල යි. තුට්ටුව එවකට භාවිතා වූ රෝම තඹ කාසියකි. එහි අගය ඩිනාර් නමින් හඳුන්වනු ලැබූ කාසියෙන් දහයෙන් එක් පංගුවකි. (10:37):-

• "මම මිහිපිට සාමය දෙන පිණිස ආවෙමි යි නොසිතන්න" මෙම පදය මීකා 7:6 සිහිගන්වයි.

• ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා ඇති අනුගාමිකයින්, සිය පවුලේ නොඅදහන සාමාජියකින්ගේ අතින් පවා හිංසා පීඩාවට පත්වන බව උන් වහන්සේ මෙහි පවසන සේක.

• ක්‍රිස්තුන් වහන්සේට ප්‍රේම කිරීම කිතුනුවන්ගේ ජීවිතයේ ප්‍රමුඛත්වයක් කර ගත යුතු ය. දේව කැමැත්ත සෙවීමෙන් හා ක්‍රියාවට නැගීමෙන් ඒ බව විද්‍යාමාන වේ.

මතෙව් 10:38-39 :- කුරුසිය රෝමවරුන් විසින් වරදකරුවන් ට මරණ දණ්ඩනය දීම සඳහා යොදාගත් හිංසාකාරී වධක ක්‍රමයකි.

• මරණ දඬුවම ලද තැනැත්තා තම කුරුසිය හෝ එහි හරස් දන්ඩ කරපිට උසුලාගෙන මරණයට පත් කරනු ලබන ස්ථානය කරා යා යුතු වේ. ජේසුස් වහන්සේ මෙම රූපකය මගින් තම අනුගාමිකයින් මරණයට මුහුණ පෑම සඳහා සූදානම් කළ සේක.

• කිතුනුවා තමාට මෙන්ම ලෝකය ඉදිරියේද මළ පුද්ගලයෙකු ලෙස සලකා ක්‍රියා කිරීමට උන් වහන්සේ ඔවුන් කැඳවූ සේක.

• සැබෑ ජීවිතය ලද හැක්කේ තම කම නසා ගැන්මෙන්ම පමණකි. (10:40) ශ්‍රාවකයින් මේ සියල්ල දැක ගැනීමටත් ඇසීමටත් අත්දැකීමටත් වාසනාව ලද පිරිසකි.

• ජේසුස් වහන්සේ ඔවුන් පිටත් කර හරින්නේ ඉගැන්වීමට, සුව කිරීමට හා අශුද්ධ ආත්ම දුරු කිරීමටය.

• එසේම දූත සේවාව සඳහා පිටත් කර හැරීම මෙසියානික වචන හා ක්‍රියාවන් දීර්ඝ කිරීමක් ලෙස දැක්වීම සුදුසුය.

**3. උපමා පිළිබඳ දේශනය (13: 1-52)**

• දේව රාජ්‍යය පැහැදිලි කිරීම සඳහා ජේසුස් වහන්සේ විවිධ උපමා භාවිත කළ සේක.

• උපමාවක් යනු සමාජ ජන ජීවිතයට ඉතා සමීප සිද්ධි ඇතුලත් කුඩා කතාන්දරයකි.

• ගැඹුරු ධාර්මික කරුණක් සරලව තේරුම් කර දීමට මෙවන් කතාන්දර යොදා ගනු ලැබ ඇත. එහි මතුපිට අර්ථය එකකි. එහෙත් එහි ගැබ්ව ඇති අර්ථය ඊට වඩා බෙහෙවින්ම ගැඹුරු එකකි.

• දේව රාජ්‍යයේ ස්වභාවය විස්තර කර ඇත. මෙම දේශනය උපමා හතකින් සමන්විතය.

• මේවායින් වපුරන්නා සහ අබ ඇටය යන උපමා දෙන මාර්ක් තුමා හා ලූක් තුමා ද සඳහන් කරති. මුහුන් පිළිබඳ උපමාව ලූක් සුභාරංචියෙහි ද ඇත.

• කිරිඳි, නිධානය, මුතු ඇටය හා දැල පිළිබඳ උපමා සඳහන් වී ඇත්තේ මතෙව් සුභාරංචියේ පමණි.

• මිනිස් සිත තුළ දේව රාජ්‍යය වර්ධනය වන්නේ ඉතා සියුම් ආකාරයටය. අබ ඇටය පොළොවේ සුළුවෙන් වැඩීමට අරඹා මහා ගසක් වන්නා සේ මුහුන් ටිකක් මගින් පිටිනැලි ගණනාවක් පිපෙන්නා සේ දේව රාජ්‍යය කෙමෙන් වර්ධනය වන්නේය.

**වපුරන්නාගේ උපමව (13:1-23)**

• වපුරන්නා වපුරන බීජ දෙවියන් වහන්සේගෙන් පැමිණෙන පණිවිඩයයි. එය දෙවියන් වහන්සේගේ රාජ්‍යය ගැන සුභාරංචියයි. අඩි පාරවත් කෙත් වතු මැදින් වැටී තිබුනි. එබැවින් වපුරන බීජ මග අසල වැටීම නිතර සිදුවේ.

• පැල හට ගැනීම ට බාදාවන් වූ විවිධ ස්ථානවල වැටුනු බීජ ලෙස සලකන්නේ විශ්වාසය දුර්වල, පරීක්ෂා පැමිණි විට ගිලිහී වැටී යාමයි.

• විශේෂ ඉගැන්වීමක් හඳුන්වා දුන් අවස්ථා වලදී ජේසුස් වහන්සේ "සවන් ඇත්තෝ සවන් දෙත්වා'' යන යෙදුම භාවිත කල සේක. (මතෙව් 11:15, මාක් 4:23, ලූක් 14:35)

• වැඩි අවදානයකින් යමෙක් සවන් දෙන්නේද උගන්වන ලද ධර්ම සත්‍යය පිළිගෙන ඒවා අගය කරන්නේ ද 'ඔවුන්ට දෙවියන් වහන්සේ වඩ වඩාත් අවබෝධය දෙන සේක. එම සත්‍යතා තම ජීවිතයට අදාල කර නොගන්නා වූ තැනැත්තාට ඇති අවබෝධයද නැතිවේ.

• උපමාවේ විවරණයෙහි සඳහන් "දැක දැකත් නොදක්නා වුන්" යන්න යෙසායා 6:9 උපුටා ගැන්මකි. මෙයින් අදහස් වෙන්නේ ශුභාරංචි පණිවිඩය සමහර අයගෙන් සඟවා තැබීමක් නොව එය වටහා ගැනීමට අකමැති අයගෙන් එහි සත්‍යය වැසී ඇති බවයි.

**කිරිඳි පිළිබඳ උපමාව (13:24-30, 36 - 43)**

• කිරිඳි, තිරිඟු කෙත්වල නිතර වැඩුණු විෂ සහිත වල් පැළෑටියකි. මුල් අවස්ථාවේදී කිරිඳි හා තිරිඟු පැළ බොහෝ සෙයින් සමාන බැවින් එකිනෙක වෙන් කර හඳුනා ගැනීමට අසීරුය.

• දැහැමි දෙවි කෙනෙකුගේ පාලනය යටතේ ජීවත් වන ලෝකයක දුදනන් වැජඹෙන්නේ කෙසේදැ යි යන පැනයට දිය හැකි එක් පිළිතුරක් ලෙස මෙය සැලකිය හැකිය.

'මේ ලෝකය සැලසුම් වී ඇත්තේ යහපත හා නපුර එකට පවතින අන්දමට ය. ඒ නිසා නපුර උදුරා ලීමට ගන්නා සෑම උත්සාහයකින් ම යහපතට ද පීඩා පැමිණිය හැකි ය. මෙය මනුෂ්‍ය පුත්‍රයාණන් විසින් ධර්මිෂ්ටයින් හා අධර්මිෂ්ටයින් වෙන් කරන යුගාන්තය තෙක් බලා සිටීම පිණිස කරන ලද නියමයකි.

• විනිශ්චයේ තීරණය අනුව ප්‍රතික්ෂේප කරනු ලැබීමෙන් ඇතිවන සන්තාපය ද (8:12, 22:13, 25:30) පිළිගනු ලැබීමෙන් ඇතිවන ප්‍රීතිය ද (දානියෙල් 12:3) දැක්වීමකි. "පිටත අන්ධකාරයෙහි දැමීම" යනු දෙවියන් වහන්සේ ප්‍රතික්ෂේප කරන්නවුන් වෙත පැමිණෙන භයානක ඉරණමයි.

### අබ ඇටය හා මුහුන් පිළිබඳ උපමා (13:31-33)

• මෙම උපමා දෙකෙහි ම මූලික අදහස වනුයේ දේව රාජ්‍යය සුළුවෙන් හා අදෘෂ්‍යමාන ලෙස ආරම්භ වන නමුත් කල් යත්ම එය ප්‍රකාශයට පත් වන බවයි. අඩි 8 ක් හෝ 10 ක් පමණ උසට වැඩෙන අබ ගසෙහි අතුවල කුරුල්ලෝ ලැගුම් ගනිති. (එසකියෙල් 17:23, දානියෙල් 4:12-21)

### නිධානය හා මුතු ඇටය පිළිබඳ උපමා (13:44-46)

• රන් මුතු මැණික් වැනි වස්තු ආරක්ෂාව සඳහා පොළොවේ වළලා තැබීම පැරණි සිරිතකි. පසුකාලයේදී අහම්බෙන් ඒවා ඇතැමුන්ට හමුවේ. මෙම උපමා දෙකෙහිම එක ම මූලික ඉගැන්වීම වන්නේ අපගේ ක්ෂණික වූත් පරිත්‍යාග ශීලී වූත් ප්‍රතිචාරයන් ඉල්ලා සිටීමයි. දේව පාලනය යටතේ ජීවත්වීමේ ප්‍රීති ජනක වරප්‍රසාද මේ කරණකොටගෙන ලැබිය හැකි ය.

**දැල පිළිබඳ උපමාව (13:47-50)**

මෙම උපමාව කිරිඳි උපමාවට කිට්ටු සම්බන්ධයක් දක්වයි. මෙමගින් ද උගන්වනුයේ අවසානයේ දමිටුන් අදමිටුන්ගෙන් වෙන් කර ඒ ඒ අයට සුදුසු විපාකය දෙන බවයි.

## 4. සභාවේ සාංගිකත්වය හා එහි අධිකාරිත්වය පිළිබඳ දේශනය (18:1-35)

• සභා නායකයින් බලය තත්වය හා ගෞරවය සඳහා වෙහෙස නොවිය යුතු බවත් කිසිවෙකුත් තවත් කෙනෙකු යටතට නොගත යුතු බව පෙන්වා දීමට ජේසුස් වහන්සේ පසුබට නොවූ සේක. (18:5)

• මතෙව් සංඝයට මෙවන් දැනුවත් කිරීමක් අවශ්‍ය බව එතුමාට හැඟෙන්නට ඇත. ජන සම්මතයෙන් බැහැර වෙමින් අළුත් අර්ථකථන සැපයීම ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වලට ආවේණික ලක්ෂණයකි.

• දේව රාජ්‍යයට ඇතුළු වීමට වරම් ලැබෙන්නේ දේව අනුග්‍රහය තමන්ට ලැබිය යුතු යැයි හිමිකම් කියන්නට නොවේ. කුඩා දරුවෙකුගේ ආදර්ශය ඔවුන් උගත යුතුය. (18:2-4)

• මෙහි "බාලයන්" යනුවෙන් අදහස් කරන්නේ ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් මිස කුඩා දරුවන් නොවේ. ඔවුන් සමාජයට බලපෑමක් කල නොහැකි සාමාන්‍ය ජනතාවයි. (18:6, 10, 14, 25:40)

• ඔවුන් නොමග යවන්නා බෙල්ලේ ගලක් බැඳ මුහුදේ දැමිය යුතු ය. (18:6) සාමාන්‍ය ජනයා නොමග යවන බලය ඇත්තවුන් කෙරෙහි දැක්වූ ආකල්පයකි.

• නායකයින් පෙරමුණ ගත යුත්තේ ධර්මදානයේ වගකීම සඳහාය. එම කාර්යයේදී කිසිවකු අත් නොහළ යුතු ය. (18:11-14)

• සමාව දීම මෙහිදී වැදගත් වේ. (18:15-19) එපමණක් නොව සමාව දී සඳහා ඕනෑම අවස්ථාවක සූදානම් ව සිටිය යුතුයි. (18:21-22) කමා නොවූ දාසයා පිළිබඳ උපමාවෙන් (18:21-35) විස්තර කරන්නේ නිලතල දරන්නන් සැම විට ම දෙවියන් වහන්සේගේ දයාව හා අනුකම්පාව ලබන බව සිහිකර ඔවුන්ගේ සහෝදරයින්ට සමාව දිය යුතු බවයි. කිසි විටෙකත් අනුන් ව විනිශ්චය කරන්නන් නොවිය යුතු බවයි.

• පුරාණ ගිවිසුමේ දෙවියන් වහන්සේ එඬේරාණන් ලෙස ද සෙනග දෙවියන් වහන්සේගේ බැටළුවන් ලෙස ද ඉදිරිපත් කර ඇත. (යෙසායා 40:11, එසකියෙල් 34:11-31, ගීතාවලිය 23)
• සැබවින් ම ජේසුස් වහන්සේ ආදර්ශමත් එඬේරාණන් වන සේක. බැටළු රැලේ එක් එක් බැටළුවා ගැන සමීප දැනුමක් ඇති උන් වහන්සේ නැති වූ බැටළුවන් සොයා යන සේක.
• තම රැළෙහි බැටළුවන් රැක බලා ගැනීම ද නැති වූවන් සොයා යාම ද ශුද්ධ වූ සභා එඬේරුන්ගේ වගකීම බව ජේසුස් වහන්සේ අවධාරණය කළ සේක. මන්ද දෙවියන් වහන්සේගේ කැමැත්ත ද එයයි.
• එහෙයින් (18:15-20) හි මූලික අදහස වරදට පත් ඇදහිලි වන්තයින් හෝ සහෝදරයින්ට අයත් සාමාජිකයින් නැවත දිනා ගැනීම හා ඔවුන් යහමගට ගෙන ඒමයි.

• අපෝස්තුලුවරුන් බඳිනු හා මුදනු ලබන දෙය ස්වර්ගයේ දී ද එසේ ම වන්නේ ය. (18:18)
• "ඔබේ සහෝදරයා ඔබට විරුද්ධව පව් කලොත් පෞද්ගලිකව ඔහු හමුවී ඔහුගේ වරද පෙන්වා දෙන්න. ඔබ කියන දේ ඔහු පිලිගත්තොත් ඔබ ඔබේ සහෝදරයා දිනා ගත්තේය (18:15)
• ජේසුස් වහන්සේගේ මේ නියමයට පේදුරුතුමා ප්‍රශ්නයක් නැගීමට හේතුවක් කරගෙන ඇත.
• සත්වාර සැත්තෑවක් සමාව දීම යනු සමාව දීමට සීමාවක් නොමැති බවයි. සමාවීමේ දී සැලකිය යුතු ප්‍රතිපත්ති විස්තර කරන මෙම උපමාව (18:23-35) සටහන් කරන්නේ මතෙව් තුමා පමණි.
• උපමාවෙහි සඳහන් රුපියල් 'දෙකෝටියක' මිල, මුල් පිටපත් වල සඳහන් වන්නේ තලෙන්තු දස දහසක් වශයෙනි. 'තලෙන්තුව' එකල භාවිත කාසි අතරින් ඉහළ ම වටිනා කමක් ඇති එකකි.
• එක තලෙන්තුවක වටිනාකම සාමාන්‍ය කුළී කරුවන් අවුරුදු 15ක් තුළ ලබන මුළු වේතනයට වැඩි බව සැලකිය යුතු ය.
• ණය කරුවෙක් ණය ගෙවා දැමීමට නොහැකි වූ විට පවුලේ අය වහල් කමට විකිණීමේ සිරිතකි. (නික්මයාම 21:2, 2 රාජාවලිය 4:1)
• රුපියල් 'දෙසීයක' මිල මුල් පිටපත් වල දක්වන්නේ ඩිනාර් 100 ක් යනුවෙනි. 'ඩිනාර්' එකක වටිනා කම දවසේ පඩියට වැඩ කළ කුලී කරුවකුගේ කුලියයි.
• මෙම උපමාවෙහි අරමුණ වන්නේ අනුන් හට සමාව දී දෙවියන් වහන්සේගෙන් සමාව ලැබීමට මග පාදන බවයි.

## 5. යුගාන්තය පිළිබඳ දේශනය (24:1-25:46)

• යුගාන්තය පිලිබඳ දේශනාව, (24:4-31) අවසාන කාලයේ ස්වභාවය පිළබඳව කියවෙන උපමා 7 කි.

• අත්තික්කා ගස, කෙතෙහි වූ මනුෂ්‍යයන් දෙදෙනා, ස්ත්‍රීන් දෙදෙනා, විශ්වාසී හා අවිශ්වාසී දාසයෝ, යුවතියන් දස දෙනා, දාසයන් තිදෙනා, එළුවන්ගෙන් බැටළුවන් වෙන් කිරීම (24:35-25:46) වශයෙනි.

• මෙම උපමාවලින් අවසාන 4 වැදගත්ය. මෙයින් ද විශ්වාසී දාසයන් පිළිබඳ උපමාව (24:45-51) ස්වාමියා ආ කල යම් දාසයෙක් සිය සේවයෙහි යෙදී සිටිනු දුටුවොත් ඒ සේවකයා භාග්‍යවන්ත ය.

• ධර්ම දානය පිළිබඳ සභාවේ නායකයින්ගේ වගකීම මින් පැහැදිලි වේ. එසේ නොකරන්නන් සම්බන්ධයෙන් සිදුවන දේ 24:48-51 හි දැක්වේ.

• යුවතියන් දස දෙනා පිළිබඳ උපමාව (25:1-13) මතෙව් තුමා පමණක් වාර්තා කරයි. මනාලයා විසින් මනාලිය සිය නිවසට කැඳවාගෙන යාම පලස්තනයේ පැවති සිරිතකි. විවාහ උත්සවය හා මංගල භෝජනය පවත්වනු ලබන්නේ මනාලයාගේ නිවසෙහිය. මධ්‍යම රාත්‍රියට ආසන්න වේලාවක දී ය.

• මෙම සිරිත පදනම් කොට ගෙන ලියා ඇති මෙම උපමාවෙන් සූදනම් ව සිටීමේ අවශ්‍යතාවය පෙන්නුම් කරයි.

• මෙම යුවතියෝ මනාලයා කැටුව එන මනාලිය හා එක් වී පෙරහැරින් ඔහුගේ නිවසට පැමිණ මංගල උත්සවයට හා භෝජනයට සහභාගී වීමට සූදානම් ව සිටි අය වෙති.

• මෙම උපමාවෙන් ද තවදුරටත් පැහැදිලි කරනුයේ ශ්‍රාවකයින් ඒකරාශීව කාලයට නිසි ලෙස අනුගත විය යුතු බවයි.

• මනාලයාගේ ප්‍රමාද වීම පුනරාගමනය සිදුවන කාලයේ අවිනිශ්චිත බව දක්වයි.

• දාසයන් තිදෙනා පිළිබඳ උපමාව ( 25:14-30) ලූක්තුමා ලියූ රන් කාසි පිළිබඳ උපමාවත් (ලූක් 19:11-21) අතර සමාන කම් මෙන්ම වෙනස් කම් ද ඇත.

• මනුෂ්‍ය පුත්‍රයාණන්ගේ පැමිණීමට සූදානම් ව සිටිය යුතු බව උපමා දෙකින්ම උගන්වයි. මතෙව්තුමා සඳහන් කරන විශේෂ කරුණ නම් ස්වාමියාගේ පිටත් ව යෑම හා නැවත පැමිණීම අතර කාලය දීර්ඝ එකක් බව පෙන්වාදීමයි. තලෙන්ත නාස්ති කිරීම අඩුපාඩුවකි. සෑම කෙනෙක්ම තමාගේ තලෙන්ත පිළිබඳව ගණන් දිය යුතු වේ.

• ජාතීන්ගේ විනිශ්චය දවස (25:31-46) පිළිබඳ උපමාවෙන් අවසාන දේශනාව නිම වෙයි.

• යමෙකුගේ සදාකාලික ඉරණම තීරණය වන්නේ ඒ අය කුසගින්නෙන් පෙලෙන්නන්ට, අනාථ වූවන්ට, සරණාගතයන්ට, රෝගීන්ට හා සිරකරුවන්ට පිහිට වූ ආකාරයට ය. එවැනි අයට උපකාර කරන අය සමිඳාණන් හට සේවය කරන්නෝ වෙති. මෙමගින් ද අවසාන විනිශ්චය සිදුවන්නේ කුමක් පදනම් කරගෙන ද යන්න පැහැදිලි කරයි.

• එනම් ආත්මක හා ශාරීරික පුණ්‍ය ක්‍රියා කිරීම මත ය.

• අනාගතයේ මුහුණ පෑමට සිදුවන දේ පිළිබඳ ව අවදියෙන් සිටීමට ශ්‍රාවකයින් ව දනුවත් කරන ජේසුස් වහන්සේ සංඝය තුල ඇති විය හැකි හිත් අමනාප කම්, පාවා දීම් නොපිළිගැනීම් පමණක් නොව උන් වහන්සේව හරි හැටි හඳුනා ගැනීමට නොහැකි ව වන මුලා වීම් ද පිළිබඳ ව පහදා දෙයි.

• එහෙත් තෝරා ගනු ලැබූවන්ට සහනයක් ඇත.

• ක්‍රිස්තු පුනරාගමනය සැඟව සිදුවන්නක් නොව ප්‍රසිද්ධියේ සිදුවන්නකි. නියමිත මොහොත දෙවියන් වහන්සේ පමණක් දන්නා සේක. අවධියෙන් සිටීම මෙම තත්ත්වයට මුහුණ දීමට ගත හැකි ක්‍රියා මාර්ගයයි. කිතු අනුගාමිකයන් විශ්වාසී, සිහි නුවණ ඇති දාසයා මෙන් අවධි ව තම කාර්යය නොපිරිහෙලා ඉටු කලහොත් ඔහු භාග්‍ය වන්තයෙකි. අයහපත් දාසයා තම වගකීම් පැහැර හැරීම නිසා අවධියෙන් සිය ස්වාමියාගේ පැමිණීම අපේක්ෂාවෙන් නොසිටි නිසා යුගාන්තයේදී තර්ජනයකට මුහුණ පාන්නේ ය.

## ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යය.

• විශ්වාසයේ පසුබිම තුළ ක්‍රියාත්මක වන, ක්‍රිස්තු පෞරුෂය ප්‍රකාශ වූ දේව රාජ්‍යයේ උදාව සනිටුහන් කරන මනුෂ්‍යයින් වෙත දෙවියන් වහන්සේගේ දයා කරුණාව අනාවරණය වන දේව බලය හා ආධිපත්‍යයේ ක්‍රියාකාරිත්වයකට ප්‍රාතිහාර්යයක් යයි කියනු ලැබේ.

• දෙවියන් වහන්සේගේ රාජ්‍යය උදා වී ඇති බවත් මෙසියස් වහන්සේ කරණකොට ගෙන එය ප්‍රත්‍යක්ෂ වන බවත් මෙම හාස්කම්වලින් පැහැදිලි වේ.

• මනුෂ්‍යයා සතර ආකාර වහල්කම්වලට ගොදුරු වී සිටිති. එනම්, මරණය, ලෙඩ රෝග, ස්වභාවික බලවේග හා දුෂ්ට ආත්මයන් ට නතුවීම ය.

• ක්‍රිස්තුන් වහන්සේ ප්‍රාතිහාර්ය කලේ මේ සතර ආකාර වහල්කම්වලින් පීඩාවට පත් ජනතාව ගලවා ගැනීමට ය.

ජේසුස් වහන්සේ සිදුකළ ප්‍රාතිහාර්ය වර්ග සතර මෙසේ ය.

1. ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
2. සුවකිරීම්
3. දුෂ්ට ආත්ම දුරුකිරීම්
4. මළවුන් උත්ථාන කිරීම්

## සුව කිරීම්: පේදුරුගේ භාර්යාවගේ මව සුව කිරීම (මතෙව් 8:14-18)

• ජේසුස් වහන්සේ පේදුරුතුමාගේ ගෙට ඇතුළු වූ කල ඔහුගේ බිරිඳගේ මව උන රෝගයෙන් ඔත්පල ව සිටිනු දැක ඇගේ අත ඇල්ලූ සේක. එවිට උන බැස ගියේ ය. ඈ නැගිට උන් වහන්සේට උපස්ථාන කළා ය.

• ඇය රෝගී ව සිටින බව උන් වහන්සේට කිව යුතු නැත. උන් වහන්සේ ඒ බව දන්නා සේක. එමෙන් ම අත ඇල්ලීම ප්‍රමාණවත් ය. අත අල්ලා නැගිටුවීමට අවශ්‍ය නැත. ඇය සම්පූර්ණයේන ම සුව වූ බව ඇගේ උපස්ථාන කිරීමෙන් පැහැදිලි වේ.

• සුව වීම, සේවාව සඳහා කැප වීමකි.

## දුෂ්ඨ ආත්ම දුරු කිරීම්: ගදරීන රටේ අශුද්ධ ආත්ම ආවේශ වූවන් දෙදෙනෙකු සුව කිරීම (මතෙව් 8:28 -34)

• මෙම වාර්තාවට අනුව යක්ෂාවේශ වූවන් දෙදෙනෙක් ජේසුස් වහන්සේ හමුවට පැමිණ නියමිත මොහොතට පෙර තමන්ට වද දෙන පිණිස පැමිණීම ගැන උන් වහන්සේට අවලාද කීවෝය.

• මනුෂ්‍යයින්ට ජේසුස් වහන්සේ කවුරුන් දැයි හඳුනාගත නොහැකි වුව ද යක්ෂයෝ උන් වහන්සේ හඳුනා ගත්හ. ඉතා විශේෂ අන්දමකට ජේසුස් වහන්සේ දේව පුත්‍ර කම දරා සිටි බව "දෙවියන් වහන්සේගේ පුත්‍රයා" යන ආමන්ත්‍රණය පෙන්වා දෙයි. ජුදා ඇදහිල්ලට අනුව යක්ෂයාගේ බලය මුළු මනින්නම නිෂ්ප්‍රභා වන්නේ අනිත්ම දියයේ දීය.

• එහෙත් ඊට පෙර ජේසුස් වහන්සේ ඔවුන් අක්‍රීය කිරීම ගැන ඔවුහු මැසිවිලි කියති. යක්ෂාවේශ වූවන් ඌරු රැළකට ආවේශ වීමට ඉල්ලීම තුළ අපට තේරුම් ගත හැක්කේ මේ ප්‍රදේශය අන්‍ය ජාතීන් වාසය කළ ප්‍රදේශයක් බව ය.

• ඌරා ජුදා ජනතාවට ඇකැප සතෙකි. යක්ෂයන්ගෙන් මේ මිනිසුන් දෙදෙනා නිදහස් කර ගැනීමට වඩා ඌරු ගොව්වන්ගේ අවධානය යොමු වී ඇත්තේ ඔවුන්ට සිදු වූ ආර්ථික පාඩුව ගැන ය.

• ජනතාව නපුරෙන් මුදා ගැනීමට වඩා ඔවුන් ට වැදගත් වූයේ ඌරු රංචු රැක ගැනී ම ය. ඒ නිසා තමන්ගේ පළාතෙන් පිටවී යන ලෙස එම ප්‍රදේශ වාසීහු ජේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටියෝ ය.

## ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්යඃ මාරුත දමනය (මතෙව් 8ඃ 23-27)

• ගලීලයේ මුහුද කඳු වලල්ලකින් වටවූ ද්‍රෝණියක පිහිටා තිබිණ. මෙම මුහුද හදිසි කුණාටුවලට ප්‍රසිද්ධ විය. ජේසුස් වහන්සේද ගෝලයෝ ද ඔරුවෙහි සිටිය දී චණ්ඩ මාරුතයක් හැමී ය. ස්වාමීන් වහන්සේ නිදා හුන් සේක. ගෝලයින්ගේ කලබලය නිසා පිබිදි උන් වහන්සේ මාරුතයට අණ කළ විට කුණාටුව නිශ්චල විය.

• ගෝලයින්ගේ ඇදහිල්ල තහවුරු කිරීමට මේ සිද්ධිය හේතු විය.

## .මළවුන් නැවත ජීවිතයට නැගිටුවීමඃ ධර්මශාලා ප්‍රධානියාගේ දූව (මතෙව් 9ඃ18-19ඃ 23-26)

• මතෙව් තුමා සඳහන් කරන ධර්මශාලා ප්‍රධානියා යායිරස් බව අනෙකුත් සුවිශේෂකවරු සඳහන් කරති. ලූක් හී හා මාක් හී සඳහන් සිද්ධියට අනුව යායිරස් ජේසුස් වහන්සේ හමුවෙද්දී රෝගියා මරණාසන්නව සිටියි. ඇය මළ බව දැන ගන්නේ පසුවය.

• එහෙත් මතෙව් හී ධර්මශාලා ප්‍රධානියා ජේසුස් වහන්සේ වෙතට එන්නේ ඔහුගේ දූව මළ බව දැන ගත් පසු ව ය. ජේසුස් වහන්සේ කෙරෙහි ඔහු තුළ වූ අපමණ විශ්වාසය මින් තහවුරු වේ.

• කුඩා දැරියගේ මරණය දරා ගත නොහැකි අය විලාප නගමින් සිටියෝ ය. "අහකට යන්න දැරිය මැරී නැත. ඇය නිදන්නී ය"යයි ජේසුස් වහන්සේ සමූහයාට ප්‍රකාශ කරද්දී ඔවුහූ උන් වහන්සේට සරදම් කළ හ.

• එහෙත් ධර්මශාලා ප්‍රධානියා ජේසුස් වහන්සේගේ කීම තරයේ අදහා ගත්තේ ය. ඔහුගේ බලාපොරෙත්තුව සපල කරමින් ජේසුස් වහන්සේ මිය ගිය දැරිය වැතිර සිටි ස්ථානයට ගොස් ඇයට නැගිටින්නැයි වදාළ සේක.

• ඒ දේව වචන ක්‍රියාකාරී විය. ඇය නැගිට්ටාය. ජනතාව බිය වූහ. නැගී සිටි දැරිය පූර්ණ සෞඛ්‍ය තත්ත්වයෙන් සිටි බව තේරුම් ගත හැක්කේ ඇයට කෑමට යමක් දෙන්නැයි ජේසුස් වහන්සේ නියම කළ නිසා ය.

## ජේසුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය මරණය, උත්ථානය හා දර්ශන වීම් ( මතෙව් 26-28)

• මතෙව්තුමා ඉදිරිපත් කරන දුක්ප්‍රාප්තිය පිළිබඳ විස්තරයේ ජේසුස් වහන්සේ අත්අඩංගුවට ගැනීම හා මරණයට පත්වන සිද්ධි ඉදිරිපත් කරන්නේ මෙම තත්ත්වයන්ට ඉවසීමෙන් මුහුණ දෙන මෙසියස් වහන්සේ ලෙසය.

• මේ අවස්ථාවේ පටන් දේව කැමැත්තට හිස නැමූ කීකරු පුත්‍රයකු ලෙස උන් වහන්සේ ජුදා ජාතිය බලාපොරොත්තුවෙන් සිටි මෙසියස් වහන්සේ ලෙස අනාවරණය වෙයි.

• ජුදෙව් සෙනග මිසරයේ වහල් බැම්මෙන් නිදහස් වීම පරිස්මරණය (අනුස්මරණය ) කිරීම පිණිස නිසාන් නම් පළමු වන මාසයෙහි (මාර්තු - අප්‍රේල් 14 ) වන දින පාස්කුව පවත්වන ලදි.

• මේ අතර ජුදා නායකයින් ජේසුස් වහන්සේ නිත්‍යානුකූල මරණයකට පත් කිරීමට උපායන් යොදයි.

• දුක්ප්‍රාප්තිය පිළිබඳ පෙර ප්‍රකාශයෙන් පසු බෙතානියේ ආලේපය සිදු වෙයි. ( 26ඃ 6-13). මෙම සිද්ධිය සුභාරංචි හතරෙහිම සඳහන් වේ.

'

• 'බෙතානිය' ජෙරුසලමට කිලෝමීටර තුනක් පමණ නැගෙනහිරින් පිහිටි ගමකි. 'සීමොන්' කලක් ලාදුරු රෝගයෙන් පෙළී සිටි, ජේසුස් වහන්සේ විසින් සුව කරනු ලැබූ අයෙකු යැයි විශ්වාස කෙරේ. ජේසුස් වහන්සේ ඔහුගේ නිවසෙහි භෝජන සංග්‍රහයකට ආරාධනා ලැබ සිටි යි.

• පිටුපසට තමන්ගේ කකුල් විහිදෙන සේ මිටි කවිච්චිවල හෝ මෙට්ට මත හෝ ඇල වී ආහාර ගැනීම එකළ පැවති සිරිත විය.

• එම නිසා මෙම සිද්ධියට සම්බන්ධ ස්ත්‍රියට ජේසුස් වහන්සේගේ දෙපා ඇගේ කෙස්වලින් පිස දැමීමට හැකි විය. "දුගීහු ඔබ සමග හැමදාම සිටිති" (26:11) ජේසුස් වහන්සේගේ මෙම වචන ද්විතීය නීති 5:11 සිහි ගන්වයි.

• වතගොත සඳහන් නොකරන මෙම ස්ත්‍රියගේ ක්‍රියාව ජේසුස් වහන්සේ හට ගෞරවය දැක්වීමක් ලෙස සැලකේ. වටිනා සුවඳ විලවුන් වර්ගයක් නිසා ශ්‍රාවකයින්ගේ මැසිවිලි මධ්‍යයේ වුවද මෙම ආලේප කිරීම මෙසියානික මෙහෙය සම්පූර්ණ කරන, උන් වහන්සේගේ මරණය හා භූමදානය පිණිස සූදානම් කිරීමකි.

• තෝරාගත් ජාතිය උන් වහන්සේ ප්‍රතික්ෂේප කරන විට පව්කාර යයි හංවඩු ගසනු ලැබූ කාන්තාවක් එතුමාව ආලේප කරයි. ක්‍රිස්තු අනුගාමිකයකු වීමට ස්ත්‍රී පුරුෂ බේදයක් වත් පවුල් පසුබිමක් වත් ජාතියක් වත් වැදගත් නොවේ. ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය හා දේව කැමැත්ත ඉටු කිරීම ප්‍රමාණවත් වන බව මින් පැහැදිලි වේ.

• වහලෙකු මිළදී ගැනීමේදී ගෙවූ මුදල රිදී කාසි 30 කි. (නික්මයාම 12:31) ජුදස් ජේසුස් වහන්සේ පාවා දෙන්නේද එවැනි මුදලකටය. (26:15)

• පාස්කු මංගල්‍යයත් සමගම ආරම්භ වන නුමුහුන් රොටි මංගල්‍යය පුරා දින 7ක් පැවැත්වේ. ඒ සතිය තුළ මුහුන් පාවිච්චි කිරීම තහනම් ව තිබිණි. (නික්මයාම 12:15-20)

• පාස්කු මංගල මේසයෙහි පළතුරු, කුළුබඩු, විනාකිරි වලින් පිළියෙල වූ අච්චාරු බඳුනක් විය. රොටි එහි ගල්වා අනුභව කිරීම සිරිත විය. පාස්කු භෝජනයෙන් තද බැම්මකින් බැඳුනු මිත්‍රත්වයක් සංකේතවත් කල බැවින්, ජුදස් මෙම භෝජනයට සහභාගී වීම ද්‍රෝහී ක්‍රියාවක් ලෙස සලකන්නට පුළුවන.

•මෙම පාස්කු භෝජන මෙහෙයෙහි "මේ මාගේ ශරීරයයි", "මේ මාගේ රුධිරයයි" යන පාස්කු භෝජනයට අඩංගු නොවූ යෙදුම් වැදගත් වන්නේ රාත්‍රී භෝජනයට ක්‍රිස්තියානි ඉගැන්වීමේ පදනම මෙය බැවිනි.

• ස්වකීය මරණය කරණ කොටගෙන ස්ථාපිත කරන ලද දෙවියන් වහන්සේ හා මනුෂ්‍යයා අතර අළුත් සම්බන්ධතාව ට පංගුකාර වීමේ වරම ක්‍රිස්තුන් වහන්සේ අනුගාමිකයින්ට මෙයින් ලබා දුන් සේක.

• "මා ඔබ සමග අළුත් මිදියුස පානය කරන දවස එන තුරු" යනුවෙන් ජේසුස් වහන්සේ ප්‍රකාශ කරන වචන නව ගිවිසුම යටතේ ලබන මිදීම සම්බන්ධයෙන් කියන ලද්දක් බව පෙනේ.

• මෙම මිදීමෙන් අදහස් වන්නේ ජේසුස් වහන්සේගේ ලේ වැගිරීම හා මරණය කරණකොට ගෙන සියලු මිනිසුන් හට අත්වන ගැලවීම ය.
• මේ ගැළවීම සම්පූර්ණ වී සියළු දෙනා දෙවියන් වහන්සේගේ පාලනය යටතේ වූ විට ජේසුස් වහන්සේ ගේ පූජා වීමේ මරණය සිහිකිරීම පිණිස උන් වහන්සේ නව පාස්කු භෝජනය පවත්වනු ලබයි.

• "ගෙත්සෙමන ඔලිව ගස් වවන ලද පලතුරු වත්තකි. මෙය ජෙරුසලම් නගරයට මුහුණ ලා ඔලිව කන්දෙහි බටහිර බෑවුමෙහි පිහිටියේය. හෙබ්‍රෙව් භාෂාවෙන් මෙහි අර්ථය "තෙල් යන්ත්‍රය" යනුයි.
• ජේසුස් වහන්සේගේ දුක් විඳීම හදිසියේ සිදුවූ සිද්ධියක්වත්, ඉරණමක බලපෑමක්වත් නායක පූජකයින්ගේ සැලැස්ම නිසා වූවක් වත්, ජුදාස් ගේ පාවා දීම නිසා සිදුවූවක් වත්, පිලාත්ගේ බලය නිසා සිදුවූවක්වත් නොව ලෝකය ගලවා ගැනීම සඳහා වූ දේව සැලැස්මයි.
• ජේසුස් වහන්සේ මෙයට මුහුණ දුන් ආකාරය සැඟවීමට මතෙව් තුමා අදහස් නොකරයි. ජේසුස් වහන්සේගේ යාච්ඤාවෙන් එය පැහැදිලි වෙයි. "අහෝ මාගේ පියාණෙනි, හැකිනම් මේ කුසලාන මාගෙන් පහකළ මැනව. එහෙත් මා කැමති ලෙස නොව. ඔබ කැමති ලෙස වේවා" (26:39)

• එතුමා සියල්ල ඉවසා සිටියේ ගැලවීමේ ජයග්‍රහණය අත්කරදීමටය.
• නොයෙකුත් ප්‍රශ්නවලට ගැටළුවලට මුහුණ දෙන මතෙව් සංඝයට මෙය ආදර්ශයකි. යමෙක් තමා පසුපස එන්නේ නම් සිය කුරුසිය දරාගෙන ආ යුතු බව මෙහිදී පැහැදිලි වේ.

• "මෙන්න නියමිත මොහොත ළංවී ඇත" මේ සඳහා භාවිත කරන ග්‍රීක වචනය "කයිරොස්" ය. එනම් "පැය" හෝ "මොහොතයි".
• ජේසුස් වහන්සේගේ මුළු ජීවිතය ම සූදානම් කරනු ලැබුවේ. මේ මොහොතට මුහුණ දීමට ය. නායක පූජකයින්ට හා විනයධරයින්ට එය පැහැදිලි නොවූවා විය හැකිය.

• ගෝලයෙකු ගුරුවරයා සිඹීම විශේෂ ගෞරවයක් දැක්වීමේ ලකුණකි. ජූදස් ජේසුස් වහන්සේ පාවා දෙන්නේ ඒ ආකාරයට ය.

• රෝම හමුදාවේ සේනාංකයක් හේවායින් 6000 කින් සමන්විත ය. දේව දූත සේනාංක දොළොසකට වැඩි සංඛ්‍යාවක වුවත් ආරක්ෂාව උන්වහන්සේට සපයා ගත හැකි බව ජේසුස් වහන්සේ මෙහිදී මතක් කර දෙයි. (26:53) මේ සියල්ල සෙකරියා 13:7 ඉටු වීමකි.

• ජුදා ශ්‍රේෂ්ඨාධිකරණය හෙවත් සැනෙඩ්‍රින් මන්ත්‍රණ සභාව ජුදෙව්වන්ගේ උත්තරීතර නඩු ශාලාව ය.

• පූජකයින්, විනයධරයින් හා ප්‍රජා මූලිකයන් මෙම සභාවේ සාමාජිකයන් වූහ. කයාපස් ක්‍රි. ව. 18-36 දක්වා උත්තම පූජක තනතුර දැරුවේය. ඔහු ක්‍රි. ව. 6:15 දක්වා උත්තම පූජකයාව සිටි අන්නස් ගේ බෑනා විය.

• නායක පූජක මඩුල්ලේ සභාපති ධූරය හා ජුදෙව්වන්ගේ උත්තරීතර මණ්ඩලයේ සභාපති ධූරය දැරුවේ මොහු ය. ජුදයින්ගේ ආගමික හා සිවිල් ප්‍රශ්න විසඳු අතර දඬුවම් කිරීමට බලය තිබුණද යමෙකු මරණයට නියම කිරීමේ බලය පැවතියේ රෝම පාලකයින්ට පමණි.

• ජේසුස් වහන්සේ සම්බන්ධයෙන් බොරු සාක්ෂි දීමට බොහෝ දෙනා ඉදිරිපත් වුව ද පුද්ගලයෙකු වරද කරුවෙකු සේ පිලිගැනීමට සාක්ෂි කරුවන් දෙදෙනෙකු ඉදිරිපත් කළ යුතු වූ බව ද්විතීය නීති 19:15 දක්වයි. මතෙව් තුමා ඒ අදහසට එකග වූ බව පෙනෙයි.

• 26: 64 සිට 65 හි සඳහන් ජේසුස් වහන්සේගේ වචන දේව ගෞරවය කෙලසන දේව අපහාසයන් ලෙස සැනෙඩ්‍රින් සාමාජිකයෝ පිළිගත්හ. එයට දඬුවම ගල් ගසා මරණයට පත් කිරීමයි (ලෙවී 24 : 11 - 16) තම වස්ත්‍ර ඉරා ගැනීම, සන්ත්‍රාසය හා දැඩි කෝපය ප්‍රකාශ කරන ජුදෙව් පිලිවෙතකි. (උත්පත්ති 37:29)

•නායක පූජකයා ජේසුස් වහන්සේගේ වචන හමුවේ සිය වස්ත්‍ර ඉරා ගනියි. අනතුරුව ජුදය, සමාරිය හා ඉදුමිය යන ප්‍රදේශ වල රෝම ආන්ඩුකාර ධූරය දැරූ පිලාත් වෙත ජේසුස් වහන්සේ ගෙන යන ලදී.

• ජේසුස් වහන්සේ පාවා දීම සඳහා ජූදස්ට ගෙවන ලද රිදී මිල 30 "ලේ මිල'' යනුවෙන් හැඳින්වේ. යම් අයෙකුගේ ජීවිතයක් විනාශ කිරීමක් උදෙසා ගෙවන ලද මුදලක් වූ බැවින් ද එය මරණය හා කිට්ටු දෙයක් වන බැවින් ද චාරිත්‍රානුකූල ව අපවිත්‍ර වූ දෙයක් ලෙස සලකන ලදී. මේ නිසා දේව මාලිගාවෙහි මුදල් ගබඩාවට එම මුදල එක් නොකිරිණි.

• 27:19 පිලාත්ගේ භාර්යාව හා සම්බන්ධ සිහිනය සඳහන් කරන්නේ මතෙව් තුමා පමණකි. දේව මගපෙන්වීම දැක්වීමේ මාර්ගයක් ලෙස සිහිනය උපයෝගී කරගෙන ඇත.

• පිලාත්ගේ අත් සේදීම ඔහු දෙන ලද තීරණය ගැන වගකීමෙන් තොර බව පෙන්වන ලකුණකි. මරණයට නියම කරන ලද අපරාධ කරුවන්ට තද වේදනා ගෙන දෙන ලෙස කසයෙන් තැලීම සිරිතක් වූ අතර ඔහු සරදමට ලක් කෙරිණි. එම සරදම සිරකරුවාට විරුද්ධව නගන ලද චෝදනාව හා සම්බන්ධ ය.

• ජේසුස් වහන්සේගේ වස්ත්‍ර ගලවා දමා රෝම හේවායින් පැළඳී අත් නොමැති කොට කබායක් අන්දවා රෝම අධිරාජ්‍යයකු හෝ මල්ලව තරගයකින් ජයගත් ක්‍රීඩකයෙකු හෝ පළඳින ඔටුන්නක් හා සමාන කටු ඔටුන්නක් ගොතා රාජ යෂ්ටිය සංකේතවත් කරන බට දන්ඩක් උන් වහන්සේගේ අතට දී අපහාස කළෝ ය.

• ඔවුහු උන් වහන්සේ කපාළ පිටිය හෙවත් "හිස්කබල'' යන අර්ථය ඇති ස්ථානයකට ගෙන ගියහ. වරද කරුවෙකු කල වරද පෙන්නුම් කරන ලියවිල්ලක් කුරුසිය මත සවිකිරීම සිරිතකි. ජේසුස් වහන්සේගේ කුරුසිය මත, "ජුදෙව්වන්ගේ රජ'' යයි සඳහන් කළේ එබැවිනි.

• "ඒලී ඒලී ලාමා සබක්තානි" හෙබ්‍රෙව් යෙදුමේ අර්ථය "මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මන්ද?" ජේසුස් වහන්සේගේ සන්තාපය ප්‍රකාශ වන මෙම වචන ගීතාවලිය 22:1 සිහිගන්වයි.

• ජේසුස් වහන්සේට දෙන ලද ඇඹුල් මිදි යුෂ සාමාන්‍ය වශයෙන් රෝම භේවායින් සහ දිළිඳු ජනයා පාවිච්චි කල ලාභ මුද්‍රික පානයකි.

• දේව මාලිගා තිරය, ශුද්ධ ස්ථානයෙන් අති ශුද්ධ ස්ථානය වෙන් කිරීමට යොදාගත් කඩතුරාව විය. (නික්මයාම 26:31) හෙබ්‍රෙව් 9:8, 10:19) තිරය දෙකඩ වීම දෙවියන් වහන්සේ වෙතට යන මාර්ගය, ජේසුස් වහන්සේ විසින් විවෘත කර දීම සංකේතවත් කරයි. (හෙබ්‍රෙව් 9:3-8,10: 19-22)

• 27:51-53 පාරිසරික වෙනස් වීම් හා සොහොන් කොත්වලින් ශුද්ධවරයින් උත්ථානවීම් ඉදිරිපත් කරන්නේ මතෙව් තුමා පමණි.

• ජෙරුසලමේ සිට වයඹ දෙසට කිලෝමීටර 25 ක් පමණ ඈතින් පිහිටි නගරයක් වූ අරිමාතියාවේ සිට පැමිණි ජෝසෙප් නමැති ධනවත් පරිසිවරයෙක් ජේසුස් වහන්සේගේ දේහය භූමදානය සඳහා ඉල්ලා සිටි අතර අලුත්ම සොහොන් ගෙයක උන් වහන්සේගේ දේහය තැන්පත් කළේ ය.

• පුනරුජ්ජීවනය පිළිබඳ සුභාරංචිවල සඳහන් ප්‍රථම සාධකය හිස්වූ සොහොන ය. ජේසුස් වහන්සේගේ දර්ශනය වීම් නිසා උන් වහන්සේගේ උත්ථානය සනාථ විය. උත්ථාන වූ ක්‍රිස්තුන් වහන්සේ ගලීලයේ දී සිය ශ්‍රාවකයින්ට දර්ශනය වීම මතෙව් තුමා වාර්තා කර ඇති අතර ලූක් තුමා ජෙරුසලම අවට සිදුවූ දර්ශන ගැන සඳහන් කරයි.

• සතියේ පළමුවන දින ජුදෙව් පිළිගැනීමට අනුව සෙනසුරාදා සවස ඉර බැස්මේ සිට ඉරිදා සවස ඉර බැස්ම දක්වා කාලයයි. ජේසුස් වහන්සේට අවසන් ගෞරවය දැක්වීම සඳහා ස්ත්‍රීන් සොහොන් ගෙය වෙත පැමිණෙති.

• දෙවියන් වහන්සේගේ වැඩ සිටීම ප්‍රත්‍යක්ෂ වනුයේ භූමි කම්පාවත් ස්වාමින් වහන්සේගේ දූතයෙක් ගල ඉවත් කර තිබීමත් උත්ථානයේ පනිවුඩය ශ්‍රාවකයින්ට දැන්වීමට අණ කිරීමත් නිසා ය.

• මෙම පණිවුඩය ගෙන යාමට ස්ත්‍රීහු සතුටු වූවෝ ය. එමෙන් ම බියට ද ඔවුහු පත් වූ හ.

**නිපුණතාව 5:2 :** පාවුලුතුමාගේ දේවධාර්මික ඉගැන්වීම් මත ජීවිතය ගොඩනගාගනී.

**කාලච්ඡේද සංඛ්‍යාව** : 20

**ඉගෙනුම් ඵල**

1. ශු. පාවුලුතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳව කරුණු ගොනු කරයි
2. බැහැපත් දිවියක් ගතකළ යුතු බව පිළිගනියි
3. ශු. පාවුලුතුමාගේ ප්‍රධාන ඉගැන්වීම් පිළිබඳව ගොනුකළ තොරතුරු නිර්මාණාත්මකව ඉදිරිපත්කරයි
4. ප්‍රේම පාරමිතාව අනුව ජීවිතය හැඩගස්වා ගනියි
5. පවුල තුළ සහයෝගයෙන් හා ප්‍රේමයෙන් දිවිගෙවයි

## ප්‍රේමය (1 කොරෙන්ති 13)

• කොරෙන්ති සංඝය විවිධ දීමනා වලින් සපිරුණු සංඝයක් විය. (1 කොරෙන්ති 12: 8-12). එමනිසා සංඝය තුළ බොහෝ දෙනා කැපී පෙනීමට උත්සහ කළහ. එම තරගය නිසා සංඝයේ සාංඝික බවට හානිවිය.

• මේ නිසා පාවුලුතුමා ප්‍රේමයෙන් බැහැරවූ කිසිදු දීමනාවක වටිනාකමක් නැති බව කියා සිටී. ප්‍රේමයේ දීමනාව සදාතනිකය. අනෙකුත් සියලු දීමනාවන් තාවකාලික වේ (13: 8).

• ප්‍රේමය සඳහා පාවුලුතුමා යොදාගන්නේ "අගාපේ" යන ග්‍රීක වචනයයි. "අගාපේ" යනු කිසිදු ප්‍රතිලාභයක් නොතකා අන් අය අපට අයහපත කළත්, අයහපත පැතුවත්, ඒ අයට යහපතම කරන, යහපතම පතන ලක්ෂණයයි.

• පාවුලුතුමා ඉතා දැඩි ලෙස අවධාරණය කර සිටින්නේ ප්‍රේමයෙන් බැහැර වූ කිසිදු දීමනාවක් කිසිදු වටිනාකමක් නැති බවයි.

• ප්‍රේමය නොමැති තැන ලෞකික හෝ ලෝකෝත්තර හැකියාවන්ගෙන්ද මහත් වූ පරිත්‍යාගයෙන්ද පලක් නැත.

• දිවැසි වැකි දෙසුවත් සකල ඥානය තිබුනත් බලවත් විශ්වාසයකින් ක්‍රියා කළත් සියලු දේ දන් දුන්නත් සිරුර ගිනි පූජාවක් සඳහා බිලි දුන්නත් ප්‍රේමය නොමැතිනම් ඒ දේවල් නිශ්ඵල වන්නේය.

• කඳු සෙලවීම කළ හැක්කක් නොවේ. එහෙත් විශ්වාසයට එවැන්නක් පවා කළ හැකිය. (මාක් 11: 23, සෙකරියා 4: 6-7) එවැන්නක් කළත් ප්‍රේමය නැතිනම් ඵල රහිතය. "ශරීර දවන යාග පූජාවක් සේ ඔප්පු කිරීම" යන්නෙන් අදහස් කරන්නේ ප්‍රාණ පරිත්‍යාගි වීමය (2 මකබි 7).

• ඉවසීම, කරුණාව, ඊර්ෂ්‍යා නොවීම, පාරට්ටු නොකිරීම, උඩඟු නොවීම, හනික නොකිපීම, අවිනීත නොවීම, ආත්මාර්ථකාමි නොවීම, නපුර සිතේ තබා නොගැනීම, හරි දේ ගැන ප්‍රීති වී අනුන්ගේ වරද ගැන ප්‍රීති නොවීම ප්‍රේමයේ ලක්ෂණය.

• විශ්වාසය හා බලාපොරොත්තුව අරුත්බර කරන්නේ ප්‍රේමයයි. විශ්වාසයටත් බලාපොරොත්තුවටත් ඉමක්, නිමක්, අගක් නැත. ප්‍රේමය සදාතනිකය. අනෙකුත් සියලු දේ පහව ගියත් ඒවා අසම්පූර්ණ වුවත් ප්‍රේමය සියල්ල සම්පූර්ණත්වයට පත් කරන්නේය.

• බේද අමතක කර පොදු සහෝදරත්වයෙන් බැඳුනු ප්‍රේමයේ ජීවිතයකට සහභාගි වන්නට පාවලුතුමා සැමදෙනාටම ආරාධනා කරයි.

## පවුල් දිවියේ සබඳතා (එපීස 5: 22/6: 4)

• කිතුනු පවුල ශුද්ධවූ සභාවේ ජීවනාලියයි. කිතුනු පවුල් රාශියක් එක්ව ගොඩ නැගුනු දෙවියන් වහන්සේගේ විශේෂ පවුල ශුද්ධවූ සභාවයි. එමනිසා පවුල් ජීවිතය ද ශුද්ධවූ සභාවේ ජීවිතය ද අතර කිට්ටු සබඳතාවක් ඇත.

• විවාහ සම්බන්ධතාවය තුළ දෙදෙනා අතර ගරු කිරීමක් තිබිය යුතුය. ශාරීරික වශයෙන් ද අධ්‍යාත්මික වශයෙන් ද එකිනෙකා වෙනුවෙන් තමා කැපවිය යුතුය, වැයවිය යුතුය.

• ගෘහස්ත පාලනයේදී භාර්යාව ස්වාමි පුරුෂයාට කීකරු විය යුතු අතර ස්වාමියා සිය භාර්යාව වෙත ක්‍රියා කිරීමේදී කරුණාවෙන් කටයුතු කළ යුතුය.

• ස්වාමි පුරුෂයාගේ ප්‍රේමය භාර්යාව කෙරේ සැලකිල්ලක් දක්වන, ඇයගේ ජීවිතය කෙරේ සැලකිලිමත් වන ප්‍රේමයක් විය යුතුය. මෙම අඹු සැමි ප්‍රේමය සේවය ලබාගන්නා ආත්මාර්ථකාමි ආදරයක් නොව සේවය කිරීමේ, අනෙකා වෙනුවෙන් කැඩිය බිඳිය හැකි පරිත්‍යාගශීලි ආදරයක් විය යුතුය.

• ස්වාමි පුරුෂයා භාර්යාව කෙරෙහි දක්වන ආදරය කිසිම දිනෙක වෙනස් කරන්නට නොහැකි ආදරයකි.

• මෙම ප්‍රේමය නිසාම ස්වාමි පුරුෂයා තම දෙමාපියන් අතහැර භාර්යාවට ඇලුම් වන්නේය. ඒ ආදරය තුළ ඔවුන් දෙදෙනා එක් කෙනෙක් වන්නේය. දෙදෙනා එකම ශරීරයක් වන්නේය.

• ස්වාමි පුරුෂයා තම භාර්යාව තමාගේ අවශ්‍යතා ඉටුකර ගැනීමේ උපකරණයක් ලෙස හෝ භාර්යාව සිය පුරුෂයා තම අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීමේ මාර්ගයක් ලෙස භාවිත නොකල යුතුය. එහි පැවතිය යුත්තේ අන්‍යොන්‍ය අවබෝධය මත පදනම් වූ අවංක ආදරයකි.

• එහෙයින් ස්වාමි පුරුෂයාගේ ශරීරය භාර්යාවටත් ඇයගේ ශරීරය ස්වාමි පුරුෂයාටත් හිමිවේ.

• ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාව ඉතා උසස් හා පිරිසිදු එකක් විය යුතුය.

• පාවුලුතුමා ස්වාමි පුරුෂයා හා භාර්යාව අතර තිබිය යුතු සම්බන්ධතාවය ක්‍රිස්තුන් වහන්සේ හා සභාව අතර ඇති සම්බන්ධතාවට සමාන කරයි. මෙම සම්බන්ධතාවයේ පදනම ආදරයයි.

• ස්වාමි පුරුෂාය භාර්යාව කෙරෙහි දැක්විය යුතු පරිත්‍යාගශීලි ආදරයකි.

• ක්‍රිස්තුන් වහන්සේ ශුද්ධවූ සභාවට ප්‍රේම කලාක් මෙන් ස්වාමි පුරුෂයා තම භාර්යාවට ප්‍රේම කළ යුතුය. කිසි විටෙක එය ස්ව ආලය නොවිය යුතුය.

• ක්‍රිස්තුන් වහන්සේ සභාව මගින් යම් දෙයක් ලැබේය යන බලාපොරොත්තුවෙන් ඇයට ප්‍රේම කලේ

• ස්වාමිපුරුෂයා භාර්යාවට ප්‍රේම කළ යුත්තේ තමාට මෙන්ය. භාර්යාව ද තම ස්වාමි පුරුෂයාට සියලු කාරණාවලදී ගරු කළ යුතුය. ක්‍රිස්තුන් වහන්සේ සභාවේ හිස වන්නාක් මෙන් ස්වාමි පුරුෂයා භාර්යාවගේ හිස ය. එය බලය පෙන්වීමේ නායකත්වයක් නොව. ප්‍රේම කිරීමේ නායකත්වයකි. සභාව ක්‍රිස්තුන් වහන්සේට යටත් වන්නාක් මෙන් භාර්යාව සියලු කරුණු වලදී පුරුෂයාට යටත් විය යුතුය. මෙම යටත්වීම බිය නිසා නොව ප්‍රේමය නිසා ඇතිවන යටහත් පහත් භාවයකි.

• ක්‍රිස්තුන් වහන්සේ සභාවට දැක්වූ ප්‍රේමය නිසා සභාව ශුද්ධවත් කළාක් මෙන් ස්වාමි පරුෂයා ද ප්‍රේමය කරණ කොටගෙන තම භාර්යාව ගැන සැලකිලිමත් විය යුතුය.

• ඕනෑම පුද්ගලයෙකු තම ශරීරයට ප්‍රේම කරයි. එය පෝෂණය කරයි. ආරක්‍ෂා කරයි. ස්වාමි පුරුෂයා භාර්යාවට ප්‍රේම කළ යුත්තේ තම ශරීරයට මෙන්ය. මන්ද සභාව ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය වේ. උන් වහන්සේ සභාව ගැන සලකන්නේ ද එසේය.

• විවාහයේ ප්‍රධාන අරමුණ දරුවන් බිහිකිරීම හා ඇතිදැඩි කිරීමය.

• දරුවන්ගේ යහපත තකා, කාලානුරූපීව ලෞකික හා අධ්‍යාත්මික තත්ත්වයද සමාජ යහපතද ශුද්ධවූ සභාවේ යහපත ද සලකා ඔවුන්ට මඟ පෙන්විය යුතුය.

• දරුවන් පුහුණුකොට හදා වඩා ගැනීම දෙමාපියන් සතු වගකීම බව පැරණි ගිවිසුමේ ද ඉගැන්වීම වේ (ද්විතීය නීති 6: 6-7, හිතෝපදේශ 22: 6).

• එහෙයින් දරුවන් ඇතිදැඩි කිරීමේ දී පියාගේ වගකීම හා මවගේ සැලකිල්ල වැදගත්ය.

• ජුදා මෙන්ම ග්‍රීක රොම සංස්කෘති වල ද දෙමාපියන්ට ගරු කළ යුතු බව එකහෙලා පිළිගෙන ඇත.

• දෙමව්පියන්ට ගරුකිරීම දේව නියමයකි. (නික්මයාම 20: 12, ද්විතීය නීති 5: 16)

• දෙමව්පියන්ට නිසි ලෙස දිය යුතු ගෞරවය, සැලකිල්ල, ආදරය දැක්වුවහොත් පමණක් යමෙකුට දීර්ඝායුෂ ලැබෙන බව දස පණත ද පෙන්වා දෙයි.

• දරුවන් දෙමව්පියන්ට ගෞරව දෙන ලෙස ජීවත් වීමට ද වගබලා ගත යුතුය. (ද්විතීය නීති 21: 18-21).

• දරුවන්ව හදා වඩා ගැනීමෙහිලා අමානුෂික දඬුවම් දීම ද අතීතයේ සිදුවිය. එහෙත් පාවුලුතුමා මෙම තත්ත්වයට සතුටු වූ බවක් නොපෙනේ.

• එතුමාට අනුව දරුවන්ව ඇති දැඩි කළ යුත්තේ ඔවුන්ව කෝප නොකොට විනයෙන් හා අවවාදයෙන් යුතුවය. එමගින් දෙමව්පියන්ගේ හා දරුවන් අතර තිබිය යුතු අන්‍යෝන්‍ය බැඳීම, ඉවසීම, තේරුම් ගැනීම පිළිබඳව එතුමා තව දුරටත් අවවාද කරයි.

• දරුවන් ද දෙමව්පියන්ගේ සියලු කටයුතු වලදී කීකරු විය යුත්තේ සමිඳාණන් වහන්සේ තුළ ආදරයෙන් හා තමන්ගේ යුතුකමක් කොට සැලකීමෙන්ය.

## ක්‍රිස්තුස් වහන්සේගේ බැහැපත්කම හා මහිමාන්විතකම (පිලිප්පි 2: 5-11)

ශුද්ධවූ පාවුලුතුමා පිලිප්පි සංඝයට ක්‍රිස්තුන් වහන්සේ බැහැපත් වූ ආකාර 2 ක් පැහැදිළි කරයි.

1. ක්‍රිස්තුස් වහන්සේ දේව ස්වරූපය දැරූ නමුත් දේව සමානකම ත්‍යාජ කරමින් වහලෙකුගේ ස්වරූපයක් ගෙන අප හා සමාන මිනිසෙකු වීම තුළින් පෙන්වූ බැහැපත්කම
2. මනුෂ්‍යාකාරයේ සිටිමින් උන් වහන්සේ කුරුසියේ මරණය දක්වා පහත්වී කීකරු වීම තුළින් හෙළිවන බැහැපත්කම.

• ක්‍රිස්තුස් වහන්සේ දෙවියන් වහන්සේමය. දේව ස්වරූපය උන් වහන්සේට ඇත.

• පාවුලුතුමා 'සමාන' ස්වරූපය යන වචනය සඳහා භාවිත කරන්නේ 'ඊසා' යන ග්‍රීක වචනයයි. එහි තේරුම "ඕනෑම පරිසරයක වෙනස් නොවන" යන්නයි.

• එසේ නම් ක්‍රිස්තුන් වහන්සේ වෙනස් නොවන දේවත්වය දරූ තැනැත් වහන්සේය. තමාට උරුම ඒ දේවත්වය සිය කැමැත්තේනම ත්‍යාජ කර අප හා සමාන මිනිසකුව එම තත්ත්වයෙන්ද පහල වූ වහලෙකුගේ ස්වරූපය ගෙන කීකරු වූ සේක.

• මෙහිදී වැදගත් වනුයේ ක්‍රිස්තුන් වහන්සේ සම්පූර්ණයේනම තමාගෙන් හිස්වීම (කිසිවක් තබා නොගෙන කරන හිස් වීමකි) තුළ වූ කීකරුකමකි. රෝම ආභාසය ඇති පාවුලුතුමා ක්‍රිස්තුන් වහන්සේ සිය කැමැත්තෙන්ම තෝරා ගත් වහල්භාවය තුළ වූ කීකරුකම අවධාරණය කරයි.

• වහලා සඳහා යොදා ගෙන ඇති ග්‍රීක වචනය 'ඩූලොස්' ය. වහලුන් සම්බන්ධයෙන් රෝම නීතිය ඒකාකාර නොවීය. වහලෙකු ස්වාමියාගේ මනාපය අනුව හසුරුවන ලදි.

• වහලකුව ගණන් ගනු ලැබුවේ චංචල දේපලක් ලෙස නිසා පුරවැසි අයිතිවාසිකම් කිසිවක් ඔහුට නොවීය.

• කීකරුකම උතුම් ගුණාංගයකි.

• කීකරුකමේ විශිෂ්ටත්වය කිතුනුවන්ට ලැබෙන්නේ ක්‍රිස්තු ආදර්ශයෙනි. මිනිසත් බව ගන්නා දේව පුත්‍රයාණන් කීකරුකමේ ප්‍රතිමූර්තිය වන්නේය. උන් වහන්සේ දෙවි පියාණන් වහන්සේට කීකරු වන්නේ එහි උපරිම තලයේ සිටය.

• දේව සැලැස්මට හිස නමන උන් වහන්සේ මරණයට පමණක් නොව නින්දිත මරණයක් ලෙස සැලකූ කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක.

• ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත්කම නිසාම වූ හිස් වීම තුළ කිසිදු මිනිසකුට නොලැබෙන තේජාන්විත තත්ත්වයක් උන් වහන්සේට ලැබිණි. දෙවියන් වහන්සේ උන් වහන්සේගේ ශරීරය පරාජිත වීමට නොදී උත්ථාන කළ සේක.

• උන් වහන්සේ අති උස් තැනට නංවා සියලු නාමයන්ට වඩා අග්‍ර නාමය උන් වහන්සේට දුන් සේක. අලුත් නමක් තැබීමකෙනෙකුගේ නව ආරම්භයකි.

• ක්‍රිස්තුන් වහන්සේගේ බැහැපත් කම නිසාම හිස්වීම තුළ කිසිදු මිනිසකුට නොලැබෙන තේජාන්විත තත්ත්වයක් උන් වහන්සේට ලැබිණි.

• දෙවියන්වහන්සේ උන් වහන්සේගේ ශරීරය ජරාජීර්ණ වීමට නොදී උත්ථාන කළ සේක. උන් වහන්සේ අති උසස් තැනට නංවා සියළු නාමයන්ට වඩා අග්‍ර නාමය උන් වහන්සේට දුන් සේක. උන් වහන්සේ දුන් අළුත් නාමය වනුයේ "ස්වාමින් වහන්සේ ය"

• සෙප්තුවජින්ත පිටපතෙහි දෙවියන් වහන්සේ යාවේ ලෙස යොදා තිබූ හෙබ්‍රෙව් නාමය ග්‍රීක භාෂාවට පරිවර්ථනය කර ඇත්තේ ස්වාමින් වහන්සේ යන නාමයෙන්ය.

• මුල් කිතුනුවන් විසින් ජේසුස් වහන්සේ ට ද එම නාමය භාවිත කරන ලදී. (මාක් 1:3, ක්‍රියා 2: 36, 1 කොරින්ති 12:3 )

• එපමණක් ද නොව සියල්ලලන් මෙම උත්තරීතර නාමය ඉදිරියේ දන නමනු ඇත. (යෙසායා 45:23) දෙවියන් වහන්සේට දියයුතු නමස්කාරය හා ප්‍රශංසාව කෙලෙස විය යුතු දැයි විස්තර වේ. ජේසුස් වහන්සේට ද ඒ ආකාරයෙන්ම නමස්කාරය හා ප්‍රශංසාව දිය යුතු බව මෙහි සඳහන් වේ.

• මෙම උසස් නාමයට ස්වර්ගයෙහි ද පොළොවෙහිද පාතාල ලෝකෙයෙහිද සියල්ලන් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ සමිඳාණන් වහන්සේ යැයි දෙවියන් වහන්සේගේ මහිමය සඳහා සෑම දිවකින්ම ද ප්‍රකාශ කරනු ලබන සේක.

• ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතය තුළ මිනිසා තම බලය පෑමට වඩා ඔවුන්ට සේවය කරන්නට කැමති වූ සේක. උන්වහන්සේ ජීවිත් වූයේ තමාගේ කැමැත්තට අනුව නොව පියාණන් වහන්සේගේ කැමැත්තට අනුවය.

• තමාව උසස් කර ගන්නවා වෙනුවෙට ජනතාව වෙනුවෙන් තමාව පහත් කර ගෙන තමාට හිමි මහිමය අත්හැර දැමූ සේක.

• ක්‍රිස්තන් වහන්සේ මෙම උත්තරීතර ගුණාංගයන් වන බැහැපත්කම හා කීකරුකම පිලිප්පියේ කිතුනුවන්ට ද අනුගමනය කිරීමට පාවුලුතුමා ආරාධනා කරයි. කීකරුකම සමාජයේ ජීවත් වීමට අත්‍යාවශ්‍ය ගුණාංගයකි. බැහැපත්කම ද ඊට නොදෙවෙනි ය.

මූලාශ්‍ර

ශුද්ධ බයිබලය.

Geoffrey Chapman, **New Jerome Biblical Commentary,Great Birtain**, 1989.

Herman Hendrickx,**The Sermon on the Mount,** St. Paul Publications, Philippines, 1984.

Herman Hendrickx, **From One Jesus to Four Gospels,** Claretain Publications, Philippines, 1991.

John Wijngaards**, Handbook to the Gospels,** Servant Publications, Michigan 1979.

Leo Zanchettin, **Matthew** ( A Devotional Commentary), St.Paul Publications, India, 1997.

Craig S. Keener, **Bible background Commentary** (New Testament), intervaesity Press, Illinois, 1993

ජී. වී පී. සෝමරත්න, **නව ගිවිසුම සමයේ සංස්කෘතිය,** දේව ධර්ම ශාස්ත්‍රාලය, කොළඹ. 2006

ජූඩ් දසනායක, ශුද්ධ බයිබලයේ සමාජ, ආගමික, දේශපාලනික හා භූගෝලීය පසුබිම, කතෝලික මුද්‍රණාලය, කොළඹ 2011

ඔස්ටින් ඩයස්, ක්‍රිස්තු ධර්මය විභාග අත්වැල, ප්‍රසාන්ත් ප්‍රින්ටර්ස්, වත්තල 1998